272 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 272 - இல. 8
Volume 272 - No. 8

2019 ජූලි 10වන බදාදා
2019 யூலை 10, புதன்கிழமை
Wednesday, 10th July, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව**

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය**
වන සංරක්ෂණ නිලධාරින් විසින් කරප්පුකුති ග්‍රාමයේ නිවාස ව්‍යාපෘතිය නතර කිරීම

**අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගත්වය**
විවාදය කල් තබන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**அரசாங்க சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை**

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
வன இலாகாவினரால் கரப்பக்குத்தி கிராம வீடமைப்புத் திட்டம் தடுக்கப்பட்டமை

**பிரதம அமைச்சர், அமைச்சரவை உள்ளிட்ட அரசாங்கம்மீதான நம்பிக்கையின்மை:**
விவாதம் ஒத்திவைக்கப்பட்டது

---

# PRINCIPAL CONTENTS

PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Suspension of Housing Project in Karappukuthi Village by Forest Conservators

VOTE OF NO CONFIDENCE IN PRIME MINISTER, CABINET AND GOVERNMENT:
Debate Adjourned.

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 ජූලි 10වන බදාදා***
*2019 யூலை 10, புதன்கிழமை*
*Wednesday, 10th July, 2019*

**පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2019 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2019.01.01 - 2019.03.31) මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව
## அரசாங்க சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PROGRESS REPORT OF THE PUBLIC SERVICE COMMISSION

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 55(5) ව්‍යවස්ථා ප්‍රකාරව, 2019 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2019.01.01 - 2019.03.31) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව මම ඉදිරිපත් කරමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන්,

(i) 2018 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2018 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව; සහ

(iii) 2016 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව

මම ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 සහ 2017 වර්ෂ සඳහා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තා; සහ

(iii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2017 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2017 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(iii) 2017 වර්ෂය සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(iv) 2017 වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(v) 2017 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(vi) 2017 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(vii) 2017 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(viii) 2017 වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(ix) 2017 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(x) 2017 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව;

(xi) 2017 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා හා ගිණුම්;

(xii) 2017 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(xiii) 2017 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(xiv) 2017 වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(xv) 2017 වර්ෂය සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(xvi) 2017 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;

(xvii) 2017 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(xviii) 2017 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(xix) 2017 වර්ෂය සඳහා කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව;

(xx) 2017 වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(xxi) 2017 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(xxii) 2017 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(xxiii) 2017 වර්ෂය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාව;

(xxiv) 2017 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාව;

(xxv) 2017 වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(xxvi) 2017 වර්ෂය සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(xxvii) 2017 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තා ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ වාර්තා පාර්ලිමේන්තුවට එන්න ඉස්සර වෙලා විගණකාධිපතිතුමා විසින් මේවායේ තිබෙන අඩු පාඩු ඇතුළත් කර මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඒ අය වෙත වෙනම යවනවා, ඒ පිළිබඳ නිරීක්ෂණ එවන්න කියලා. ඒ එසේ වුවත්, ඒ අය සමහර වෙලාවට ඒ අදාළ ගිණුම් වාර්තා නිවැරදි කරලා එවන්නේ නැහැ. අපි නැවත වතාවක් ඒ අය කැඳවලා මේ කරුණු පැහැදිලි කරලා දෙනවා. පැහැදිලි කරලා දුන්නාම, ඒ අය ඒ මොහොතේ වැරැද්ද පිළිගෙන යනවා මිසක්, මේ කටයුත්ත නිවැරදි වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒගොල්ලන්ට දිගින් දිගටම අවවාද කළා, පාර්ලිමේන්තුවට කැඳවන්න පෙර මේ සියලු වාර්තා සම්පූර්ණ කරලා ලබා දෙන ලෙස. ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

## ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2, ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා ගරු සභාවේ නැහැ. [බාධා කිරීම්] බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය අපට අහන්න පුළුවන්නේ; අන්තිමට අහන්න පුළුවන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මම මොහොතකට කලින් දැක්කා, ගරු අග්‍රාමාත්‍යතුමා මේ සභාවේ ඉන්නවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ, නැහැ, එතුමා දැනට ආසනයේ නැහැනේ. මා එම ප්‍රශ්නය අහන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නය අහනවා.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් සැකකරුවන් කී දෙනෙක් මේ වන විට,-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please!

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙන අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන අපි ප්‍රශ්නයක් අහලා තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசியக் கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs.)

අද ප්‍රශ්න තුනක් ඉදිරිපත් කරලා තිබෙනවා. මරික්කාර් මන්ත්‍රීතුමා එකක් දුන්නා, අනුර දිසානායක මන්ත්‍රීතුමා එකක් දුන්නා, චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා එකක් දුන්නා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම ඔබතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා තමයි ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

විපක්ෂය වෙනුවෙන් තමයි ඒක ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රශ්න තුනක් ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Prime Minister, you are prepared with the Answer. So, why do you not answer? I will ask the Question.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Member concerned is not here.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

Let us go in this order. - [*Interruption.*] Let me do this. මට අලුත් ප්‍රශ්නයක් භාරගන්න බැහැ. නමුත්, අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙනකොට මේ ප්‍රශ්නයට අදාළ පිළිතුරත් ඇතුළු කරලා පිළිතුරු දෙන්නම්; for both.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙනකොට මේ ප්‍රශ්නයටත් අදාළ points එක්ක පිළිතුරු දෙන්නම්. එච්චරයි කරන්න තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මා විසින් අසනු ලබන ප්‍රශ්නය මෙසේයි.

(1) (i) පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධ සැකකරුවන් කීදෙනකු මේ වන විට අත්අඩංගුවේ පසු වන්නේ ද?

(ii) ඒ අය අතරින් ත්‍රස්තවාදයට සෘජු හා වක්‍ර සබඳතා පැවැත්වූ ගණන කොපමණ ද?

(iii) සැක පිට අත්අඩංගුවට ගත් අයගේ ගණන කොපමණ ද?

(iv) එසේ සෘජු හා වක්‍ර සබඳතා පැවැත්වූ අය සම්බන්ධව ගන්නා වැඩ පිළිවෙළ හා සැකයට පමණක් භාජන වූ අය වෙනුවෙන් ගන්නා වැඩ පිළිවෙළ කුමක් ද?

(v) එමෙන්ම කුලියාපිටියේ හා හෙට්ටිපොළ සිදු වූ අන්තවාදී ක්‍රියා සම්බන්ධව අත්අඩංගුවට ගත් ප්‍රමාණය කවරේ ද?

(vi) ඒ සඳහා ගෙන ඇති නීතිමය ක්‍රියා මාර්ගය කුමක් ද?

(vii) ඒ සඳහා ආධාර අනුබල දුන් අය අත්අඩංගුවට ගන්නේ ද?

(viii) නො එසේ නම් ඒ මන්ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා විසින් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධව මේ වන විට රැඳවුම් භාරයේ සැකකරුවන් 161 දෙනකු ද, රක්ෂිත බන්ධනාගාරගතව සැකකරුවන් 167 දෙනකු ද සිටිනවා. අත්අඩංගුවේ පසු වන එම සැකකරුවන් මේ සිද්ධියට සෘජුව හා වක්‍රව සම්බන්ධ බවට කරුණු අනාවරණ වී තිබෙන අතර, ඒ සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන කටයුතු සිදු කරමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රහාරය සම්බන්ධයෙන් සැක පිට පුද්ගලයන් 99 දෙනෙකු මේ වන විට අත්අඩංගුවට ගෙන තිබෙනවා. එම සැකකරුවන් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කිරීමෙන් පසුව නීතිපතිතුමාගේ උපදෙස් මත ඔවුන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, කුලියාපිටියේ සහ හෙට්ටිපොළ සිදුවූ අන්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් මේ වන විට පුද්ගලයන් 39 දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කර වැඩිදුර විමර්ශන කටයුතු සිදු කෙරෙනවා. මේ කඩාකප්පල්කාරී ක්‍රියාවලට ආධාර අනුබල දුන් අය සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ ක්‍රියාත්මක කර තිබෙනවා. වැරදි කළ අයට නිසි දඬුවම් ලැබෙන බව ස්ථිරයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසන මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙනුත්, හෙට්ටිපොළ සහ කුලියාපිටිය අන්තවාදී ක්‍රියාවලිනුත් හානි වූ ක්‍රිස්තියානි දේවස්ථාන හා මුස්ලිම් දේවස්ථාන, ව්‍යාපාරික ස්ථාන සහ නිවාසවලට වන්දි ගෙවීම සඳහා තක්සේරුවක් කරලා තිබෙනවාද? ඒ වන්දි ගෙවන්නේ කවදාද ?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
දැනට තක්සේරු කරගෙන යනවා. ක්‍රිස්තියානි පල්ලිවලට මූලික ගෙවීමක් කරලා තිබෙනවා. මම මුස්ලිම් කටයුතු අමාත්‍යාංශයට කිව්වා, මුස්ලිම් පල්ලිවලට ගෙවීම කරන්න කියලා. කෙසේ හෝ ලබන සතියේදී වන්දි ගෙවීම පිළිබඳ අපි ක්‍රියා කරනවා. දැනට හානි වූ ව්‍යාපාර තක්සේරු කරගෙන යන ගමන්, රුපියල් 50,000 හෝ රුපියල් 100,000 මූලික මුදල ඒ අයට ලබා ගන්න පුළුවන්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු අගමැතිතුමනි, ඔබතුමා ඒ පිළිබඳ උපදෙස් ලබා දී තිබෙන බව මම දන්නවා. ඒ වුණත් මේ ආකාරයටම දිගන ප්‍රදේශයට අන්තවාදී ප්‍රහාර එල්ල

වුණු අවස්ථාවේත් තක්සේරු කළා; වන්දි ගෙවනවා කිව්වා. නමුත් අද වන තෙක් වන්දි ගෙවලා නැහැ. මේකටත් ඒ වාගේ තත්ත්වයක් උදා වෙයිද? එහෙම නැත්නම් ලබන සතියේ වන්දි ගෙවන්න පුළුවන් වෙයිද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

දිගන සිද්ධිවලට අදාළ වන්දි ගෙවලා තිබෙනවා. අපි ලබන සතියේ රැස් වෙනකොට ඔබතුමාටත් ආරාධනා කරන්නම්. ඒ ගැන සාකච්ඡා කරලා අවසන් කරමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අනුර දිසානායක මහතා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 1995 මැයි මාසයේ 16වැනි දින කොළඹදී අත්සන් තබා ඇති ඇමෙරිකානු හමුදා ස්ථානගත කිරීම පිළිබඳ SOFA නමින් වන ගිවිසුම තවත් ශක්තිමත්කොට ක්‍රියාත්මක කිරීම සඳහා 2018 අගෝස්තු මාසයේ 28වැනි දින එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් නව යෝජනාවලියක් ඉදිරිපත්කොට තිබුණා. මේ වන විට ආණ්ඩුව ඒ සඳහා වන නව ගිවිසුමක් එක්සත් ජනපදය සමඟ අත්සන් තැබීමට සූදානමින් පසු වන බවටත්, විශේෂයෙන් පසුගිය මැයි මාසයේ තිලක් මාරපන විදේශ අමාත්‍යවරයාගේ එක්සත් ජනපද සංචාරයේදී මෙම ගිවිසුම පිළිබඳව එකඟතාවලට එළඹුණු බවටත් වාර්තා පළ වෙනවා.

මෙම කරුණ රටේ ආරක්ෂාව සම්බන්ධව සෘජුව බැඳී පැවතුණද ඒ පිළිබඳ සාකච්ඡා සහ එකඟතා එක්සත් ජනපද තානාපති කාර්යාලය සහ විදේශ අමාත්‍යාංශය අතර සිදු වී තිබෙන බව දැන ගන්නට ලැබෙනවා.

1. ඉහත නව ගිවිසුම අනුව එක්සත් ජනපද ආරක්ෂක අංශ සහ සිවිල් පුරවැසියන්ටද, එක්සත් ජනපද ආරක්ෂක දෙපාර්තමේන්තුව හා ගිවිසුම්ගතව සිටින, තාවකාලිකව ශ්‍රී ලංකාවට පැමිණ සිටින එක්සත් ජනපද කොන්ත්‍රාත්කරුවන්ටද මෙරටදී වියානා සම්මුතිය ප්‍රකාරව තානාපති නිලධාරින්ට ලැබෙන වරප්‍රසාද ලබා දීමට යෝජිතව තිබේද?

2. එක්සත් ජනපද පුරවැසියන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට තනිව හෝ කණ්ඩායමක් ලෙස ඇමෙරිකා හැඳුනුම්පතක් යටතේ ශ්‍රී ලංකාවට ඇතුළුවීමට සහ පිටවීමට අවසරය හිමිවනු ඇත්ද?

3. රිය පැදවීම සඳහා එක්සත් ජනපදය විසින් නිකුත් කර තිබුණු රියදුරු බලපත්‍ර ශ්‍රී ලංකාව විසින් පිළිගැනීමටත් රාජකාරිවල නියැළෙන අවස්ථාවන්හිදී ඇමෙරිකා හමුදාවලට නිල ඇඳුමින් සැරසී සිටීමටත්, ඔවුන්ට රට තුළ අවි රැගෙන යෑමට අවසර ලබා දීමටත් ශ්‍රී ලංකාව සූදානමින් සිටීද?

4. මෙම පුද්ගලයන් ශ්‍රී ලංකාවේ ගතකරන කාලය අතරතුර ඔවුන්ගේ කටයුතු සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමේ බලය -උදාහරණයක් හැටියට ගත්තොත් යම් අපරාධයකට හවුල් වුණත්, යම් රිය අනතුරකට හවුල් වුණත්- එක්සත් ජනපද රජයට ලබා දීමටත්, ඔවුන් මෙරට ක්‍රියාත්මක බදු හෝ වෙනත් ගෙවීම්වලට යටත් නොකිරීමටත්, ආනයනය කරනු ලබන හා අපනයනය කරනු ලබන භාණ්ඩවලට බදු අය නොකිරීමටත් එකඟ වී තිබේද?

5. යාත්‍රාවලට සහ වාහනවලට ශ්‍රී ලංකාවෙන් පිටවීමට සහ මෙරට නිදහසේ සැරිසැරීමට අවසර ලබාදීමටත්, ගුවන්විදුලි සංඛ්‍යාත ලබා දීමටත් ඒ සඳහා එක්සත් ජනපද තොරතුරු සන්නිවේදන උපකරණ භාවිත කිරීමට අවසරය ලබා දීමටත්, වෙන් කෙරෙන රේඩියෝ සංඛ්‍යාත වෙනුවෙන් කිසිදු අය කිරීමක් නොකිරීටමත් ශ්‍රී ලංකා රජය එකඟ වී තිබේද?

6. මෙම කරුණු සහ තවත් කරුණු ඇතුළත් වූ ගිවිසුමකට ශ්‍රී ලංකා ආණ්ඩුව එකඟ වී ඇද්ද? මෙම යෝජනාවලියට අදාළව ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එක්සත් ජනපදයට ප්‍රතිචාර දක්වා තිබේද? මෙම ගිවිසුම සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියල්ල දෙස බැලුවාම ශ්‍රී ලංකා මාතෘභූමිය ඇතුළේ එක්සත් ජනපද භූමියක් පිහිටුවීම සඳහා තමයි මේ යෝජනා සියල්ල අන්තර්ගත වී තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව විධිමත් පිළිතුරක් අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ලබාදෙනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත්, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් මේ ප්‍රශ්න ගැන දැනුම් දීලා තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නය අහන්න මෙතැනට පැමිණියේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා පමණයි. ඒ හා සම්බන්ධ ACSA ගිවිසුම තියෙන නිසා මම ඒ ගැනත් මගේ අදහස් ප්‍රකාශ කරන්නම්. මම හිතන හැටියට මගේ මිත්‍ර බන්දුල ගුණවර්ධන මැතිතුමා වෙන සෝභාවක වාඩි වෙලා ඇති. නමුත් මම මේ SOFA එක ගැන කියන්නම්.

පළමුවෙන්ම මම කැමැතියි, මේ SOFA ගිවිසුමට අදාළ ලිපිය පාර්ලිමේන්තුවේ සභාගත කරන්න. මේ 1996 අත්සන් කරපු, ලියවිලි හුවමාරුවක්. එය ගිවිසුමක් නොවෙයි. ලංකාවේ ඇමෙරිකානු තානාපති කාර්යාලයත්, අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයත් අත්සන් කරපු ලියවිලි හුවමාරුවක්. මම ඒක **සභාගත*** කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ පරණ එක නේද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔව්, පරණ එක. එච්චරයි මා ළඟ තිබෙන්නේ. මා ළඟ වෙන එකක් නැහැ. ඒ ගිවිසුම සභාගත කරන්න කියලා මගෙන් ඉල්ලුවා. ඉතින් මම එය සභාගත කළා. මේ ගිවිසුම ක්‍රියාත්මක කරගෙන ගියා. කවුරුවත් ඒකට විරුද්ධ වුණේ නැහැ, ඒ කාලයේ. ඒ SOFA එක තමයි තිබෙන්නේ, මෙතැන. තව sofas මොකුත් නැහැ. ඊට

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

අමතරව තිබෙන්නේ ආලින්දයේ තිබෙන sofas ටික විතරයි. මෙතැන වෙන එකක් නැහැ. [බාධා කිරීමක්] "SOFA" කියන්නේ, "Status of Forces Agreement." මම ඒ ගැන ඇමෙරිකාව කියන එක කියන්නම්. I quote:

"A SOFA is not a mutual defense agreement or a security agreement, and generally does not authorize specific exercises, activities, or missions. SOFAs are peacetime documents and therefore do not address the rules of war, the Laws of Armed Conflict, or the Laws of the Sea. "

These agreements, commonly referred to as Status of Forces Agreements (SOFAs), generally establish the framework under which U.S. military personnel operate in a foreign country.1 SOFAs provide for rights and privileges of covered individuals while in a foreign jurisdiction and address how the domestic laws of the foreign jurisdiction apply to U.S. personnel."

1995 මැයි 16වන දා, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිගේ කාලයේ තමයි මේ ලියුම් හුවමාරු කළේ. It states, I quote:

"This Ministry is pleased to inform the above mentioned personnel will be accorded the same status as provided to technical and administrative staff of the Embassy of the United States. The Ministry also wishes to inform that this reply shall constitute an agreement between two Governments effective 16th May, 1995.."

මෙහි "Ministry" කියා සඳහන් වෙන්නේ, Ministry of Foreign Affairs; "above-mentioned personnel" කියන්නේ, U.S. military personnel and civilian employees of the Department of Defence.

මේ අනුව, දැනටම තානාපති වරප්‍රසාද ඇමෙරිකානු හමුදාවේ අයටත් තිබෙනවා, ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් සේවකයන්ටත් ඒ වරප්‍රසාද ලබා දීලා තිබෙනවා.

ඉන් අනතුරුව, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය යටතේ ඇමෙරිකානු රජය සමඟ ශ්‍රී ලංකා රජය තවත් ගිවිසුමක්, එනම් Acquisition and Cross-Servicing Agreement - ACSA - 2007දී අත්සන් කළා. එම ගිවිසුමේ වලංගු කාලය 2017 මාර්තු 05වන දින අවසන් වුණා. ඉන් පසුව එම ගිවිසුම 2017 අගෝස්තු මාසයේ 04වන දා නැවත අලුත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය කටයුතු කර තිබෙනවා. එම ගිවිසුමත් සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා. නැවතත් SOFA එකක් සම්බන්ධ ගෝණි බිල්ලෙක් මැවීමට විපක්ෂය උත්සාහ කරනවා. මෙතැන අලුත් ගිවිසුම් මොකුත් නැහැ. තිබෙන්නේ, ලංකාණ්ඩුව හා ඇමෙරිකා රජය ඇති කරගත් SOFA එක පමණයි. ඒවාට වගකිව යුතු රේඛීය අමාත්‍යාංශය වන්නේ, ආරක්ෂක අමාත්‍යාංශයයි. එම නිසා මේ සම්බන්ධයෙන් යම් යෝජනාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේද යන්න මම අමාත්‍ය මණ්ඩලයේ ලේකම්තුමාගෙන් විමසුවා. එවැනි යෝජනාවක් ආරක්ෂක අමාත්‍යාංශය හෝ වෙනත් කිසිදු අමාත්‍යාංශයකින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයට ඉදිරිපත් කර නොමැති බව එතුමා මා වෙත ලිඛිතව වාර්තා කර තිබෙනවා. එම ලිපියත් සභාගත කරන්න මා කැමැතියි. ඒ නිසා, මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. අපි අලුත් එකක් සම්මත කරලාත් නැහැ; අලුත් එකක් ඉදිරිපත් කරලාත් නැහැ. ඒ ගැන සාකච්ඡා කරගෙන යනවා. මොකද, අලුත් කෙටුම්පතේ සමහර කොන්දේසි -අනුර දිසානායක මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා.- අපට පිළිගන්න බැහැ. ඒ නිසා අපි දැනුම් දීලා තිබෙනවා; මාත් දැනුම් දුන්නා, "මෙන්න මේවා ගැන තමයි ප්‍රශ්න තිබෙන්නේ" කියලා. අදාළ අමාත්‍යාංශයයි, ඇමෙරිකානු තානාපති කාර්යාලයයි ඒ ගැන සාකච්ඡා කරනවා. සමහර විට ඒක සාර්ථක වෙන්නත් පුළුවන්; අසාර්ථක වෙන්නත් පුළුවන්. නමුත් අපේ පරමාධිපත්‍යයට, ස්වෛරීභාවයට හානි වෙන කිසි දෙයක් අපි කරන්නේ නැහැ.

මෙහෙම ගිවිසුමක් අත්සන් කළා කියලා සමහර අය කියනවා මාධ්‍ය තුළින් මම දැක්කා. මම ඒ අයට කියන්න කැමැතියි, ඒ අත්සන් කරපු ගිවිසුම කරුණාකර මට දෙන්න කියලා. මොකද, ඒක හොර ගිවිසුමක්. එහෙම නම්, මම පොලීසියට ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරන්න ඕනෑ. ඊට පසුව පොලීසිය ඒ ගැන විභාගයක් කරන්න ඕනෑ, මේ කියන ගිවිසුම අත්සන් කළේ කවුද, අප මෙහෙම තත්ත්වයකට පත් කරන්න යන්නේ කවුද කියලා සොයා ගන්න. විශේෂයෙන්ම මාධ්‍යවලින්, මේ සම්බන්ධයෙන් යම් යම් දේවල් කියන හැම කෙනෙකුගෙන්ම මම ඉල්ලීමක් කරනවා, 1995දී ලිපි හුවමාරු කිරීමෙන් පසුව අපි අත්සන් කළ SOFA වැනි ගිවිසුමක් තිබෙනවා නම්, කරුණාකර ඒ සම්බන්ධයෙන් අපට දැනුම් දෙන්න කියලා.

මේ SOFA වාගේ ගිවිසුම් දකුණු අප්‍රිකාව, මලයාසියාව, සිංගප්පූරුව වැනි රටවල තිබෙනවා. මේ ගිවිසුම් එක එක විධියටයි යන්නේ. "ACSA" කියන ගිවිසුමේත් සංශෝධන කීපයක් තිබෙනවා. අපිත් එය සංශෝධනය කර තිබෙනවා; ඒ අයත් සංශෝධනය කර තිබෙනවා. අපි සංශෝධනය කළේ points of contact. ඇත්ත වශයෙන්ම කලින් තිබුණු ගිවිසුමේ දමා තිබුණේ, "යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව" කියායි. දැන් අපි එය වෙනස් කර තිබෙනවා. ඒ අනුව අපි දැන් කියා තිබෙනවා, ආරක්ෂක අමාත්‍යාංශයට එවන්න කියලා.

මේ ගිවිසුම් ගැන මම තවදුරටත් කියන්න කැමැතියි. ඇමෙරිකාවත් points of contact වැඩි කර තිබෙනවා. මොකද, ඇත්ත වශයෙන්ම මේ සංවිධානය යටතේ ඒ ගොල්ලන්ගේ අණ දෙන කාර්යාල වැඩි කර තිබෙනවා. අපේ රටේ අණ දෙන්නේ හමුදාපතිවරුයි. ඇමෙරිකාවේ, Goldwater-Nichols Department of Defense Reorganization Act එක යටතේ ඒ ඒ කලාප භාර අය තමයි අණ දෙන්නේ.

ඒක 1986 වර්ෂයේයි ගෙනැල්ලා තිබෙන්නේ. ට්‍රම්ප් ජනාධිපතිතුමා ඒ අණ දෙන කාර්යාල වැඩි කළා නම්, ඒකට මට කරන්න දෙයක් නැහැ. එදා ඇමෙරිකානු නාවික හමුදාවේ යුද්ධ නැව් 491යි තිබුණේ. දැන් 600කට වැඩි කරන්න යනවා. ඒක නිසා contact points වැඩි වෙලායි තිබෙන්නේ. මම මේ කාරණය කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මූලික ගිවිසුම දෙස බලනවා නම්, විශේෂයෙන්ම 2007 අවුරුද්දේ ගෝඨාභය රාජපක්ෂ මහතා අත්සන් කරපු ACSA එකේ පිටු හතක් තිබෙනවා. නමුත් අපි අත්සන් කරපු එකේ පිටු පහයි තිබෙන්නේ. ඒ කියන්නේ අපි යම් දේවල් අඩු කරලා තිබෙනවා කියන එකයි. මෙතුමා මේ ගැන විශේෂඥයෙකු නිසා කරුණාකරලා මට කියන්න, මොකක්ද මෙතැන දමා තිබෙන්නේ කියලා. පිටු පහේ එක, පිටු හතේ එකට වඩා ඇයි හානිදායක යැයි කියන්නේ? මේ ගිවිසුම් දෙස බලන්න. මේකේ පිටු පහක් තිබෙනවා. කලින් එකේ පිටු හතක් තිබෙනවා. ඔබතුමන්ලා කියන විධියට පිටු හත තිබෙන එක හොඳයි. පිටු පහ තිබෙන එක හොඳ නැහැ. පිටු පහේ එක හොඳ නැහැ. ඒක රට පාවලා දෙන එකක්. පිටු හත තිබෙන එක හොඳයි. ඒ ගැනයි මම අහන්නේ. මෙහි යම් කාරණයක් තිබෙනවා නම්, කරුණාකරලා මට ඒ ගැන දැනුම් දෙන්න. අපේ එකම ප්‍රශ්නය තිබුණේ ඇමෙරිකන් පුරවැසියෙක් ඒ ගිවිසුම අත්සන් කරපු එක ගැනයි. ඇමෙරිකාව එක්ක අත්සන් කරන කොට මෙහෙම තිබෙනවා. චීනය වාගේ රටවල් එක්ක අත්සන් කරන කොට මේ මොකුත් නැහැ. ඒ ගොල්ලන් සාමාන්‍ය දේවල් එවන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ කාරණය මතක තියා ගන්න ඕනෑ. ඉන්දු - ලංකා ගිවිසුම සම්බන්ධයෙන් අපේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමායි, රජිව් ගාන්ධි අගමැතිතුමායි අතර ලියුම් හුවමාරුවක් තිබුණා.

ඒකේ අපි කියලා තිබෙනවා, "Trincomalee or any other ports in Sri Lanka will not be made available for military use by any country in a manner prejudicial to India's interests" කියලා. ඊට පස්සේ අපි තීරණය කළා, අපි කාටවත් අපේ වරාය දෙන්නේ නැහැ කියලා. චීනයට දෙන්නේත් නැහැ, ඇමෙරිකාවට දෙන්නේත් නැහැ, එංගලන්තයට දෙන්නේත් නැහැ. ඕනෑ නම් එන්න කියනවා. මේ අනුව තමයි අපි වැඩ කටයුතු කරගෙන යන්නේ.

මේ ගරු සභාවේ අපේ මිත්‍ර මන්ත්‍රීතුමන්ලා එහෙම කියනවා. සුනාමියෙන් පස්සේ ඇමෙරිකාව ඇවිල්ලා ගොඩනැඟිලි හැදුවේ මුහුදෙන් වෙරළට ඇවිල්ලා ලංකාව අල්ලාගන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඇමෙරිකන් හමුදාව කියන්නේ, මාළු අල්ලන බෝට්ටුවල නැඟලා වෙරළට එන උදවිය නොවෙයි. ඇත්ත වශයෙන්ම ඒ ගොල්ලන්ට මෙවාට වුවමනාවක් නැහැ. ඒ ගොල්ලන්ගේ ප්‍රධාන කඳවුරු තිබෙන්නේ, ජපානයේ ඔකිනාවා, දකුණු කොරියාව, හවායි, දියාගෝ ගාෂියාවල. ඒ ගොල්ලන්ගේ ගුවන් හමුදාවට ප්‍රහාරක යානා දහසක් තිබෙනවා. ලෝකයේ හතරවැනි විශාල හමුදාව. ප්‍රධාන ගුවන් හමුදාව ඇමෙරිකන් ගුවන් හමුදාව. දෙවැනි එක, රුසියන් ගුවන් හමුදාව. ඊට පස්සේ චීන ගුවන් හමුදාව. ඊට පස්සේ ඇමෙරිකාවේ නාවික හමුදාව. රොනල්ඩ් රීගන් වාගේ නැවක් ආවොත් ප්‍රහාරක ගුවන් යානා 90ක් ගෙනෙනවා. ලංකාවේ කොහේද එක තැනක ප්‍රහාරක ගුවන් යානා 90ක් දමන්නේ? මම අහන්නේ, මේ අවසරය දුන්නත් මේවා මේ රටට ඇවිල්ලා කොහේද දමන්නේ? මුහුදේ නේ මේවා තියාගන්න ඕනෑ. මේ රටට ගෙනෙන්න බැහැ. ඒ වාගේම නැව් 9ක් තිබෙනවා. ඒ ගොල්ලෝ එතැනින් තමයි හමුදාවේ අය, marine කණ්ඩායමේ අය ගෙනැල්ලා එක එක රටවල් ආක්‍රමණය කරන්න කටයුතු කරන්නේ. ඒ අය බෝට්ටුවෙන් එන්නේ නැහැ. දැන් එන්නේ හෙලිකොප්ටර්වලින්. Osprey helicopter එකක බල ඇණි 33ක් ගෙනෙන්න පුළුවන්. ඒ වාගේම, transport docksවලින් තව 11ක් සමඟ එකතුව 44ක් ගෙනෙන්න පුළුවන්.

ඒ ගොල්ලෝ යුද්ධ කරන්නේ අලුත් විධියකට. අපි හිතන්නේ, ඒ ගොල්ලෝ පෘතුගීසිකාරයන් වාගේ බෝට්ටුවක නැඟලා ඇවිල්ලා, ඊට පස්සේ පාන් ඉල්ලනවා කියලායි. එහෙම කාලයකද අපි ඉන්නේ? ඇත්ත වශයෙන්ම අද ඒ අයට වුවමනා නැහැ. අපටත් වුවමනා නැහැ. අද අපි බලන්නේ ඉන්දියන් සාගරයේ නාවුක ගමනාගමනය ආරක්ෂා කරන්නයි. එතකොට අපට බැහැ, කඳවුරු දෙන්න. එදා කිව්වා, අපි චීනයට කඳවුරු දුන්නා කියලා. අද කියනවා, අපි ඇමෙරිකාවට කඳවුරු දෙනවා කියලා. මේ ගැන දැකපු, කථා කරන විශේෂඥයෝ බොහෝදෙනෙක් ඉන්නවා. තෙල් බෙහෙත්කාරයෝ ඇවිල්ලා මේ පිළිබඳව ඕනෑ තරම් කථා කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තෙල් ඕනෑ නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ තෙල් නොවෙයි. තෙල් බෙහෙත් ගෙනැල්ලා මොනවා විකුණනවාද කියලා මා දන්නේ නැහැ.

ඊළඟට, Millennium Challenge Corporation Compact එක ගැන අහලා තිබුණා. ඇත්ත වශයෙන්ම ඒක ලංකාවයි, ඇමෙරිකාවයි අතර ආධාර ලබාගැනීම සඳහා වන ගිවිසුමක් පමණයි. අපි ඉල්ලා තිබෙන ව්‍යාපෘති ගණනාවකට ඒ ගොල්ලෝ මුදල් දෙනවා. ප්‍රවාහන ව්‍යාපෘති සඳහා ඩොලර් මිලියන 350ක පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරි වසර විස්සේ ප්‍රාමාණික ආර්ථික ප්‍රතිලාභ අනුපාතය සියයට 19ක් වන අතර එමඟින් බස්නාහිර, මධ්‍යම, සබරගමුව හා ඌව යන පළාත්වල නගර බද හා පළාත් බද ප්‍රවාහනය, යටිතල පහසුකම් හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වෙනවා. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් මා වාගේ කොළඹ සිට පැමිණෙන නිසා මේ ප්‍රවාහනය දියුණු කිරීම සම්බන්ධයෙන් එතුමා විරුද්ධද කියා අහන්න මා කැමැතියි.

ඊළඟට, ඉඩම් ව්‍යාපෘතිය ගැන කියන්න ඕනෑ. ඉඩම් ව්‍යාපෘතිය අපිම ඉල්ලුවා.

ඉඩම් ව්‍යාපෘතියට ක්‍රියාකාරකම් පහක් තිබෙනවා. රජයේ ඉඩම් ලේඛනගත කිරීම, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ධාරිතාව වැඩිදියුණු කිරීම, ඉඩම් වාර්තා ඩිජිටල්ගත කිරීම, දේපළ ඔප්පු හිමිකම් සහතික බවට පරිවර්තනය කිරීම, ඉඩම් ප්‍රතිපත්ති ලේකම් කාර්යාලය.

ඒ යටතේ තිබෙන්නේ ඒ ටික විතරයි. ඒ අය ඉල්ලා තිබෙනවා, ඒ ගොල්ලන්ගේ නීතිය අනුව, මේක පාර්ලිමේන්තුවෙන් අනුමත කරන්න ඕනෑය කියලා. අනුමත කරලා පනත් කෙටුම්පතක් සම්මත කරනවා, ඇමෙරිකාව වාගේ. ඒත් අපේ පාර්ලිමේන්තුව කියනවා නම් "ඒක වුවමනා නැහැ. ආණ්ඩුව විතරක් අත්සන් කරන්න" කියලා, මම ඇමෙරිකාවට ගිහිල්ලා කියන්නම්, "ඒ කොටස අයින් කරන්න. පාර්ලිමේන්තුවට එවන්න එපා. පාර්ලිමේන්තුවේ අනුමැතිය වුවමනා නැහැ. අපට දෙන්න එපා. ඔයගොල්ලන් අත්සන් කරලා කරන්න" කියලා. ඒක ඒ ගොල්ලන් ඉල්ලනවා නම් මට ප්‍රශ්නයක් නැහැ. මම ගිහිල්ලා කියන්නම්. අපිත් බැලුවේ මේ ගැන Sectoral Oversight Committee එකට දාලා ටිකෙන් ටික පාර්ලිමේන්තුවේ බලතල වැඩි කරන්නයි. රටවල් ගණනාවක මෙහෙම ගිවිසුම් ක්‍රියාත්මක වනවා. ණය ගන්න, ආධාර ලබා ගන්න, ආධාර දෙන්න මෙහෙම ගිවිසුම්වලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්න ඕනෑකම තිබෙනවා. අපි ඒ ක්‍රමවේදයට යනවාද, ඒක අත හරිනවාද කියලා තමයි විශේෂයෙන් තීරණය කරන්න තිබෙන්නේ. මම දන්නා හැටියට ACSA ගිවිසුමයි, මේකයි අතර වෙනසක් නැහැ. මම ඒක සංසන්දනය කරලා පාර්ලිමේන්තුවට ලබා දෙන්නම්. SOFA ගිවිසුමක් අපි අත්සන් කරලා නැහැ. අපටත් ඒ ගැන ප්‍රශ්න තිබෙනවා. Millennium Challenge Corporation agreement එක කියන්නේ ඇත්ත වශයෙන්ම ආධාර ලබා ගන්න තිබෙන එකක් විතරයි කියන එකත් මම කියන්න කැමැතියි. ඒක කැබිනට් මණ්ඩලයේ සම්මත වුණාට පස්සේ අපි පාර්ලිමේන්තුවට එවන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න පෙර මම ගරු අගමැතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, ACSA ගිවිසුමේ තිබෙන ඇමුණුම් සංඛ්‍යාවත් ඔබතුමා ඉදිරිපත් කරන්න ලෑස්තිද කියලා. මොකද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිවිසුමක හානිකර තත්ත්වය මනින්නේ පිටු ගණනින් නොවෙයි. පිටු හතක ගිවිසුම හානිකර වැඩියි, පිටු පහක ගිවිසුම හානිකර අඩුයි කියලා පිටු ගණනින් හොඳද, නරකද කියලා මනින නිර්ණායකයක් නැහැ. හොඳද, නරකද කියලා මනින නිර්ණායකය තමයි ඒ පිටුවල

[ගරු අනුර දිසානායක මහතා]

තිබෙන අඩංගුව. "ගෝඨාභය රාජපක්ෂ 2007දී පිටු හතක ගිවිසුමක් අත්සන් කළා. අපි අත්සන් කළේ පිටු පහක ගිවිසුමක්. ඒ නිසා පිටු හතක ගිවිසුම භයානකයි, පිටු පහක ගිවිසුම භයානක නැහැ" කියනවා වාගේ තර්ක වැරදියි. අපි එය මතින්න ඕනෑකම තිබෙන්නේ, ඒ ගිවිසුමේ අන්තර්ගතයෙන්. එය පිටු භාගයකද තිබෙන්නේ, වගන්තියකද තිබෙන්නේ, පිටුවකද තිබෙන්නේ කියන එක මත නොවෙයි ඒ වැදගත්කම තිබෙන්නේ එහි හරය කුමක්ද කියන එක මත. ඒ නිසා 2007 එකත් වැරදියි, 2017 එකත් වැරදියි. පිටු හතේ එකත් වැරදියි, පිටු පහේ එකත් වැරදියි.

මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට අහන්නේ පිටු පහේ 2017දී නැවත සංශෝධනය කර අත්සන් කරන ලද ගිවිසුමට අදාළ ඇමුණුම් ටිකත් ඇතුළත් කරලාද සභාගත කර තිබෙන්නේ කියන ප්‍රශ්නය.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ වෙනස්කම් ඔක්කෝම ඇතුළත් කරලා මම සභාවට භාර දෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ඔබතුමා කිව්වා, අත්සන් කරන ලද ගිවිසුම සභාගත කරනවා කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒකේ ඇමුණුම් තිබෙනවාද කියලා මා දැනගන්න කැමතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම ඒවා වෙන් කරලා දෙන්නම්. ඔබතුමා නොවෙයි ප්‍රශ්නය ඇහුවේ. බන්දුල ගුණවර්ධන මැතිතුමා තමයි ඔය ප්‍රශ්නය ඇහුවේ. මම ඒ ඇමුණුම් දෙන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමුණුම් ටික දැන් තිබෙනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇමුණුම් එක්ක තමයි මම කථා කළේ. මා හොඳ උදාහරණයක් දෙන්නම්. මම ඒවා ලියලා තිබෙනවා. ඒවා clear නැහැ, දෙන්න. මම ඔක්කොම සකස් කරලා දෙන්නම්. මෙතැන වැඩියෙන් තිබෙන්නේ points of contact පිළිබඳ, කවුරු කවුරුද සම්බන්ධය තබා ගන්නේ කියන එක. ලංකාව පැත්තෙන් පළමුවැනි එකේ, Army Headquarters-Army Headquarters, MGO, Air Force Headquarters-Air Force Headquarters, Naval Headquarters-Naval Headquarters කියලා අපි දාලා තිබෙනවා. එහෙත් 2017 එකේදී ඇත්ත වශයෙන්ම අපි ඒක මධ්‍යගත කරලා කියනවා. ඒ ටික ඉවත් කරලා, විශේෂයෙන්ම Annexure B එකෙන් අපි කියන්නේ, Secretary, Ministry of Defence, Additional Secretary, Ministry of Defence, Military Liaison Officer කියන තුන් දෙනා ගැන. අපි හමුදා තුනේ මූලස්ථාන වෙනුවට ආරක්ෂක අමාත්‍යාංශය එකක් විධියට අරගෙන තිබෙනවා. ඇමෙරිකාව අනික් පැත්තෙන් අණ දෙන මූලස්ථාන ගණන වැඩි කරලා තිබෙනවා. ඒකයි වැඩියෙන් තිබෙන්නේ. මට ප්‍රශ්නයක් නැහැ, මම ඔය දෙකම ලකුණු කරලා, මේ ගරු සභාවට ලබා දෙන්නම්. මෙකේ හංගන්න දෙයක් නැහැ. ඒ නිසා භය වෙන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. මම clear පිටපත් අරගෙන දෙන්නම්. මේ ලේඛනවල මම mark කරලා තිබෙන්නේ. මම clear ඒවා අරගෙන දෙන්නම්. මම ගෙනාවේ මගේ ඕනෑකමට mark කරපු ඒවා. එච්චරයි, ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. මේ ඔක්කොම ඔබතුමාට දෙන්නම්. ඒ හැම එකක්ම බලන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විමසා සිටියේ ඒ තරම් කලබල වෙන්න දෙයක් නොවෙයි. එතුමා පිළිතුරේදී නිශ්චිත ලෙස කිව්වා, ගිවිසුම සභාගත කරන බව. මම එතුමාගෙන් නිශ්චිත ලෙස ඇහුවේ, "ඒ ගිවිසුමේ ඇමුණුම් ටික තිබෙනවාද නැද්ද?" කියලායි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම සභාගත කරන්නේ ඒ ගිවිසුමේ ඇමුණුම් සමහයි; ඒවා නැතිව නොවෙයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇත්තටම හොඳයි, හොඳයි. තිබෙනවා නම් හොඳයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේ ඇමුණුම දෙන්න බැහැ. මේ ඇමුණුමේ මගේ notes දාලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳ බබෙක්. ඔක්කොම සම්පූර්ණ කරලා ඉදිරිපත් කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමාට මා ඒ ලේඛන ගෙනැත් දෙන්නම්, කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යවරයා විසින් දීපු පිළිතුර අනුව 1995 මැයි මාසයේ 16 වැනි දා, මෙතෙක් අත්සන් කරලා තිබෙන, ගිවිසුම සභාගත කළා. ඊළඟට අපි අසමින් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය වන්නේ දැනට අත්සන් කිරීමට නියමිත ගිවිසුමේ තිබෙන කොන්දේසි පිළිබඳවයි. ඒවා තමයි මගේ ප්‍රශ්නයේ අඩංගු වෙලා තිබෙන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අත්සන් කරන්න නියමිත ගිවිසුමක් නැහැ. ඒ අය කෙටුම්පතක් දුන්නා. අපි එකඟ වන ඒවායි, අපි එකඟ නොවන ඒවායි දැනුම් දීලා තිබෙනවා. ඒ ගැන තවදුරටත් සාකච්ඡා කරනවා. දැනට අත්සන් කරන්න මොකුත් නැහැ. ඊළඟ මාස කීපයේ අත්සන් කරන්න එකක් තියේවි කියලා මට පෙනෙන්නේත් නැහැ. ඒ ගොල්ලන් එක්ක කථා කරන්න තිබෙනවා. අපට එකඟ වෙන්න පුළුවන් නම් විතරයි අත්සන් කරන්නේ. ඒ නිසා ඒ වෙලාවට අපි ඒ ගැන කියන්නම්. දැනට මොකුත් නැහැ. දැනට තිබෙන්නේ 1995 ගිවිසුම විතරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ අවසාන කාරණය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දැන් මගේ mike එකේ switch එක on කරන්න. ඒ mike එකේ switch එක off කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාගේ mike එකේ switch එක on කරලා තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එතකොට හරිනේ. නැත්නම් මොකක් හරි වචනයක් ඇහෙනකොට ඒ වචනය අල්ලාගෙන මොනවා හරි කියන්න පටන් ගන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා ප්‍රශ්නය අහලා අවසාන කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ නේ. දැන් ඒ mike එකේ switch එක off නේද? මම ප්‍රශ්නය අහලා ඉවර වෙනකම් පොඩ්ඩක් ඉන්න කියන්න. Mike එක නැතුව නිකම් කිව්වාට කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1995 මැයි මාසයේ 16වැනි දා අත්සන් කරන ලද ගිවිසුම එතුමා ඉදිරිපත් කළා. අපේ ප්‍රශ්නය තිබෙන්නේ, දැනට සාකච්ඡා වෙමින් පවතින ගිවිසුම පිළිබඳවයි. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා මැයි මාසයේ 15, 16 සහ 17 කියන තෙදින තුළ ඇමෙරිකා එක්සත් ජනපදයට ගොස් මේ ගිවිසුම පිළිබඳ සාකච්ඡාවලට සහභාගි වුණා. මේ ගරු සභාවේ විදේශ කටයුතු ඇමතිතුමා ඉන්නවා. ඒ වාගේම, දැනට ඇමෙරිකා එක්සත් ජනපදය විසින් තමන්ගේ ගිවිසුමට ඇතුළත් කළ යුතුයි කියන යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනා පිළිබඳව තමයි විදේශ කටයුතු අමාත්‍යාංශය සාකච්ඡා කරමින් තිබෙන්නේ. මම ඔබතුමාගෙන් නිශ්චිත ලෙස අහලා තිබෙන්නේ මෙයයි. ඔබතුමාට කියන්න තිබෙන්නේ මෙච්චරයි. මම ඔබතුමාගෙන් ප්‍රශ්න 6ක් අහලා තිබෙනවා. මේ ප්‍රශ්න හයෙන්ම අහලා තිබෙන්නේ ගිවිසුමේ අඩංගු වන දේවල් පිළිබඳවයි. එතකොට ඔබතුමා කියන්න ඕනෑ, "හරි, ඒවා ඇමෙරිකා එක්සත් ජනපදයෙන් යෝජනා ලෙස ඇවිල්ලා තිබෙනවා. නමුත්, අපි ඒවා ප්‍රතික්ෂේප කරනවා" කියලා. මට කියන්න, මේ යෝජනා 6න් තමුන්නාන්සේලා දැනට එකඟ වෙන්න සූදානම් වෙමින් තිබෙන යෝජනා කවරේද, ප්‍රතික්ෂේප කරන යෝජනා කවරේද කියලා. එසේ නැතිව, "අපිත් මේවා ප්‍රතික්ෂේප කරමින් ඉන්නේ. අපිත් සාකච්ඡා කරමින් ඉන්නේ" කියන්නේ නැතිව,-[බාධා කිරීමක්]- නැහැ, mike එක දීලා නැහැ.

මේ කරුණු හයෙන් ඔබතුමන්ලා ප්‍රතික්ෂේප කරන කරුණු මොනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

සාකච්ඡා කරන්නේ මම නොවෙයි, අදාළ අමාත්‍යාංශවලින්. මේ ඇමතිතුමා ඇමෙරිකාවට ගියේ SOFA ගැන කථා කරන්න නොවෙයි. Partnership Dialogue එක ගැන කථා කරන්න. -[බාධා කිරීමක්]- මට අවස්ථාව දෙන්න කියන්න. එතැනදී මේ ගැන ඇහුවාම කිව්වා, මේකේ ප්‍රශ්න තිබෙනවා, ප්‍රශ්න තිබෙන නිසා තවම ඒකට එකඟ වෙන්න බැහැ කියලා. ඒ ඔක්කෝම තොරතුරු මා ළඟ නැහැ. උසාවියේ බලතල ගැන අපට ප්‍රශ්නයක් තිබෙන බව මම දන්නවා. ඔව්. අන්න එහෙම කාරණා කීපයක් තිබෙනවා. මට ආපු විශේෂ කරුණක් තමයි උසාවියේ බලතල ගැන. ඒක ඇහුවාම අපිත් කිව්වේ ඒ අනුවයි. මෙහෙම ප්‍රශ්න කීපයක් තිබෙනවා. ඇමතිතුමා ගිහින් රිය පැදවීම ගැන අහලා තිබෙනවා. ඒවා ඔය තිබෙන සමහර කාරණාවලින් එකක්. ගුවන්විදුලි සම්බන්ධව ගත්තොත්, කොහොමටත් දැන් ඒක දීලා තිබෙනවා. ඒක අලුත් එකක් නොවෙයි. ඒ නිසා අපි සාකච්ඡා කරලා එකඟත්වයට එන්න පුළුවන් නම් අත්සන් කරනවා. අපේ ස්වෛරීභාවයයි,- ඇමෙරිකාවේත් Status Of Forces Agreement කියලා එක වර්ගයක් නැහැ, වර්ග ගණනාවක් තිබෙනවා. ඒ නිසා අපිත් බලන්නේ රටවල්වල ස්වාධිපත්‍යය ආරක්ෂා වන විධියට කටයුතු කරන්නයි. මොංගෝලියාවේ තිබෙන එක නොවෙයි, ඇත්ත වශයෙන්ම යුරෝපයේ තිබෙන්නේ. යුරෝපයේ තිබෙන එක නොවෙයි මැලේසියාවේ තිබෙන්නේ. ඒවා දිහා බලලා, අපට වාසිදායක වන විධියට තමයි අපිත් වැඩ කටයුතු කරන්නේ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඇමතිතුමා ගිහිල්ලා හම්බ වෙලා කථා කළේ, සියලු ගිවිසුම් ගැන අද තිබෙන තත්ත්වයයි. අපට එකඟ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

වෙන්න පුළුවන් මොනවටද, එකඟ වෙන්න බැරි මොනවටද කියන ටික විතරයි කථා කළේ. Partnership Dialogue කියන්නේ සාමාන්‍යයෙන් අපි වර්ෂ දෙකකට සැරයක් කරන දෙයක්. එය ඉස්සරත් කළා; දැනුත් කරනවා. ඒක අලුත් දෙයක් නොවෙයි. ඒක කරගෙන යන වැඩ කටයුත්තක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟ ප්‍රශ්නය, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி! கௌரவ பிரதமர் அவர்களளிடம் நான் பின்வரும் வினாக்களை விடுக்க விரும்புகின்றேன்:

1. வடக்கில், குறிப்பாக வன்னி மாவட்டத்தில், யுத்தம் முடிவடைந்து மீள்குடியேற்றப்பட்ட பல்லாயிரக் கணக்கான குடும்பங்களுக்கு இதுவரையில் நிரந்தர வீடுகள் வழங்கப்படவில்லை என்பதனை கௌரவ பிரதம அமைச்சர் அவர்கள் அறிவாரா? இதற்கு எவ்வாறான நடவடிக்கைகளை மேற்கொள்ள முடியும் என்பதனை அவர் இச்சபைக்கு அறியத் தருவாரா?
2. மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களில் அரபு நாடுகளில் இருக்கின்ற தனிப்பட்ட செல்வந்தர்கள் இலங்கையில் சில அரசியல்வாதிகள்மூலம் முஸ்லிம் கிராமங்களை உருவாக்குகின்ற நடவடிக்கையினை மேற்கொள்கின்றார்கள் என்பதையும், அக்கிராமங்களில் பல காலங்களாகியும் மக்கள் குடியேறாமல் பல வீடுகள் இருக்கின்றன என்பதையும் கௌரவ பிரதம அமைச்சர் அவர்கள் அறிவாரா? குறிப்பாக, மன்னார் மாவட்டத்தில் மறிச்சுக்கட்டியில் 600 வீடுகள், தாராபுரம் துருக்கி சிற்றியில் 300 வீடுகள் மற்றும் 2ஆம் கட்டை சைட் சிற்றியில் 250 வீடுகள் என, மக்கள் குடியேறாதுள்ள வீடுகள் தொடர்பில் கௌரவ பிரதம அமைச்சர் அவர்கள் என்ன நடவடிக்கை மேற்கொள்ளப்போகின்றார்?
3. அரபு நாடுகளில் இருக்கின்ற தனிப்பட்ட செல்வந் தர்கள் இலங்கையில் முஸ்லிம் கிராமங்களை அமைக்க முயற்சிகள் எடுக்கின்றபோது, அரசாங்கத்தால் கடைப் பிடிக்கப்படவேண்டிய நடைமுறைகள் யாவை?

குறித்த நபர் உலகப் பயங்கரவாத அமைப்புக்களுடன் தொடர்புபட்டவரா என்பதை அறிய, தேசிய புலனாய்வுமூலம் அவர் தொடர்பில் அறிக்கை பெறப்பட்டதா? இலங்கையில் 2009ஆம் ஆண்டு யுத்தம் முடிவடைந்ததற்குப் பிற்பாடு, அரபு நாடுகளில் இருக்கின்ற தனிப்பட்டவர்களின் உதவிமூலம் எந்தெந்த மாவட்டத்தில் எவ்வளவு வீட்டுத் திட்டம் மற்றும் முஸ்லிம் பள்ளிவாசல்கள் அமைக்கப்பட்டிருக்கின்றன என்ப தையும், எதிர்காலத்தில் இவர்களுக்கு இவ்வாறான நடவடிக்கைகளை மேற்கொள்ள அனுமதி வழங்கப்படுமா என்ற விபரங்களையும் கௌரவ பிரதமர் அவர்கள் இச் சபைக்கு அறியத் தருவாரா?

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, மாவட்டச் செயலாளரினதோ அல்லது பிரதேச செயலாளரினதோ எந்தவிதத் தலையீடும் இல்லாமல்தான் இந்தக் குடியேற்றங்கள் நடைபெறுகின்றனவா? என்பதையும் நான் உங்களிடம் தெரிந்துகொள்ள விரும்புகிறேன்.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

යුද්ධය නිමවීමෙන් පසුව උතුරු පළාත සංවර්ධනය කිරීම සඳහා විශේෂිත වැඩසටහන් ගණනාවක් ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයත්, ඊට පෙර තිබුණු ඒ විෂය භාර අමාත්‍යාංශ විසිනුත් දියත් කරනු ලැබූ බව ඔබ සැවොම දන්නවා. ඒ යටතේ විශේෂයෙන්ම යුද්ධයෙන් සිය නිවාස අහිමිවූවන් වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා 2015 වසරේ සිට මේ දක්වා රුපියල් මිලියන 24,000ක මුදලක් වැය කර තිබෙනවා. ඒ යටතේ උතුරු පළාතේ පදිංචි වන ජනතාව වෙනුවෙන් නිවාස 27,356ක් ඉදිකිරීමටත් අපි කටයුතු කළා. ඒ සියල්ලම සිදු කළේ යුද්ධයෙන් අනතුරුව නැවත පදිංචි වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීමේ අරමුණින්. ඒ වාගේම අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ස්ථිර නිවාස ලබා දීම සඳහා මෙන්ම ඉන්දියන් රජය විසින් නැවත පදිංචි කිරීමේ කටයුතු වෙනුවෙන් සපයන ලද ආධාර යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. මීට අමතරව නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස ව්‍යාපෘති යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් 2016 වර්ෂයේ සිට නිවාස 9,479ක් සඳහා රුපියල් මිලියන 1,490ක මුදලක් වැය කර තිබෙනවා. එලෙස ක්‍රියාත්මක වන වැඩසටහන් සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් මම ලබා දෙන්නම්.

විදේශීය දානපතියකුට හෝ පෞද්ගලික ආයතනයකට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හරහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් සිය මූල්‍ය දායකත්වය ලබා දෙන්නට පුළුවන්. ඒ වාගේම නිවාස ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් අදාළ රජයේ ආයතන විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල සම්මත නීති, රෙගුලාසි අනුගමනය කරමින් නිවාස ඉදිකිරීමට පරිත්‍යාග කිරීමට බාධාවක් නැහැ.

ඇත්ත වශයෙන්ම යුද්ධයෙන් පස්සේ උතුරු-නැඟෙනහිර නිවාස ඉදි කරන්න කියලා රජයෙන් පමණක් නෙවෙයි, ලංකාවේ තිබෙන පෞද්ගලික ආයතන සහ සංවිධාන ගණනාවක් - Lions Club එක වැනි සංවිධාන ගණනාවක් - මුදල් ලබා දුන්නා. විදේශ රටවල ආයතනත් දායකත්වය ලබා දීලා තිබෙනවා.

මේ නියෝග අනුව වැඩ කටයුතු කරනවා නම්, ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. පවතින නීති රාමුවට පිටතින් කටයුතු කිරීමට කිසිවෙකුට හැකියාවක් නැහැ. එහෙම එකක් වෙනවා නම්, ඒ ගැන සොයා බලා අවශ්‍ය පියවර ගන්න අපට පුළුවන්. එහෙත්, දැනට විදේශ මුදල්වලින් හෝ ලංකාවේ පෞද්ගලික මුදල්වලින් දියුණු කළ ආගමික සිද්ධස්ථාන ගණනාවක් තිබෙනවා. මුස්ලිම් විතරක් නොවෙයි, හින්දු, බෞද්ධ, ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථාන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වන සම්පූර්ණ ලැයිස්තුවක් නම් නැහැ. මොකද, එක එක මාර්ගවලින් ලබාගත් මුදල්වලින් දියුණු කර තිබෙන ආගමික සිද්ධස්ථාන විශාල සංඛ්‍යාවක් රට වටේම තිබෙනවා. මා දන්නා හැටියට ඒ විස්තර අදාළ අමාත්‍යාංශය සතුව නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you can ask your first Supplementary Question.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට පොඩ්ඩක් ඉන්න වෙනවා, ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්න ඉවර වෙනකල්.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මට අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන් නේද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්. අහන්න.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதமர் அவர்களே, ஏற்கெனவே அங்கு முஸ்லிம் கிராமங்கள் உருவாக்கப்பட்டிருக்கின்றன. அக்கிராமங்களிலுள்ள பல வீடுகளில் ஆட்கள் இல்லை. அவ்வாறு ஆட்கள் இல்லாத, குடும்பங்கள் குடியேறாத வீடுகள் தொடர்பில் நீங்கள் என்ன நடவடிக்கை எடுக்கப்போகின்றீர்கள் என்பதைத்தான் நான் உங்களிடத்தில் கேட்டிருந்தேன். அதில் ஒரு சில அரசியல்வாதிகளுடைய பங்களிப்பு இருக்கின்றது. இதனால், அந்தக் கிராமங்களிலுள்ள பல வீடுகள் அரசியல் காரணங்களுக்காக வழங்கப்படாமல் இருக்கின்றன. பிரதேச செயலாளரோ மாவட்ட செயலகமோ இந்த வீடுகளை வீடு இல்லாதவர்களுக்கு வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வில்லை. ஆட்கள் குடியேறாத அந்த வீடுகளை வீடுகள் இல்லாத முஸ்லிம் குடும்பங்களுக்கு வழங்கவேண்டும் அல்லது அந்த வீடுகள் தொடர்பில் நீங்கள் எடுக்கவுள்ள நடவடிக்கை என்ன என்பதைத்தான் நான் உங்களிடத்தில் கேட்டிருந்தேன். அதற்கு நீங்கள் சரியான பதிலைத் தரவில்லை. ஆட்கள் இல்லாத வீடுகள் தொடர்பில் நீங்கள் எடுக்கக்கூடிய நடவடிக்கை என்ன என்பதைத்தான் நான் உங்களிடம் கேட்கின்றேன்.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
සමහර තැන්වල නිවාස ඉදි කරලා තිබෙනවා. නමුත්, යටිතල පහසුකම් ලබා දීලා නැහැ. වෙනත් හේතු තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. ඒ ගැන අපට බලන්න වෙයි. එහෙත් එම නිවාස පුද්ගලයන්ට භාර දී තිබෙනවා නම්, එම නිවාසවල අයිතිය තිබෙන්නේ එම පුද්ගලයන්ටයි. ඒ අයිතිය ඉවත් කරන්න පුළුවන්ද කියලා මම දන්නේ නැහැ. එහෙම කළොත් නීත්‍යානුකූල ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. පෞද්ගලික නිවාස බෙදන අවස්ථාවේදී දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දෙන්න වුවමනාවක් නැහැ. රජයේ නිවාස දෙනකොට තමයි එහෙම කරන්නේ. වැඩි තොරතුරු තිබෙනවා නම්, මේ ගැන සොයා බලා වාර්තාවක් දෙන්න මට පුළුවන්. මේවා තමයි මට කියන්න පුළුවන් ප්‍රතිපත්ති ටික.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதம அமைச்சர் அவர்களே, தனியார் வீடுகளை வழங்குவதற்குப் பிரதேச செயலாளருடைய அனுமதியைப் பெறவேண்டிய தேவையில்லை என்று நீங்கள் ஏற்கெனவே கூறினீர்கள். ஆனால், அவர்களிடம் வீட்டுத்திட்டம் தேவையுடையவர்களின் பெயர் விபரங்கள் இருக்கின்றன. அப்படி இருக்கின்றபோது, யார், யாருக்கு அந்த வீடுகள் ஒப்படைக்கப் பட்டன என்ற விபரத்தைப் பிரதேச செயலாளரிடம் கொடுத்தால்தானே, அந்தப் பிரதேச செயலாளர் அவர்களுக்கு இன்னொரு வீட்டைக் கொடுக்காது இருக்கலாம். அரசாங்கத்தினால் ஒரு வீடும் அரபு நாடுகளில் இருக்கின்ற செல்வந்தர்களினால் தனிப்பட்ட ரீதியில் இன்னொரு வீடும் தற்பொழுது வழங்கப்பட்டுக் கொண்டிருக்கின்றது. அதைத்தான் நான் இங்கு கூறிக் கொண்டிருக்கிறேன். தங்களுடைய அரசியல் பலத்தைத் தக்கவைத்துக் கொள்வதற்காக குறிப்பிட்ட ஒரு சில அரசியல்வாதிகளின் தலையீட்டால்தான் இது நடைபெறுகிறது. உண்மையில், முஸ்லிம் மக்களில்கூட பலருக்கு இன்னும் வீடுகள் கிடைக்கவில்லை. அவர்கள் அரசியல் ரீதியாகப் பழிவாங்கப்பட்டுக் கொண்டிருக்கிறார்கள் என்பதை நான் இங்கு கூற விரும்புகின்றேன். ஆகவே, கௌரவ பிரதமர் அவர்களே, நீங்கள் நேரடியாக இந்த விடயத்தில் தலையிட வேண்டுமென்று நான் கேட்டுக்கொள்கிறேன்.

அத்துடன் இந்த நாட்டு மக்கள் எதிர்நோக்குகின்ற ஒரு பிரச்சினையை உங்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகிறேன். இலங்கை மின்சார சபைக்கும் இலங்கைப் பெற்றோலியக் கூட்டுத்தாபனத்துக்கும் இடையில் ஏற்பட்ட முரண்பாடு காரணமாகப் பல மாவட்டங்களில் மின் தடை ஏற்பட்டுக்கொண்டிருக்கின்றது. தற்பொழுது, அது தொடர்பில் சாதகமான பதில்கள் வருகின்றன. ஆனாலும், வன்னிப் பிரதேசத்தில் - மன்னார் மாவட்டத்தில் மாணவர்கள் படிக்கின்ற நேரங்களில் குறிப்பாக, பி.ப. 6.00 மணியிலிருந்து 9.00 மணிவரை மின்தடை ஏற்படக்கூடிய வாய்ப்புகள் இருப்பதாக அங்கிருக்கின்ற அதிகாரிகள் கூறுகிறார்கள். இன்னும் 3 வாரங்களில் க.பொ.த. உயர் தரப் பரீட்சை நடைபெறவிருக்கின்றது. அதேபோல், இன்னும் 4 மாதங்களில் GCE (O/L) பரீட்சை நடைபெறவிருக்கின்றது. பரீட்சைக்குப் படிக்கின்ற மாணவர்களுடைய நலனைக் கருத்திற்கொண்டு, மின்தடையை ஏற்படுத்தாமல் நாட்டு மக்களுக்கு 24 மணித்தியாலங்களும் மின்சாரத்தை வழங்கவேண்டிய பொறுப்பு நாட்டினுடைய பிரதமருக்கு இருக்கின்றது. ஆகவே, இதுதொடர்பில் நடவடிக்கை எடுக்கவேண்டுமெனக் கேட்டுக் கொள்கிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ඔබතුමාගේ මුල් ප්‍රශ්නයෙන් මේවා ගැන අහලා නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නයෙන් නිශ්චිත කාරණයක් අහලා තිබෙනවා. නමුත්, විදුලි බලය ගැන මෙතුමාගෙන් අහලා නැහැ. ගරු අගමැතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් උත්තරයක් දෙනවාද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

I will direct the Hon. Minister of Power, Energy and Business Development to answer that Question.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට අවස්ථාව දුන්නා. ප්‍රශ්නය අහන්න අවස්ථාව දුන් වෙලාවේ ඔබතුමා සභාවේ නොසිටි නිසා, ඔබතුමාගේ ප්‍රශ්නයයි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයයි දෙකම එකතු කරලා තමයි පිළිතුරු දුන්නේ. එක් පැහැදිලි කිරීමක් සඳහා පමණක් අවස්ථාව දෙන්නම්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

අතුරු ප්‍රශ්න දෙක සඳහා විතරක් අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එක පැහැදිලි කිරීමක් සඳහා පමණක් අවස්ථාව දෙන්නම්.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

අතුරු ප්‍රශ්න දෙක ඇසීම සඳහා පමණක් අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාට අතුරු ප්‍රශ්නයක් අහන්න විධියක් නැහැ. මොකද, එතුමා ඒ ප්‍රශ්න දෙකටම උත්තර දුන්නා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු අගමැතිතුමනි, මෙය ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් නිසා ලිච්ඡවි ක්‍රමයට ප්‍රශ්න දෙකකට විතරයි ඔබතුමාට උත්තර දෙන්න තිබෙන්නේ. [බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඒකට පිළිතුර දීලා අවසන් කළා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ඔබතුමා එහෙම- [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ජාතික වැදගත්කමක් තිබෙනවා නම්, කොහොම හරි නැඟිටලා මෙහේට එන්න තිබුණා. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟිටලා එන එක- [බාධා කිරීම්] අනෙක් හැම දවසකම වාගේ ආවා- [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔබතුමා ප්‍රමාද වෙලා ඇවිල්ලා මට කියනවා, පිළිතුරු දෙන්න කියලා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

පොඩි පොඩි අකරතැබ්බ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, අවශ්‍ය නම් ඔබතුමා එක් පැහැදිලි කිරීමක් කරවා ගන්න. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

"ලිච්ඡවි ක්‍රමය" කියලායි කියන්නේ. [බාධා කිරීම්] පාර්ලිමේන්තුවේ සිටින අයට වචනයක්වත් කතා කරන්න දෙන්නේ නැතිව රටට හොරෙන් ගිවිසුම් අත්සන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please!

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ජනාධිපතිට හොරෙන් ගිවිසුම් අත්සන් කරනවා. [බාධා කිරීම්] අහපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න- [බාධා කිරීම්] විනාඩියක් පරක්කු වුණාම, ඒකට උත්තරයක් දෙන්න බැරි තරම්- [බාධා කිරීම්] මෙහෙම පාර්ලිමේන්තුවක් කරගෙන යන්න පුළුවන් ද? මේක "උත්තරීතර ආයතනය" කියලා කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාට ප්‍රශ්නයක් අහන්න අවස්ථාව දුන්නා නම්, ඒ ප්‍රශ්නය අහන්න ඔබතුමා මෙතැන ඉන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ඔව්, එතුමාට පුළුවන් ඇමෙරිකානු නැවට යන්න. ගිහිල්ලා ඉවර වෙලා මේ රටට කියන්නේ නැතිව, ජනතාවට කියන්නේ නැතිව, ජනාධිපතිතුමාට කියන්නේ නැතිව- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ඒක මෙතැනට අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ මැතිවරණ ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය: පරීක්ෂණ කඩිනම් කිරීම
### கொடகவெல பிரதேச செயலக வளவில் தேர்தல் விளம்பர பலகையொன்று காட்சிப்படுத்தப்பட்டமை: விசாரணையைத் துரிதப்படுத்தல்
### DISPLAY OF ELECTION PROPAGANDA HOARDING AT GODAKAWELA DIVISIONAL SECRETARIAT PREMISES: EXPEDITION OF INVESTIGATION

40/'18

**1.** ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 ජනාධිපතිවරණ සමයේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ විශාල ප්‍රමාණයේ (අඩි 20x30) මැතිවරණ ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණය මෙතෙක් අවසන් නොවීමට හේතු කවරේද;

(ii) මෙම පරීක්ෂණ කඩිනම් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) රාජ්‍ය ආයතන තුළ මැතිවරණ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම වැනි දූෂණ ක්‍රියාවන් සම්බන්ධයෙන් පරීක්ෂණ ඉදිරියේදීත් මන්දගාමීව සිදු වීම වළක්වාලීමට ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2015 சனாதிபதி தேர்தல் காலத்தில் கொடகவெல பிரதேச செயலக வளவில் பாரியளவிலான (20 x 30 அடி) தேர்தல் விளம்பர பலகையொன்று காட்சிப் படுத்தப் பட்டமை தொடர்பில் மேற்கொள்ளப்பட்ட விசாரணைகள் இதுவரை நிறைவு செய்யப் படாமைக்கான காரணம் யாது என்பதையும்;

(ii) இந்த விசாரணையை துரிதப்படுத்த மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) அரச நிறுவனங்களுக்குள் தேர்தல் விளம்பர பலகைகளை காட்சிப்படுத்தல் போன்ற ஊழல் நடவடிக்கைகள் தொடர்பிலான விசாரணைகள் எதிர்காலத்தில் மந்தகதியில் நடைபெறுவதைத் தடுப்பதற்கு மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the reason for not having completed yet the investigation into the display of an election propaganda hoarding (20x30 feet) in the premises of the Godakawela Divisional Secretariat during the period of the Presidential Election 2015;

(ii) the action that will be taken to expedite this investigation; and

(iii) the action that will be taken against the sluggish manner that such investigations into the acts of corruption such as the display of election propaganda hoardings in public institutions are carried out?

(b) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පරීක්ෂණයක් එම කාලය තුළ සිදු කර ඇත.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන්-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මොකක්ද, point of Order එක?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මේ විධියට නම් ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ හැසිරෙන්නේ- [බාධා කිරීම්] විනාඩි ගණනක ප්‍රමාදයක් නිසා ප්‍රශ්නයක් අහන්න දෙන්නේ නැත්නම්- [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම ඒක පිළිගන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
පාර්ලිමේන්තුව නොමඟ යවලා, පාර්ලිමේන්තුවට අසත්‍ය අය වැය ලේඛන ඉදිරිපත් කරලා, මේ රටේ ජනතාව පාවා දීලා, ජනාධිපතිට කියන්නේ නැතිව, රටට කියන්නේ නැතිව ඒකාධිපති විධියට [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ප්‍රසාද් කාරියවසම්ලා, මංගල සමරවීරලා කරන මේ දේශ ද්‍රෝහි පාවා දීමට විරුද්ධව අපි පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් සටන් කරනවා කියන එක කියනවා. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වජිර අබේවර්ධන අමාත්‍යතුමා, උත්තරය දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමා නොමැති වුව ද, ඒ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න කියලා ආරම්භයේ දීම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටියා.

මන්ත්‍රීතුමා ප්‍රමාද වී හෝ පැමිණ ප්‍රශ්නය ඇසුවාම, ගරු අගමැතිතුමා හා ආණ්ඩුව පිළිතුරු දෙන්නේ නැත්නම්, එම ප්‍රශ්නය යළිත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ අයිතිය ඇතිව අපේ විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමා මුලින්ම කථා කරනකොට කිව්වා, ඒ ප්‍රශ්න දෙකටම එතුමා පිළිතුරු දෙනවා කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මට ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කිසිම හේතුවක් නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉල්ලපු නිසා ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යටතේ ඒ ප්‍රශ්නයටත් පිළිතුරු දුන්නා. ආපහු අහන්න. මම අහන්නේ මේකයි. මෙය ඉතා වැදගත් නම්, මේ සභාවට අයිති නැති ප්‍රසාද් කාරියවසම් කියන පුද්ගලයෙක් රට පාවලා දෙනවා නම්, වෙලාවට මේ ප්‍රශ්නය අහන්න ආවේ නැත්තේ ඇයි? එච්චරයි මම අහන්නේ. මෙතැන ඉන්න එකම කාරියවසම්, අකිල විරාජ් කාරියවසම් විතරයි. වෙන කාරියවසම් කෙනෙක් ගැන මම දන්නේ නැහැ. ඒවා අහගෙන එන්න. ඒක අහගත්තොත් පිළිතුරු දෙන්නම්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමාත් ආවේ පරක්කු වෙලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි. බොහොම ස්තුතියි.

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

(අ) (i) එවැනි පරීක්ෂණයක් කලින් සිදු කරලා තිබෙනවා. එහි යම් ප්‍රමාද දෝෂයක් සිදු වී තිබෙනවා. ඒ ගැන ඉක්මනින් පියවර ගැනීමට -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සති අන්තයේ, සිකුරාදා දිනයේ විවාදයට ගැනීමට අපේ පාර්ශ්වයෙන්ම දීපු කල් තැබීමේ යෝජනාවක් තිබෙනවා. ඒ වෙනුවට, දැන් අගමැතිතුමා SOFA ගිවිසුම, ACSA ගිවිසුම ඒ ඔක්කොම සභාගත කරනවා කියලා පිටු ගණනත් කිව්වා. ඒ සභාගත කරන ලද ගිවිසුම් පිළිබඳ කල් තැබීමේ විවාදයක් අපට සිකුරාදාට ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක පක්ෂ නායක රැස්වීමේ දී ගත යුතු තීරණයක්, මෙතැනදී ගන්න තීරණයක් නොවෙයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා පක්ෂ නායක රැස්වීමක් කැඳවලා ඒ සඳහා අවස්ථාව දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේ දී අපට ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. හිතෙන හිතෙන වේලාවට නැඟිටලා විවාද ඉල්ලන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම ඒක පිළිගන්නවා.

Order, please! අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමනි පිළිතුර දෙන්න.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

(ii) එම පරීක්ෂණය සති දෙකක් ඇතුළත අවසන් කරලා වර්තාව සැපයීමට බලාපොරොත්තු වෙනවා.

(iii) ඒ සඳහා මන්දගාමීව කටයුතු කරන නිලධාරින්ට විරුද්ධව ක්‍රියා කිරීමට අපේක්ෂා කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාට මෙම ප්‍රශ්නය යොමු කළේ 2015 වර්ෂයේ වූ සිදුවීමක් සම්බන්ධවයි. 2015 වසරේ ජනාධිපතිවරණය වෙලාවේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ මහින්ද රාජපක්ෂ අපේක්ෂකතුමාගේ අඩි 10 x 20 cut-out එකක් ප්‍රදර්ශනය කළා. ඒක නීතිවිරෝධීයි. ප්‍රාදේශීය ලේකම්වරයාට ඒක කරන්න අයිතියක් නැහැ. එවකට හිටපු ප්‍රාදේශීය ලේකම්වරයාට විරුද්ධව පරීක්ෂණයක් කරන්න කියන ඉල්ලීම තමයි කළේ. නමුත්, මා දන්නා තරමින් අමාත්‍යාංශයෙන් මේ ගැන පරීක්ෂණයක් කළා. මේකට අදාළ ඡායාරූප පවා මම ඒ අදාළ ලේකම්වරයාට ඉදිරිපත් කළා. නමුත්, මේ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාර්යාල භූමියේ cut-out එකක් ගහගෙන සිටින ඒ ප්‍රාදේශීය ලේකම්වරයා මහජනයා වෙනුවෙන් ස්වාධීනව වැඩ කරන්නේ කොහොමද කියලා හිතාගන්න පුළුවන්. කොහොම වුණත්, මේ ලේකම්වරයා අද වෙනකොට පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරනවා. අමාත්‍යාංශයෙන් සිදු කළ පරීක්ෂණය පිළිබඳ සතුටු වෙන්න බැහැ ගරු ඇමතිතුමනි. මෙවැනි නිලධාරින් මහජනතාව වෙනුවෙන් දේශපාලන භේදයකින් තොරව වැඩ කරයි කියලා විශ්වාසයක් තියාගන්න බැහැ. ඒ නිසා මේ වෙනුවෙන් කඩිනම් පරීක්ෂණයක් සඳහා අවස්ථාවක් දෙන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
මෙයට අදාළව රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන ලිපි ගොනු ගෙන්වන්න මම තීරණය කරලා තිබෙනවා. ඒ අනුව දින 14ක් ඇතුළත මේ ප්‍රශ්නය අවසන් කිරීමට කටයුතු කරනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, දේශපාලන පක්ෂයක් නියෝජනය කරපු, එවකට මැතිවරණයේ යෙදුණු ජනාධිපතිවරයාගේ පින්තූර ගැන තමයි මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. හාලිඇල ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිල්ල තුළට ඔබතුමා දැන් ගියත් බලන්න පුළුවන්, එක්තරා දේශපාලන පක්ෂයක ලාංඡනය සහ ඒ නාමය තමයි ඒ මුළු building එකේම තිබෙන්නේ. මේ ගැන දිගින් දිගටම අපි කථා කළාට අවශ්‍ය කටයුතු වෙන්නේ නැහැ. මොන පක්ෂය ජයග්‍රහණය කළත්, ස්වාධීන ආයතනයක් ලෙස ප්‍රාදේශීය සභාවෙන් විය යුතු සේවය ස්වාධීන විය යුතුයි. ඒ නිසා තමයි ගරු මන්ත්‍රීතුමාත් ප්‍රශ්න කළේ මෙවැනි කටයුත්තක් වීම තුළ ඒ ස්වාධීනභාවය අහිමි වෙලා යනවා නේද කියලා.

ගරු ඇමතිතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ දේශපාලන පක්ෂයක ලාංඡනය ඒ මුළු building එකේම ගහලා තිබීම ගැන පළාත් පාලන ඇමතිවරයා හැටියට ඔබතුමාට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග මොනවාද? මේ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්න බව කිව්වා. මෙවැනි දෙයක් තිබෙනවාය කියන කාරණය මම දැන් තහවුරු කරනවා. ඔබතුමා මේ සම්බන්ධව ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම දැන ගන්න කැමතියි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ දැන්. ඒ ගැන ක්‍රියා කිරීම සඳහා මම පළාත් පාලන කොමසාරිස්තුමාට දැනුම් දෙන්නම්. ඒ ගැන අද මම ක්‍රියා කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 2 - 91/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සිටින අනධ්‍යයන සේවකයන්: උසස්වීම්
### ஊவா மாகாணக் கல்வி அமைச்சின்கீழ் கடமையாற்றும் கல்விசாரா ஊழியர்கள்: பதவியுயர்வு
### NON-ACADEMIC EMPLOYEES UNDER MINISTRY OF EDUCATION OF UVA PROVINCE: PROMOTIONS

148/'18

3. **ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන අනධ්‍යන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් දැනට දරන තනතුරු කවරේද;

(iii) මෙම සේවකයන් 06/2006 චක්‍රලේඛය මඟින් බඳවා ගත්තද, ඔවුන්ට නියමිත උසස්වීම් මේ දක්වා ලැබී නොමැති බව දන්නේද;

(iv) මෙම සේවකයන්ගේ ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) ஊவா மாகாண கல்வி அமைச்சின் கீழ் கடமையாற்றும் கல்விசாரா ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இவர்கள் தற்போது வகிக்கும் பதவிகள் யாவை என்பதையும்;

(iii) இந்த ஊழியர்கள் 06/2006 ஆம் இலக்க சுற்ற றிக்கையின்படி ஆட்சேர்ப்பு செய்யப்பட்டுள்ள போதிலும், இவர்களுக்கு உரியதான பதவி உயர்வுகள் இதுவரை கிடைக்கவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(iv) இந்த ஊழியர்களின் பிரச்சினைகளைத் தீர்ப் பதற்காக அமைச்சு எடுக்கவிருக்கும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the number of non-academic employees serving under the Ministry of Education of the Uva Province;

(ii) the positions held by them currently;

(iii) whether he is aware that these employees have not been granted due promotions even though they have been recruited under Circular 06/2006; and

(iv) the measures to be initiated by the Ministry to solve their problems ?

(b) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2,940කි.

(ii) ඔවුන් දැනට පහත තනතුරුවල සේවයේ නිරතව සිටී

- පාසල් කාර්ය සහායක
- පාසල් රසායනාගාර සේවක
- පාසල් පුස්තකාල සේවක
- පාසල් මුරකරු
- පාසල් කම්කරු

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හා ඊට පෙර චක්‍රලේඛවලින් බඳවා ගත් සේවකයන් සියලුදෙනා 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2011 වර්ෂයේදී අනුමත කරන ලද, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනධ්‍යන ප්‍රාථමික ශිල්පීය නොවන සේවයට අයත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය වී ඇත.

ඒ අනුව එම සේවකයන් අදාළ පරිපාටිය ප්‍රකාරව උසස්වීමට අදාළ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීම ඇතුළු සුදුසුකම් නියමිත කාලයේදී සම්පූර්ණ නොකිරීමේ හේතුව මත 2016 වර්ෂය වන තෙක් කිසිදු උසස්වීමක් ලබා නොමැති බව නිරීක්ෂණය විය.

එසේම, අදාළ පරිපාටිය ප්‍රකාරව අනධ්‍යයන සේවයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගද නියමිත පරිදි පවත්වා නොතිබූ බැවින්, මේ පිළිබඳව ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කර අදාළ කාල සීමාවට අයත් සේවකයන්ට පමණක් පෞද්ගලික වන සේ, ඔවුන්ගේ උසස්වීම් සඳහා අවශ්‍ය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූවා සේ සලකා, උසස්වීම් ක්‍රියාත්මක කිරීමට ලබා ගත් විශේෂ අනුමැතියක් මත 2006.01.01 දිනට පෙර බඳවා ගත් සේවකයන් සියලුදෙනා සඳහාම උසස්වීම් ලබාදී ඇති අතර, ඊට අදාළ හිඟ වැටුප් ද ගෙවා ඇත.

එසේම, 2006.01.01 දිනට පසු ලබාදී ඇති අනධ්‍යයන සේවක තනතුරුවලට අදාළ සේවකයන් සඳහා ද, නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්ව ඇති සේවකයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් දිනයන් පෙර දාතම් කර ඔවුන්ට අදාළ සියලු උසස්වීම් ලබාදී ඇත.

තවද, අනුමතව පවතින රසායනාගාර සහකාර තනතුරේ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව එම තනතුරට උසස් කිරීම සඳහා, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු සියලු අනධ්‍යන සේවකයන්ගෙන්, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මේ වනවිට අභ්‍යන්තර අයදුම්පත් කැඳවා ඇත.

(iv) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පාසල්වල සේවයේ නියුතු අනධ්‍යන සේවකයන් සම්බන්ධයෙන් ලැබී ඇති සියලු ගැටලු සඳහා විසඳුම් මේ වනවිට ලබාදී ඇත.

එසේම තවදුරටත් ඔවුන් සම්බන්ධයෙන් ගැටලු ඇත්නම්, ඒ පිළිබඳව ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරනු ලබන ලිඛිත දැනුම්දීමක් අනුව සොයා බලා ඒ සඳහා කඩිනම් විසඳුම් ලබාදීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකළ හැකිය.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක තමයි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අපට ලබා දී තිබෙන පිළිතුර.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

සවිස්තරාමක පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි. මේ ප්‍රශ්න අපි ලිඛිතව ඉදිරිපත් කළාට ඒවාට සාධනීය පිළිතුරු ලැබෙන්නේ නැහැ.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ අනධ්‍යන කාර්ය මණ්ඩලයට උසස්වීම් ලැබිලා, ඔබතුමා සඳහන් කළ ආකාරයට පාසල් කාර්ය සහායක, රසායනාගාර සහායක කියන තනතුරු නාමවලින් හැඳින්වූවාට, ඔවුන් මෙම සේවා ස්ථානවල නැහැ. තම සේවා ස්ථානවලින් බැහැරව, දේශපාලන වශයෙන් තමන්ට පත්වීම් දුන්, ඒ දේශපාලනය කරන කණ්ඩායම්වල ව්‍යාපාරවල තමයි ඒ අය රාජකාරි කරන්නේ. මේ පුද්ගලයන් ඉතාම අසරණ තත්ත්වයකයි ඉන්නේ. මොකද, මේ ප්‍රශ්නය කාටවත් කියන්න විධියක් නැහැ, ඒ අයට විශාල බලපෑම් තිබෙන නිසා. සමහර අය ඇල්ලේ තිබෙන හෝටල්වල වැඩ කරනවා. තව සමහර අය ගල් ක්‍රෂර්වල වැඩ කරනවා. තවත් සමහර අය යතුරුලියන වැඩ කරනවා. සමහර රාජ්‍ය නිලධාරින් දැනුවත්ව තමයි මේවා සිදු වන්නේ. මේ අය අදාළ සේවා ස්ථානවල නැහැ. මේක තමයි බරපතළ ගැටලුව, ගරු අමාත්‍යතුමනි. මේ පත්වීම් ලබා දුන් ඒ අමාත්‍යවරයා ඔවුන් අදාළ කාර්යයේ යොදවා ගන්නේ නැහැ.

අප දැන් ඒ පාසල්වලට ගිහින් බැලුවත් අපට පෙනෙනවා, ඒ අය මේ මොහොතේත් අදාළ කාර්යයේ නැති බව. නමුත්, ඔවුන් එම තනතුරට අදාළ වැටුප ගන්නවා. සමහර අය විධිමත් ක්‍රමවේදයක් යටතේ අනුයුක්ත කරගෙනත් නැහැ. ගරු ඇමතිතුමනි, එම නිසා මේ ගැන විශේෂ විමර්ශනයක් කළ යුතුයි කියා මම හිතනවා. අවශ්‍ය නම්, ඒ පුද්ගලයන් කවුද කියලා අපට නම් සමඟ තොරතුරු දෙන්නට පුළුවන්, ඔවුන් කුමන හෝටලයේද වැඩ කරන්නේ, කවුද වැඩ කරන්නේ, කුමන ගල් ක්‍රෂර් එකේද වැඩ කරන්නේ කියලා. අපි මේවා ලිඛිතව යොමු කළාට වැඩක් වෙන්නේ නැහැ. අද පාර්ලිමේන්තුව තුළ මේ ප්‍රශ්නය ගැනෙනවා. ඔබතුමාට අවස්ථාවක් තිබෙනවා නම් මේ ප්‍රශ්නය ගැන සොයා බලන්න, ගරු ඇමතිතුමනි. මේ සේවකයන් මේ තනතුරු ගත්තත්, උසස්වීම් ගත්තත් රාජකාරි කටයුතු කරන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඌව පළාත තුළ සිදුවන මේ සිදුවීම් පිළිබඳව විමර්ශනයක් කරලා, අවශ්‍ය කටයුතු කරන්න ඔබතුමා සූදානම්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳ විනය බලධාරියා ලෙස කටයුතු කරන්නේ ආණ්ඩුකාරවරයා සහ පළාත් රාජ්‍ය සේවා කොමිසමයි. මේ ගැන ඔවුන් දැනුවත් කරන්න අපට පුළුවන්. එහෙම නැත්නම් අමාත්‍යාංශ මට්ටමින් ලිඛිතව දැනුවත් කරන්න පුළුවන්, මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්න කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පළාතේ ආණ්ඩුකාරවරයා හැටියට පත් කර තිබෙන්නේ ජනාධිපතිවරයාගේ නියෝජිතයා නේ. එතුමාටත් අපි මේ පිළිබඳව -නම් වශයෙනුත්, ස්ථාන වශයෙනුත්- දිගින් දිගටම දන්වා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, ඒවා මඟ හරින තත්ත්වයක් තමයි තිබෙන්නේ.

කෙසේ වෙතත්, අපි දන්නා අනෙක් කාරණය මේකයි. මේ තනතුරු දෙදහස් ගණන දෙනකොට කිසිම සුදුසුකමක් නොබලා තමයි දුන්නේ. නමුත්, යම් යම් කරුණු කාරණා එකතු කරලා ආණ්ඩුකාරවරයාගෙන් විශේෂ අනුමැතිය ලබාගෙන, ඔහුට ආවේණික වන සේ සලකා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුකූලව පත්වීම් ලබා දෙනවා. මේක දිගින් දිගටම සිද්ධ වෙන දෙයක්. ඒක ලොකු අසාධාරණයක්. බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියෙන් තොරව, "ආණ්ඩුකාරවරයාගේ විශේෂ අනුමැතිය" කියලා යොදා, ඒ නීතියට යටත්ව ඒ බඳවා ගැනීම් කරනවා. හැබැයි ඒක නීත්‍යනුකූල වෙනවා. මෙහෙම අසාධාරණ විධියට නීත්‍යනුකූල තත්ත්වයක් ඇති කිරීම මඟ හැරවීම සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගත යුතුයි කියන එකයි මගේ නම් අදහස. පළාත් සභාවල වැඩි වශයෙන් මේ කටයුත්ත සිද්ධ වෙනවා, ගරු අමාත්‍යතුමනි. මොකද, "ආණ්ඩුකාරවරයාගේ විශේෂ අනුමැතිය", "ආණ්ඩුකාරවරයාගේ එකඟතාව" කියන කාරණය සලකා බැලුවාම අනෙක් සියල්ල නොසලකා හරිනවා. මේක නවත්වන්න යම් වැදගත් පියවරක් අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් ගන්න පුළුවන් නම්, අපේ පළාත් සභා සියල්ල තුළ කෙරීගෙන යන මේ අවිධිමත් විධියට සේවකයන් බඳවා ගැනීමේ වැඩ පිළිවෙළ නිවැරදි කරන්න පුළුවන් වෙයි කියා මම හිතනවා. ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ සම්බන්ධයෙන් කථා කළා. මම හිතන විධියට ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාටත් ඉදිරියේදී මේ සම්බන්ධව කෙළින්ම කථා කරන්න පුළුවන්කම ලැබෙයි. ඊයේත් අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස්වුණා. ලබන 26වන දාත් සවස 2.00ට

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස් වෙනවා. අපි එම කාරක සභාවට පළාත් ලේකම්වරුන්, පළාත් අධ්‍යක්ෂවරුන් සහ අදාළ බලධාරීන් කැඳවනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම කාරක සභාවට සහභාගි වුණොත්, ඒ අවස්ථාවේම ඒ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාරණයක් අහන්න මට අවස්ථාවක් දෙන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, බොහොම කනගාටුයි. අද කාලය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ, බොහොම කනගාටුයි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මට පැහැදිලිව ඇහෙන්නේ නැහැ. ඔබතුමා මොකක්ද කිව්වේ, තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි?

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගෙන් මට පොඩි පැහැදිලි කිරීමක් කරගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාලය ලබා දෙන එක මට ප්‍රශ්නයක්, ගරු මන්ත්‍රීතුමනි. හොඳයි, අහන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මම මෙන්න මේ කාරණය අහන්න කැමැතියි. පන්තියක සිටිය යුතු ළමයින් ප්‍රමාණය පිළිබඳව නියාමනයක් කර තිබියදීත්, ඒ ප්‍රමාණයට වඩා වැඩි ළමයින් ප්‍රමාණයක් ගන්න කියලා දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා නියෝගයක් නිකුත් කර තිබෙන ආකාරය පසුගිය දිනවල අප දැක්කා. එහෙම කරන්නේ කොහොමද? රට තුළ සිදු වන මෙවැනි කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදුවිය යුතුයි. රටේ නීති රීති පද්ධතිය ආරක්ෂා කරනවාය කියමින් නේ, මෙතුමන්ලා පත්වෙන්නේ. ඒ හැම දෙයක් ගැනම මහා පරිමාණයෙන් හඬ නඟපු ආණ්ඩුකාරවරුන් මෙහෙම හැසිරෙන එක ඔබතුමා අනුමත කරනවාද? මෙහෙම වෙන එක හොඳද?

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට ගරු ඇමතිතුමා පිළිතුරු දී අවසන් වුණාට පසුව, ඔබතුමාගේ point of Order එකට අවස්ථාව ලබා දෙන්නම්.

ගරු ඇමතිතුමනි, තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් දෙනවාද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඇත්තටම පළාත් සභාව සතු කටයුත්තක්. නමුත් සමහර අවස්ථාවලදී, විශේෂ අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් වැනි දේවල් සහ විශේෂ හේතු මත සීමාව ඉක්මවා යම් යම් අසාධාරණකම් කර තිබෙනවා. නමුත් ප්‍රතිපත්තියක් විධියට එහෙම විවිධ හේතු දක්වමින්, මත දරමින් අනවශ්‍ය විධියට ඒක කරන්න පුළුවන්කමක් නැහැ. ඒ සම්බන්ධයෙන් මට දෙන්න තිබෙන පිළිතුර ඒකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මේ කාරණය ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න මා කැමැතියි. ගරු ඇමතිතුමනි, කැබිනට් අනුමැතිය ඇතිව පසුගිය කාලයේ දකුණු පළාතේත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා විශාල පිරිසක් බඳවා ගෙන තිබෙනවා. දකුණු පළාත් සභාවේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවීම් කටයුතු කරන්න අවශ්‍ය මුදල් ලබා ගැනීමට මහා භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කර ගැනීමේ යෝජනාව ඉදිරිපත් කළා කියන්නේත් මුදල් ඇමතිතුමායි. නමුත්, පළාත් පාලන ආයතනවලට වෙන් වූ මුද්දර ගාස්තු තමයි පසුගිය මාස තුනේ ඔවුන්ට පඩි ගෙවීම සඳහා පාවිච්චි කර තිබෙන්නේ. දැන් මේ මුද්දර ගාස්තු පාවිච්චි කරලා පඩි ගෙවමින් අනධ්‍යයන කාර්ය මණ්ඩල නඩත්තු කර ගෙන යනවා. සමහර පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාවට සමාන පිරිසක් අනධ්‍යයන කාර්ය මණ්ඩලවලටත් බඳවා ගෙන තිබෙනවා. සමහර පාසල්වලට එවැනි අනධ්‍යයන කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවකුත් නැහැ. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ඊළඟට, තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා මතක් කළ කාරණය මම නැවතත් මතක් කරනවා. විශේෂයෙන්ම පාසල්වලට ලිඛිතව නියෝග නිකුත් කර, ළමයින් බඳවා ගන්න කියන්න ආණ්ඩුකාරවරුන්ට බලයක් තිබෙනවාද, එහෙම පුළුවන්කමක් තිබෙනවාද කියන කාරණයත් මම ප්‍රශ්නයක් හැටියට ඔබතුමාට යොමු කරනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවතත් කියන්න ඕනෑ, ළමයින් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් නඩු තීන්දු ගණනාවක් තිබෙන බව. ඒ අනුව, එක පන්තියක සිටිය යුතු ළමයින් සංඛ්‍යාව 40 වුවත්, වසර 5ක් තුළ ඒ සංඛ්‍යාව 35ක් දක්වා අඩු කිරීමට අධිකරණයට එකඟ වෙලා, ඒ ක්‍රියාදාමය ක්‍රියාත්මක වනවා. එම නිසා, රේඛීය අමාත්‍යාංශය වශයෙන් අපටවත්, පළාත් සභාවලටවත් ඒ නීතිය උල්ලංඝනය කරන්න පුළුවන්කමක් නැහැ. නමුත්, ඉතාම විශේෂ අවස්ථාවලදී යම් යම් දේවල් කරනවා. ඇත්ත වශයෙන්ම විනිශ්චයකාරවරුන්ගේ, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සහ වෛද්‍යවරුන්ගේ ස්ථානමාරු වීම් වාගේ දේවල්වලදී අපි සීමාව ඉක්මවා මෙවැනි දේවල් සාධාරණීකරණය කර දමනවා. නමුත්, ප්‍රතිපත්තියක් වශයෙන් එහෙම තොග පිටින් ළමයින් පන්තිවලට දමන්න පුළුවන්කමක් නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, අනධ්‍යයන කාර්ය මණ්ඩලයට කිසිවිටෙකත් cadre එකෙන් පිට සේවකයන් ගන්න පුළුවන්කමක් නැහැ. අපි රේඛීය අමාත්‍යාංශය විධියටත් cadre එකෙන් පිට කිසිම කෙනෙක් අරගෙන නැහැ. නමුත්, ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, උපදේශක කාරක සභාවේදී ඊයේත් මේ ප්‍රශ්නය මතු වුණා. පළාත් සභාවලට, cadre එකෙන් පිට, අනුමැතියකින් තොරව වෙනත් මුදල් පාවිච්චි කරමින් අනධ්‍යයන සේවකයන් බඳවා ගෙන තිබෙනවාය කියන කාරණය එහිදී ඉදිරිපත් වුණා. ඒ සම්බන්ධයෙන් මම මුදල් ඇමතිතුමාත් දැනුවත් කර තිබෙනවා. මෙය කිසිසේත්ම ස්ථිර පත්වීමක් වෙන්නේ නැහැ. ඒ වාගේම මෙය නීත්‍යනුකූලත් නැහැ. මැතිවරණය ඉලක්ක කර ගනිමින් වැරදි භාවිතයක යෙදවීමක් තමයි මේ කරන්නේ.

## උසස්වීම් ලබා දීමේදී නව ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව පදනම් කරගැනීම: ගැටලු
## புதிய இலங்கை அதிபர் சேவைப் பிரமாணக் குறிப்பின் அடிப்படையிலான பதவியுயர்வுகள்: பிரச்சினைகள்
## APPLICATION OF NEW SRI LANKA PRINCIPALS' SERVICE MINUTE IN GRANTING PROMOTIONS: ISSUES

225/'18

**4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 1999.07.02 දිනැති අංක 1086/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව පදනම් කර ගනිමින් 2005 වර්ෂයේ ගැසට් කර 2006 වර්ෂයේ තරග විභාගයක් පවත්වා, ඉන් සමත් වූ නිලධාරින් කොටසකට 2009.11.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුහල්පති පත්වීම් ලබාදී ඇති බවත්;

(ii) එම තරග විභාගය පදනම් කරගනු ලැබූ අංක 212/2010/FR දරන හා 2012.01.26 දිනැති නඩු තීන්දුවට අනුව වර්ෂ 2010, 2012 සහ 2014 දී විදුහල්පති තනතුරු ලබා දී ඇති බවත්;

(iii) මෙම පත්වීම් 1999.07.02 දිනැති අංක 1086/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ලබා දී ඇතත්, උසස්වීම් ලබා දීමේදී 2014.10.22 දිනැති අංක 1885/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නව ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අදාළ කොන්දේසි පදනම් කර ගත් බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙලෙස එකම විභාගයකට මුහුණ දුන් පිරිසකට වසර ගණනාවක් තිස්සේ වරින් වර පත්වීම් ලබා දීම අසාධාරණ බවත්;

(ii) මෙලෙස උසස්වීම් ලබා දීමට කටයුතු කිරීමේදී නව සේවා ව්‍යවස්ථාව පදනම් කර ගැනීමෙන් අතීතයට බලපාන පරිදි නව කොන්දේසිවලට යටත් කිරීම අසාධාරණ බවත්;

එතුමා පිළිගන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 1999.07.02 ஆம் திகதிய 1086/26 ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் வெளியிடப்பட்ட, இலங்கை அதிபர் சேவைப் பிரமாணக் குறிப்பினை அடிப்படையாகக் கொண்டு, 2005ஆம் ஆண்டு வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டு, 2006 ஆம் ஆண்டில் போட்டிப் பரீட்சை நடாத்தப்பட்டு அதில் சித்தியடைந்த ஒருசில அலுவலர்களுக்கு 2009.11.13ஆம் திகதியிலிருந்து நடைமுறைக்கு வரும் வகையில் அதிபர் பதவி வழங்கப் பட்டுள்ளது என்பதையும்;

(ii ) மேற்படி போட்டிப் பரீட்சையை அடிப்படை யாகக் கொண்ட 212/2010/FR ஆம் இலக்க மற்றும் 2012.01.26 ஆம் திகதிய வழக்குத் தீர்ப்பின்படி 2010, 2012 மற்றும் 2014 ஆம் ஆண்டுகளில் அதிபர் பதவிகள் வழங்கப் பட்டுள்ளன என்பதையும்;

(iii ) இந்த நியமனங்கள் 1999.07.02 ஆம் திகதிய 1086/26 ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் வெளியிடப்பட்ட இலங்கை அதிபர் சேவைப் பிரமாணக் குறிப்பின்படி வழங்கப்பட்டுள்ளபோதிலும், பதவி உயர்வு வழங்கும்போது 2014.10.22 ஆம் திகதிய 1885/31 ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் வெளியிடப்பட்ட புதிய இலங்கை அதிபர் சேவைப் பிரமாணக் குறிப்புக்கு ஏற் புடைய நிபந்தனைகளின் அடிப்படையாகக் கொள்ளப்பட்டன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இவ்வாறு ஒரே பரீட்சையில் தோற்றிய வர்களுக்கு பல வருட காலமாக அவ்வப்போது நியமனங்கள் வழங்கப்படுவது அநீதியானது என்பதையும்;

(ii) இவ்வாறு பதவி உயர்வு வழங்க நடவடிக்கை எடுக்கும்போது புதிய சேவை பிரமாணக் குறிப்பினை அடிப்படையாகக் கொள்வதன் மூலம் கடந்த காலத்திற்கும் ஏற்புடைய விதத்தில் புதிய நிபந்தனைகளுக்கு உட்படுத்துதல் அநீதியானது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

asked the Minister of Education:

(a) Is he aware-

(i) that a section of officers have been granted appointments for the post of Principal with effect from 13.11.2009 based on the Principals' Service Minute published in the Gazette Extraordinary dated 02.07.1999 and No. 1086/26, having gazetted in 2005 and conducting a competitive examination in 2006;

(ii) appointments for Principals have been granted in 2010, 2012 and in 2014 as per the Court Ruling No. 212/2010/FR and dated 26.01.2012 based on that competitive examination; and

(iii) that though these appointments were given according to the Service Minute published in the Gazette Extraordinary No. 1086/26 and dated 02.07.1999, in granting the promotions, the conditions in the new Service Minute published in the Gazette Extraordinary No. 1885/31 and dated 22.10.2014 have been applied?

(b) Will he admit that-

(i) it is unfair to grant appointments from time to time throughout a number of years for a group who faced the same examination; and

(ii) it is unfair to offer promotions based on the new Service Minute and subject them to new conditions with retrospective effect?

(c) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 2010 වර්ෂයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලබාදී නොමැති අතර, 2012.01.26 දිනට ක්‍රියාත්මක වන පරිදි අධිසේවක පදනම මත පත්වීම් ලබාදී, නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතාව හා පුරප්පාඩු මත පදනම්ව 2012.01.26 දිනට නිලධාරින් 1,044 දෙනෙකු හා 2014.01.01 දිනට නිලධාරින් 877 දෙනෙකු ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කර ඇත.

(iii) ඔව්.

(ආ) (i) වරින්වර පත්වීම් ලබා දුන්නද එම පත්වීම් ලබාදීමේදී ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණු මත පදනම්ව පත්වීම් ලබා දී ඇති බැවින් අසාධාරණයක් වී නොමැත.

(ii) අගතියක් සිදු වී නොමැත.

සේවා ව්‍යවස්ථා සංශෝධනයකදී සේවයේ නියැලී සිටින නිලධාරින් අගතියට පත් නොවන පරිදි නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ.

යම් සේවයක සේවා ව්‍යවස්ථාව සංශෝධනයේදී එම සේවයට අදාළ නිලධාරින් පැරණි ව්‍යවස්ථාවෙන් නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වන අතර, ඉන්පසු එම නිලධාරින්ගේ අදාළ උසස්වීම් හා අනෙකුත් විධිවිධාන බලපවත්වනු ලබන්නේ අන්තර්ග්‍රහණය වූ නව සේවා ව්‍යවස්ථාව අනුව වේ.

එය සේවා ව්‍යවස්ථාව සංශෝධනය වූ රාජ්‍ය සේවයේ සියලු සේවාවලට අදාළ ක්‍රමවේදය වේ. එබැවින් අංක 1885/31 හා 2014.10.22 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව එම නිලධාරින්ගේ උසස්වීම් සිදුකරනු ලබන්නේද, එම අන්තර්ග්‍රහණය කරනු ලැබූ නව ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට අනුකූලව වේ.

එසේම ව්‍යවස්ථාවක් අනුව බඳවා ගනු ලබන සියලු රාජ්‍ය සේවකයන්ගේ පත්වීම් ලිපිවල, එම බඳවා ගන්නා ලද සේවා ව්‍යවස්ථාවට දැනටමත් කර ඇත්තාවූ ද, මතුවට කළ හැකි වන්නාවූ ද සංශෝධනයන්ට යටත්ව එම නිලධාරින්ගේ පත්වීම් පාලනය වන බව දක්වා ඇත.

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ගේ ද පත්වීම් ලිපියක 03 වගන්තියට අනුව, "1999 ජූලි 02 දිනැති හා අංක 1086/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් කර ඇත්තාවූ ද, මතුවට කළ හැකි වන්නාවූ ද සංශෝධනයන්ට යටත්ව එම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් ඔබගේ පත්වීම පාලනය වනු ඇත." ලෙස දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න නම්, ගුරුවරු සහ විදුහල්පතිවරු තෘප්තියක් සහිතව සේවයේ යොදවන්නට ඕනෑය කියලා ඔබතුමා දන්නවා. ගුරු - විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්න ගණනාවක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා තිබෙනවා. මාර්තු මාසයේ 13වැනි දා ලංකාවේම ගුරු - විදුහල්පතිවරු වැඩ වර්ජනයක් කරලා ඒ ප්‍රශ්න පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කෙරෙව්වා. ඒ අයගේ ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, 1997 ඉඳලා අවුරුදු 22ක් තිස්සේ නොවිසඳී තිබෙන වැටුප් විෂමතාව. අවුරුදු 22ක් තිස්සේම මේ අය පීඩාවට පත්ව සිටින මේ ප්‍රශ්නය විසඳීම ඉතාම සාධාරණයි.

ඒ වාගේම, නව ගුරු ව්‍යවස්ථාව නිසා මාස තිහක වැටුප් කප්පාදුවක් සිදු වෙලා තිබෙනවා. මේ ආදී ඔවුන්ට බලපාන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව එක්වරක් වැඩ වර්ජනයක් කළා; ඔබතුමාත් එක්ක සාකච්ඡාත් කළා. නමුත් තවම විසඳුමක් ලැබිලා නැහැ. ඒ නිසා මෙන්න මේ ගුරු- විදුහල්පතිවරුන්ගේ සාධාරණ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්නට ඔබතුමා කටයුතු කරන්නේ කොහොමද කියලා දැනගන්න කැමැතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගුරු වැටුප් විෂමතාව අද-ඊයේ ඉඳලා එන එකක් නොවෙයි. බී.සී. පෙරේරා වාර්තාවේ සිට

විශාල කාලයක් තිස්සේ එන ප්‍රශ්නයක්. ඒ වාගේම, අනෙකුත් සේවා සමඟ ගැටෙන බැවින් ඒ ප්‍රශ්නය අධ්‍යාපන අමාත්‍යාංශයට පමණක් තනිව නිරාකරණය කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවට බඳුන් වුණා. මා දන්නා විධියට මේ වෙනකොට මුදල් අමාත්‍යාංශයෙන් මේ සියලු සේවාවල වැටුප් විෂමතා ගළපන්න කමිටුවක් දමා, පොදුවේ ඒ සියල්ලටම අදාළ තීරණ ගැනීම සඳහා අවශ්‍ය සාකච්ඡා පැවැත්වෙමින් යනවා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය විධියට මේ වැටුප් විෂමතාව අපට හුදෙකලාව අරගෙන කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ.

එය එසේ වුවත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙරට සාපේක්ෂව -2015ට සාපේක්ෂව- ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප විශාල මුදලකින් වැඩි වුණා. විශේෂයෙන් ගුරුවරයෙකුගේ වැටුප ගත්තොත්, සියයට 106කින් පමණ වැඩි වෙලා තිබෙනවා. කොටින්ම කියනවා නම්, රුපියල් 24,000ට තිබුණු පළමුවැනි ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ මූලික වැටුප දීමනා රහිතව රුපියල් 44,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, දෙගුණයකට වැඩියෙන් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, දීමනා ඔක්කෝම එකතු වෙලා එනකොට සමහර ගුරුවරුන්ට ජ්‍යෙෂ්ඨත්වය අනුව අද වැටුප රුපියල් 60,000, රුපියල් 70,000, රුපියල් 75,000 දක්වාත් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ වැටුප වැඩිවීමට අමතරව තවත් රුපියල් 6,500කින් පළමුවැනි ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකුගේ දීමනා වැඩි කරන්න මම කැබිනට් පත්‍රිකාවක් දැම්මා. ඒක ඒ අයගේ ශ්‍රේණිය අනුව වෙනස් වුණා. අතීතයේ රුපියල් 2,000කින්, 2,500කින් වැටුප් වැඩි කරන්න කියලා පාරට බැස්සා; උද්ඝෝෂණ පැවැත්තුවා. නමුත් මේ කාලය තුළ රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප සහ pension එක රුපියල් 2,800 සිට රුපියල් 20,000 දක්වා ඉතා වැඩි ප්‍රමාණයකින් වැඩි කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම, සියයට 106කින් වැටුප් වැඩි කරලා තිබෙනවා. මේ ගුරු වැටුප් විෂමතාවත් මම දන්නවා. මම දශකයකට වැඩි කාලයක් විපක්ෂයේ සිටියදීත් මේ සම්බන්ධයෙන් කථා කළා. මේ ගැන අපි ලිඛිතව සහ වාචිකව මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ඉදිරි කාලයේ ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, පෙබරවාරි 21 වැනි දා ඉඳලා අපේ රටේ ගුරු උපදේශකවරු 4,471දෙනෙක් වැඩ වර්ජනය කරනවා කියලා ඔබතුමා දන්නවා. ගුරු උපදේශක සේවාව පිළිබඳ ප්‍රශ්නය දැනට අවුරුදු හැටකට වඩා වැඩි කාලයක් තිස්සේ පවතිනවා. මම 2016 පෙබරවාරි මාසයේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනාවා, ගුරු උපදේශක සේවාව පිහිටුවන්න කියලා. ඔබතුමාත් ඒකට එකඟ වුණා.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. දැන් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, බස්නාහිර පළාතේ ගුරු උපදේශකවරුන්, ගුරු උපදේශක සේවාවෙන් ඉවත් කරලා පාසල්වලට යවන එකයි. ගුරු උපදේශකවරුන්ගේ ගැටලුව විසඳා ඔවුන් යළි සේවයට කැඳවා ගන්නට ඇමතිවරයා හැටියට ඔබතුමා කටයුතු කරන්නේ කොහොමද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගුරු උපදේශන සේවාවත් අපි පිහිටවපු එකක් නොවෙයි. මේ ප්‍රශ්නය වසර ගණනාවක් තිස්සේ පසුගිය ආණ්ඩුව කාලයේ සිට එන ප්‍රශ්නයක්. ඒ ගොල්ලෝ මේ ප්‍රශ්න විසඳුවේ නැහැ, මේ ප්‍රශ්න විසඳන්න කටයුතු කළේ නැහැ. එසේ වුණත් අපේ රජය බලයට පත් වුණාට පස්සේ මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඒ කැබිනට් පත්‍රිකාව අනුමත වුණා. ඇත්ත වශයෙන්ම ගුරු උපදේශන සේවාවේ වෘත්තීය සමිති නායකයන් මා හමුවෙලා මුලින්ම කිව්වා, "මේක සේවාවක් විධියට පිහිටුවා දෙන්න" කියලා. මුලදී ඒ ගොල්ලෝ කිව්වා, වැටුප් පිළිබඳ අවශ්‍යතාවක් නැහැයි කියලා. ඒ ගොල්ලනුත් දැනගෙන සිටියා, මේ කටයුතු කරන්න ගියොත් ටිකක් අමාරු ප්‍රශ්නයක් වෙනවා කියලා. ඒ නිසා ඒ ගොල්ලන්ගේ ඉල්ලීම මත මේ සේවාව ස්ථාපිත කළා. ඒක ස්ථාපිත වුණාට පසුවත් ඒ සම්බන්ධයෙන් විරෝධතා ව්‍යාපාර එහෙම නැත්නම් වැටුප පිළිබඳවත් නැවත ප්‍රශ්නයක් තිබුණා. ඒ ගැනත් සාකච්ඡා කළා. එහිදී එකඟ විය හැකි දේවල් තිබුණේ නැහැ. ඒ වැටුප සම්බන්ධයෙන් National Salaries and Cadre Commission එකේත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේත් - Department of Management Servicesහිත් - එකඟතාවක් තිබුණේ නැහැ. ඊට පසුව නැවතත් කරුණු ඉදිරිපත් කළා. එහිදී රජය දුන්නු වැටුප් තලයට ගුරු උපදේශන සේවයේ ඉන්න නිලධාරීන්, ඒ වෘත්තීය සමිති කණ්ඩායම එකඟ වුණා. ඊට පස්සේ නැවතත් අපි කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමත්, ඒ වාගේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවත් දැන් ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් යනවා. එකවර එකඟ නොවීම සහ කාලයක් ගතවීම නිසා තමයි මෙවැනි තත්ත්වයක් ඇති වුණේ. මා හිතන හැටියට ඉතාම කෙටි කාලයක් තුළ මේ ගුරු උපදේශන සේවය සේවාවක් විධියටත්, මේ වැටුප් ප්‍රශ්නයත් නිරාකරණය වෙයි. රජයේ දෙපාර්තමේන්තුවලින් සිදුවන ක්‍රියාවලියට යම් කාලයක් පමණයි ගතවෙන්නේ. ඒ විස්තර ලැබුණු සැණින් මේ සේවාව ස්ථාපිත කරලා ඔවුන් යළි සේවයේ පිහිටුවන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 5 -266/'18- (1), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 434/'19 - (1), ගරු කනක හේරත් මහතා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development, Wild Life and Christian Religious Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විස්තර රාශියක් විමසා තිබෙන නිසා අපට යම් කාලයක් අවශ්‍යයි. ඒ නිසා මේ ප්‍රශ්නයට පිළිතුර

[ගරු ජෝන් අමරතුංග මහතා]

දීම සඳහා මාසයක් පමණ කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 7 - 455/'19 - (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා,

එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දන්නවා එතුමාට උත්තර නැහැ කියලා. මා දන්නවා මේ ප්‍රශ්නයට උත්තර ලැබෙන්නේ නැහැ කියලා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 8 - 572/'19 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 2 - 91/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග : මන්නාරම දිස්ත්‍රික්කය
புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள்: மன்னார் மாவட்டம்
RENOVATED IRRIGATION SCHEMES: MANNAR DISTRICT

266/'18

**5. ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக )
(The Hon. Nimal Siripala De Silva on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் மன்னார் மாவட்டத்தில் புனரமைக்கப்பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப்பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iv) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடைய தான புனரமைப்புப் பணிகளின் பௌதீக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென்ப தையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக்கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின் போது அகற்றப்பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(viii) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களை பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the minor, medium and major-scale irrigation schemes renovated in Mannar District in the years 2015, 2016 and 2017;

(ii) the estimated amount for each renovation work, separately;

(iii) whether tenders were called for the said renovation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) the physical and financial progress of the renovation work of that contract with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports relevant to that renovation work will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in renovation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග |
|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය |
| | ඇළ මාර්ග වැඩිදියුණු කිරීම |
| | ගංවතුර හානි |
| | අත්හැර දමන ලද වැව් පිළිසකර කිරීම |
| 2017 | අමුණු සුළු අලුත්වැඩියාව |
| | ඇළ මාර්ග වැඩිදියුණු කිරීම |
| | වැව් ප්‍රතිසංස්කරණය |

මධ්‍යම පරිමාණ වාරිමාර්ග- නැත

මහා පරිමාණ වාරිමාර්ග - 2015,2016,2017 වසරවලදී ජයාන්ස් (Giants) , අකතිමුරිප්පු, වියාඩිකුලම් යන මහා වාරිමාර්ග ව්‍යාපාරවල වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායි වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු , ඇල මාර්ග වැඩි දියුණු කිරීම කටයුතු , දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම , ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

(ii)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය | 10,950,000.00 | 10,950,000.00 |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය | 52.700,000.00 | 118,900,000.00 |
| | ඇළ මාර්ග වැඩිදියුණු කිරීම | 11.200,000.00 | |
| | ගංවතුර හානි | 22.400,000.00 | |
| | අත්හැර දමන ලද වැව් පිළිසකර කිරීම | 32.600,000.00 | |
| 2017 | අත්හැර දමන ලද වැව් පිළිසකර කිරීම | 21,535,000.00 | 53,311,318.87 |
| | වැව් ප්‍රතිසංස්කරණය | 13,760,000.00 | |
| | විශේෂ ව්‍යාපෘති | 18,016,318.87 | |

| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | | 183,161,318.87 |
|---|---|---|---|---|
| | | | | |
| වර්ෂය හා වාරි ව්‍යාපාරය | | මහා පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
| 2015 | ජයාන්ස් (Giants) / අකතිමුරිප්පු / වියාඩිකුලම් | මෙහෙයුම් හා නඩත්තු | 29,662,420.00 | 45,570,340.00 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 6,153,960.00 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 7,453,960.00 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 1,000,000.00 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 1,300,000.00 | |
| 2016 | ජයාන්ස් (Giants) / අකතිමුරිප්පු / වියාඩිකුලම් | මෙහෙයුම් හා නඩත්තු | 16,950,000.00 | 76,938,700.00 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 5,514,350.00 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 14,184,350.00 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 30,000,000.00 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 1,620,000.00 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 8,670,000.00 | |
| 2017 | ජයාන්ස් (Giants) / අකතිමුරිප්පු / වියාඩිකුලම් | මෙහෙයුම් හා නඩත්තු | 28,851,000.00 | 133,333,916.00 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 9,131,450.00 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 13,131,450.00 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු | 75,904,016.00 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 2,316,000.00 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 4,000,000.00 | |
| 2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.) | | | | 255,842,956.00 |

(iii) සුළු පරිමාණ වාරිමාර්ග - ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 05 ට අඩු ව්‍යාපෘති සෘජු කොන්ත්‍රාත් ලෙස අදාල ගොවි සංවිධාන වෙත පවරා ඉටුකරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මන්නාරම දිස්ත්‍රික්කය වෙත ලබා දෙන අතර දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරු විසින් අදාල කොන්ත්‍රාත් පිරිනමනු ලැබේ.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ටෙන්ඩර් කැඳවීමෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලද ව්‍යාපෘති කිහිපයක් ඇත.

(iv) සුළු පරිමාණ වාරිමාර්ග - ඉදිරිපත් කළ හැක.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ඔව්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

| අනු අංකය | කොන්ත්‍රාත්කරුගේ නම |
|---|---|
| 01 | ප්‍රියන්කා කන්ස්ට්‍රක්ෂන්ස් |
| 02 | ජොසිනා කන්ට්‍රැක්ටර්ස් |
| 03 | ෂකීර් කන්ස්ට්‍රක්ෂන්ස් |
| 04 | පස්ටින් කන්ස්ට්‍රක්ෂන්ස් |
| 05 | සියාරා කන්ස්ට්‍රක්ෂන්ස් |
| 06 | ආර්.ඩී.එස්.යුරත්තිරසන්කුලම් |
| 07. | කෘෂිකර්ම සමාජය , සිරුකුලම් |

(v) සුළු පරිමාණ වාරිමාර්ග

| වර්ෂය | වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | වැඩ අවසන් | අවිච්ඡේද |
| 2015 | 10,563,262.17 | 96.46 | 8 | - |
| 2016 | 105,631,856.43 | 88.84 | 42 | 1 |
| 2017 | 31,903,583.41 | 59.84 | 8 | 6 |

මහා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග - සියළුම කාර්යයන් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ අවසන් කර ඇති අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%කි.

(vi) සුළු පරිමාණ වාරිමාර්ග - අදාළ නොවේ

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - දැනට පවතින ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සහ පරිසර වාර්තා සකස් කිරීම අවශ්‍ය නොවේ. සියලු කාර්යයන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කර සැලසුම් කිරීමෙන් පසු ඇස්තමේන්තු සකස් කර ඇත.

(vii) නැත.

(viii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

---

** [මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]*
*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This answer is also placed in the Library.]*

## ලංකා විදුලිබල මණ්ඩලය: කළමනාකරණ සැලැස්ම

### இலங்கை மின்சார சபை: முகாமைத்துவத் திட்டம்

### CEYLON ELECTRICITY BOARD: BUSINESS CONTINUITY PLAN

572/'19

**8. ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**

(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)

(The Hon. Anura Sidney Jayarathne on behalf of the Hon. Thushara Indunil Amarasena)

විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සතුව ආපදා කළමනාකරණ සැලැස්මක් තිබේද;

(ii) එසේ නොමැති නම්, එයට හේතුව කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයට හදිසි තත්ත්වයකදී කටයුතු අඛණ්ඩව ගෙන යාම සඳහා වූ සැලැස්මක් (Business Continuity Plan) තිබේද;

(iv) එසේ නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இலங்கை மின்சார சபையிடம் இடர் முகாமைத்துவத் திட்டமொன்று உள்ளதா;

(ii) இன்றேல், அதற்கான காரணம் யாது;

(iii) இலங்கை மின்சார சபையிடம் அவசர நிலைமையொன்றின் போது தொடர்ச்சியாக அலுவல்களை மேற்கொள்வதற்கான திட்ட மொன்று (Business Continuity Plan) உள்ளதா;

(iv) இன்றேல், அதற்கான காரணம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Business Development:

(a) Will he inform this House-

(i) whether Ceylon Electricity Board has a Disaster Management Plan;

(ii) if not, the reasons for not having such a plan;

(iii) whether Ceylon Electricity Board has a Business Continuity Plan; and

(iv) if not, the reasons for not having such a plan?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) හදිසි තත්ත්වයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. ආපදා කළමනාකරණය ලංකා විදුලිබල මණ්ඩලය මඟින් අනුගමනය කරනු ලබන සැලසුම් ක්‍රමවේදයක් තුළ අන්තර්ගත වන අතර, ඒ අනුව ආපදා අවස්ථාවකදී විදුලි පද්ධතිය නම්‍යශීලී වේ. ගෝලීය විදුලි ජාලයේ ක්‍රියාත්මක කරනු ලබන ජාත්‍යන්තර විශිෂ්ට භාවිතයන් යොදා ගැනීම හේතුවෙන් විදුලිබල ජාලයේ මෙහෙයුම් ක්‍රියාවලියෙහි මෙම ආවේණික ලක්ෂණය දක්නට ලැබේ. කෙසේ වෙතත්, සහායක සහ ආධාරක ක්‍රියාවලින් ආපදා කළමනාකරණය සඳහා ශක්තිමත් විය යුතු අතර, එවැනි ක්‍රියාවලින් ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

(ii) ලංකා විදුලිබල මණ්ඩලය දශක ගණනාවක් තුළ අත්දැකීම් සහිත හොඳින් ස්ථාපිත වූ රාජ්‍ය ආයතනයකි. මානව සම්පත, ද්‍රව්‍ය, යන්ත්‍ර, ක්‍රමවේද, මූල්‍ය, නඩත්තු, මිනුම් හා වෙළඳකරණය යන ක්‍රියා මේ සඳහා අයත් වේ. වාර්ෂික සැලැස්ම, වාර්ෂික අය වැය, දිගුකාලීන ජනන සැලැස්ම (වසර 02කට වරක් සමාලෝචනය කරනු ලබන), දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම (වසර 02කට වරක් සමාලෝචනය කරනු ලබන) හා ලංවිම සංයුක්ත සැලැස්ම යන අංග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් අවදානම් තත්ත්ව කළමනාකරණය කර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය සමත්ව ඇත.

අධීක්ෂණය හා සමාලෝචනය මඟින් ළඟා කරගත් ප්‍රතිඵල පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරීත්වය මඟින් අවදානම් කළමනාකරණ රාමුව, ප්‍රතිපත්ති සහ ඊට අනුබද්ධ ලංකා විදුලිබල මණ්ඩලයේ ආපදා කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ඇත.

දිගුකාලීන උත්පාදන සැලසුම සහ දිගුකාලීන සම්ප්‍රේෂණ සැලසුම්, ජාත්‍යන්තරව පිළිගත් පද්ධති ආරක්ෂණය සහ හදිසි අවශ්‍යතා නිර්ණායක යටතේ සංවර්ධනය කරනු ලැබේ. විදුලිබල පද්ධති ස්ථායිතාව, විදුලිබල පද්ධති ආරක්ෂණ සහ පද්ධති ඔරොත්තු දීම යන අංග හදිසි අවශ්‍යතා සැලසුම්කරණය මඟින් ඒකාබද්ධ කරනු ලැබේ.

පාලනය කළ හැකි හා පාලනය කළ නොහැකි තත්ත්වයන් යටතේ හට ගැනෙන හදිසි අවස්ථා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා විදුලි ජනනය, සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ අදියරයන් ආවරණය වන පරිදි පියවර ගෙන ඇත. (ඇමුණුම 01 බලන්න).**

ඉහත සඳහන් කළ පරිදි, එම පියවර ගෙන තිබෙන අතර, සම්පත් කළමනාකරණය, නඩත්තුව, මිනිස් බල යෙදවීම ආදී වශයෙන් අදාළ කරුණු ඇතුළත්ව සියලු ආධාරක සහ සහායක කාර්යයන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ආපදා කළමනාකරණ සැලසුමෙහි විෂය පථයට ඇතුළත් කර තිබේ. ඉහත සැලසුම යටතේ, "Functional Manual on Corporate Risk Management" යන මැයෙන් අත් පොතක් දැනටමත් කෙටුම්පත් කර තිබේ. (ඇමුණුම 02 බලන්න)**

(iii) හදිසි තත්ත්වයකදී තීරණාත්මක ක්‍රියාවලි සහ ආයතනයේ ක්‍රියාකාරීත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය තුළ ධාරිතාව වර්ධනය කර ඇත.

බෙදා හැරීම් පද්ධතිය අංශ 04ක් යටතට පත් කර එම සෑම අංශයක්ම අතිරේක සාමාන්‍යාධිකාරිවරයකුගේ අධීක්ෂණය යටතට පත් කිරීම මඟින් ලංකා විදුලිබල මණ්ඩලයේ කළමනාකාරීත්වය වඩාත් කාර්යක්ෂම කර ඇත. අත්දැකීම් බහුල තාක්ෂණික හා තාක්ෂණික නොවන කාර්යය මණ්ඩලයක් ලංකා විදුලිබල මණ්ඩලය සතුව ඇත. ප්‍රමාණවත් අමතර කොටස් දිවයින පුරා බෙදී යන ආකාරයෙන් ගබඩා කර ඇත.

තවමත් කෙටුම්පත් කරමින් පවතින ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්ව අත් පොතෙහි "Functional Manual on Corporate Risk Management" ව්‍යාපාර අඛණ්ඩතාව පිළිබඳව අවධානය යොමු කර තිබේ. (ඇමුණුම 2, වගන්තිය 5).

තීරණාත්මක යටිතල පහසුකම් සම්බන්ධයෙන් ව්‍යාපාර අඛණ්ඩතාව යන සන්දර්භය, ව්‍යාපාර ආයතනයක ව්‍යාපාර අඛණ්ඩතාව යන කරුණින් වෙනස් වේ. ක්‍රියාවලියෙහි දැඩි කිරීම සඳහා ආපදා කළමනාකරණ පමණක් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තීරණාත්මක මෙහෙයුම් සඳහා යටිතල පහසුකම් දැඩි කිරීම අවශ්‍ය වේ. ලංවිමට අයත් ජාතික පද්ධතියට, මේ සඳහා ඔරොත්තු දීමේ හැකියාව ආවේණිකව ලැබී ඇති අතර, මේ සම්බන්ධයෙන් ක්‍රියාවලින් දැඩි කිරීමේ කාර්යයෙහි මෙම ආයතනය නියැලෙමින් සිටී.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### වන සංරක්ෂණ නිලධාරින් විසින් කරප්පුකුති ග්‍රාමයේ නිවාස ව්‍යාපෘතිය නතර කිරීම
### வன இலாகாவினரால் கரப்பக்குத்தி கிராம வீடமைப்புத் திட்டம் தடுக்கப்பட்டமை
### SUSPENSION OF HOUSING PROJECT IN KARAPPUKUTHI VILLAGE BY FOREST CONSERVATORS

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி!

வவுனியா வடக்கு VA/223B சின்னடம்பன் கிராம சேவையாளர் பிரிவினைச் சேர்ந்த கரப்பக்குத்தி கிராமத்தில் தேசிய வீடமைப்பு அதிகாரசபையின்கீழ் மேற்கொள்ளப்பட்டு வருகின்ற 17 பயனாளிகளுக்குரிய வீடமைப்புத் திட்டம் தற்போது தடைப்பட்டுள்ளதாகக் கரப்பக்குத்தி மாதர் கிராம அபிவிருத்திச் சங்கத்தினர் தெரிவிக்கின்றனர். மேற்படி வீடமைப்புத் திட்டத்திற்கெனத் தேர்ந்தெடுக்கப்பட்டுள்ள காணிகள், 2006 மற்றும் 2014ஆம் ஆண்டுகளில் அங்குள்ள சில தனி நபர்களால் அன்பளிப்பாக வழங்கப்பட்டுள்ள அரச அனுமதிப்பத்திரம் கொண்ட காணிகள் என்றும், தேசிய வீடமைப்பு அதிகாரசபையின் வீடமைப்புத் திட்டத்திற்கென இக்காணிகள் அப்பகுதிப் பிரதேச செயலாளர் உள்ளிட்டோரால் சிபாரிசு செய்யப்பட்டு வழங்கப்பட்டுள்ள நிலையில், கடந்த மார்ச் மாதம் 27ஆம் திகதி வீடமைப்புத் திட்டத்திற்கான அடிக்கல் நடப்பட்டுள்ளதாகவும் கடந்த ஏப்ரல் மாதம் 12ஆம் திகதி அவ்விடத்திற்கு வருகைதந்திருந்த வன இலாகாவினர் அக்காணிகளைப் பார்வையிட்டுச் சென்றதாகவும், அப்போது அக்காணிகள் பற்றிய எவ்விதமான பிரச்சினைகள் குறித்தும் அவர்கள் கதைக்கவில்லை என்றும் தெரிவிக்கும் மேற்படி மாதர் அபிவிருத்திச் சங்கத்தினர், கடந்த ஜூன் 20ஆம் திகதி வீட்டுப் பயனாளிகள் அக்காணிகளில் அத்திவாரங்களை அமைக்கும் பணியில் ஈடுபட்டிருந்த நிலையில், விசேட அதிரடிப் படையினருடன் அங்கு வருகைதந்திருந்த வன இலாகாத்துறை அதிகாரிகள் பணியில் ஈடுபட்டிருந்த 7 நபர்களைக் கைது செய்துள்ளனர் என்றும் இதனால் அவ்வீட்டுத் திட்டம் தடைப்பட்டுள்ளதாகவும் தெரிவிக் கின்றனர்.

மேற்படி காணி தேசிய வீடமைப்பு அதிகாரசபையின் வீடமைப்புத் திட்டத்திற்கென வழங்கப்பட்ட நாள் முதற்கொண்டு அக்காணிகள் பற்றி எவ்விதமான அக்கறையினையும் காட்டியிராத வன இலாகாத் துறையினர் மேற்படி வீடமைப்புத் திட்டத்திற்கான நிதி பயனாளிகளுக்கென விடுவிக்கப் பட்டிருந்த நிலையில், அத்திவாரங்களை அமைக்கும் பணி மேற்கொள்ளப்பட்டிருந்தபோது, இத்தகைய செயலில் ஈடுபட்டிருப்பதானது தங்களுக்கு மிகுந்த சந்தேகத்தை ஏற்படுத்துவதாக மேற்படி மாதர் அபிவிருத்திச் சங்கத்தினர் தெரிவிக்கின்றனர்.

1. மேற்படி விடயம் தொடர்பில் ஆராய்ந்து, கரப்பக்குத்தி வீடமைப்புத் திட்டத்தை முன்னெடுப்பதற்கான நடவடிக்கையினை விரையில் மேற்கொள்ள முடியுமா?

எனது மேற்படி கேள்விக்கான பதிலை கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவார் என நான் எதிர்பார்க்கின்றேன். ஆனால், துரதிருஷ்டவசமாக இன்று கௌரவ அமைச்சர் அவர்கள் சபைக்கு வரவில்லை.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

Sir, the Answer will be given tomorrow.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நேற்றும் நான் ஒரு கேள்வி எழுப்பியிருந்தேன். அந்தக் கேள்விக்குரிய பதில் இன்று தருவதாகச் சொல்லப்பட்டது. ஆனால், இதுவரை அந்தப் பதில் கிடைக்கவில்லை.

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, we have informed the Ministers concerned. It is their duty to come and answer in Parliament. We have informed. That is all what we can do.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாங்கள் எழுப்பும் கேள்விகளுக்கு உரிய அமைச்சர்கள் எப்போது பதில் சொல்வார்கள் என்று தெரிந்திருந்தால், மேலதிக வினாக்களைக் கேட்பதற்கு நாங்கள் தயாராக இருக்கலாம். நேற்றுக்கூட, கௌரவ அநுர திஸாநாயக்க அவர்களுடைய கேள்விக்கான பதிலை சமூக வலுவூட்டல் அமைச்சர் அவர்கள் வழங்குகின்றபோது தஸ்தாவேஜு அவருடைய கையில் இருக்கவில்லை. ஆனபடியினால், தயவுசெய்து அவ்வாறான கேள்விகளுக்கான பதில்களை கௌரவ அமைச்சர்கள் தருகின்றபொழுது முன்கூட்டியே தெரிவித்தால், நாங்கள் அதற்குத் தயாராக இருக்கலாம் என்பதையும் நான் இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, the Ministers answer these on Parliament Sitting days when the Members of Parliament are expected to be here.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, we will ensure that the two Questions will be answered within this week.

Thank you.

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු.

අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

## අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගත්වය
## பிரதம அமைச்சர், அமைச்சரவை உள்ளிட்ட அரசாங்கம்மீதான நம்பிக்கையின்மை
## VOTE OF NO CONFIDENCE IN PRIME MINISTER, CABINET AND GOVERNMENT

[පූ.භා. 11.57]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු අනුර දිසානායක මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,- අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංගත්වය,- වර්ෂ 2019 අප්‍රේල් 21 වැනි පාස්කු ඉරිදා දින කොළඹ, මීගමුව සහ මඩකලපුව යන ප්‍රදේශවල සිදු වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ඇතුළු දෙසිය පණහකට අධික පිරිසක් ඝාතනය වීමත්, තවත් පන්සියයකට ආසන්න පිරිසක් තුවාල ලැබීමත් සහ එකී බෝම්බ ප්‍රහාර හේතුවෙන් වූ දේපළ හානිය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් නිසි තොරතුරු ලැබී තිබියදී සාපරාධී නොසැලකිල්ලෙන් පහත සඳහන් කෙරෙන ක්‍රියාවන් කරමින් හෝ නොකර හැරීමෙන් ද:-

(අ) 2019.05.08 වැනි දින අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ පරිදි 2014 වර්ෂයේ සිට අයිඑස්අයිඑස් -ISIS- ජාත්‍යන්තර ඉස්ලාම් අන්තවාදී සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ පිරිස් විවිධ සබඳතා පැවැත්වූ බවත්, විවිධ ක්‍රියාකාරකම්වල යෙදුණ බවත් දැන සිටියදී ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට අපොහොසත් වීම;

(ආ) විවිධ ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන මුස්ලිම් සමාජය තුළ ක්‍රියාත්මක වන බවට මුස්ලිම් ප්‍රජාව විසින්ම විවිධාකාරයෙන් ආණ්ඩුව සහ වගකිව යුතු ආයතන දැනුවත් කර තිබියදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම;

(ඇ) කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විවිධ අවස්ථාවල එල්ල කරන ලද තර්ජන සහ ප්‍රහාර සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 21 වැනි දින බෝම්බ පුපුරුවාගෙන මිය ගිය සහරාන් හෂීම් සහ 2019 අප්‍රේල් 26 වැනි දින සයින්දමරුදුහිදී බෝම්බ පුපුරුවාගෙන මිය ගිය ඒ. එල්. එම්. නියාස් යන අයවලුන්ට එරෙහිව අධිකරණය විසින් වරෙන්තු නිකුත් කර තිබියදී සහ එකී වරෙන්තුකරුවන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ප්‍රසිද්ධව විවිධ ක්‍රියාකාරකම්වල යෙදී සිටියදී ඔවුන් අත්අඩංගුවට ගැනීමට හෝ නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම;

(ඈ) වර්ෂ 2018 දෙසැම්බර් 24 වැනි දින මාවනැල්ලේ දී බුද්ධ ප්‍රතිමාවන්ට හානි කිරීම සම්බන්ධයෙන් සහරාන් හෂීම් ප්‍රමුඛ කණ්ඩායමක් සම්බන්ධ බවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විසින් ජාතික බුද්ධි අංශය වෙත 2018 දෙසැම්බර් 28 වැනි දින දැනුම් දී තිබියදීත්, හා මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් සැක කරමින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබියදීත් විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යාම වළක්වමින් ඒ සඳහා මැදිහත් වීම් තිබුණු බව ආණ්ඩුවේ අමාත්‍යවරයකු විසින්ම ප්‍රකාශ කර තිබීම;

(ඉ) මෙම ප්‍රහාරයන්ට සැලකිය යුතු කාලයකට පෙර සිට ශ්‍රී ලංකාව තුළ ඉස්ලාම් අන්තවාදී සංවිධානවල විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂයෙන් සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් අයිඑස්අයිඑස් -ISIS- සංවිධානය සමඟ බැඳී කටයුතු කිරීම ඇතුළු කරුණු සම්බන්ධයෙන් නීතිමය සහ ආරක්ෂක පියවර ගැනීමට අපොහොසත් වීම;

(ඊ) ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයකු වන අග්‍රාමාත්‍යවරයා ආරක්ෂක මණ්ඩල සභාවාරයන්ට සහභාගී නොවීමෙන් රට වැසියා වෙත ඔහු විසින් ඉටු කළ යුතු මූලික වගකීම් පැහැර හැරීම;

(උ) විදේශීය ඔත්තු සේවාවන් විසින් ශ්‍රී ලංකාව තුළ කතෝලික දේවස්ථාන හා හෝටල් ඉලක්ක කරගෙන මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කෙරෙන බවත්, එයට සම්බන්ධ පුද්ගලයන් හා ඔවුන්ගේ දුරකථන අංක, ජාතික හැඳුනුම්පත් අංක ඇතුළු නිශ්චිත තොරතුරු ලබා දී තිබියදී එම තොරතුරු මත පදනම්ව කටයුතු කිරීම පැහැර හැරීම;

වැඩිමනත් ලෙස 2019.04.21 වැනි දින ප්‍රහාරයන්ට පෙර අදාළ විදේශ ඔත්තු සේවාවන් විසින් නැවතත් මෙම ප්‍රහාරයන් සම්බන්ධයෙන් නිශ්චිතව අනතුරු අඟවා තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පැහැර හැරීම;

(ඌ) 2019.04.11 වැනි දින නියෝජ්‍ය පොලිස්පති, විශේෂ ආරක්ෂක දිසාව ප්‍රියලාල් දසනායක මහතා විසින් ``Information of an alleged plan attack" යන ශීර්ෂය හා අංක DIG/SPR/126/4.19 දරන ලිපිය මඟින් 2019 අප්‍රේල් 21 වැනි දින නිශ්චිත ස්ථාන ඉලක්ක කරගෙන සැලසුම්ගත මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ල වන බවට, එනම් "ජාතික තව්හීත් ජමාත් නායක මොහොමඩ් සහරාන් මෙරට

මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරක් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව මඟින් ලබා දී තිබූ වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින්" යනුවෙන් සඳහන් ලිපිය පහත නම් සඳහන් එනම්,

අධ්‍යක්ෂ/ඇමති ආරක්ෂක කොට්ඨාසය

අධ්‍යක්ෂ / අධිකරණ ආරක්ෂක කොට්ඨාසය

අධ්‍යක්ෂ / විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය

වැඩ බලන අධ්‍යක්ෂ/තානාපති ආරක්ෂක කොට්ඨාසය (iv)

වැඩ බලන අධ්‍යක්ෂ/ විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය (v)

අයවලුන්ට පූර්වයෙන් ලබා දී තිබීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම පැහැර හැරීම, යන ඉහත කරුණු අනුව 2019.04.21 වැනි දින සිවිල් වැසියන් ඉලක්ක කර ගනිමින් සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය අවශ්‍යයෙන්ම වළකා ගැනීමට හෝ හානිය අවම කරගත හැකිව තිබූ හෙයින්ද;

(එ) 2019.04.21 වැනි දින සිදු කරනු ලැබූ ප්‍රහාර මාලාවෙන් පසුව අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍යවරුන් විසින් එකී ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් වූ වගකීම භාර නොගෙන එම වගකීම වෙනත් පාර්ශ්වයන්ට පැවරීමට උත්සාහ කරමින්ද, රජයේ අමාත්‍යවරුන් විසින් වගකීම් විරහිත, පරස්පර සහ සාවද්‍ය ප්‍රකාශයන් සිදු කරමින් රටේ සාමාන්‍ය ජන ජීවිතය හා මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් සහ අනාරක්ෂිතභාවයක් ඇති වන පරිදි කටයුතු කර ඇති හෙයින්ද;

(ඒ) 2019.04.21 වැනි පාස්කු ඉරිදා දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාවලියට බාධා කරමින් සහ එකී අපරාධයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කරමින් හෝ වළක්වමින් ආණ්ඩුවේ සමහර අමාත්‍යවරුන් කටයුතු කර ඇති හෙයින්ද;

(ඔ) 2019.04.21 වැනි දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර මාලාවෙන් පසුව තවත් එවැනි ප්‍රහාර මාලාවක් ඇති වීම හෝ වෙනත් ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීම මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පූර්ණ නීති මාලාවක් රාජ්‍යය සතුව තිබියදී 2019.05.13 වැනි දින ගම්පහ ප්‍රදේශයේ සහ වයඹ පළාතේ සිදු වූ අන්තවාදී ප්‍රචණ්ඩකාරී ක්‍රියා, එනම් මනුෂ්‍ය ඝාතන, දේපළ හානි සහ ජනතාව අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා නිසි අවධානයකින් සහ වගකීමෙන් කටයුතු නොකිරීමේ සහ එකී සිද්ධීන් මැඩපැවැත්වීම සඳහා ගතයුතු නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මත ජනතාව සම්බන්ධයෙන් රජය විසින් ඉටු කළ යුතු යුතුකම් වගකීම් නිසි ආකාරයෙන් ඉෂ්ට කිරීම පැහැර හැරීමෙන් සහ 2019.04.21 වැනි දින ප්‍රහාර මාලාවෙන් පසුව රටෙහි විවිධ ජන වර්ගයන් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් සහ ප්‍රහාරයන්වලට යොමු වීමේ ප්‍රවණතාවයක් තිබියදී එකී ප්‍රහාරයන් වළක්වා ගැනීමට කටයුතු නොකළ හෙයින්ද;

(ඕ) එකී පාස්කු ඉරිදා දින ප්‍රහාරයෙන් මාසයක් ගතවී තිබියදී, රටෙහි සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලිය නැවත ගොඩ නැඟීමට අසමත් වී ඇති හෙයින්ද, රටෙහි පාසල් සහ සරසවි අධ්‍යාපන ක්‍රියාවලිය නැවත ගොඩ නැඟීමට අසමත් වී ඇති හෙයින්ද, රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය නැවත යථා තත්ත්වයට පත් කිරීමට අසමත් වී ඇති හෙයින්ද, ආණ්ඩුවක් වශයෙන් රටෙහි ජනතාව වෙත තමන් විසින් ඉටුකළ යුතු වගකීම් සහ වගවීම් පැහැර හැර ඇති හෙයින්ද; සහ

2019.04.21 වැනි දින ප්‍රහාර මාලාව වැළැක්වීමට අසමත් වූ නිසා මෙන්ම ඉන් පසුවද රටේ ආරක්ෂක තත්ත්වය සහ සිවිල් ජන ජීවිතය යථා තත්ත්වයට පත් නොකිරීම නිසා ඇති වී තිබෙන අරාජික තත්ත්වය මත රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට විදේශ රාජ්‍යයන්ට ඉඩකඩ හරිමින් ක්‍රියා කර ඇති හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව සම්බන්ධයෙන් තවදුරටත් විශ්වාස භංගත්වයට පත්ව ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉහත මා ඉදිරිපත් කළේ, මේ ආණ්ඩුවට එරෙහිව අප විසින් ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාවයි. ආණ්ඩුවට එරෙහිව මෙවැනි විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීමට හේතු වුණේ ඇයි කියන එක, මේ ආණ්ඩුවට තවදුරටත් මේ රට පාලනය කරන්න, මහජනයාගේ වගකීම දරන්න අයිතියක් නැති බව තහවුරු කිරීම සඳහා පසුව එහි අඩංගු කරුණු උපයෝගි කර ගන්න මම බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප්‍රේල් මාසයේ 21වැනි දා - පාස්කු ඉරිදා- ප්‍රහාරය අපේ රටේ ජීවත් වන සියලු ජනතාවගේ හදවත් කම්පනයට ලක් කරන ලද ප්‍රහාරයක්. ඒ, අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර තිබුණු සමඟිය වෙනුවට, වෛරය, ක්‍රෝධය වර්ධනය වුණු අවස්ථාවක්. ඒ වාගේම, 21වැනි දා ප්‍රහාරය දියත් වුණේ, අපේ රටේ කිසිදු පන්නයේ ජාතිවාදයක් වර්ධනය කරන්න හෝ ජාතිවාදි දේශපාලනයක් නොකරපු, තමන්ගේ ආගමික කටයුතුවල යෙදුණු කණ්ඩායමක් වාගේම, හෝටල් පද්ධතියක සිටි කණ්ඩායමක් ඉලක්ක කරගෙනයි. ඒ සිද්ධිය නිසා 258කට ආසන්න පිරිසක් මිය ගොස් තිබෙනවා; 500කට ආසන්න පිරිසකට තුවාල සිදු වී තිබෙනවා; දේවස්ථානවලට, හෝටල් පද්ධතියට විශාල විනාශයක් සිදුවී තිබෙනවා; මුළු සමාජයම දෙදරා යන තත්ත්වයක් නිර්මාණය වී තිබෙනවා; රට තුළ විශාල අරාජිකත්වයක් නිර්මාණය වී තිබෙනවා; සමාජය තුළ එකිනෙකා අතර සැකය, කෝපය වර්ධනය වෙමින් තිබෙනවා. ඒ නිසා අප්‍රේල් මාසයේ 21වැනි දාට පෙර ලංකා ඉතිහාසයක් සහ අප්‍රේල් මාසයේ 21වැනි දාට පසු ලංකා ඉතිහාසයක් ලියැවෙන තත්ත්වයක් අද නිර්මාණය වී තිබෙනවා. හැබැයි, අප්‍රේල් මාසයේ 21වැනි දා අපේ සමාජය දෙදරවන, අපේ ඉතිහාසයේ ඉතාම ඛේදනීය බෙදීමක් ඇති කළ, ඒ සන්ධිස්ථානයේ වගකීම භාර ගන්නේ කවුද? එයට වගකිව යුත්තේ කවුද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට කලිනුත් කියා තිබෙනවා, මෙම ඝාතනයට අපරාධකරුවන් දෙදෙනකු සිටින බව.

එක් ප්‍රධාන අපරාධකරුවෙක් තමයි මෙම ඝාතනයට හවුල් වී තිබෙන, මෙම ප්‍රහාර එල්ල කිරීම සඳහා සැලසුම් කරන ලද, ඒ සැලසුම් දියත් කරන ලද, ප්‍රහාර එල්ල කරන ලද කණ්ඩායම. ඒ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්ත විමර්ශන ඒකකය විවිධ පරීක්ෂණ කර ගෙන යනවා. මෙම ප්‍රහාරවල සමහර අපරාධකරුවන් ඝාතනය වී සිටිනවා. අනෙක් අපරාධකරුවන් අත්අඩංගුවට අරගෙන නීතිය හමුවට පමුණුවමින් තිබෙනවා. එම නිසා එක් අපරාධ කණ්ඩායමකට නීතිය ක්‍රියාත්මක වෙමින් අත් අඩංගුවට ගැනීම් සිදු කරමින් එම අපරාධ කණ්ඩායමට ලබා දිය යුතු දඬුවම ලබා දීමට කටයුතු කරමින් තිබෙනවා. හැබැයි මෙහි අනෙක් අපරාධකරුවන් කවුද? මෙහි අනෙක් අපරාධකරුවන් තමයි -මම පසුව පැහැදිලිව ඒක ඔප්පු කරන්නම්- මෙම ඝාතන සිදු වෙන්න ඉඩදී තමන්ගේ වග කීම මුළුමනින්ම පැහැර හරින ලද, වළක්වා ගත හැකිව තිබුණු ප්‍රහාරය දියත් වෙන්නට ඉඩකඩ දී ජනාධිපති ධුරයේත්, අග්‍රාමාත්‍ය ධුරයේත්, කැබිනට් මණ්ඩලයේත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියටත් තිබෙන වග කීම් පිළිබඳව කිසිදු සැලකිල්ලකට භාජන නොකොට මේ සිදු වීම සිදුවන්නට, මෙම ඛේදවාචකය සිද්ධ වෙන්නට ඉඩ දී ඔහේ නිහඬව බලා සිටි ආණ්ඩුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කවුද ආණ්ඩුවට දඬුවම් දෙන්නේ? අප හමුවේ තිබෙන ප්‍රශ්නය ඒකයි. මේ අපරාධකරුවන්ට, නිශ්චිත ලෙස මේ ඝාතනවලට හවුල් වූ අපරාධකරුවන්ට දඬුවම් ලබාදීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තිබෙනවා නම්, නිශ්චිත ලෙස මෙම අපරාධකරුවන් වන අනෙක් කණ්ඩායමට -ආණ්ඩුවට- දඬුවම් ලබා දෙන්නේ කවුද? දෙසිය පණස්අට දෙනෙකුගේ ජීවිත, ඒ ජීවිතවල වග කීම් අත් හැරපු ආණ්ඩුවක්, රටේ ඛේදවාචකයක් නිර්මාණය වෙන්නට ඉඩ දී බලා සිටි ආණ්ඩුවක්, ජනතාවගේ ජීවිත පයට පැගෙන දූවිල්ලක් තරම්වත් ගණන් නොගන්නා ලද

[ගරු අනුර දිසානායක මහතා]

ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ. එම නිසා මේ ආණ්ඩුවට එරෙහිව ක්‍රියාත්මක විය යුතු නැද්ද? මේ ගැන අද ජනතාව කියන්නේ කුමක්ද? අද ජනතාව කියන්නේ, තවදුරටත් මේ ආණ්ඩුවට මේ රටේ ආරක්ෂාව පිළිබඳවත්, මහජනයාගේ ආරක්ෂාව පිළිබඳවත් වග කීම් උසුලන්නට යුක්තිසහගත අයිතියක් නැහැ කියන එකයි. එම නිසා ජනතාව ඉල්ලා සිටිනවා, මේ ආණ්ඩුව යවන්න, මේ ආණ්ඩුව අයින් කරන්න, ජනතාවට නව ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට අවස්ථාව ලබා දෙන්න කියලා. ඒකයි දැන් කරන්න තිබෙන්නේ.

මේ සභාවේ සිටින අග්‍රාමාත්‍යවරයාට හෝ මේ සභාව නියෝජනය නොකරන ජනාධිපතිවරයාට හෝ මේ රට පිළිබඳවත් මේ රටේ මහජනයා පිළිබඳවත් වග කීම් උසුලන්න යුක්තිසහගත අයිතියක් තිබෙනවාද? සදාචාරසම්පන්න අයිතියක් තිබෙනවාද? කිසිදු ආකාරයක යුක්තිසහගත හෝ සදාචාරසම්පන්න අයිතියක් මේ ආණ්ඩුවට තවදුරටත් නැහැ, අපේ රටේ මහජනයාගේ සහ රට පිළිබඳව වග කීම් උසුලන්න. එක සාධකයක් කියන්න, මෙන්න මේ නිසා අපි මහජනයා සහ රට පිළිබඳව වගකීමේ සහතිකය උසුලනවා, මෙන්න මේ නිසා අපි ආණ්ඩුව පාලනය කරනවා, මෙන්න මේ වුවමනාව නිසා අපි ආණ්ඩුව පාලනය කරනවා කියලා. ඒ විධියට තමුන්නාන්සේලාට කියන්න කිසිවක් නැහැ. තමුන්නාන්සේලා සෑම අතින්ම අසාර්ථකභාවයට පත් වෙච්ච ආණ්ඩුවක්. එම නිසා තවදුරටත් තමුන්නාන්සේලාට ඔය පැත්තේ වාඩි වෙලා මේ රටේ ආණ්ඩු කරන්න, මහජනයා පිළිබඳ වගකීමක් උසුලන්න, රට පිළිබඳ වගකීමක් උසුලන්න අයිතියක් නැහැ. එයයි මහජනයාගේ යෝජනාව.

මේ ආණ්ඩුව පලවා හැරීම සඳහා මහජනයාට ලැබෙන අවස්ථාව සහ මේ ආණ්ඩුව මහජනයා පිළිබඳව තිබෙන වගකීමෙන් සහ රට පිළිබඳව තිබෙන වගකීමෙන් ඉවත් කිරීම සඳහා තිබෙන අවස්ථාව කුමක්ද? මැතිවරණයකදී මහජනයාට ඒ සඳහා අවස්ථාවක් ලැබෙනවා. හැබැයි මැතිවරණයක් එනතෙක් -එක් මැතිවරණයක සිට අනෙක් මැතිවරණය දක්වා- ආණ්ඩුවක් පලවා හැරීමට, ආණ්ඩුවක් ඉවත් කිරීමට බලයක් තිබෙනවා මේ පාර්ලිමේන්තුවට. අන්න ඒ බලය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ නියෝජනය කරනු ලබන්නේ. ජනතාවට මේ ආණ්ඩුව පිළිබඳ කවර කළකිරීම් තිබුණත්, ජනතාවට මේ ආණ්ඩුව නෙරපීම සඳහා කවර වුවමනාවක් තිබුණත්, ජනතාවට මේ ආණ්ඩුව පිළිබඳව මුළු විශ්වාසය බිඳ වැටී තිබුණත්, ජනතාවගේ ආරක්ෂකයා හා ඔවුන් පිළිබඳ වග කීම දරන්නා බවට මේ ආණ්ඩුව නුසුදුසුකම් ලබා තිබුණත්, ජනතාවට අවස්ථාවක් නැහැ මේ ආණ්ඩුව වෙනස් කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණයක සිට අනෙක් මැතිවරණය දක්වා කාලයේ ඒ අවස්ථාව තිබෙන්නේ පාර්ලිමේන්තුවට. අන්න ඒ පාර්ලිමේන්තුවට ලැබී තිබෙන බලය නියෝජනය කරමින් තමයි අපි මේ විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කරන්නේ. ඒ අන් කවරක්වත් නිසා නොවෙයි, මහජනයා පිළිබඳවත් මේ රට පිළිබඳවත් වග කීම උසුලන්න කිසිදු සදාචාරාත්මක අයිතියක් හෝ යුක්තිසහගත අයිතියක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට නැති නිසා.

ඒ නිසා දැන් කළ යුතු වන්නේ මේ ආණ්ඩුව පරාජයට පත් කිරීමයි. එහි අනික් අන්තය ගත්තොත්, මේ ආණ්ඩුව පරාජයට පත්කර කවර වර්ගයේ හෝ ආණ්ඩුවක් මෙම පාර්ලිමේන්තුවේ අටවා ගැනීමත් සුදුසු නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව පරාජයට පත් කරලා, නැවත මේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් හරහා පාර්ලිමේන්තු මැතිවරණයක් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතුයි කියන එකයි අපේ යෝජනාව වන්නේ. එය තමයි, අපේ රටට, අපේ රටේ ජනතාවට අප විසින් ඉටු කළ යුතු යුක්ති සහගතම අවස්ථාව සහ දේශපාලනය. මේ ආණ්ඩුව පරාද කරන්න ඕනෑ. ජනතාවට නව ආණ්ඩුවක් පිහිටුවා ගැනීම සඳහා අවශ්‍ය මැතිවරණයක් ලබා දිය යුතුයි. ඒ නිසා මේ කරුණු දෙක එකට බද්ධ වෙලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වාස භංග යෝජනාවේ කරුණු පිළිබඳව සාකච්ඡා කරන්න පෙර මා මේ කාරණයත් කියන්න කැමතියි. මේ විශ්වාස භංග යෝජනාවත් එක්ක අපේ රටේ දේශපාලනයේ බොහෝ දේවල් කථා වෙන්න පටන් ගත්තා. එකක් තමයි, "මෙය ආණ්ඩුව ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන එන ලද විශ්වාස භංග යෝජනාවක්" කියලා කියන්න පටන් ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිදුවීම පිළිබඳවත්, මේ සිදුවීමේ ඇතුළාන්තය දෙස බැලුවාමත් ඉතාම පැහැදිලිව තිබෙනවා, මේ සිදුවීමට නිශ්චිත වගඋත්තරකරුවෙකු බවට ආණ්ඩුව පත් වන එක. ඒ නිසා අපේ අභිප්‍රාය -ඉලක්කය- බවට පත් වී තිබෙන්නේ අන්න ඒ නිශ්චිත වගකිව යුත්තාට -නිශ්චිත අපරාධකරුවාට- පාර්ලිමේන්තුව ඇතුළේ ලබා දිය යුතු දඬුවම, මේ රටේ ජනතාව අපේක්ෂා කරන දඬුවම ලබා දීමයි. ඒ වෙනුවෙන් තමයි අපි ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවේ. අපි මෙතැනදී වලිග අල්ලන්න ගියේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහර අය ප්‍රධාන තැන බේරලා, වලිග අල්ලන්න කටයුතු කරලා සතුටක් ලබනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වලිග අල්ලනවා වෙනුවට නිශ්චිත ලෙස මෙහි වග කිව යුතු ආණ්ඩුවට විරුද්ධව අපි විශ්වාස භංග යෝජනාව ගෙනාවා. ඒක තමයි පළමුවැනි කාරණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කාරණය මෙයයි. බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව කෝප් කමිටුවේ පරීක්ෂණ පැවැත්වෙන කොට සමහර මන්ත්‍රීවරු මෙන්න මේ හරියේ ඉඳගෙන කෑ ගැහුවා අපට මතකයි, "කෝප් කමිටුවේ ජනතා විමුක්ති පෙරමුණේ කාර්යභාරය බැඳුම්කර ගනුදෙනුවේ වංචනිකයන් කහ වතුරින් සෝදා පිරිසිදු කිරීමද?" කියලා. අපි ඒවා එතරම් සැලකිල්ලට ලක් කරන්නේ නැහැ. එදා කොච්චර දැඟලුවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ස්ථිර ලෙස කෝප් කමිටුව ඇතුළේ ඉතා හොඳින් තහවුරු කොට ඔප්පු කොට තිබුණා, මහ බැංකු බැඳුම්කරයට ආණ්ඩු පාර්ශ්වයේ අග්‍රාමාත්‍යවරයා, මහ බැංකු අධිපතිවරයා සහ අනික් කණ්ඩායම් තිබෙන බැඳියාව පිළිබඳව. එලෙස පෙන්නුම් කරපු දේශපාලන ව්‍යාපාරයක් තමයි අපේ දේශපාලන ව්‍යාපාරය. "ඔක්තෝබර් මාසයේ 26වැනි දා මේ ආණ්ඩුව පරාද කළා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා නව ආණ්ඩුවක් හැදුවා. ඒ වෙලාවේ ඒක වළක්වලා, දැන් ආණ්ඩුව පරාද කරන්න යෝජනාවක් ගෙන එන එක සාධාරණ නැහැ" කියලා සමහර අය කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔක්තෝබර් මාසයේ 26වැනි දා අපි කළේ අන් කවරක්වත් නොවෙයි. මැතිවරණයකින් පසුව ජනාධිපතිවරයා සහ ජනතාව අතර තිබෙන බැඳීම, ජනාධිපතිවරයා සහ ජනතාව අතර තිබෙන ගිවිසුම, ජනාධිපතිවරයා සහ ජනතාව අතර තිබෙන එකඟතාව තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ඔක්තෝබර් මාසයේ 26වැනි දා සිද්ධ වුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනාධිපතිවරයා විසින් හිතුවක්කාරි හා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ලෙස උල්ලංඝනය කිරීමයි. ජනතා විමුක්ති පෙරමුණ පෙනී හිටියේ අන්න ඒ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාමාර්ගයට එරෙහිවයි. මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ හිටියා නම් "අද

ඔබතුමා ඒ ගැන මොකක්ද කියන්නේ?" කියා මම අද එතුමාගෙන් අහන්න හිතාගෙන හිටියා. ඔක්තෝබර් මාසයේ 26වැනි දා සිදු වුණේ වැරැද්දක් කියලා විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා පිළිගන්නවා ඇති කියා මා විශ්වාස කරනවා. එතුමා අද එහෙම පිළිගනීවි කියා මා විශ්වාස කරනවා. ඒ ඇයි? එය, ව්‍යවස්ථා විරෝධී ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වුවක් බවට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් හත් දෙනෙකු විසින් තීන්දුවක් ලබා දීලා තිබෙන නිසා. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණේ එදා මේ පාර්ලිමේන්තුවේ ප්‍රවේශය වෙලා තිබුණේ ඒ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාමාර්ගයට එරෙහිවයි. නමුත් අද? අද තිබෙන්නේ අන් කවරක්වත් නොවෙයි. මේ ආණ්ඩුවට එරෙහිව ව්‍යවස්ථානුකූලව මේ පාර්ලිමේන්තුව ඇතුළේ ගෙන ආ හැකි, ගෙනා යුතු යෝජනාව තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුවේ තිලක් මාරපන අමාත්‍යවරයා නීතිය හා සාමය අමාත්‍ය ධුරය දරන කොට මේ පාර්ලිමේන්තුවේදී ඇවන්ට් ගාර්ඩ් ගනුදෙනුව පිළිබඳව දවසක විවාදයක් පැවැත්වූවා අපට මතකයි. රටට අහිමි වූ මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 1,120ක් බවත්, එය මහජනයාට අයිති ධනයක් බවත්, හිටපු ආරක්ෂක ලේකම්වරයාට හා තමන්ගේ ගජ මිතුරන්ට සුවසේ මුදල් එක් රැස් කර ගන්න ලබා දී තිබෙන බවත් අප මේ පාර්ලිමේන්තුවේදී පෙන්වා දීලා, දවසක විවාදයක් පැවැත්වූවා.

ඒ විවාදයේ දී තිලක් මාරපන අමාත්‍යවරයා පෙනී සිටියේ මහජනයාගේ ධනය වෙනුවෙන් නොවෙයි, ඇවන්ගාර්ඩ්ගේ ධනය වෙනුවෙන්. අන්න ඒ සම්බන්ධව, එතුමා කරන ලද ප්‍රකාශයක් සම්බන්ධව අපි මේ පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළා. අන්න ඒ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවේ විවාද කරන්න කලින් තිලක් මාරපන අමාත්‍යවරයා ඉල්ලා අස් වුණා. ඒක හොඳයි.

ඊළඟට, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමේ හා විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ රවි කරුණානායක අමාත්‍යවරයා මුදල් අමාත්‍යවරයා එම ගනුදෙනුවේදී එතුමාට තිබුණ දායකත්වය, එම ගනුදෙනුව හරහා එතුමා උපයාගෙන තිබෙන ධනය, එම ගනුදෙනුවෙන් එතුමාට ලැබුණු වරප්‍රසාද පිළිබඳව විශාල තොරතුරු ප්‍රමාණයක් හෙළිදරව් වෙන්න පටන් ගත්තා. අන්න එහිදී විපක්ෂය විසින් රවි කරුණානායක අමාත්‍යවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. එතුමාත් ඒ විශ්වාස භංග යෝජනාවට මුහුණ දෙන්නේ නැතිව අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් වුණා.

ඊට පස්සේ, ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. මා හිතන හැටියට ඒ විශ්වාස භංග යෝජනාව පරාජයට පත් වුණා. ඒ නිසා විශ්වාස භංගවලටත් ඉතිහාසයක් තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන අවස්ථාව කලින් ගෙනා හැම විශ්වාස භංග යෝජනාවකටම වඩා විශේෂ අවස්ථාවක් කියලා. ඒ අවස්ථාව තමයි, දැන් තිබෙන්නේ සුළුතර ආණ්ඩුවක් වීම. දැන් සුළුතර ආණ්ඩුවක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව පැත්තේ වාඩි වෙලා ඉන්නේ මන්ත්‍රීවරු 106 දෙනයි. අද ආණ්ඩුවට එරෙහිව විපක්ෂයේ වාඩිවී සිටිනවා මන්ත්‍රීවරු 118දෙනෙක්. ඒ නිසා නිශ්චිත ලෙස සුළුතරයක් වන ආණ්ඩුවට විරුද්ධව තමයි මේ අවස්ථාවේ මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ආණ්ඩුව පැත්තේ වාඩි වෙලා ඉන්නේ 106 දෙනයි. විපක්ෂයේ 118දෙනෙක් වාඩි වී සිටිනවා. මා හිතන විදියට මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා අද නායකත්වය දෙන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රී කණ්ඩායමට. එම මන්ත්‍රී කණ්ඩායමට එතුමා නායකත්වය දෙන්නේ නැත්නම් එතුමාට විපක්ෂ නායක ධුරය හිමි වෙන්නේ නැහැ, පාර්ලිමේන්තුවේ පසුගිය කාලය පුරාවටම සිද්ධ වූ සංවාද අනුව. ඒ නිසා මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා විපක්ෂ නායක ධුරය හොබවන්නේ එතුමාගේ මන්ත්‍රී කණ්ඩායමේ නායකයා ලෙසයි. ඒ වාගේම, පසුගිය ඔක්තෝබර් 26වැනි දා එතුමා කුමන්ත්‍රණය සාර්ථක කර ගැනීම වෙනුවෙන් එතුමා මන්ත්‍රීවරු ගණනාවක් මිලදී ගත්තා. මම දන්නේ නැහැ ඒ ගත්තේ කොහොමද කියලා. ඒක වෙනම දෙයක්. කොහොම හරි ගත්තා. ඒ මන්ත්‍රීවරු කණ්ඩායම පිළිබඳව වගකීම තිබෙන්නේත් එතුමාට. ඒ නිසා විපක්ෂ නායකවරයා හැටියට එතුමා නායකත්වය දෙන මන්ත්‍රී කණ්ඩායමටත්, ඔක්තෝබර් මාසයේ 26වැනි දාට පසුව එතුමා ගන්නා ලද මන්ත්‍රීවරුන්ටත් නායකත්වය ලබා දෙනවා නම්, එතුමාගේ සියලු මන්ත්‍රීවරු හෙට පාර්ලිමේන්තුවට ආ යුතුව තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කරපු සම්පන්දන් මහත්මයාගේ දේශපාලන ව්‍යාපාරයත් තිබෙනවා. එතැන මන්ත්‍රීවරු, -[බාධා කිරීමක්]- ඒක ඔබතුමානේ දන්නේ. "ආ! රංගෙ අද එනවා ද, නැද්ද" කියලා ඔය වාගේ අයට තමයි කෝල් එන්නේ. අපට එන්නේ නැහැ. ඒක මතක තියා ගන්න. එහෙට මෙහෙට විකිණෙන බඩුවලට කෝල් එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියමින් සිටියේ සම්පන්දන් මහත්මයා පසුගිය කාලය පුරාවට විවිධ අවස්ථාවල දී මේ ආණ්ඩුවේ ආරක්ෂාව වෙනුවෙන් ඡන්දය ලබාදී තිබෙන බවයි. ඒක ඇත්ත. හැබැයි අපි දෙමළ ජාතික සන්ධානයෙන් අහනවා, නිශ්චිත ලෙස අපරාධකරුවන් අපේ ඇස් ඉදිරිපිට සිටියදී, ජාතිවාදී දේශපාලනය වර්ධනය වෙන්න ඉඩ කඩ ලබාදී තිබියදී, සියලු ජනයාගේ ආරක්ෂාව පිළිබඳව තැති ගැන්මක් නිර්මාණය කරලා තිබියදී, නිශ්චිත ලෙස මේ ප්‍රහාරයේ වග උත්තරකරුවන් බවට ආණ්ඩුව පැහැදිලිව හඳුනාගෙන තිබියදී, පාර්ලිමේන්තුව විසින් පත්කර තිබෙන විශේෂ කාරක සභාව නියෝජනය කරන දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයකු වන සුමන්තිරන් මහත්මයාට අවබෝධ වන කරුණු අනුව, -එතුමා ඒ කාරක සභාවේ ඉන්නවා; ප්‍රශ්න කරනවා.- මම අහන්නේ එක දෙයයි. මේ විශ්වාස භංග යෝජනාවේ දී දෙමළ ජාතික සන්ධානයට නිහඬව සිටිය හැකිද? එතුමන්ලා සැබවින්ම උතුරේ දේශපාලනය නියෝජනය කරනවා නම්, එතුමන්ලා සැබවින්ම ජනතාවගේ දේශපාලනය නියෝජනය කරමින් ඉන්නවා නම්, එතුමල්ලා සැබවින්ම ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටිනවා නම්, මේ විශ්වාස භංගයට සහාය දීම මඟ හරින්න දෙමළ ජාතික සන්ධානයට කිසිසේත්ම අයිතියක් නැහැ.

ඊළඟට, අපි. අපි මේ විශ්වාස භංගය ඉදිරිපත් කරපු අය. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ සංයුතිය ඉතා හොඳින් මැන බැලුවොත් මෙය ජයග්‍රහණය කරන්න පුළුවන් විශ්වාස භංග යෝජනාවක් කියලා අපි විශ්වාස කරනවා. වෙනත් යටි ගනුදෙනු, යටි වුවමනා , යටි දේශපාලන ගේම් නැත්නම් මෙය ජයග්‍රහණය කළ හැකි විශ්වාස භංගයක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම විශ්වාසයෙන් යුතුව තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. සමහර අය අපෙන් අහනවා, මේ පිළිබඳව මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක ඔයගොල්ලන් සාකච්ඡා කළාද, නැද්ද කියලා. මහින්ද අමරවීර විපක්ෂයේ සංවිධායකතුමා එළියේදී මගෙන් ඇහුවා, ඔබතුමන්ලා අපිත් එක්ක මේක ගැන කථා කළේ නැහැ නේද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයේදී අපි කිසිවෙකු එක්ක කාමර අස්සේ කුටු කුටු ගාන්න සූදානම් නැහැ. මේ ප්‍රශ්නය අපි සාකච්ඡා කළ යුතු වන්නේ, කාමර අස්සේ නොවෙයි. මෙය කාමර අස්සේ සාකච්ඡා කළ යුතු ප්‍රශ්නයක් නොවෙයි. මේක මහ ජනයාගේ ආරක්ෂාව පිළිබඳවත්, ජීවිත සිය ගණනක් පිළිබඳවත්, රටේ අරාජිකත්වය පිළිබඳවත්, අපේ

[ගරු අනුර දිසානායක මහතා]

ආර්ථිකයට කරන ලද ප්‍රහාරය පිළිබඳවත් මේ සභා ගර්භය ඇතුළේ සාකච්ඡා කළ යුතු කරුණක්. ඒ නිසා තමයි අපි විශ්වාසභංග යෝජනාවක් ගෙනාවේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් විශ්වාසභංග යෝජනාවක් ගෙනාපුවාම මාධ්‍යවල ලොකු ප්‍රවෘත්ති නිර්මාණය වනවා. "එයා පනිනවා. මෙයා පනිනවා. අරයා ගන්න හදනවා. එයාට ඇමතිකමක් දෙනවා කිව්වා. මෙයාට සල්ලි දෙනවා කිව්වා. දැන් හරි. 106 හරි. අංක හරි" ඒ වාගේ විශාල ලෙස විගඩම්කාරී ජවනිකා නිර්මාණය වෙනවා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ ඒ විගඩම්කාරී ජවනිකාවලට මේ විශ්වාසභංග යෝජනාවේදී ඉඩ දෙන්නේ නැහැ. අපේ සූදානම බවට පත්වී තිබුණේ මොකක්ද?

සැබැවින්ම විපක්ෂ නායකවරයා හැටියට මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රටේ ජනතාවගේ ජන මතයක් නියෝජනය කරනවා නම් එතුමාගේ වගකීම තමයි, එතුමා මන්ත්‍රීවරු කණ්ඩායම නිශ්චිත පරිදි පාර්ලිමේන්තුවට කැඳවා මෙම විශ්වාසභංග යෝජනාවට සහාය ලබා දීම. ඒක එතුමාගේ වගකීම. එය එතුමා සහ අපි අතර කෙරෙන අභ්‍යන්තර සාකච්ඡාවක ප්‍රතිඵලයක් විය යුතු නැහැ. ඒක එතුමා විසින් කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. එතුමාගේ කණ්ඩායමේ සිටින යම් යම් අය මේ පිළිබඳව කටු කුටු ගාමින් හිටියත් එතුමා ප්‍රකාශයට පත් කරලා තිබුණා, මේ විශ්වාස භංග යෝජනාවට සහාය පළ කරන බව. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වනවා. මම එතුමාගෙන් දැන් ඉල්ලා සිටින්නේ අන් කවරක්වත් නොවෙයි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ මන්ත්‍රීවරු සියලුදෙනාම හෙට දිනයේ පාර්ලිමේන්තුවට කැඳවන්න.

ඒ වාගේම දෙමළ ජාතික සන්ධානයෙනුත් අපි ඉල්ලා සිටින්නේ අන් කවරක්වත් නොවෙයි. අපට කාමර අස්සේ ගිහිල්ලා කථා කරන්න දෙයක් නැහැ. අපි දෙමළ ජාතික සන්ධානයෙන් ඉල්ලා සිටින්නේ, මේ අපරාධයේ වග උත්තරකරුවන් ආණ්ඩුව බවට නිශ්චිතව හෙළිදරව් වී තිබියදී මේ විශ්වාස භංග යෝජනාව මඟ හරින්න, එහෙම නැත්නම් ආණ්ඩුව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඡන්දය දෙන්න දෙමළ ජාතික සන්ධානයට ශුද්ධ වූ අයිතියක්වත් නැති බව මා දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය සුළුතර ආණ්ඩුවකට එරෙහිව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාවක්. ආණ්ඩුවක් කරන්න තමුන්නාන්සේලාට තිබෙන සදාචාරාත්මක අයිතිය මොකක්ද? මන්ත්‍රීවරු 106 දෙනායි ඉන්නේ. අද ආර්ථිකය කඩා වට්ටලා තිබෙනවා. හොරකම්වලින් ගහන වෙච්ච රාජ්‍යයක් බවට පත් කරලා තිබෙනවා. දයා ගමගේ ඇමතිවරයා කියනවා, "ලක්ෂ 3000 කජ්ජක්ද" කියලා. මෙය කෝටි, ප්‍රකෝටි ගණන් හොරකම් කරන්න ලෑස්ති වෙච්ච පාලනයක්. ජාත්‍යන්තරය හමුවේ විවිධ ගිවිසුම් ගහමින්, රටේ ආර්ථිකයත්, රටේ ස්වාධීනත්වයත් පාවා දෙමින් තිබෙන ආණ්ඩුවක්. කිසිදු දැක්මක් හෝ සැලැස්මක් නැතිව ඉබාගාතේ රටක් දුවවන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වී තිබෙනවා. බහුතරයක් නැතිවයි අද රට පාලනය කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ බහුතරය විතරක් නොවෙයි නැත්තේ. මේ ආණ්ඩුවට ජනතාවගේ බහුතරයකුත් නැති බව මම සහතික කරනවා. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදීන් නම්, සැබෑ ජනතා මතයට ගරු කරනවා නම්, විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න පෙර ආණ්ඩුවට යෝජනාවක් ගෙනෙන්න තිබුණා, පාර්ලිමේන්තුව විසුරුවා හැර, ජනතා මතය අහන්න. අපි කියන්නේ ඒක. ජනතාව ළඟට ගිහින් ජන මතය අහන්න. තවදුරටත් ආණ්ඩුවක් කරන එක, කොපමණ නිර්ලජ්ජිත ක්‍රියාවක්ද? ඒ සඳහා තමුන්නාන්සේලාට මොකක්ද තිබෙන අයිතිය? තමුන්නාන්සේලාට ආණ්ඩුවක් කරන්න අයිතියක් නැති බව මතක තබා ගන්න. මොකක්ද තිබෙන අයිතිය? මොනවාද කරලා තිබෙන්නේ? මොන එකඟතා රැකලා තිබෙන්නේ? තවදුරටත් රට පාලනය කරන්න සියලු ආකාරයෙන් නුසුදුසුකම් ලබපු පාලනයකට විරුද්ධව තමයි අපි මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාවේ දී අපි නිශ්චිත ලෙස කරුණු කැටි කරලා තිබෙනවා. අපි ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාවෙන් ඉතා පැහැදිලි ලෙස කියනවා, "වර්ෂ 2019 අප්‍රේල් 21 වැනි පාස්කු ඉරිදා කොළඹ, මීගමුව සහ මඩකලපුව යන ප්‍රදේශවල සිදු වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ඇතුළු දෙසිය පනහකට අධික පිරිසක් ඝාතනය වීමත්, තවත් පන්සියයකට ආසන්න පිරිසක් තුවාල ලැබීමත් සහ එකී බෝම්බ ප්‍රහාර හේතුවෙන් වූ දේපළ හානිය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් නිසි තොරතුරු ලැබී තිබියදී සාපරාධී නොසැලකිල්ලෙන් පහත සඳහන් කෙරෙන ක්‍රියා කරමින් හෝ නොකර හැරීමෙන් එම ප්‍රහාර සිදු වුණා" කියලා. තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ සාපරාධී ක්‍රියාවක්. ඇයි මා එහෙම කියන්නේ? තමුන්නාන්සේලාට ඒ පිළිබඳ නිසි පරිදි තොරතුරු ලැබිලා තිබෙනවා. මම තමුන්නාන්සේට එකින් එක කියන්නම්.

2019.05.08 වැනි දා මේ පාර්ලිමේන්තුවේදී මා අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්නයක් විමසා සිටියා. මම විමසුවා, "ISIS සංවිධානය වැනි ජාත්‍යන්තර ත්‍රස්ත සංවිධාන මේ රටේ ක්‍රියාත්මක වෙමින් තිබෙන බව දැන සිටියාද? දැන සිටියා නම්, ඒ කවර දිනක සිටද?" කියලා. මොකක්ද අග්‍රාමාත්‍යවරයා එවා තිබුණු පිළිතුරේ තිබුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019.05.08 හැන්සාඩ් වාර්තාව බලන්න. 2019.05.08 වැනි දා හැන්සාඩ් වාර්තාවේ එය නිශ්චිත ලෙස මා සඳහන් කර තිබෙනවා. අග්‍රාමාත්‍යවරයාගේ පිළිතුරේ තිබුණා, "2014 වර්ෂයේ සිට මෙවැනි ජාත්‍යන්තර ත්‍රස්ත සංවිධානයක් එක්ක සබඳතා තිබෙන කණ්ඩායමක් ලංකාවේ ක්‍රියාත්මක වෙමින් තිබෙන බව දැනගෙන සිටියා" කියලා. 2014 සිට මෙවැනි ප්‍රශ්නයක් සිදු වෙමින් තිබෙන බව මේ ආණ්ඩුව දැනගෙන සිටියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව එය දැනගෙන සිටියේ නැහැ කියා අපි උපකල්පනය කරමු හැබැයි, අපි දන්නවා මුස්ලිම් ජනතාවගේ විවිධ සංවිධාන මේ පිළිබඳව නිශ්චිත ලෙස පැමිණිලි ඉදිරිපත් කර තිබූ බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තිබෙනවා, B.J.M. Road, Kattankudy ලිපිනය දරන Alhaj Abdul Jawaadh Aalim Waliyyullah Trust එක ජනාධිපතිවරයාට, අග්‍රාමාත්‍යවරයාට, පොලීසිය භාර අමාත්‍යවරයාට, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පැමිණිල්ල ඉදිරිපත් කර තිබෙන්නේ, 2017.03.27වන දිනයි. මොකක්ද මේ පැමිණිල්ලෙන් කියන්නේ? මේ පැමිණිල්ලේ ඉතා පැහැදිලි ලෙස සඳහන් කර තිබෙනවා, "කාත්තන්කුඩිය ප්‍රධාන කර ගනිමින් පවත්වාගෙන යන තවුහීත් ජමාත් සංවිධානයත්- 296, F.C. Road, New Kattankudy 03 යන ඉස්ලාමීය මූලධර්මවාදී අන්තවාදී සංවිධානයේ ප්‍රචාරකයා වන මවුලවි එච්.එම්.එම්. සහරාන් ... යන අය විසින් ප්‍රචාරය කරනු ලබන ධර්මයේ ඇති ප්‍රචණ්ඩ සාමකාමී ක්‍රියාව ඉස්ලාම් ධර්මයට පටහැනි බවත්, එය වෙනත් ආගමික ප්‍රතිපත්තියක් බවත් ප්‍රචාරය කරන අතර..." යනුවෙන්.

ඔහු මෙසේ සඳහන් කරන බව ද කියනවා.

"ඉස්ලාම් ධර්මය සාමයට අයත් ධර්මයක් නොව කඩුවට අයත් ධර්මයකි. මුස්ලිම් ධර්මයට අයත් නොවන අය මරා දැමිය යුතුය.

මුස්ලිම් ධර්මයට අයත් නොවන අය සමඟ එකමුතුව නොසිටිය යුතුය. ආයුධවලින්, මුස්ලිම් නොවන අයගේ ආර්ථිකය මංකොල්ල කෑ යුතුය. දේශප්‍රේමය යනු ඉස්ලාම් පාලනයට හානිකරය. මව් රටට ආදරය කරන්නා මුස්ලිම් නොවේ. ශ්‍රී ලංකා ජාතික කොඩිය එසවීම ඉස්ලාම් පාලනයට හානිදායකය. ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ධර්මයේ කොඩිය එසවිය යුතුය. ශ්‍රී ලංකාව මුස්ලිම්වරුන්ගේ රටක් නොවන බැවින් එය මුස්ලිම්වරුන් අත් පත් කර ගත යුතු ය. ශ්‍රී ලංකාව මුස්ලිම් රටක් ලෙස වෙනස් වන දිනට මුස්ලිම්වරුන්ට නිදහස ලැබේ."

කවුද මෙහෙම කියන්නේ? සහරාන්ලා මෙවැනි දේශන පවත්වන බව මේ සංවිධානය විසින් නිශ්චිත වශයෙන් ආණ්ඩුවට දැනුම් දෙනවා. මුස්ලිම් ජනතාව විසින් තමයි එය දැනුම් දෙන්නේ. ඒ, 2017 වර්ෂයේදියි. "මෙවැනි නොයෙක් අන්තවාදි අදහස් මවුලවි සහරාන් යන අය විසින් ප්‍රචාරය කරනු ලබයි. මේ රටේ ජාතික එකමුතුභාවයට හා සාමයට ඉතාමත් හානිදායක වෙයි." කියා එහි තවදුරටත් සඳහන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තොරතුරු මුස්ලිම් ජනතාව විසින් ජනාධිපතිවරයා වෙත යොමු කරනවා; අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරනවා; ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙත යොමු කරනවා; පොලීසිය භාර අමාත්‍යවරයා වෙත යොමු කරනවා. ඒ සම්බන්ධයෙන් මොකක්ද කර තිබෙන්නේ? අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් පිළිතුරු ලිපියක් ලැබිලා තිබෙනවා, "ලිපිය ලැබුණා. බොහොම ස්තුතියි" කියලා. එච්චරයි! "ලිපිය ලැබුණා. බොහොම ස්තුතියි." කියලා පිළිතුරු ලැබී තිබෙනවා. මේ කාරණා තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ ජන කොට්ඨාසය ඇතුළේ මෙවැනි විනාශකාරි, ව්‍යසනකාරි මතවාද පතුරවමින් තිබෙනවා, මේ තමයි ඒ කණ්ඩායම, ඒ කණ්ඩායම කියන්නේ මේවායි, මේක රටේ අනාගතයටත්, ජාතික එකමුතුභාවයටත්, මහ ජනයාගේ ආරක්ෂාවටත් තර්ජනයක් කියලා කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන මුස්ලිම් ජනතාව කියන කොට ආණ්ඩුව මොකක්ද කිව්වේ? අගමැති කාර්යාලයෙන් ලියුමක් යවනවා, "බොහොම ස්තුතියි" කියලා. මේකට ද ආණ්ඩුවක් හදලා තිබෙන්නේ? තමුන්නාන්සේලාගෙන් තමයි අප මේ ප්‍රශ්නය අහන්නේ. ජනාධිපති කාර්යාලයෙන් උත්තරයක්වත් නැහැ. මේකටද ආණ්ඩුවක් හදා තිබෙන්නේ? මේකටද ජනාධිපති ඒ පුටුවේ වාඩි කරවා තිබෙන්නේ? 2017 තුන්වන මාසයේ 27වන දා තමයි මේ ලිපිය යොමු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ විශ්වාසභංග යෝජනාවේ සඳහන් කරනවා, "විවිධ ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන මුස්ලිම් සමාජය තුළ ක්‍රියාත්මක වන බවට මුස්ලිම් ප්‍රජාව විසින්ම විවිධාකාරයෙන් ආණ්ඩුව සහ වග කිවයුතු ආයතන දැනුවත් කර තිබියදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම;" කියන කාරණය. ආණ්ඩුව අපොහොසත් වෙලා නැද්ද? තමුන්නාන්සේලා කාට හෝ නැඟිටලා කියන්න පුළුවන් ද, "නැහැ, අපි සමත් වුණා." කියලා. මට ඒ ගැන කියන්න. හෙට මේ ආණ්ඩුව වෙනුවෙන් අත ඔසවන්න බලාගෙන සිටින අයගෙන් මා අහනවා, "ජනතාව එවැනි කරුණක් කියා තිබියදී අපි අපොහොසත් වුණේ නැහැ. අපි පොහොසත් වුණා. අපි වැඩේ කළා" කියලා කාට හෝ නැඟිටලා කියන්න පුළුවන් ද?" කියලා. පුළුවන් නම් කියන්න, අපි මේ යෝජනාව අයින් කර ගන්නම්. "අපි මෙහෙම ක්‍රියා මාර්ග ගත්තා" කියලා කියන්න. නමුත් තමුන්නාන්සේලා කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. මතක තබා ගන්න. ජනතාව විසින් නිසි පරිදි මේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු ලබා දී තිබියදී තමුන්නාන්සේලා නිද්‍රාශීලිව සිටියා.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම විශ්වාස භංග යෝජනාවේ (ඇ) කියන කොටසෙන් අපි ඉදිරිපත් කර තිබෙන කාරණය බලන්න. මම එය කියවන්නම්:

> "කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විවිධ අවස්ථාවලදී එල්ල කරන ලද තර්ජන සහ ප්‍රහාර සම්බන්ධයෙන් 2019 අප්‍රේල් මාසයේ 21 වැනි දින බෝම්බ පුපුරවාගෙන මිය ගිය සහරාන් හෂීම් සහ 2019 අප්‍රේල් මාසයේ 26 වැනි දින සයින්දමරුදූහිදී බෝම්බ පුපුරවාගෙන මිය ගිය ඒ.එල්.එම්. නියාස් යන අයට විරුද්ධව අධිකරණය විසින් වරෙන්තු නිකුත් කර තිබියදී සහ එකී වරෙන්තුකරුවන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ප්‍රසිද්ධියේ විවිධ ක්‍රියාකාරකම්වල යෙදී සිටියදී ඔවුන් අත් අඩංගුවට ගැනීමට හෝ නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම;"

කාත්තන්කුඩි ප්‍රදේශයේ ඇති වූ සිද්ධියක් හේතු කොටගෙන,- මේ හේතුව නිසාමයි ඒ ගැටුම ඇති වුණේ.- ආගමික අන්තවාදීන් අතර ගැටුමක් නිර්මාණය වුණා. එම ගැටුම සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිල්ලක් තිබුණා. එම පැමිණිල්ල අධිකරණයට ගොනු කර තිබුණා. ඒ අය අධිකරණය මඟහරිමින් සිටියා. අධිකරණය වරෙන්තු නිකුත් කර තිබුණා. හැබැයි, තමුන්නාන්සේලා ඔවුන් අත් අඩංගුවට ගැනීමට කටයුතු කළේ නැහැ. බුද්ධි අංශ වාර්තා මා ළඟ තිබෙනවා. ඒ සෑම වාර්තාවකම සහරාන්ලා ගැවසෙන තැන් සියල්ල සඳහන් වී තිබෙනවා. නමුත්, තමුන්නාන්සේලා එම වරෙන්තුකරුවන්ට, ඒ අපරාධකරුවන්ට නිදැල්ලේ හැසිරෙන්න අවස්ථාව දීලා තිබුණා. මම අහන්න කැමැතියි, තමුන්නාන්සේලා ඒකට වරදකරුවන් නොවෙයිද කියලා? නැත්නම් නිවැරැදිකරුවෝද? ඒක මට කියන්න. ආණ්ඩුව වෙනුවෙන් අත ඔසවන්න නේ, බලාගෙන ඉන්නේ. "නැහැ, නැහැ, එතැන ගැටුමක් තිබුණා, ඒ අයට වරෙන්තු නිකුත් කර තිබුණා, අත් අඩංගුවට ගන්න මෙහෙයුමක් තිබුණා, අපි ඒ මෙහෙයුම දියත් කර තිබුණා" කියලා තමුන්නාන්සේලාට නැඟිටලා කියන්න පුළුවන්ද? ආරක්ෂක ඇමතිවරයාට එහෙම කියන්න පුළුවන්ද? අග්‍රාමාත්‍යවරයාට කියන්න පුළුවන්ද? තමුන්නාන්සේලා ඒ අපරාධකරුවන්ට නිදැල්ලේ වර්ධනය වෙන්න ඉඩ දුන්නා. ඒකට වැරදිකරුවෝත් තමුන්නාන්සේලායි.

ඊළඟට, මෙම යෝජනාවේ (ඇ) කියන කොටසේ අප සඳහන් කර තිබෙන කාරණය මොකක්ද බලන්න. ඒ, මෙන්න මේ කාරණයයි:

> "වර්ෂ 2018ක් වූ දෙසැම්බර් 24 වැනි දින මාවනැල්ලේ දී බුද්ධ ප්‍රතිමාවන්ට හානි කිරීම සම්බන්ධයෙන් සහරාන් හෂීම් ප්‍රමුඛ කණ්ඩායමක් සම්බන්ධ බවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විසින් ජාතික බුද්ධි අංශය වෙත 2018 දෙසැම්බර් 28 වැනි දින දැනුම් දී තිබියදීත්, හා මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් සැක කරමින් කිහිපදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබියදීත් විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යාම වළක්වමින් ඒ සඳහා මැදිහත් වීම් තිබුණු බව ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු විසින්ම ප්‍රකාශ කර තිබීම;"

ඒ ගැන මා නැවත කරුණු කියන්නම්. මාවනැල්ලේ බුද්ධ ප්‍රතිමාවලට හානි කිරීම සම්බන්ධයෙන් සහරාන්ලාගේ කල්ලිය වග කිව යුතු බව දැන් හෙළිදරව් වී තිබෙනවා. ඒක ඉතාම පැහැදිලියි. මුස්ලිම් කවුන්සලය, 2018 දෙසැම්බර් මාසයේ 28වන දා බුද්ධි අංශයට දැනුම් දෙනවා, ඒ අය තමයි මේ සිද්ධියේ හවුල්කරුවන් කියලා. තමුන්නාන්සේලා මොකක්ද කළේ? සිද්ධිය වුණාට පස්සේ, කබීර් හෂීම් අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කොයි වෙලාවකදී හෝ කිව්වා මම අහගෙන හිටියා, "නැහැ, ඒ අය අත් අඩංගුවට ගත්තාට පස්සේ ඇමතිවරයෙක් පරීක්ෂණවලට බාධා කළා" කියලා. ඒ ඇමතිවරයා කවුද කියලා මම දැන ගන්න කැමැතියි. කබීර් හෂීම් අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒක කියන්න ඕනෑ. මාවනැල්ලේ බුද්ධ ප්‍රතිමාවලට හානි කිරීමේ සිද්ධියට සහරාන්ලාගේ කල්ලිය සම්බන්ධ බව මුස්ලිම් කවුන්සලය ඉතා මැනවින් දැනුම් දී තිබියදී, ඒ පිළිබඳ පරීක්ෂණ යනකොට එම පරීක්ෂණ නතර කරන්නය

[ගරු අනුර දිසානායක මහතා]

කියලා ආණ්ඩුවේ ඇමතිවරයෙක් කිව්වාය කියලා ආණ්ඩුවේම තව ඇමතිවරයෙක් කියනවා. කබීර් හෂීම් අමාත්‍යවරයා තමයි එහෙම කිව්වේ. දැන් තමුන්නාන්සේලා මොකක්ද කර තිබෙන්නේ? මේ ආණ්ඩුව, අපරාධකරුවන්ට විරුද්ධ කරන ඒ පරීක්ෂණ නවත්වලා තිබෙනවා. [බාධා කිරීමක්] කවුරුන් හෝ ඇමතිවරයෙක්. කබීර් හෂීම් ඇමතිතුමා හෙට හෝ මේ ගරු සභාවට ඇවිල්ලා උත්තරයක් දෙයි, ඒ ඇමතිවරයා කවුද කියලා. ඒක මේ පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු සභානායකතුමනි, දිවා ආහාර විවේකය සඳහා සභාවේ වැඩකටයුතු නොනවත්වා, විවාදය ඉදිරියට අරගෙන යනවා නම්, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ කාලය 12.36 දක්වා ඉදිරියට යන්න ඕනෑ. ඒ සඳහා සභාවේ එකඟතාව අරගෙන, ඉන් පසු දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු නතර කරමුද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු නතර නොකර අපි විවාදය දිගටම අරගෙන යමුද? එහෙම තමයි තීරණය කර තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඕනෑ එකකට කැමැතියි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කලින් තීරණය කළේ එහෙම නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
දිවා ආහාර විවේකය ඇතිව හෝ නැතිව හෝ විවාදය අරගෙන යමු.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, අපි තීරණය කර තිබෙන්නේ, දිවා ආහාර විවේකය ගන්නේ නැතිව විවාදය දිගටම පවත්වන්නයි. ඒක තමයි අපේ තීරණය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඉතිරි විනාඩි හය දිවා ආහාර විවේකයට අයත් කාල සීමාවෙන් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
We are agreeable, Sir. එතුමාට තිබෙන ඉතිරි විනාඩි හය දෙන්නම්. ඊට පස්සේ දිවා අහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටවමු.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. එදා අපි තීරණය කළේ, දිවා ආහාරය සඳහා වේලාව ගන්නේ නැතිව විවාදය අරගෙන යන්න නේද? මට මතක විධියට නම් එහෙමයි. එහෙම නේද, සහකාර මහ ලේකම්තුමියනි? දිගටම විවාදය පවත්වන්න තමයි අපි තීරණය කළේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
දිවා ආහාරය සඳහා දෙන විවේක කාලය ගන්නේ නැතිව ඉස්සරහට යන්න, - [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා එකඟ නම්, -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Let us suspend for lunch, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඉතිරි විනාඩි 6ක කාලය දැන් ලබා දෙන්නම්. එතැනින් පසු, දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටුවනවා.

දැන් ඔබතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තව කාලය තිබෙනවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
12.30න් පස්සේ ඔබතුමාට කථා කරන්න තව විනාඩි 6ක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපේ පක්ෂයට වෙන් කළ කාලය තව තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම් මෙහෙම කරමු. 12.30ට දිවා ආහාර විවේකය සඳහා විවාදය නවත්වනවා. ඊට පස්සේ ඔබතුමාගේ කථාව නැවත ආරම්භ කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා ආහාර විවේකය ගන්නේ නැහැ කියන පදනම මත තමයි කාලය බෙදුවේ. ඔබතුමා ඒ කාරණය පරීක්ෂා කර බැලුවොත් හොඳයි කියා මා හිතනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා කියන විධියට අප කටයුතු කරන්නම්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා ආහාර විවේකය සඳහා අපි විවාදය නවත්වන්න අවශ්‍ය නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I agree.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකය නොගෙන සභාවේ කටයුතු ගෙන යෑමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියමින් හිටියේ ආණ්ඩුවේ අමාත්‍යවරයකු විසින් මෙම පරීක්ෂණයට බාධා කරන බව ඉතා පැහැදිලිව ප්‍රකාශයට පත් කරමින් තිබුණ බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ප්‍රහාරයෙන් පසුව අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශයට පත් කළා, "එතුමා ජාතික ආරක්ෂක මණ්ඩලයට කැඳෙව්වේ නැහැ" කියලා. හැබැයි, මේ සිදුවීමට පෙර කිසිදු අවස්ථාවක ජාතික ආරක්ෂක මණ්ඩලයට කැඳවපු නැති බව අග්‍රාමාත්‍යවරයා කොතැනකදී හෝ ප්‍රකාශ කළේ නැහැ. ඒ කියන්නේ මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක දවසක් කියපු දෙයක් මට මතකයි. ඒ සිද්ධිය මාත් දන්නවා. එතුමා දිඹුලාගල ඉඳලා හදිසියේ කොළඹ ඇවිත්, මහ බැංකුවට යන්න සූදානම් වුණා කියලා කිව්වා. මහ බැංකුවට යන්න සූදානම් වෙන බව අගමැතිවරයාට ආරංචි වෙලා, අගමැතිවරයා එතුමා හමුවෙන්න වහාම කඩාගෙන ඇවිත්, "මහ බැංකුව තිබෙන්නේ මගේ භාරයේ. මම නැතිව ඔබතුමා යන්නේ කොහොමද" කියලා ප්‍රශ්න කළා කිව්වා. ඊට පසුව එතුමා මහ බැංකුවට යනකොට අර්ජුන මහේන්ද්‍රන් බුලත් අතකුත් අතේ තියාගෙන හිටියා, අග්‍රාමාත්‍යවරයාත් එතැන හිටගෙන හිටියා කියලා කිව්වා. ඇයි ඒ? රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා මහ බැංකුව ආරක්ෂා කරන්න විශේෂ වෙහෙසක් දරනවා. එය එතුමාගේ වගකීම ලෙස එතුමා සලකනවා. එතුමා යටතේයි මහ බැංකුව තිබෙන්නේ. ඒ නිසා එතුමාගේ අවසරයකින් තොරව ජනාධිපතිවරයාටවත් මහ බැංකුවට ප්‍රවිෂ්ට වෙන්න බැහැ. මහ බැංකුව ආරක්ෂා කිරීම මගේ මූලික වගකීම කියලා එතුමා දොරටුපාලයා වාගේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා එනකොට දොර ළඟ හිටගෙන ඉන්නවා. ඇයි ඒ? මහ බැංකුවේ ආරක්ෂාව පිළිබඳ තිබෙන බැඳීම. හැබැයි, ජාතික ආරක්ෂක මණ්ඩලයට එහෙම එනවාද? ජාතික ආරක්ෂක මණ්ඩලය පිළිබඳ එතුමාට වගකීමක් නැද්ද? බැඳීමක් නැද්ද? ඒකට ඕනෑ දෙයක් වුණාවේ, මම මහ බැංකුව බලා ගන්නම් කියන තැනයි එතුමා හිටියේ. නමුත් ඒක අග්‍රාමාත්‍යවරයාට තිබෙන වගකීමක්. අග්‍රාමාත්‍යවරයා ජාතික ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයෙක්. ආරක්ෂක මණ්ඩලයට යෑම එතුමාගේ වගකීම. එතුමා ඒකට නොයන්නේ නම්, එය පාර්ලිමේන්තුවට කීමට එතුමා බැඳී සිටිනවා. ඒ නිසා ආරක්ෂාව පිළිබඳව එතුමා දක්වා තිබෙන නොසැලකිල්ල මෙම ප්‍රහාරයට හේතු සාධක වී තිබෙන බව අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රහාරය හිටි හැටියේ අහසින් කඩා පාත් වුණු උල්කාපාතයක් වාගේ ප්‍රහාරයක් නොවෙයි. මේ ප්‍රහාරය නිශ්චිත වශයෙන් ඉතාම වැදගත් තොරතුරු, සාධක හෙළිදරව් වී තිබුණු ප්‍රහාරයක්. මම ඒ එකින් එක කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2019.04.09වැනි දින පූජිත් ජයසුන්දර පොලිස්පතිවරයා වෙත රාජ්‍ය බුද්ධි සේවාවේ නිලන්ත ජයවර්ධන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් යවන ලද රහස්‍ය වාර්තාවක් මා සතුව තිබෙනවා. මේවා තව දුරටත් රටේ රහස් විය යුතු නැහැ කියලා මම හිතනවා. මේ වාර්තාවේ මොකක්ද කියන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාර්තාවේ ඉතා පැහැදිලිව මෙහෙම කියනවා:

"මෙම ප්‍රහාරය සඳහා මෙරට ප්‍රසිද්ධ කතෝලික පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉලක්ක කරන බව වැඩි දුරටත් සඳහන් කර ඇත" කියලා.

"ජාතික තව්හිද් ජමාත් නායක මොහොමඩ් සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන බවට ලද තොරතුරක් සම්බන්ධව" කියන එක තමයි මෙහි ශීර්ෂ පාඨය. කවදාද මේ කියන්නේ? 2019 අප්‍රේල් මාසයේ 09වැනි දින තමයි බුද්ධි අංශ මෙය වාර්තා කරන්නේ. සහරාන් ඇතුළු කණ්ඩායමක් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමට සිටින බවත්, එය කතෝලික දේවස්ථාන ඉලක්කකොට ඇති බවත් ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අහම්බෙන් අප්‍රේල් මාසයේ නවවැනි දින ආපු පණිවුඩයක් නොවෙයි. සහරාන්ලාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ, කාත්තන්කුඩි සිදුවීම් ගැන දිගටම පැමිණිලි කරමින් තිබුණා. මුස්ලිම් කවුන්සිලය පැමිණිලි කරමින් තිබුණා. මාවනැල්ල ප්‍රදේශයේ බුද්ධ ප්‍රතිමා කඩා දැමීම පිළිබඳ පරීක්ෂණ සිදු වෙමින් තිබෙනවා. ඔවුන් විවිධ දේශන කරමින් සිටිනවා. මේ සියල්ල මත තමයි මේ කරුණු විග්‍රහ කර ගන්න ඕනෑ. ගරු

[ගරු අනුර දිසානායක මහතා]

නියෝජ්‍ය කථානායකතුමනි, මේ තොරතුර පමණක් අතට ආවොත්, මේක එහෙමම නොවෙයි වාගේ කියලා කාට වුණත් හිතෙන්න පුළුවන්. වනාතවිල්ලුවේ වෙඩි තැබීමක් සිදු වෙලා තිබුණා. වෙඩි බෙහෙත් අත් අඩංගුවට අරගෙන තිබුණා. මේ ක්‍රියාවලිය අවබෝධ වෙමින් තිබුණා. මේ ක්‍රියාවලිය අවසානයේ තමයි ජාතික තවුහිත් ජමාත් නායක සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට 2019.04.09 වැනි දින තමයි තොරතුරක් ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හිටිහැටියේ අහම්බයෙන් සිදු වුණු දෙයක් නොවෙයි. මේ පිළිබඳ ක්‍රියාවලියක් තිබුණා. ඒ ක්‍රියාවලිය අවසානයේදී ප්‍රහාරයක් එල්ල කරන්න සහරාන්ලා සූදානම් වෙන බවත් ප්‍රකාශ කළා. ඒ විතරක් නොවෙයි. කතෝලික පල්ලි ඉලක්ක කරගෙන මේ ප්‍රහාර දියත් වෙන බව සඳහන් කරලා තිබුණා. ඒ නිසා කාදිනල් හිමිපාණන් -එතුමා සාමකාමී වුවත්- හිතේ තිබෙන ආවේගය ප්‍රකාශයට පත් කරමින් කිව්වේ කුමක්ද? කාදිනල් හිමිපාණන් කියන්නේ, "අඩුම තරමින් තමුන්නාන්සෙලාට මට කියන්න තිබුණා" කියලායි. ආණ්ඩුවට මොකවත් කරන්න බැරි නම්, කාදිනල් හිමිපාණන්ට කිව්වා නම් උන්වහන්සේ කරන්නේ මොකක්ද? "අඩුම තරමින් මම එදාට පල්ලි එන්න එපා කියලාවත් කියනවා" කියලායි. ඒ වාගේ වගකීමක්වත් ඉටු කර ගන්න බැරි වුණු පාලකයන් තමුන්නාන්සේලා. එහෙමනම් මේ රටේ මහජනයාගේ ආරක්ෂාව පිළිබඳව වගකීම් දරන්න තමුන්නාන්සේලා සුදුසුද? මම තමුන්නාන්සේලාගෙන් අහන්නේ එච්චරයි. අඩුම තරමින් ඒ ගැන පණිවුඩයක් තියන්න බැරිද? "මෙවැනි ප්‍රහාරක තොරතුරු අපට ලැබිලා තිබෙනවා" කියලා කියන්න තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබුණේ නැහැ. තමුන්නාන්සේලා හිතා මතා මේ ලේ ගංගාව රටේ ගලන්න ඉඩ දුන්නා. ඒක ද තමුන්නාන්සේලාගේ ආණ්ඩුව?

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය ගැන සම්පූර්ණ විස්තර කියනවා. සහරාන් හෂීම් සහ ෆාසි අජ්වාඩ් යන දෙදෙනා 2018.12.25 වෙනි දා මාවනැල්ල ප්‍රදේශයේ ආගමික ප්‍රතිමාවලට පහරදීමෙන් පසු ප්‍රදේශයෙන් පලා ගොස් දැනට අක්කරපත්තු ඔලුවිල් ප්‍රදේශයේ රහසිගතව සැඟවී සිටින බවට තොරතුරු වාර්තා වී ඇත. ඔවුන් හිටපු ස්ථානත් දන්නවා. පාවිච්චි කරන දුරකථන අංකයත් දන්නවා. ගෙදර එන වෙලාවත් දන්නවා. මෙහෙම කියනවා, "රිල්වාන් රාත්‍රී කාලයේදී -රාත්‍රී 11.00- පාන්දර 4.00- අංක 309/බී, ෆරීනාස් පාර, දෙවන හරස්වීදිය, ආරියම්පති - නැඟෙනහිර, ආරියම්පති යන ලිපිනය වෙත පැමිණෙන බවත්, එම ලිපිනයේ ඔහුගේ බිරිඳ හා දරුවා රැඳී සිටින බවත් දැන ගැනීමට ලැබී ඇත" කියලා. එතකොට, ඔහු එන වෙලාවත් කියනවා. ඔහු එන දවසත් කියනවා. ඔවුන් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකට සූදානම් වෙලා තිබෙන බවත් කියනවා. ඒ විතරක් නොවෙයි. සහරාන්ගේ බාල සොයුරා හා ඔහුගේ ම වාදය වටා සිටින පිරිස් රැස් කිරීමේ නියමුවා ලෙස කටයුතු කළ සහරාන්ගේ මල්ලි රිල්වාන් යන අය කාත්තන්කුඩි පොලිස් වසමේ මොහිදීන් පල්ලිය පාරේ තමයි පදිංචි වෙලා ඉන්නේ. ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය කියනවා. ඔහු පාවිච්චි කරන දුරකථන අංකය කියනවා. ඔහු පාවිච්චි කරන බයිසිකල් අංකය කියනවා. මීට වඩා දෙන්න පුළුවන් තොරතුරු මොනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවදාද මේ තොරතුරු දෙන්නේ? 2019 අප්‍රේල් මාසයේ 09 වෙනි දා. මෙවැනි ප්‍රහාරයක් එල්ල විය හැකි බවත්, ප්‍රහාර එල්ල කරන අයත්, ඒ ප්‍රහාරය එල්ල කරන අය ගැවසෙන ස්ථාන පිළිබඳවත් වාර්තාවක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට අප්‍රේල් මාසයේ 16 වෙනි දා කාත්තන්කුඩි ප්‍රදේශයේ මෝටර්සයිකලයක් පුපුරුවා හැරලා අත් හදා බැලීමක් කරනවා. ඒකත් දන්නවා. මෝටර්සයිකලයක බෝම්බ අටවා කළ පිපිරීමක් පිළිබඳවත් බුද්ධි අංශ වාර්තා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගැන මෙසේ සඳහන් කර තිබෙනවා. "කාත්තන්කුඩි පොලිස් වසමේ පාලන්කුඩා ප්‍රදේශයේ පිහිටි අක්කර 43ක වපසරයකින් යුත් ඉඩමකදී 2019.04.16 වෙනි දින පැය 21.20ට -ඒ කියන්නේ, රාත්‍රී 9.20ට පමණ- යතුරු පැදියක් පුපුරුවා හැර ඇති බවත්, අදාළ පිපිරීමෙන් යතුරු පැදියේ කොටස් මීටර 50ක දුරකට විසිරී ඇති බවටත් වාර්තා වී ඇත" කියලා. අත්හදා බැලීම් කරන ඒවාත් වාර්තා වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප්‍රේල් මාසයේ 16 වෙනි දා වාර්තාවක් ඉදිරිපත් වෙනවා. ඒ මොකක්ද? අත්හදා බැලීමක් කරන්න මෝටර්සයිකලයක් පුපුරුවා හැර තිබෙනවා. පුපුරුවා තිබෙන්නේ අහවල් ස්ථානයේ කියලාත් කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෝටර්සයිකලයේ අයිතිකරුවා, මෝටර්සයිකලය මිලදී ගත් ස්ථානය ආදී මෝටර්සයිකලයේ සියලු විස්තර වාර්තා වෙනවා. ඒත් මොකක්ද ආණ්ඩුව කරන්නේ? තමුන්නාන්සේලා බබ්බුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෙල්ලම් ආණ්ඩුවක් වුණත් අඩුම තරමින් මේ ප්‍රශ්න පිළිබඳව මීට වඩා සැලකිල්ලක් දැක්විය යුතුව තිබුණා. ඒ වෙනුවට තමුන්නාන්සේලා මොකක්ද කළේ? හැබැයි, තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ පැත්තෙන් ගන්න ඕනෑ හොඳම පියවර අරගෙන තිබෙනවා. ඒ මොකක්ද? 2019.04.11 වෙනි දා මේ පිළිබඳ දැනුම් දීම සඳහා අධ්‍යක්ෂ, ඇමති ආරක්ෂක කොට්ඨාසය, අධ්‍යක්ෂ, අධිකරණ ආරක්ෂක කොට්ඨාසය, අධ්‍යක්ෂ, විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය, - ඒ කියන්නේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත්- අධ්‍යක්ෂ, තානාපති අධ්‍යක්ෂ කොට්ඨාසය, අධ්‍යක්ෂ, විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසයට ලිපියක් යවනවා.

ඒ ගොල්ලන්ට කියනවා, "ඔයගොල්ලන් පරිස්සම් වෙන්න" කියලා. ඒ නිසා මේ ඇමතිවරු දැනගෙන හිටියා. ඇමතිවරුන්ට දැනුම් දෙනවා. [බාධා කිරීමක්] ඔව්, කියන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Non Cabinet Minister of Economic Reforms and Public Distribution)

ගරු මන්ත්‍රීතුමා, මට ඇමති ආරක්ෂකයන් දෙන්නෙක් ඉන්නවා. කිසිම වේලාවක අප දැනුවත් කරලා තිබුණේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක අභ්‍යන්තර ප්‍රශ්නයක්, බේරාගන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එහෙම නොවෙයි. දැන් ඔබතුමා කිව්වා නේ අපි දැනගෙන හිටියා කියලා. මම ඔබතුමාට ඉතාම ඕනෑකමින් කියනවා, අපි දැනගෙන හිටියේ නැහැ කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනගත යුතුව තිබුණා. මතක තියා ගන්න වචනය. ඇමති ආරක්ෂක කොට්ඨාසය තියෙනවා. අමාත්‍ය ආරක්ෂකයන් අරගෙන තිබෙනවා නේ?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට දෙන්නෙක් ඉන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දෙන්නෙක් ඉන්නවා. ඒ දෙන්නා පාලනය වන්නේ කා යටතේ ද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇමති ආරක්ෂක-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමති ආරක්ෂක කොට්ඨාසය යටතේ තමයි ඒ දෙදෙනා පාලනය වන්නේ. ඇමති ආරක්ෂක කොට්ඨාසය නිසි පරිදි,-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නම්. ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න. ඇමති ආරක්ෂක කොට්ඨාසය නිසි පරිදි මේ ගැන දැනුවත් කර තියෙනවා. ඒකෙන් ගම්‍ය වන්නේ අන් කවරක්වත් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම්, ඇමති ආරක්ෂක කොට්ඨාසය නිසි පරිදි කටයුතු ඉටු කරලා නැහැ. එහෙම නැත්නම්, ඇමති ආරක්ෂක කොට්ඨාසය තීරණය කරනවා, "මගේ ඇමතිට නම් කියලා වැඩක් නැහැ" කියලා. ඒ වාගේ මොකක් හරි එකක් නේ වෙලා තිබෙන්නේ. සමහරු හිතන්න පුළුවන්, "මගේ ඇමතිට නම් මොනවා හරි වුණත් කමක් නැහැ" කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා, ඔබතුමාටත් විනාඩි 9ක කාලයක් වෙන් කර තියෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ වෙලාවේදී කථා කරන්න. ඒක හොඳයි. මේ අවස්ථාවේදී මගේ කාලය දෙන්නේ නැහැ.

ඒ නිසා මම කියන්නේ මේ ඇමතිවරු දැනගෙන සිටියා කියලායි. සමහරු කියනවා නේ "මගේ තාත්තා කිව්වා" කියලා. හරිද? ඉතින් ආණ්ඩුවක් තියෙන්නේ මොකටද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් තියෙන්නේ මොකටද? ආණ්ඩුවේ මුළු යාන්ත්‍රණයම ක්‍රියාත්මක වෙනවා නම්, තමුන්නාන්සේත් දැන ගන්න ඕනෑ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] ඒකත් විශ්වාස භංග යෝජනාවට අදාළයි. කරුණාකර ඔබතුමා වාඩිවෙන්න, තේරුම් ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ රාජ්‍ය යාන්ත්‍රණයට බුද්ධි අංශයක් තිබෙනවා. ඒ රාජ්‍ය යාන්ත්‍රණයට බුද්ධි අංශය තොරතුරු වාර්තා කරනවා. ඒ පිළිබඳ තීන්දු තීරණ ගන්න ආරක්ෂක මණ්ඩලයක් තිබෙනවා. එහි අග්‍රාමාත්‍යවරයා ඉන්නවා. ඊට පස්සේ එය දැනුම් දිය යුතු ස්ථානවලට දැනුම් දෙනවා. එතකොට අගමැති ආරක්ෂක කොට්ඨාසයට, ඇමති ආරක්ෂක කොට්ඨාසයට, නායපති ආරක්ෂක කොට්ඨාසයට, හිටපු ජනාධිපතිවරු දෙදෙනාගේ ආරක්ෂක කොට්ඨාසයේ අධ්‍යක්ෂවරුන්ට දැනුම් දෙනවා. ඒ අධ්‍යක්ෂවරු අදාළ ප්‍රභූවරයාට දැනුම් දිය යුතුයි. හැබැයි, මේ කිසිවක් වෙන්නේ නැත්තේ ඇයි? ඇයි, ඒ කිසිවක් වෙන්නේ නැත්තේ? ඒ කිසිවක් වෙන්නේ නැත්තේ මුළු රාජ්‍ය යාන්ත්‍රණයම බිඳ වැටිලා තිබෙන නිසා. එහෙම රාජ්‍ය යාන්ත්‍රණය බිඳ වැටුණු තැනකදී තමුන්නාන්සේ දැන ගන්නේ නැති එක අරුම පුදුම දෙයක් නොවෙයි. හැබැයි, එවැනි යාන්ත්‍රණයක් තිබෙනවා නම් තමුන්නාන්සේ දැනගත යුතුයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අපි දැනගෙන හිටියේ නැහැ නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොඩ්ඩක් ඉන්න. මේ ක්‍රියාවලිය-[බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලාටත් MSD එකෙන් ඉන්නවා නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මගෙන් ප්‍රශ්නයක් අහනවා. ඔබතුමන්ලාගේ MSD අය දැනගෙන හිටියේ නැද්ද කියලා. අපි MSD අරගෙන නැහැ මන්ත්‍රීතුමනි. ජනතාව ළඟට යන්න අපි භය වෙන්නේ නැහැ. මතක තබා ගන්න. ජනතාව ළඟට යන්න අපි පොලීසිය අරගෙන යන්නේ නැහැ. මතක තබා ගන්න. අපි දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. කිසිදු ආරක්ෂක අංශ නිලධාරියෙක් අපි අපේ ආරක්ෂාවට අරගෙන නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට ආරක්ෂකයෙක් අරගෙන නැත්නම් ඒ වරදත් තමුන්නාන්සේලා කරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපට භය වෙන්න ඕනෑ නැහැ, ජනතාව ළඟට යන්න. එච්චරයි. තමුන්නාන්සේලාටයි ඕනෑ. තමුන්නාසේලාට ලයිට් දාන්න කෙනෙක් ඕනෑ; දොර අරින්න කෙනෙක් ඕනෑ; බෑග් එක අරින්න කෙනෙක් ඕනෑ; බෑග් එක උස්සන්න කෙනෙක් ඕනෑ. හරිද? අපට එහෙම අවශ්‍ය නැහැ. ඔබතුමා වාඩිවෙන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමා, මට එක පොලිස්කාරයෙක්වත් ආරක්ෂාවට හිටියේ නැහැ. මම ත්‍රිකුණාමලයේ තනියම හිටියේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඉතින් මම මොනවා කරන්නද ඒකට? [බාධා කිරීමක්] ඉතින් මට මොකද? ඉතින් මම මොනවාද කරන්නේ? ඔබතුමා තනියම ඉන්නවාද, නෝනාත් එක්ක ඉන්නවාද කියන එක මට වැඩක් නැහැ. ඔබතුමා කාත් එක්ක ඉන්නවාද කියන එක මට වැඩක් නැහැ. මම නිශ්චිත වශයෙන් කියන්නේ, මගේ තර්කය වන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ත්‍රිකුණාමලයේ ඉන්නකොට පොලීසියේ කවුරුවත් හිටියේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඉතින් ඒකට මම මොනවා කරන්නද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

අපි භය නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

භය නැත්නම් හොඳයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හැබැයි, ඔබතුමා අපට චෝදනා කරන්න එපා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] ඔබතුමා වාඩිවෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කියමින් ඉන්නේ මේ ක්‍රියාවලිය ගැන. එතකොට රාජ්‍ය යාන්ත්‍රණ ක්‍රියාවලියක් සකස් කරලා තිබෙනවා. ඒ ක්‍රියාවලිය මෙහෙයවිය යුතු වන්නේ දේශපාලන අධිකාරිය. ඒකට තමයි ආණ්ඩුවක් තියෙන්නේ. ඒකට තමයි ජනවරමක් දීලා ආණ්ඩුවක් හදන්නේ. එතකොට බුද්ධි අංශයක් තිබෙනවා; තොරතුරු වාර්තා වෙනවා. ආරක්ෂක මණ්ඩලයක් තියෙනවා; තොරතුරු සාකච්ඡා කරනවා; තීන්දු තීරණ ගන්නවා; තීන්දු පහළට ගලාගෙන එනවා. මේ ක්‍රියාවලියම බිඳ වට්ටලා. කවුද ඒකට වග කියන්න ඕනෑ? ඒ ක්‍රියාවලිය බිඳ වැට්ටවීමට වග කියන්න ඕනෑ කවුද? ක්‍රියාවලිය බිඳ වැට්ටවීමට වග කියන්න ඕනෑ, දේශපාලන නායකත්වය ගත් ආණ්ඩුව. අද ආණ්ඩුවක් නැහැ, ඒකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ආණ්ඩුව වග කියන්නේ නෑ මේ ක්‍රියාවලියට. ආණ්ඩුව මේ ක්‍රියාවලිය සංවිධානාත්මකව ක්‍රියාත්මක කිරීමට අසමත් වීම තමයි තිබෙන ප්‍රශ්නය.

ඒක තමයි ආණ්ඩුවට විරුද්ධ විශ්වාස භංග යෝජනාවේ පදනම. මේ ක්‍රියාවලිය ඉතාම හොඳින් 1 සිට 100 දක්වා අදාළ තැන්වලට නිසි පරිදි, නිසි වේලාවට ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක් තිබුණා නම් මේ තත්ත්වය වළක්වා ගත හැකිව තිබුණා. ඒකයි මම කියන්නේ. ඒ යාන්ත්‍රණය මුළුමනින්ම බිඳ වට්ටපු පාලනයක් මේ තිබෙන්නේ. ආරක්ෂාව කියන එක, මහ ජනයාගේ ආරක්ෂාව, රටේ ආරක්ෂාව තුට්ටු දෙකට දාපු පාලනයක් තමයි මේ. ඊට වඩා මහ බැංකුව පස්සේ ගිය පාලනයක්, ඊට වඩා වංචා දූෂණ පස්සේ ගිය පාලනයක්, ඊට වඩා හොරකම් කරන්න පස්සේ ගිය පාලනයක්, ඊට වඩා "ඩීල්" දාන්නට ගිය පාලනයක් තමයි මේ. ඒ පාලනය නිසා තමයි මේවා සිද්ධ වෙන්නේ. ඒක තමයි විශ්වාස භංග යෝජනාවේ පදනම ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019.04.16 වෙනි දා මෝටර්සයිකල් එකක් පුපුරුවා අත්හදා බැලීමක් කර තිබෙන බව වාර්තා වෙනවා. බයිසිකලයේ අයිතිකරුවන්, බයිසිකලය මිලදී ගත්ත තැන, බයිසිකලයේ අංකය, ඒක උපයෝගී කර ගත්තේ කවුද කියන එක පිළිබඳව ඉතා පැහැදිලි වාර්තා තිබෙනවා. මේ තොරතුරු වාර්තා වී තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ, 18 වෙනි දා වාර්තාව. 19 වෙනි දා වාර්තාව මොකක්ද කියන්නේ? 2019.04.19වෙනි දා, කාත්තන්කුඩියේදී යතුරුපැදිය පුපුරුවා හැරීම සම්බන්ධයෙන් පුද්ගලයකු පිළිබඳ පැමිණිල්ල, 2019.04.18 දින යොමු කරන ලද එස්/1758/20 දරන ලිපිය හා සැසඳේ කියලා විස්තර කියනවා. කලින් කියනවා, මෙහෙම පිපිරීමක්වෙලා තිබෙනවා, පුපුරුවලා තිබෙන්නේ මේ ගොල්ල කියලා. ඊළඟ දවසේ, 19වෙනි දා පුපුරුවලා තිබෙන්නේ මෙන්න මේ අය, ඔවුන්ගේ හැඳුනුම් පත් අංක, ඔවුන් ගැවසෙන තැන්, ඔවුන් ඇසුරු කරන කණ්ඩායම් කියන මේ සියල්ල වාර්තා වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙහෙම කියනවා. "සහරාන් ඇතුළු එම ජාලයේ කටයුතු සඳහා සක්‍රිය ලෙස සම්බන්ධව සිටින මොහු, - මේ බයිසිකලය ගත්ත කෙනා- කොළඹ ප්‍රදේශයේ රැකියාවක නිරතව සිටින බවක් ප්‍රදේශවාසීන් වෙත සඳහන් කර ඇති බවත්, සතියකට දින කිහිපයක් බිරිඳ සහ දරුවන් බැලීම සඳහා ඉහත මැදවච්චිය ලිපිනයට පැමිණෙන බවටත් දැන ගැනීමට ඇත." එතකොට මේක නිකම් පිපිරීමක් නොවෙයි. බයිසිකලයක් පුපුරුවනවා. ඒ බයිසිකලය සහරාන්ගේ ජාලයේ පුද්ගලයකුගේ බව වාර්තාවේ සඳහන් වී තිබෙනවා. මේ පැමිණිලි පිළිබඳව බුද්ධි අංශ වාර්තා ඉතාම පැහැදිලිව සඳහන් කර තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම අප්‍රේල් මාසයේ 18වෙනි දා ලිපිය කියෙව්වා, 19වෙනි දා බුද්ධි අංශ වාර්තාව කියෙව්වා. අප්‍රේල් 20වෙනි දා -මේ ප්‍රහාරයට කලින් දවසේ- බුද්ධි අංශ වාර්තාව මොකක්ද කියන්නේ? ජාතික තව්හීද් ජමාද් සංවිධානයේ මොහොමඩ් සහරාන් නමැත්තා පිළිබඳව මොකක්ද කියන්නේ? "මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් යන අය 2018.09.26වෙනි දා හවස 3.00ත් 3.30ත් අතර කාලය තුළ අක්කරෙයිපත්තු පල්ලියකුඩිප්පුව ප්‍රදේශයේ තවත් පුද්ගලයකු සමඟ යතුරුපැදියකින් ගමන් කරන අයුරු එම ප්‍රදේශයේ අරාබි විද්‍යාලයක රැකියාවක නියුතු සාහුල් හමීඩ් නමැති පුද්ගලයකුට නිරීක්ෂණය වී ඇති බවට තොරතුරු ලැබී ඇත." එතකොට මොහු ඒ කාලයේ ඒ ප්‍රදේශයේ ගැවසෙන බවටත් තොරතුරු ලැබී තිබෙනවා. මේක තමයි 20වෙනි දා බුද්ධි අංශ වාර්තාව ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 9වෙනි දා වාර්තාවක් එනවා, 18වෙනි දා වාර්තාවක් එනවා, 19වෙනි දා වාර්තාවක් එනවා, 20වෙනි දා වාර්තාවක් එනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 9වෙනි දා වාර්තාවේ දිගුව තමයි මේ එන්නේ. 9වෙනි දා වාර්තාවේ කියනවා, සහරාන් ඇතුළු කණ්ඩායම ගැන. එහි නම් 7ක් කියනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ හත් දෙනා මරාගෙන මැරෙන බෝම්බයකට සූදානම්වෙලා තිබෙනවා. කතෝලික පල්ලි ඉලක්ක කරනවා කියලා 9වෙනි දා කියනවා. ඉන් පසුව 18වෙනි දා වාර්තාවක් එනවා, 19වෙනි දා වාර්තාවක් එනවා, 20වෙනි දා

වාර්තාවක් එනවා. නමුත් මොකක්ද ආණ්ඩුව කළේ? 21වෙනි දා ගැහුවාට පස්සෙත් එක ඇමතිවරයෙක් රූපවාහිනියට කියනවා, "මට නම් තාත්තා කිව්වා" කියලා. තාත්තා ඒක කියනවා නම් මේවා ආණ්ඩුද? අපි අහන්නේ එච්චරයි. ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා කියනවා, "මේක නවසීලන්තයේ ප්‍රහාරයට ප්‍රතිප්‍රහාරය" කියලා. තව නියෝජ්‍ය ඇමතිවරයෙක් කියනවා, "අපට ඇමෙරිකාවේ බුද්ධි අංශය මේවා කියලා තිබුණා" කියලා. රනිල් වික්‍රමසිංහ කියනවා, "මම ආරක්ෂක මණ්ඩලයට ගියේ නැහැ නේ" කියලා. මේවා කියන්නද ආණ්ඩුවක් තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධි අංශ වාර්තා ඉතා පැහැදිලිව මේ ප්‍රහාර සිදු විය හැකි තැනත්, ප්‍රහාර සිදු විය හැකි දිනයත් 21වෙනි දා උදේ 7.00ටත් කියනවා. පාස්කු ඉරිදා උදේ 7.00ට බුද්ධි අංශ වාර්තාව කියනවා, අද කතෝලික දේවස්ථානවලට ප්‍රහාරයක් එල්ලවීමේ සූදානමක් තිබෙනවා කියලා. උදේ 7.00ට කියන්නේ; 8.45ට ගහනවා. මෙවැනි තත්ත්වයක් පාලනය කර ගන්නට බැරි ආණ්ඩුවකට තවදුරටත් අපේ රටේ මහ ජනයාගේ ආරක්ෂාව හෝ රටේ ආරක්ෂාව තහවුරු කිරීම පිළිබඳව වගකීමක් ඉසිලිය හැකිද? අපි අහන්නේ ඒක. ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂියෙන් අහන්න. උදේ 7.00ට කියනවා, කතෝලික පල්ලිවලට ගහනවා කියලා. ඒ නිසාම තමයි කාදිනල් උන්නාන්සේ කියන්නේ, "මට කිව්වා නම් මම පල්ලි යන එක නතර කරවනවා" කියලා. එහෙම නම් මිනිස් ජීවිත බේරා ගන්න තිබුණා. දැන් 258කට ආසන්න පිරිසක් මිය ගිහිල්ලා; 500කට වඩා වැඩි පිරිසක් තුවාලවෙලා. අද සිංහල-මුස්ලිම් සමාජයේ එකිනෙකා අතර සම්බන්ධය දෙදරා ගිහිල්ලා: ආර්ථිකයට විශාල ප්‍රහාරයක් එල්ල වෙලා; සංචාරක ව්‍යාපාරය මුළුමනින්ම කඩා වැටිලා; සමාජය තුළ තැති ගැන්මක්, අනාරක්ෂිතභාවයක් නිර්මාණය වෙලා. ඊයේත් වාර්තාවක් ආවා, කළුතර ඉඳලා මාතර දක්වා මොකක් හරි ප්‍රහාරයක් එල්ල වෙන්න පුළුවන් කියලා. මෙවැනි විශාල අනාරක්ෂිත තත්ත්වයක් රටේ නිර්මාණය කිරීමේ අපරාධකරුවන් තමුන්නාන්සේලා. ඒ නිසා අපි එකයි අහන්නේ. මේ අපරාධකරුවන්ට රට පාලනය කරන්න දෙන්න ඕනෑද? මේ අපරාධකරුවන්ට යුක්ති සහගත අයිතියක් තිබෙනවාද රටක් පාලනය කරන්න? මේ ආණ්ඩුව මිනිස් ජීවිත 258ක් විනාශ කළ සාපරාධී අපරාධකරුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ප්‍රහාරයේ අපරාධයෙන් මේ ආණ්ඩුවට ගැලවෙන්න කිසිසේත්ම අයිතියක් නැහැ. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ, මේ ආණ්ඩුව ඉල්ලා අස්වෙන්න ඕනෑය කියලා. මේ ආණ්ඩුව මේ විශ්වාසභංග යෝජනාවෙන් පාර්ලිමේන්තුවේදී පරාද කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර 106ක් තිබෙන ආණ්ඩුවක්, ජනතාවගේ ජනවරමක් ගන්න බැරි ආණ්ඩුවක්, පාර්ලිමේන්තුවේ බහුතරයක් නැති ආණ්ඩුවක්, රටේ ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව අබමල් රේණුකවත් හැඟීමක් නැති ආණ්ඩුවක් මේ රට පාලනය කරන්න සුදුසුද? ඒ නිසා තමයි අපි කියන්නේ මේ විශ්වාසභංග යෝජනාවට සහාය දීලා මේ ආණ්ඩුව පරාජයට පත් කළ යුතුයි කියලා.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පස්සේ -අප්‍රේල් මාසයේ 21වැනි දා සිද්ධියෙන් පස්සේ- මොකක්ද වුණේ? අප්‍රේල් මාසයේ 21වැනි දාට පසුව රටේ සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට ගෙනෙන්න මේ පාලකයන් අසමත් වුණා. සභානායකතුමා මේ පාර්ලිමේන්තුවේ එතුමාගේ අසුනෙන් නැඟිටලා කිව්වේ මොකක්ද? ගරු සභානායකතුමනි, ඔබතුමා කිව්වේ මොකක්ද? ඔබතුමා කිව්වා, ඔබතුමාගේ ආරක්ෂක නිලධාරීන් "අමාත්‍යාංශයට යන්න එපා" කියලා ඔබතුමාට දැනුම් දුන්නාය, ඒ නිසා ඔබතුමා ගෙදර ඉඳගෙන වැඩ කළාය කියලා. එහෙම කිව්වා නේද? මම හැන්සාඩ් වාර්තාව ගෙනෙන්නම්. කිව්වා නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ප්‍රහාරයෙන් පස්සේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ප්‍රහාරයෙන් පස්සේ. ප්‍රහාරයෙන් පස්සේ සභානායකවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, "මගේ ආරක්ෂක නිලධාරීන් නම් මට කිව්වා, ගෙදර ඉඳගෙන වැඩ කරන්න කියලා. ඒ නිසා මම අමාත්‍යාංශයට ගියේ නැහැ." කියලා. ඉතින් රටේ ජනතාවට මොකක්ද කියන්නේ? ඉතින් රට ස්ථාවරත්වයට ගෙනෙන්න පුළුවන්ද? හරි ඇමතිවරයෙක් නම් කිව යුත්තේ, "රටේ අනතුරුදායක තත්ත්වයක් තිබියදී මහජනයාගේ විශ්වාසය තහවුරු කිරීම වෙනුවෙන් මම එදාත් උදේ පාන්දර අමාත්‍යාංශයට ගියා" කියලායි. එහෙමයි, රටක් පාලනය කළ යුත්තේ. නමුත් මෙතුමා රටකට කියන්නේ මොකක්ද? "මට ආරක්ෂක නිලධාරීන් කිව්වා, 'යන්න එපා' කියලා. ඒ නිසා මම ගෙදරට වෙලා හිටියා" කිව්වා. ඉතින් ජනතාව එළියට බහියිද? ජනතාවට විශ්වාසයක් ඇති වෙයිද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ප්‍රහාරයෙන් පසුවත් සාමාන්‍ය තත්ත්වයක් ඇති කරන්න ආණ්ඩුව අසමත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රහාරයෙන් පසුව -මට දිනය හරියට මතක නැහැ- නැවත විසි ගණන්වල ප්‍රහාරයක් එල්ල වෙයි කියලා ආරංචියක් ආවා; බුද්ධි අංශ වාර්තා කර තිබුණා. එහිදී අග්‍රාමාත්‍යවරයාට කිව්වා, "කොළඹ ඉන්න එපා" කියලා. මම අහනවා, අගමැති කොළඹ සිටියාද කියලා. අගමැති කොළඹ දාලා ගියා. මේකයි ඇත්ත කථාව. මේ රටේ නායකයන් තමන් ඉන්න නගරයට ප්‍රහාරයක් එල්ල වෙයි කියන කොට, නගරයෙන් පලා යන නායකයන්. එහෙම නැත්නම් "නැහැ" කියලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න. එහෙම නැත්නම් "නැහැ" කියන්න. අගමැතිවරයා කොළඹ මඟහැර ගියා. තර්ජනයක් එනවා කියන කොට, රටේ අගමැතිවරයා නගරය දමා හැංගෙන්න යනවා. එසේ හැංගෙන්න යන අයට ද රට පාලනය කරන්න දෙන්න කියන්නේ? ඒ අයටද අපි මහජනයාගේ ආරක්ෂාව පිළිබඳව සහතිකයක් දෙන්න කියන්නේ? ඒ ගොල්ලන්ට මහජනයාගේ ආරක්ෂාව පිළිබඳව සහතිකයක් දෙන්න බැහැ. සභානායකවරයා එකක් කියනවා; අගමැතිවරයා තව වැඩක් කරනවා.

අධ්‍යාපන ඇමතිවරයා මොකක්ද, කිව්වේ? අධ්‍යාපන ඇමතිවරයා කිව්වා, "පහෙන් ඉහළ ළමයි 6වැනි දා ඉස්කෝලේ එන්න, පහෙන් පහළ ළමයි 13වැනි දා එන්න" කියලා. මොකක්ද, ඒකේ තේරුම? එහෙම ඉස්කෝල පටන් ගැනීමේ තේරුම මට කියන්න. පහෙන් උඩ ළමයි 6වැනි දා එන්නලු. ඒ කියන්නේ ප්‍රහාරයක් එල්ල කරන්න පුළුවන්, ඒ නිසා දුවන්න පුළුවන් අයට 6 වැනි දා එන්න කියනවා. ලොකු ළමයින්ට 6වැනි දා එන්න කියනවා. ඒ වාගේම, ප්‍රහාරයක් එල්ල වෙන්න පුළුවන්, ඒ නිසා දුවන්න බැරි පොඩි ළමයි 13වැනි දා එන්නලු. දෙමව්පියන්ට ලොකු ළමයාත් එකයි, පොඩි ළමයාත් එකයි. ඒ නිසා දෙමව්පියන් ඒ කිසි ළමයෙක් ඉස්කෝලේ යැව්වේ නැහැ. මේකයි සිද්ධ වුණේ. ඒ නිසා රටේ අරාජිකත්වය පාලනය කරගන්න මේ පාලකයෝ අසමත් වුණා.

ඇමතිවරු එක එක විගඩම් කථා කියන්න පටන් ගත්තා. "මට තාත්තා කිව්වා" කියලා එක්කෙනෙක් කිව්වා. එක්කෙනෙක් කිව්වා, "නවසීලන්ත ප්‍රහාරයේ ප්‍රතිප්‍රහාර" කියලා. තව කෙනෙක් කිව්වා, "ඇමෙරිකානු බුද්ධි අංශය තොරතුරු වාර්තා කර තිබෙනවා" කියලා. අගමැතිවරයා හැංගිලා සිටියා, සභානායකවරයා ගෙදර සිටියා. ඉතින් රටේ ස්ථාවරයක් ඇති

[ගරු අනුර දිසානායක මහතා]

වෙයිද? ඇමතිවරු මේ සිදුවීමෙන් පස්සේ වගකීම භාරගන්න සමත් වුණේ නැහැ. "ආරක්ෂක මණ්ඩලයට කැඳවන්නේ නැහැ" කිව්වා. "මේකේ වගකීම ජනාධිපති භාරගන්න ඕනෑ" කිව්වා. "මට අදාළ නැහැ" කිව්වා. "මට අදාළ මහ බැංකුව විතරයි" කිව්වා. "මම ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක් නොවෙයි" කිව්වා. මොකක්ද, මේ විගඩම් කථා? මේ පාලකයන්ට පුළුවන්ද, රටට ආරක්ෂාවක් දෙන්න? හෙට දෙන්න පුළුවන්ද? තමුන්නාන්සේලාට රටේ ආරක්ෂාව ගැන සහතිකයක් හෙට දෙන්න පුළුවන්ද මේ පාර්ලිමේන්තුවට? තමුන්නාන්සේලාට එහෙම සහතිකයක් දෙන්න බැහැ. එහෙම සහතිකයක් දෙන්න බැරි ඇයි? තමුන්නාන්සේලා ඒ වගකීම උසුලන්න තවදුරටත් සුදුසු නැති පාලකයන්. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවදුරටත් මේ ආණ්ඩුව පවත්වාගෙන යන්න අයිතියක් නැහැ කියලා.

ඊළඟට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සිද්ධියෙන් පස්සේ සමාජයේ විශාල නොසන්සුන්තාවක් නිර්මාණය වුණා. ඒක දේශපාලනය දන්නා ඕනෑ කෙනෙකුට උපකල්පනය කරන්න පුළුවන්. මෙවැනි සිදුවීමක් වුණාට පස්සේ, දේශපාලනික වශයෙන් අවතැන්වීමට පත් වී තිබෙන කණ්ඩායම් මෙවැනි සිදුවීම් දේශපාලනයේ ගොදුරක් බවට පත් කරගන්න උත්සාහ කරනවා. ඔවුන් තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය දියත් කරන්න උත්සාහ කරමින් තිබෙනවා. ඒ නිසා රට ඇතුළේ විවිධ කලබැගෑනි නිර්මාණය කිරීම සඳහා දැනුවත්ව දේශපාලන කණ්ඩායම් මැදිහත් වුණා. ඒ සමහර ඒවා වීඩියෝ දර්ශනවලින් අපි දැක්කා. සමහර පක්ෂවල -ඒක පක්ෂයකුත් නොවෙයි- සමහර අය මතුපිට තලවලම ක්‍රියාත්මක වෙමින් සිටිනවා, මෙම ප්‍රහාර මෙහෙයවන්න. අපි දැක්කා, සමහර මන්ත්‍රීවරු හෙට්ටිපොළ පොලීසියට ගිහිල්ලා පොලීසියේ සිටින සැකකරුවන් එතුමාගේ ජීප් එකේ දමාගෙන එන හැටි. පොලීසියේ සිටින සැකකරුවෙක් ඒ විධියට තමන්ගේ ජීප් එකේ දමාගෙන යන්න මන්ත්‍රීවරයෙකුට පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ "සිරිපාල හා රන් මැණිකාද" ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මට දැනගන්න තිබෙන්නේ ඒකයි. හෙට්ටිපොළ පොලීසියට ගිහිල්ලා පොලීසියේ සිටින හතරදෙනා ඒ මන්ත්‍රීතුමාගේ ජීප් එකේ අරගෙන එනවා, බිංගිරිය පොලීසියට. ඇප අරගෙන එනකොට බිංගිරියේ සිට හෙට්ටිපොළට එන තෙක් ඔවුන්ට ගහමින් එනවා. මේ සිද්ධිවලින් කොපමණ විනාශයක් වුණාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැයි මාසයේ 13වෙනි දා ගම්පහ සිදුවීම් 164ක්, කුරුණෑගල සිදුවීම් 480ක්, පුත්තලම සිදුවීම් 182ක්, කළුතර සිදුවීම් 03ක් ඇතුළු මුළු සිදුවීම් 829ක් වාර්තා වෙලා තිබුණා. විශේෂයෙන්ම එහිදී මිනිස් ඝාතනයක් සිද්ධ වෙලා තිබෙනවා. තුවාලවීම් 10ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් දේවස්ථාන කිහිපයකටත් හානි සිද්ධ වෙලා තිබෙනවා. මේ, දින 21කට පස්සේයි. මෙවැනි ගැටුම් තත්ත්වයක් ඇති වීම සඳහා යම් යම් දේශපාලන ව්‍යාපාර විශාල වශයෙන් මැදිහත්ව කටයුතු කරමින් තිබෙන තත්ත්වයක් වාර්තා වී තිබියදී, දින 21කට පසුව මැයි මාසයේ 13වෙනි දා ඇති වූ මෙම තත්ත්වය පාලනය කර ගන්න තමුන්නාන්සේලා අසමත් වී තිබෙනවා. තමුන්නාන්සේලාට ඒ සිදුවීම වළක්වා ගන්නත් නොහැකි වී තිබෙනවා. ඒ සිදුවීමෙන් පසුව යථා තත්ත්වයට රට ගේන්නත් අසමත් වී තිබෙනවා; ආර්ථිකයට ඇති වූ අලාභ හානි සමනය කර ගන්නත් නොහැකි වී තිබෙනවා; පීඩාවට පත් වූ ජනතාවට සහන දෙන්නත් තමුන්නාන්සේලා අසමත් වී තිබෙනවා; කඩා වැටුණු ව්‍යාපාර යළි ගොඩ නඟන්නත් අසමත් වී තිබෙනවා. එම නිසා මේ ආණ්ඩුව ප්‍රහාරයෙනුත් අසමත් වූ ආණ්ඩුවක්. ඒ වාගේම ප්‍රහාරයෙන් පසුවත් අසමත්වීම් වැලක් පෙන්වන ආණ්ඩුවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා අපි නැවත නැවත යෝජනා කරන්නේ අන් කවරක්වත් නොවෙයි. අපි මේ ආණ්ඩුව පරාජයට පත් කළ යුතුව තිබෙනවා. තමුන්නාන්සේලාගේ අසාර්ථක වීම පිටුපස අපේ රටට අත පෙවීම සඳහා බලාගෙන සිටින විදෙස් බලවතුන්ට, විදෙස් වුවමනාවලට නිදැල්ලේ ක්‍රියාත්මක වන්න ඉඩකඩ සකස් කරමින් තිබෙනවා. ඒවාට මුවා වෙලා ආරක්ෂක ගිවිසුම් අත්සන් කරන්න බල කරමින් සිටින ඇමෙරිකාවත් එක්ක එකතු වෙලා ජනතාව මර්දනය කිරීම සඳහා වූ අණ පනත් ගේන්න තමුන්නාන්සේලා සූදානම් වෙලා තිබෙනවා. මේ ඇති වූ බේදවාචකය ඇතුළේත් වාසි සහගත දේශපාලන තීන්දු තීරණ ගන්නවා හැරුණු කොට රටේ ජනතාවගේ ආරක්ෂාව හෝ රටේ ජනතාවගේ වගකීම් හෝ උසුලන්න මේ ආණ්ඩුව සමත් වෙලා නැහැ. එම නිසා මේ ආණ්ඩුව දැන් ඉවත් වන්න ඕනෑ. මෙවැනි තත්ත්වයක් යටතේ ආණ්ඩුවක් කිරීම සඳහා තමුන්නාන්සේලාට තිබෙන අයිතිය මොකක්ද? ආණ්ඩුවක් කිරීම සඳහා මහජනයාට තමුන්නාන්සේලා කෙරෙහි තිබෙන විශ්වාසය සහ වගකීම මොකක්ද? තමුන්නාන්සේලාට තිබෙන්නේ ඒ කිසිවක් නැති පාලනයක්. අහසේ ඔහේ ඔංචිල්ලාවක පාවෙනවා වාගේ ආණ්ඩුවක් තිබෙනවා. ජනතාව මහ පොළොවේ අනේක විධ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙමින් තිබෙනවා; අනේක විධ අනාරක්ෂිතතාවකට මුහුණ දෙමින් සිටිනවා; සමාජය ඇතුළේ කැකෑරෙන ගිනි දැල් පුබුදුවමින් තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලා වලාකුළක තොටිල්ල වාගේ පැද්දි පැද්දී ඔහේ ජීවත් වෙමින් සිටින රඟ මඩලක් කර ගත් ආණ්ඩුවක් තිබෙනවා. එම නිසා තවදුරටත් මේ ආණ්ඩුවට අපේ රට පාලනය කරන්න අයිතියක් නැහැ.

අද විපක්ෂය නියෝජනය කරන කණ්ඩායම වැඩියි. ආණ්ඩුවේ ඉන්නේ 106දෙනායි. තමන් නායකත්වය දෙන සියලු කණ්ඩායම් පාර්ලිමේන්තුවට කැඳවන්න මහින්ද රාජපක්ෂ විපක්ෂ නායකතුමා සමත් වන්නේ නම්, අනික් හැම එකකදීම ආණ්ඩුවට පක්ෂ වුණාට මේ ව්‍යසනයේදී හෘදය සාක්ෂියට අනුව ආණ්ඩුවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න කියලා තීන්දුවක් ගන්න දෙමළ ජාතික සන්ධානයේ නායකතුමා වන සම්පන්දන් මැතිතුමා සමත් වන්නේ නම්, අනිවාර්යයෙන්ම හෙට හවස වන විට මේ ආණ්ඩුව පරාජයට පත් කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, එසේ නැතිව තමන්ට විපක්ෂ නායක ධුරය ප්‍රමාණවත්, මේ වෙලාවේ තමන්ගේ න්‍යාය පත්‍රයේ එවැනි සැලසුමක් නැහැ, එම නිසා මගේ න්‍යාය පත්‍රයේ තිබෙන්නේ වෙනම සැලසුමක් කියලා මහින්ද රාජපක්ෂ මහත්තයා කල්පනා කරනවා නම්, ඒ වාගේම අපේ දේශපාලන න්‍යාය පත්‍රය වෙන එකක්, මෙවැනි තත්ත්ව අපට අදාළ නැති දේවල්, අපේ දේශපාලන ජීවිකාව වෙන විධියකට ගත වෙමින් තිබෙනවා, එම නිසා මේක අපට අදාළ නැහැයි කියලා සම්පන්දන් මහත්මයා මේ ප්‍රශ්න ගැන වෙන විධියකට කල්පනා කරනවා නම්, ජනතාවට වග කිව නොහැකි මේ දුර්වල අසාර්ථක ආණ්ඩුව හෙටත් පවතීවි. හැබැයි, මහජනයාගේ හෘදය සාක්ෂියට ඇහුම් කන් දෙන විපක්ෂයක් අපේ රටේ තිබෙනවා නම්, විපක්ෂය නියෝජනය කරන එවැනි දේශපාලන ව්‍යාපාර අපේ රටේ

තිබෙනවා නම්, හෙට හවස් වනකොට මේ ආණ්ඩුව පරාජයට පත් කරන්න පුළුවන්. ඒ වෙනුවෙන් විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට, සියලු නායකයන්ට ආරාධනා කරමින් මම නතර වනවා. බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා.1.00]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අප්‍රේල් මාසයේ 21වැනි දාට කලින් මේ ISIS ත්‍රස්තවාදය ගැන මේ රටේ සංවාදයක් තිබුණේ නැහැ. අප්‍රේල් 21වන දාට කලින් සිට අපි අවුරුදු ගණනාවක් තිස්සේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විදියට ඉන්නවා. නමුත් මේ පාර්ලිමේන්තුව තුළවත් ISIS ත්‍රස්තවාදය ගැන සංවාදයක් තිබුණේ නැහැ. මේ ISIS ප්‍රහාරය බලාපොරොත්තු රහිත ප්‍රහාරයක්. ඊයේ මේ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් කිහිප දෙනෙකුට ඇප හම්බ වුණා. ඒ, ඇප ලබා දීමේ දී විනිශ්චයකාරවරිය කියනවා, "මේ බෝම්බ පිපිරීම සිදුවන කාලවකවානුව වනාහි යුද්ධය නිමා වී වසර 10ක පමණ කාලයක් ඉතාම සාමකාමී යහපත් කාලවකවානුවක් වූ අතර මහා පරිමාණ මිනිස් ඝාතන කිසිවක් වාර්තා නොවූ කාලවකවානුවක් බව කිව යුතුය. එවැනි කාලවකවානුවක් ගැනද අධිකරණය මනස යොමු කළ යුතුය. අධිකරණයක් යථාර්ථවාදී විය යුතු බවත්, පිටසක්වලින් පැමිණි අය මෙන් තීන්දු - තීරණ නොගත යුතු බවත්, යම් නිගමනයකට එළඹීමේ දී මතු පිටින් පමණක් බලා තීන්දු - තීරණවලට නොඑළඹිය යුතු බවත් 1993 ශ්‍රී ලංකා නීති වාර්තාවේ සඳහන් වෙනවා. මේ ප්‍රහාරයට ප්‍රථමයෙන් ශ්‍රී ලාංකිකයන්ට වසර 10ක කාලයක් මෙවැනි අවාසනාවන්ත සිද්ධි සිදු වුණේ නැත" කියලා. මහෙස්ත්‍රාත්වරියත් කියනවා, ඇත්ත වශයෙන්ම මේක බලාපොරොත්තු රහිත ප්‍රහාරයක් කියලා. ලංකාව තුළ කිසිම සංවාදයක් තිබුණේ නැහැ, ISIS ත්‍රස්තවාදයක් ඉස්මතු වෙලා කියලා. ජනතා විමුක්ති පෙරමුණ මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා; අපි ඉන්නවා; ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉන්නවා; පොහොට්ටුව පක්ෂය වෙනුවෙන් කටයුතු කරන මන්ත්‍රීවරුන් ඉන්නවා. කවුද මේ පාර්ලිමේන්තුව ඇතුළේ නැඟිටලා කිව්වේ අයිඑස් ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා? කවුරුවත් කිව්වේ නැහැ. පසු ගිය අවුරුදු 10 තුළ සාමකාමී වාතාවරණයක් මේ රටේ තිබුණා. මේක බලාපොරොත්තු රහිත ප්‍රහාරයක්. රටේ අන්තවාදී සංවිධාන තිබුණා. නමුත් ඒ අන්තවාදී සංවිධාන ත්‍රස්තවාදී ප්‍රහාරයකට අනුගත වෙනවාය කියන තොරතුරක් අපට ලැබුණේ නැහැ. ඒක තමයි ඇත්ත.

අපේ හිතවත් අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ තොරතුරු ගැන කථා කළා. මේ තොරතුරු නිශ්චිත නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මහෙස්ත්‍රාත්වරිය කියපු දේ කියවන්නම්. මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා මේකට සවන් දෙන්න කියලා. එතුමියගේ තීන්දුවේ තවදුරටත් කියනවා, "එම ලිපිවල අවසානයේ සඳහන් වන අන්දමට සහරාන් යන අය සිය මුහුණු පොත ඔස්සේ සිය අනුගාමිකයන් අභිප්‍රේරණය කරමින් සිටින අතර ඒ සම්බන්ධ රහසිගත තොරතුරු පිළිබඳව රහසිගතව විමර්ශන කරන බව සඳහන් කර ඇත" කියලා. මේක තමයි වැදගත්. එහි වැඩිදුරටත් කියනවා, "ඒ අනුව රාජ්‍ය බුද්ධි ප්‍රධානියා එවන් ප්‍රහාරයක් ගැන දින වකවානුවක් සම්බන්ධයෙන් සඳහන් කර නැත" කියලා. බුද්ධි ප්‍රධානියා මේ ප්‍රහාර ගැන දින වකවානුවක් සඳහන් කරලා නැහැ කියලා මහෙස්ත්‍රාත්තුමිය කියනවා. මේක තොරතුරක් පමණයි. මහෙස්ත්‍රාත්වරිය ඊයේ එතුමියගේ තීන්දුවෙන් කියනවා, බුද්ධි ප්‍රධානියා ප්‍රහාරයක් ගැන දින වකවානුවක් සඳහන් කළේ නැහැ කියලා. මේ නඩු තීන්දුවේයි එහෙම තිබෙන්නේ. මේක තමයි ඇත්ත. තොරතුරු ආවා. නමුත් දින වකවානුවක් -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Member, please do not disturb me. මම මේ කථා කරන්නේ ඊයේ නඩු තීන්දුව ගැනයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නවලට උත්තර ඔක්කෝම මේකේ තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

තීන්දුවක් දුන්නාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඇප දෙන කොට තීන්දුවක් දුන්නා නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඇප නියෝගයක් දුන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒක තීන්දුවක් නේ. ඇප නියෝගයක් කියන්නේත් තීන්දුවක්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඇප නියෝගයක් දෙන්නේ ඇප දෙන්න විතරයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එතුමිය තවදුරටත් එම තීන්දුවෙන් කියනවා, "ඒ අනුව රාජ්‍ය බුද්ධි ප්‍රධානියා එවැනි ප්‍රහාරයක් ගැන දින වකවානුවක් සම්බන්ධයෙන් සඳහන් කර නැත. එමෙන්ම 2019 අප්‍රේල් මස 21වැනි දා පෙරවරු 8.46ට යොමු කර ඇති..." කියලා. WhatsApp

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

පණිවුඩයකින් තමයි බුද්ධි ප්‍රධානියා මේ තොරතුරු යවලා තිබෙන්නේ. මහෙස්ත්‍රාත්වරියගේ තීන්දුවෙන් තමයි මේ කියන්නේ.

"...පණිවුඩය ගැන සඳහන් කිරීමේදී ඉතාම වැදගත් බුද්ධි තොරතුරක් දැනුම් දීම සඳහා විධිමත් ක්‍රමවේදයක් භාවිත කළ යුතු වේ. WhatsApp ක්‍රමය මඟින් එවැනි තොරතුරක් ලබා දීම ප්‍රඥාගෝචර නැත. එය දැන ගැනීමෙන් පසු පළමු සැකකරු එය පොලිස්පතිවරයා වෙත යොමු කර ඇත..." WhatsApp එකෙන් තමයි පළමුවැනි සැකකරුට තොරතුර ආවේ. පසුව ඔහු පොලිස්පතිවරයාට යොමු කරලා තිබෙනවා.

..."එහිදී දෙවැනි සැකකරු සඳහන් කර ඇත්තේ, එම තොරතුර සම්බන්ධයෙන් පහළ නිලධාරීන් දැනුවත් කර ඇති බවයි."

මේක තමයි ඇත්ත. පුවත් පත්වල එක එක දේවල් තියෙන්න පුළුවන්. දිනය දුන්නා, වෙලාව දුන්නා, Identity Card numbers දුන්නා කියලා. නමුත්, මහෙස්ත්‍රාත්වරිය කියනවා, එවැනි දැනුම් දීම් සිද්ධ වුණේ නැහැ WhatsApp පණිවුඩ හරහා තමයි ඒවා යවා තිබෙන්නේ, දින වකවානුවක් ගැන කිසිම දවසක බුද්ධි අංශය සඳහන් කරලා නැහැ කියලා.

මේ විශ්වාස භංග යෝජනාව දිහා බැලුවාම ආරක්ෂක ඇමතිවරයාට වග කීමක් නැහැ. ඔක්කෝම තිබෙන්නේ අගමැතිතුමාට; කැබිනට් මණ්ඩලයට; මන්ත්‍රීවරුන්ට. මේ විශ්වාස භංග යෝජනාවේ ඔබතුමන්ලා ආරක්ෂක ඇමතිවරයා ගැන සඳහන් කරලා තිබෙනවාද? ඇයි, අගමැතිවරයා ගැන විතරක් සඳහන් කරන්නේ? අගමැතිතුමායි, අපියි, -කැබිනට් මණ්ඩලයයි- අමාරුවේ දමන්න මේක හිතාමතාම කරපු දෙයක්. ආරක්ෂක ඇමතිවරයා ගැන මේකේ වචනයක්වත් කියලා තිබෙනවාද? [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, please! ඇයි, ආරක්ෂක ඇමති,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ආණ්ඩුව තමයි. නමුත්, අගමැතිතුමා නමින් සඳහන් කරනවා; කැබිනට් මණ්ඩලය නමින් සඳහන් කරනවා; ඇමතිවරු නමින් සඳහන් කරනවා. ඇයි ආරක්ෂක ඇමතිවරයා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විනිශ්චයකාරතුමිය ආරක්ෂක ඇමතිවරයාගේ වග කීම ගැන මේ ඇප නියෝගයේ සඳහන් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] මේක පොඩ්ඩක් අහගෙන ඉන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] දෝෂාභියෝගය නොවෙයි. තමුන්නාන්සේලා හිතාමතා මේක ෂේප් න්‍යායෙන් ගෙනැල්ලා තිබෙන්නේ. ෂේප් න්‍යායෙන් මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ආරක්ෂක ඇමති ගැන වචනයක් කියලා නැහැ. අගමැතිවරයා තමයි වැරදිකාරයා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ, please.

දැන් බලන්න, මහෙස්ත්‍රාත්වරිය මෙහිදී ආරක්ෂක ඇමතිවරයා ගැන කියනවා. රාජ්‍ය බුද්ධි සේවාව මෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳ සියලු වග කීම් පැවරෙන්නේ ආරක්ෂක ඇමතිවරයාට බව මේ නඩු තීන්දුවේ තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආරක්ෂක ලේකම්වරයාට යම් කිසි තොරතුරක් ලැබුණාම ත්‍රිවිධ හමුදාපතිවරු කැඳවන්න එතුමාට බලයක් නැහැ කියලා තිබෙනවා. The Secretary to the Ministry of Defence has no power to summon the Service Chiefs. මේ තීන්දුවේ තිබෙනවා, ලේකම්වරයාට බලයක් නැහැ කියලා. ඒ බලය තිබෙන්නේ ජනාධිපතිතුමාට. එනම් ආරක්ෂක ඇමතිතුමාට. අප්‍රේල් මාසයේ 9 වැනි දා මේ තොරතුර ආරක්ෂක මණ්ඩලයේ සාකච්ඡා වුණාම ආරක්ෂක අමාත්‍යවරයාට තිබුණා ත්‍රිවිධ හමුදාපතිවරුන්ට අවශ්‍ය නියෝග දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක ඇමතිවරයාගේ බලතල ආරෝපණය කරගන්න ආරක්ෂක ලේකම්වරයාට බලයක් නැහැ කියලා මෙතැන කියනවා. මේ ඇප නියෝගයේ තිබෙනවා. ආරක්ෂක ලේකම්වරයාට බලයක් නැහැ, ත්‍රිවිධ හමුදාපතිවරුන් කැඳවන්න. ආරක්ෂක ඇමතිවරයාගේ බලතල ආරෝපණය කරගන්න ආරක්ෂක ලේකම්වරයාට බැහැ. මේ ඇප නියෝගයේ එහෙම තියෙනවා. මේක කෙළින්ම එක්සත් ජාතික පක්ෂයටත්, ගරු අගමැතිතුමාටත් මඩ ගහන්න ගෙනාපු යෝජනාවක්. මොකද, ඊයේ ලබා දුන් ඇප නියෝගය අනුව ආරක්ෂක ඇමතිවරයාට තමයි බුද්ධි සේවාවේ, පොලිස් දෙපාර්තමේන්තුවේ වග කීම් පැවරෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ආරක්ෂක ඇමති ආණ්ඩුවේ සාමාජිකයෙක් නොවෙයිද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒකට ඔබතුමන්ලා උත්තර දෙන්න කෝ. [බාධා කිරීමක්] එහෙනම්, ආරක්ෂක ඇමතිගේ නම විශ්වාස භංග යෝජනාවේ සඳහන් කරලා නැත්තේ ඇයි? මේ වගකීම අගමැතිවරයායි, එක්සත් ජාතික පක්ෂයයි පිට පටවන්න තමයි අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ. අද "ලංකාදීප" පුවත් පතේ 10 වැනි පිටුවේ එම ඇප නියෝගය තිබෙනවා. තමුන්නාන්සේලා ඒක කියවන්න. තමුන්නාන්සේලා කරපු වැරැද්ද ඒකයි. ආරක්ෂක ඇමතිවරයාට කිසිම දෝෂාරෝපණයක් එල්ල කරලා නැහැ. [බාධා කිරීම්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ආරක්ෂක ඇමති පත් කළේ කවුද? [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි, හරි. [බාධා කිරීමක්] ඔව්, මම දන්නවා. තමුන්නාන්සේලා විරුද්ධව වැඩ කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සහරාන් පක්ෂව වැඩ කළා!

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ විශේෂ කාරක සභාව පත් කළේ ඇයි? දැන් මෙතුමන්ලා ප්‍රශ්න අහනවා නේ. අපිත් අහන්නේ ඒ ප්‍රශ්න තමයි. ඒකට තමයි විශේෂ කාරක සභාව පත් කළේ. අපටත් දැන ගන්න ඕනෑ කොහේද වැරදුණේ කියලා. ඒකයි අපි කියන්නේ, ඒ විශේෂ කාරක සභාවට අගමැතිතුමාට එන්න කිව්වත්, ජනාධිපතිතුමාට එන්න කිව්වත් යන්න ඕනෑය කියලා. මොකද, මේ රටේ ජනතාවට අයිතියක් තිබෙනවා, තිරය පිටුපස - behind the scenes - වුණේ මොකක්ද කියලා දැන ගන්න. මේ විශේෂ කාරක සභාව පත් කළ නිසා තමයි අපි දැන ගත්තේ, එක සැකකරුවකුට තානාපතිකමක් ලබා දෙන්න

උත්සාහයක් ගත්තා කියලා. විශේෂ කාරක සභාව නැත්නම් ඒ තොරතුර එනවාද? එක වූදිතයකු කිව්වා, "මට තානාපතිකමක් දෙන්න හැදුවා, අස්වෙලා යන්න කිව්වා" කියලා. ඔහු අස් වුණේ නැති නිසා නඩු වැටුණා. මේ දේවල් තමයි ජනතාව දැන ගන්න කැමැති.

ඊළඟට, සහරාන්ට මුදල් දුන්නාය කියා හෙළිදරව් වෙලා තිබෙනවා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය රජය කාලයේ සහරාන්ට මුදල් දුන්නා. ඒ නිසා හිටපු ආරක්ෂක ලේකම් මේ විශේෂ කාරක සභාවට කැඳවන්න අදහසක් තිබෙනවා. සරත් ෆොන්සේකා මැතිතුමා කියා තිබුණා, හිටපු ආරක්ෂක ලේකම්, ජනාධිපති සහ අගමැති මේ කාරක සභාවට කැඳවනවා කියලා. ඉතින් මේවා තමයි තොරතුරු කියන්නේ. මේ විශේෂ කාරක සභාව පත් කළේ තිරය පිටුපස සිදු වුණු දේවල් දැන ගන්නයි. ආරක්ෂක කවුන්සලය මාස ගණනකින් රැස් වෙලා නැහැ. ඒකට අගමැතිවරයාට එන්න කියලා නැහැ. ඒකට අපි පළි ද? අගමැතිවරයාට ඒකට එන්න කියන්නේ නැත්නම්, අගමැතිවරයා කොහොමද මේ දේවල්වලට වග කියන්නේ?

දැන් මේ සිද්ධිය වෙලා හමාරයි. නමුත්, රජය ඉතාම ඉක්මනින් -පැය 24ක් ඇතුළත- ඒ ත්‍රස්තවාදී දැල කඩන්න පියවර ගත්තා. ඉතාම කෙටි කාලයක් තමයි ඒකට ගත වුණේ.

ඒ වාගේම, වන්දි ගෙවීම සම්බන්ධයෙන් කියනවා නම්, සියයට 99ක්ම ඒ අවශ්‍ය වන්දි මුදල් ලබා දීලා තිබෙනවා.

වයඹ පළාතේ කුරුණෑගල සිද්ධියට, මිනුවන්ගොඩ සිද්ධියට අදාළව TV එකේ පෙන්නුවේ කවුද? අපිද? පොලීසියට ගිහිල්ලා හතරදෙනකු එළියට ගත්තේ අපිද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය ජාතිවාදය වපුරන්නයි හදන්නේ. දැන්වත් -ප්‍රමාද වෙලා හෝ- මේ ජාතිවාදය වපුරන එක නවත්වන්නය කියලා මම කියනවා. මොකද, අපේ රටේ මුස්ලිම් අය, ද්‍රවිඩ අය සිංහල අයගේ නෑදැයෝ. ද්‍රවිඩ අයත් ආවේ ඉන්දියාවෙන්. අපිත් ආවේ ඉන්දියාවෙන්. ඒක අපි පිළිගන්න ඕනෑ. සමහරු ඒක පිළිගන්න කැමැති නැහැ. අපි දෙගොල්ලන්ම ආවේ ඉන්දියාවෙන්. ගිය සතියේත් මම පාර්ලිමේන්තුවේදී මේ කාරණය කිව්වා. 16වන සියවසේදී මුස්ලිම් අය -ඉස්ලාම් භක්තිකයන්- ලංකාවට එන කොට කාන්තාවන් අරගෙන ආවේ නැහැ. අපේ සිංහල කාන්තාවන් තමයි ඔවුන් විවාහ කර ගත්තේ. නැඟෙනහිර පළාතේ මුස්ලිම් අය කියනවා, "අපේ අම්මලා සිංහල කාන්තාවන්" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, නැඟෙනහිර පළාතේ මුස්ලිම් අය පදිංචි කළේ මහනුවර සෙනරත් රජතුමා බව. මොකද, ඕලන්දකාරයන් ඒ අය එළෙව්වාම -ඒ අය 16වන සියවසේ වෙළෙඳාමට ආවේ- මහනුවර රජතුමා හම්බ වෙන්න තමයි ආවේ. දැන් කාලයේ නම් එහෙම හම්බ වෙන්න ආවොත් මොනවා වේවිද? නමුත්, එදා මහනුවර රජතුමා සානුකම්පිතව කිව්වා, "නැඟෙනහිර පළාතේ ඔයගොල්ලන් පදිංචි වෙන්න, මම වෙනුවෙන් නැඟෙනහිර පළාත බලා ගන්න" කියලා. ඒ විධියට තමයි අපේ සිංහල රජවරු ක්‍රියා කළේ.

වවුනියාවේ දේවස්ථානය හදන්න, මහනුවර සෙනරත් රජතුමා තමයි කතෝලික පියතුමන්ලාට ඉඩම දුන්නේ. ජෝශප් වාස් පියතුමා -මේ ළඟදි උන්වහන්සේ සාන්තුවරයකු කළා, පාප් වහන්සේ පැමිණි වෙලාවේ- ගැන එහෙම ඔබතුමා දන්නවා ඇති නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා මිහිදන් කළේ මහනුවරයි. මහනුවර රජවරු අපේ රටට ආදර්ශයක් දීලා තිබෙනවා. එදා ජාතිවාදයෙන් තොර සංස්කෘතියක් තිබුණා. සමහර විට ඒක මැදමුලන සංස්කෘතියට වෙනස් වෙන්න පුළුවන්. නමුත් මහනුවර රජවරු සියලු ජාතීන්ට එක විධියට සැලකුවා. එදා ද්‍රවිඩ රජවරු තමයි සිටියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න කලින් මා ඔබතුමාට හොඳ කථාවක් කියන්නම්. නරේන්ද්‍රසිංහ රජතුමාගෙන් පස්සේ සිංහල රාජ වංශය අවසන් වූ බව ඔබතුමා දන්නවා නේ. ඊට පස්සේ, රජකමට සිංහල කුමාරයෙක් සහ ද්‍රවිඩ කුමාරයෙක් සිටියා. සිංහල කුමාරයා තමයි, උනම්බුව කුමාරිහාමිගේ දරුවකු වූ උනම්බුව බණ්ඩාර කුමාරයා. ද්‍රවිඩ කුමාරයා තමයි, නරේද්‍රසිංහ රජුගේ බිසවගේ සහෝදරයකු වන විජය රාජසිංහ කුමාරයා. මේ ද්‍රවිඩ කුමාරයායි, සිංහල කුමාරයායි අතර තරගයක් තිබුණා. මල්වතු - අස්ගිරි මහා නායක හිමිවරුන් රජකමට තෝරා ගත්තේ කවුද? උන්වහන්සේලා රජකමට සිංහල කුමාරයා තෝරා ගත්තේ නැහැ, ද්‍රවිඩ කුමාරයා තමයි තෝරා ගත්තේ. ඇයි ඒ? ඒ කුමාරයා බෞද්ධාගමට ළැදියි. උනම්බුව බණ්ඩාර සෙල්ලක්කාරයාය කියලා ඒ කුමාරයා අයින් කරලා ද්‍රවිඩ කුමාරයාට රජකම දුන්නා. එතුමා තමයි විජය රාජසිංහ හැටියට රජ වුණේ. අපේ රටේ මේ සංස්කෘතියක්, ඉතිහාසයක් තිබෙනවා. නමුත් මේ ඉතිහාසය දැන් පාසල්වල උගන්වන්නේ නැහැ. බොහෝදෙනෙක් දන්නේ, 1956 ජයග්‍රහණයයි, 1977 එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණයයි, 1971 කැරැල්ලයි, 1989 කැරැල්ලයි ගැන විතරයි. ඒ ඉතිහාසය දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1971 කැරැල්ල කාලයේ අපි නීති විද්‍යාලයේ තමයි සිටියේ. 1971දී එකවර පහර දෙයි කියලා කවුරුත් බලාපොරොත්තු වුණාද? අපි නීති විද්‍යාලයේ ඉන්නකොට එක රාත්‍රියක පොලිස් ස්ථාන 37කට ගැහුවා. ඒ ගැන දැනගෙන සිටියේ නැහැ. මේ සිද්ධියත් ඒ වාගේ තමයි. මේ පාර්ලිමේන්තුව තුළදීවත්, පාර්ලිමේන්තුවෙන් පිටතදීවත් ඉස්ලාමීය ත්‍රස්තවාදය ගැන කවුරුවත් කථා කළේ නැහැ. ආණ්ඩු පක්ෂය කථා කළේත් නැහැ, විපක්ෂය කථා කළේත් නැහැ. නමුත් ඒ සිද්ධිය සිද්ධ වුණාට පස්සේ හැමදෙනාම ඒ ගැන කථා කරනවා. අපේ රට ගොඩ ගන්න නම් ජාතික සමගිය ආරක්ෂා කරගෙන අපි ඉදිරියට යන්න ඕනෑ. ඒ නිසා, ජාතික සමගිය අත්‍යවශ්‍යයි.

එක්තරා භික්ෂූන් වහන්සේ නමක් පසුගිය දිනවල මහනුවරට ගිහින් විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූවා. ඊට පස්සේ මල්වතු - අස්ගිරි මහා නායක හිමිවරු මොකක්ද කිව්වේ? උන්වහන්සේලා ඒකට අනුබල දුන්නාද? නැහැ. හිටපු මුස්ලිම් ඇමතිවරුන්ට කිව්වා, යළි ඇමති ධුර භාරගන්න කියලා. ඒකට තමයි මැද පිළිවෙත - middle path - කියලා කියන්නේ. භික්ෂූන් වහන්සේ නමක් අවසරයක් නැතිව, බලහත්කාරයෙන් ගිහිල්ලා උපවාස කළා. මල්වතු - අස්ගිරි මහා නායක හිමිවරු මුස්ලිම් හිටපු ඇමතිවරුන්ට කිව්වා, වහාම ඇමති ධුර භාරගන්න කියලා. අපි කැමැති නැහැ, මුස්ලිම් ජනතාවගේ ඒ නියෝජිතයන් ඉවත් කරලා මේ රටේ ආණ්ඩු කරන්න. මේ සියලු දේවල්වලින් පාඩම් ඉගෙන ගන්න ඕනෑ. සිද්ධියක් වුණාට පස්සේ ඒ ගැන කථා කරන්න පුළුවන්. දැන් අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කළේ, මේ සිද්ධියට කලින් ඔක්කොම තොරතුරු දැනගෙන සිටියා කියලායි. මේ ඔක්කොම දැනගත්තේ සිද්ධිය වුණාට පසුවයි. මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, ඊයේ මහෙස්ත්‍රාත්තුමිය දුන්නු නඩු තීන්දුව කියවන්න කියලා. ඒක කියෙව්වොත්, අපට වැරැදුණේ කොතැනද කියලා හොයාගන්න ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් මා කියන්න ඕනෑ. ගරු අගමැතිතුමාට චෝදනා කරන්න එපා. අනික, අගමැතිතුමා මේ කාරණය දැන ගත්තාට පස්සේ ආරක්ෂක මණ්ඩලයේ අයට උපදෙස් දීලා තිබුණා, අගමැතිතුමා එන්න කිව්වත් යන්න එපා කියලා. ඒක නේ, ඒ ගොල්ලෝ ආවේ නැත්තේ. අගමැතිතුමා ඒ අයට එන්න කිව්වත් ඒ ගොල්ලෝ ගියේ නැහැ. අගමැතිතුමා නිහතමානීව ආරක්ෂක අමාත්‍යාංශයට ගියා. එතුමා ආරක්ෂක අමාත්‍යාංශයට ගිහින් පැය

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

භාගයක් එළියේ වාඩිවෙලා හිටියා. ඒ විධියට තමයි උපදෙස් දීලා තිබුණේ. ඉතින් අනුර දිසානායක මන්ත්‍රීතුමා අගමැතිතුමාට දොස් කියන්නේ කොහොමද? මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුව හැටියට අපි, මේ සිදුවුණු දේවල්වලින් පාඩම් ඉගෙනගෙන, එක්සත් ශ්‍රී ලංකාවක් ගොඩ නඟන්න සියලුදෙනාම ඇප කැප වෙමුයි කියන පණිවුඩය මේ සභාව ඉදිරියේ තබමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Vasudeva Nanayakkara.

[අ.භා.1.20]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පළමුවෙන් කිව යුතු වන්නේ මෙයයි. මේ ආණ්ඩුව පිහිටුවන්නට උදව් වූ උදවිය අද මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන එනවා. ඒක ඉතිහාසයේ එක්තරා හාස්‍යයක්. එසේ වීම ගැන අපට සතුටුයි. නමුත් මේකෙන් අඟුරුවල කළුපාට ඉවත් කරන්නට බැරි බව අපි කිව යුතුයි. කියමනක් තිබෙනවා, " කිරි දියෙනි දෙවියත් - අඟුරු සුදු වන කලෙක් නම් නැත්" කියලා. ඒකට කමක් නැහැ. අපට අද අවස්ථාව ලැබී තිබෙනවා, විශ්වාස භංග යෝජනාවක් ගැන සාකච්ඡා කරන්න. මේ විශ්වාස භංග යෝජනාව ගැන අපි කවුරුත් දන්නවා. මේ ප්‍රශ්නයේදී ආණ්ඩුවට කටඋත්තර නැහැ. සිද්ධිය පිළිබඳව නිශ්චිතව කියලා තිබුණේ නැති බව සභානායක, ගරු කිරිඇල්ල මැතිතුමා කියනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නඩුකාරතුමිය කියපු එක -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඊයේ නඩුකාරතුමිය ඇප දෙනවාට වඩා එහා කටයුත්තක් ඉටු කිරීමට ඉදිරිපත් වෙලා තිබෙන බව මාත් දැක්කා.

නිශ්චිත වශයෙන් දෙයක් වෙන්න යන බව දැන ගැනීමේ වගකීම ආණ්ඩුවටයි තිබෙන්නේ. ආණ්ඩුවේ රාජ්‍යයට, රාජ්‍යයේ ආරක්ෂක අංශවලට තමන්ගේ වගකීම ඉටු කරන්න බැරි වීම නිසා, කාටවත් ඒ ගැන කියන්න බැහැ කියලා විනිශ්චය ආසනයකින් කියවුණාය කියලා අද මේ ගරු සභාවේදී ඔබතුමා කරුණු දක්වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අහන්නේ මේකයි. දිගටම ජනමාධ්‍යවල පළ වුණා, "ජිහාඩ් සටන්කරුවන් පුහුණු වෙනවා. ජිහාඩ් සටන්කරුවන් ප්‍රහාරයන්ට සූදානම් වෙනවා" කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
After the event?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. නැහැ. පසුගිය අවුරුද්දක කාලයක් තිස්සේ. එතකොට තමුන්නාන්සේලා කිව්වේ මොකක්ද? ඒවා ජාතිවාදය. තමුන්නාන්සේලා ඒවාට කිව්වා, "ජාතිවාදි බිල්ලෝ මවන්න එපා" කියලා. තවත් අය කිව්වා, "හැළියේ කිඹුල්ලු දකින්න එපා" කියලා. දැන් හැළියේ කිඹුල්ලු දැක්කා නම් හොඳයි නේද? ඒකයි මම කියන්නේ, තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය soft-pedal කළා කියලා. තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය soft-pedal කිරීමට හේතුවක් තිබෙනවා. තමුන්නාන්සේලාට මුස්ලිම් ජාතිකයන්ගෙන් ඡන්ද එකතු වෙනවා. මුස්ලිම් ඡන්ද බහුල වශයෙන් තමුන්නාන්සේලාටයි ලැබෙන්නේ. ඒ අයගේ සංවිධානවල නායකයෝත් තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය ඇතුළත සිටිනවා. ඒ ගොල්ලෝ ඔක්කොම ආණ්ඩුවත් එක්ක එකට පොදි ගැහිලා සිටිනවා. ඒ අයත්, ආණ්ඩුවත් අතර තිබෙන සම්බන්ධය නිසා ආණ්ඩුව මේවා පිළිබඳ සෙවීම යටපත් කළා. ඇයි ආණ්ඩුව එහෙම කරන්නේ? ඇයි ඒ නායකයෝ තමුන්නාන්සේලාට එහෙම බල කරන්නේ? මේ ජිහාඩ්කරුවන් ගැන තොරතුරු දුන්නොත්, ඒවා ගැන පරීක්ෂණ පවත්වන්නට ගියොත් මුස්ලිම් සමාජයේ ඒ ගැන රිදීමක් ඇති වෙනවා; බෙදීමක් ඇති වෙනවා. මේවා ගැන ආණ්ඩුව සොයන්න බලන්න ගියොත් ආණ්ඩුවට විරුද්ධව මුස්ලිම් කණ්ඩායමක් ඇති වෙනවා. එම නිසායි මේවා යටපත් කළේ. එහි ප්‍රතිඵලය තමයි අවසානයේ තමුන්නාන්සේලා අද මේ රටට, මේ රටේ ජනතාවට විඳින්නට සිද්ධ කර තිබෙන්නේ. මෙපමණ තොරතුරු, දින වකවානු නැති වුණත් මට ඊයේ "විෂ්ණුබාන්ත්" කියන මඩකලපුවේ එක්තරා දේශපාලන නායකයෙක් හමු වුණා. ඔහු අපිට කිව්වා, දැනට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා, ඔහු රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානියාට දැන්වුවාය කියලා මෙන්න මේ වාගේ තත්ත්වයක් ගොඩ නැඟෙමින් එනවා. මේ වාගේ තර්ජනාත්මක තත්ත්වයක්, මේ වාගේ ප්‍රහාරක බලයක් ගොඩ නැඟෙමින් තිබෙනවා. මේ වාගේ ප්‍රචණ්ඩ ආකල්පයකට පිරිස් එකතු කරමින් ඉන්නවා කියලා. ඒ තොරතුරු ඔක්කොම බුද්ධි අංශ සතුව තිබුණා. තමුන්නාන්සේලාගේ වාර්තා අරගෙන බලන්න. ඒ වාර්තාවල මේ ගැන කොපමණ අනතුරු ඇඟවීම් තිබුණාද කියලා. අන්තිමට වනාතවිල්ලුවෙන් පුහුණු වෙඩි පිටියක්, නවීන ආයුධ, වෙඩි බෙහෙත් මතු වුණා. කොහොමද ඒ ගැන හෙවිල්ල නතර වුණේ කියලා අපට කියන්න. ඒ ගැන හෙවිල්ල නතර වුණේ කොහොමද? ඒකට මැදිහත් වුණේ කවුද? ඇමතිවරයෙක් හා ආණ්ඩුකාරවරයකු මැදිහත්වෙලා, ඒවා ඒ වෙලාවේ යටපත් කළාය කියන කාරණය දැන් කවුරුත් දන්නා තොරතුරක්. ඒ අය එහෙම කළේ ඇයි? මේවා පිළිබඳව පරීක්ෂණ එළිදරවු වෙලා ඇදෙන්න ගත්තා නම් මේ කටයුතු නවතින්නේ කොතැනින්ද

කියලා කියන්න බැහැ. එහෙම වුණා නම් මේ ආණ්ඩුවත් එක්ක මුස්ලිම් සමාජයේ රැඩිකල් බලවේග ගැටෙනවා. "මේවා හොයන්න යන්න එපා. මේක හොයන්න ගිහිල්ලා ඇති වන්නා වූ අවුල අපේ ඡන්දවලට විශාල පාඩුවක් ඇති කරයි" කියලා මුස්ලිම් නායකයන් තමුන්නාන්සේලාට කිව්වා. අන්න ඒකයි පළමුවැනි කාරණය.

අගමැතිතුමාට මෙතැනදී වෙනම න්‍යාය පත්‍රයක් තිබුණා. මේ සිද්ධියෙන් පසුව නියත වශයෙන්ම ඇති වෙන්නට ඉඩ තිබුණු විශාල මුස්ලිම් විරෝධී කෝලාහලය අගමැතිතුමා බලාපොරොත්තු වුණා. මේ රටේ මහා කලබැගෑනියක් ඇති කරලා, දසදහස් ගණන් සරණාගතයන් -සිංහල ජනයා අතර ජීවත් වන මුස්ලිම්වරු- ඉවත්වෙලා, නැඟෙනහිර පළාතට යන්න පටන් ගනීවි. ඒ සමඟම මේ රටේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සරණාගත අංශ මැදිහත් වෙන්න පටන් ගනීවි. ඒ සමඟම මිනිසුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කියලා ඇමෙරිකන් හමුදාවලට මැදිහත් වෙන්න "R2P" කියලා ඔවුන් හදා ගත්ත සූත්‍රයක් තිබෙනවා, ඒක ක්‍රියාත්මක වේවි කියලා හිතුවා. මේවා එතුමාගේ බලාපොරොත්තු. එතකොට ඡන්ද පවත්වන කථාව අවසානය; මේ රටේ මැතිවරණ අවසානයි; ප්‍රජාතන්ත්‍රවාදය අවසානයි. කෝලාහලයක් තමයි එන්නේ. එතකොට සරණාගතයන් දසදහස් ගණනක් ඉන්නවා. එක් පැත්තකින් එක්සත් ජාතීන්ගේ සරණාගත අංශ මීට මැදිහත් වනවා. අනික් පැත්තෙන් R2P යටතේ ඇමෙරිකන් හමුදා කෙළ හලමින් බලා හිටි අවස්ථාව පැදෙනවා. එතකොට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අභාවයට පත් වනවා. මේකයි තමුන්නාන්සේලාගේ නායකයාගේ බලාපොරොත්තුව වෙලා තිබුණේ. තමුන්නාන්සේලාගේ නායකයාට වෙනම න්‍යාය පත්‍රයක් තිබුණු බව අපි කවුරුත් දන්නවා. මේ පිපිරීම සම්බන්ධයෙන් කල් ඇතිව දැන ගන්න බැරි වුණාය කියන එක තමයි ඔබතුමන්ලාට එල්ල වන ලොකුම විශ්වාස භංග යෝජනාව.

"අපට කලින් දැනගන්න බැරි වුණා," කියලා රජයත් කියනවා. අගමැතිතුමා විතරක් නොවෙයි, ආරක්ෂක ඇමතිතුමාත් මේකට වග කියන්නේ නැද්ද කියලා ඊළඟට අහනවා. මේවා ඔක්කොම තමුන්නාන්සේලාගේ ප්‍රශ්න. තමුන්නාන්සේලා මේ පාපොච්චාරණයක් කරන්නේ. "අපට ඒ කටයුත්ත කරන්න බැරි වුණා. අපට ඒක හොයා ගන්න බැරි වුණා. අපේ ආරක්ෂක ඇමතියි, අපියි අතර එකඟතාවක් නැතිවයි හිටියේ" කියන කාරණා අපේ කාරණාද? මේ විශ්වාස භංග යෝජනාවට තමුන්නාන්සේලාට එක දෙයයි කරන්න පුළුවන් කියන එක අපි තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ප්‍රකාශ අනුව තමුන්නාන්සේලාට වැරැදීම් වෙලා තිබෙනවා නම්, හරියට හොයා ගන්න බැරි වීම් වෙලා තිබෙනවා නම්, වාර්තා පිට වාර්තා ආපු ඒවා ජනමාධ්‍යවල දිගටම පළ වෙද්දී ජිහාඩ් සටන්කරුවන් ගැන තොරතුරු හොයාගෙන ඔවුන් මෙල්ල කරන්න -මර්දනය කරන්න- බැරි වෙලා තිබෙනවා නම් තමුන්නාන්සේලාට කියන්න තිබෙන්නේ *"mea culpa"* කියලා විතරයි. අපි තමයි වැරැදිකාරයන්, අපෙන් තමයි මේ වැරැද්ද වුණේ කියලා හිතලා ආණ්ඩු පක්ෂයේ ඉන්න මේ පිළිබඳව දන්නා වූ උදවිය මේ විශ්වාස භංග යෝජනාවට අඩු ගණනේ ඡන්දය නොදී වැළකී ඉන්නවා නම් හොඳයි. මේ ආණ්ඩුව මේ කරපු අපරාධය තවත් අපරාධ වැලක කොටසක් හැටියට එකතු වනවාය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ වාගේම මේ රටේ කවදාවත් නොවූ විරූ ඓතිහාසික

බෙදුම්වාදයක නිර්මාතෘවරු හැටියට මේ රජය මේ රටේ ඉතිහාසයට එක් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී තවත් කාරණයක් කියන්න මා ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා. ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා. එම පනත් කෙටුම්පතට විරුද්ධව උසාවි ගිහිල්ලා තිබෙනවා.

ඒ අතර ජනාධිපතිතුමා අමාත්‍ය මණ්ඩල සටහනක් ලියා තිබෙනවා, "මෙම පනත් කෙටුම්පතට මම එකඟ වුණේ නැහැ. මම දීලා තිබෙනවා වෙනත් සංශෝධන. ඒ සංශෝධන ඇතුළත් වෙලා නොවෙයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙලා තිබෙන්නේ" කියලා. මේ ලිපි දීලා තිබෙන්නේ ජනාධිපතිතුමා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ලිපි දෙක මම **සභාගත*** කරනවා.

සිකුරාදාට ඉදිරිපත් කිරීමට නියමිතව තිබෙනවා ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගැන සභාව කල් තැබීමේ යෝජනාවක්. අධිකරණයේ මෙය සැලකිල්ලට භාජන වෙමින් තිබෙද්දී සහ ජනාධිපතිතුමාගේ මේ ලිපි මඟින් මේ විධියට ප්‍රකාශ කර තිබෙද්දී අපේ ස්ථාවර නියෝග අනුව සභාව කල් තැබීමේ යෝජනාවක් ලෙස මේ ප්‍රශ්නය සිකුරාදා දින සාකච්ඡාවට ගැනීම සුදුසුද කියලා ඔබතුමාගෙන් මම විමසන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Leader of the House.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය ගැන කිව්වොත්, ඇත්ත වශයෙන්ම ජනාධිපතිතුමාගේ සංශෝධන අපි Committee Stage එකේදී ඉදිරිපත් කරනවා කියලා කැබිනට් මණ්ඩලයේදී එතුමාට පොරොන්දු වුණා. එතුමාගේ සංශෝධන Committee Stage එකේදී ඇතුළත් කරන බව කැබිනට් මණ්ඩලයේදී අපි එකඟ වුණා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම සටහනක් එතැන නැහැ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We agreed.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
But, it is not there.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
At the last Cabinet Meeting, we told him that his amendments will be accepted at the Committee Stage.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) Harsha De Silva. You have nine minutes.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා.1.32]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Non-Cabinet Minister of Economic Reforms and Public Distribution)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විසින් මෙම විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුවට එරෙහිව බව අපි හැම දෙනාම දන්නවා. මේ විශ්වාස භංග යෝජනාවට මූලික වෙන්නේ පසුගිය දා මෙරටට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයයි. ඒ ම්ලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරවලින් මිය ගිය සහ තුවාල ලැබූ අපේ සහෝදර ජනතාවට මුලින්ම මගේ කනගාටුව පළ කරනවා.

අපි දින දෙකක් පුරා මෙම විශ්වාස භංග යෝජනාව විවාද කරලා, ඡන්දයක් පවත්වනවා. එහිදී පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන කණ්ඩායම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනිවාර්යයෙන්ම ජයග්‍රහණය කරනවා. මේ විශ්වාස භංග යෝජනාවෙන් එක් පාර්ශ්වයක් පමණක් දිනනවා, අනෙක් අය පරාජයට පත් වනවා විතරද? එහෙම නොමැතිව, මෙවැනි ප්‍රශ්න අපේ සමාජයේ යළි ඇති නොවන ආකාරයේ සංවාදයක් ඇති කිරීමට මේ විවාදය අපට යොදා ගන්න බැරිද? මම හිතන්නේ, අපි ඒ දෙවෙනි කාරණයේ තැනටයි එන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේ ප්‍රශ්න ගණනාවක් මගේ හිතට එනවා. මම පෞද්ගලිකව විශ්වාස කරන දෙයක් තමයි, මේ විශ්වාස භංග යෝජනාවේ තිබෙන කරුණු දෙස වඩාත් අවධානය යොමු කර ඉදිරියේදී අපේ රටේ මෙවැනි විපතක් යළි නොවීමට අපි සියලුදෙනා වග බලාගත යුතු බව. එහෙම නැතුව මෙම ප්‍රහාරයේ වගකීම නිලධාරින් මත පටවන එක වැරදියි. පොලිස්පතිවරයාට හා ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව ඉදිරිපත් කර තිබුණු මිනී මැරුම් චෝදනා පදනම් විරහිතයි කියලා ඊයේ ගරු අධිකරණය සඳහන් කළා. එහිදී එම නිලධාරින් දෙදෙනාට එල්ල කර තිබෙන අනෙකුත් සියලු චෝදනා ප්‍රශ්න සහගත බවත්, ප්‍රකාශ සටහන් කර ගන්නේ නැතුව එම නිලධාරින් අත්අඩංගුවට ගෙන තිබීමත්, මේ සිද්ධියට පාදක වූ ජනාධිපති පරීක්ෂක මණ්ඩලය යම් පනතකට අනුව ස්ථාපිත කරපු එකක් නොවන බවත් ගරු මහෙස්ත්‍රාත්තුමිය ප්‍රකාශ කළා. මේ නිසා මෙම පරීක්ෂක මණ්ඩලය අධිකරණ කටයුත්තකට අදාළ නොවන බව ගරු මහෙස්ත්‍රාත්තුමිය ප්‍රකාශ කළා. මේ අනුවත් අපට පෙනෙනවා, මේ ප්‍රහාරයේ වගකීම නිලධාරින් පිට පටවා දේශපාලනඥයන්ට අත පිහදා ගන්න බැරි බව.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Hon. Minister, then she could have discharged them.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I will come back to that later because I have only nine minutes. You are a lawyer and I am not.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "මේ ප්‍රහාරය ගැන දේශපාලනඥයන් දැනගෙන හිටියා. සියලු ඇමතිවරු දැනගෙන හිටියා" කියලා. මම ඒ වෙලාවේ නැඟිටලා එතුමාට කිව්වා, "එහෙම දෙයක් වුණේ නැහැ" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඇත්ත කථාව කියන්න මම විනාඩියක් අරගන්නවා.

ඒ ප්‍රහාරය ගැන ඇත්ත වශයෙන්ම අපි දැනගෙන හිටියේ නැහැ. අපේ MSD එක අප ඒ සම්බන්ධයෙන් දැනුවත් කරලා තිබුණේ නැහැ. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "ජනතාව අතරට යන්න අපට පොලීසිය ඕනෑ නැහැ" කියලා. අපටත් ජනතාව අතරට යන්න පොලීසිය ඕනෑ නැහැ. මම බදාදා, බ්‍රහස්පතින්දා හා සිකුරාදා හිටියේ ත්‍රිකුණාමලයේ. පොලිස් නිලධාරින් කිසි කෙනෙක් ආරක්ෂාවට හිටියේ නැහැ. මගේ පවුලත් එක්ක තමයි මම හිටියේ. බදාදා ආසිරි පෙරේරා බිෂොප්තුමා මට කථා කරලා කිව්වා, "ගරු මන්ත්‍රීතුමා, අනුරාධපුරයේ ප්‍රශ්නයක් තිබෙනවා. කරුණාකරලා මැදිහත් වෙලා ඒක විසඳා දෙන්න බැරිද?" කියලා. මම එතුමාගෙන් ඇහුවා, "බිෂොප්තුමා මොකක්ද ප්‍රශ්නය?" කියලා. එතුමා කිව්වා, එක කණ්ඩායමක් ඇවිල්ලා මෙතෝදිස්ත පල්ලියට ගල් ගහනවා" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්වාස කරන්න, මම බිෂොප්තුමාට IGP හා අගමැතිතුමා හමුවෙන්න බ්‍රහස්පතින්දා meeting එකක් arrange කළා. අනුරාධපුරයේ මෙතෝදිස්ත පල්ලියට ගල් ගහන්න සූදානම් වීමක් සම්බන්ධයෙන් IGP, බිෂොප්තුමා සහ අගමැතිතුමා එතැනදී සාකච්ඡා කළා. මම බ්‍රහස්පතින්දා Twitter පණිවුඩයක් යැව්වා. මම කිව්වා, අනුරාධපුරයේ මෙතෝදිස්ත පල්ලියට ගල් ගහන එක නවත්වන්න පොලීසිය දැන ගන්න ඕනෑ කියලා. Good Friday එනවා, ඊළඟට පාස්කු ඉරිදා එනවා, එම නිසා පොලීසිය මැදිහත් වෙන්න ඕනෑ කියලා මම කිව්වා. අපි දැනගෙන සිටියා නම් ඒ සම්බන්ධයෙන් අපි ක්‍රියාත්මක වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අනුරාධපුරයේ පල්ලියකට ගල් ගැසීමක් සම්බන්ධයෙන් මම IGPයි, බිෂොප්තුමායි අගමැතිතුමාට සම්බන්ධ කළා නම්, ඔබතුමා හිතනවාද, කතෝලික පල්ලිවලට බෝම්බ ගහනවා, මිනී මරනවා කියලා අපි දැනගෙන සිටියා නම් අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා? එම නිසා මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා, බොරු චෝදනා ගේන්න එපා කියලා. ඔබතුමන්ලාට අවශ්‍ය නම් විශ්වාස භංග යෝජනාවක් ගේන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. නමුත්, අපි දැනගෙන ඉඳලා මොකුත් කළේ නැහැ කියලා කරුණාකරලා කියන්න එපා. අපි දැනගෙන සිටියා නම්, ඒක වෙන්න දෙන්නේ නැහැයි කියන එක මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. එම නිසා මේ ගැන දැනගෙන හිටපු දේශපාලනඥයන්ට වගකීමක් තිබෙනවා. කෙළින්ම IGPටයි, Secretary of Defenceටයි වගකීම දීලා මේකෙන් බේරෙන්න හැකියාවක් නැහැ.

නමුත්, මෙම ත්‍රස්තවාදී ප්‍රහාරයට පෙර හා පසු සිදු වුණු කරුණු දිහා අපි බලන්න ඕනෑ දේශපාලන කෝණයකින් නොවෙයි. අපට විවිධ දේශපාලන කාරණා පිළිබඳව වාද විවාද කරන්න පුළුවන්. නමුත්, අපේ රටේ සියලු පුරවැසියන්ට බලපාන ඉතා තීරණාත්මක කාරණයකදී අපට දේශපාලන කණ්ණාඩියෙන් බලන්න බැහැ. එම නිසා ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාවේ සඳහන් වැදගත් කරුණු පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. මෙම විවාදය එවැනි මහත්මා මට්ටමකින් කරගෙන යන්න පුළුවන් නම්, අපට මේ රටේ ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන්. අපි සර්ව සම්පූර්ණයි කියලා අපට කියන්න බැහැ. අපට කොතැනක හෝ වැරදුණා නම්, ඒ වරද අපට යළිත් කරන්න බැහැ. ඒ වරද නිවැරදි කරගෙන අපි ඉස්සරහට යන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මෙම විශ්වාස භංග යෝජනාව අපගේ රජයට විරුද්ධව ගෙන ආපු එකක් වුණත්, අපි එය පරාජය කළත් එහි තිබෙන වැදගත් කරුණු පරාජය නොකළ යුතු බවයි මම අවධාරණය කරන්නේ.

පාස්කු දින ප්‍රහාරයෙන් දේශපාලන වාසි ගන්න දඟලන බොහෝ දෙනෙක් අපට මේ දවස්වල අපට දකින්නට පුළුවන්. "මේක තමයි නියම වෙලාව" කියලා තමයි ඔවුන් හිතන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මීට පෙර දවසකදී මම පාර්ලිමේන්තුවේදී කරපු කථාවකදී කිව්වා, රට මුහුණ දීලා තිබෙන තීරණාත්මක අභියෝගය හමුවේ ළඟ බලන්න එපා, දුර බලන්න කියලා. ඒක නිසාමයි ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කර තිබෙන මෙම විශ්වාස භංග යෝජනාව ආණ්ඩුවක් විධියට අපි පරාජය කළත්, එහි තිබෙන වැදගත් කරුණු පරාජය නොකළ යුතුයි කියලා මා කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉදිරි ඡන්දය ඉලක්ක කරගෙන එක්තරා කණ්ඩායමක් ජාතිවාදය වපුරනවා. පාස්කු දින ප්‍රහාරයෙන් පස්සේ දිනෙන් දිනම මෙම රැල්ල ඔවුන් හිතා මතාම සැලසුම් සහගතව ගොඩ නඟමින් තිබෙන බව කුඩා දරුවෙකුට වුණත් පැහැදිලි වෙනවා. මම එදා කිව්වා වාගේ අදත් කියනවා, අපට මේ රට ගොඩ නැඟීම සඳහා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ඇතුළු සියලු ජනතාවගේ එකමුතුව අවශ්‍යයි. එක මිටට පියාඹන්න අපට බැරි නම්, අපි පටලැවී තිබෙන දැලෙන් අපට ගැලවෙන්න බැහැ. සියලු මුස්ලිම් ජනතාව ත්‍රස්තවාදීන් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත්, සහරාන්ලා නිර්මාණය කළ ත්‍රස්තවාදය අපි විනාශ කළ යුතුයි. "මුස්ලිම් නොවන අය මරන්න ඕනෑ කියලා සහරාන්ලා කිව්වා" කියලා ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා. මේ රටේ එහෙම කථා කරන්න කාටද හැකියාවක් තිබෙන්නේ? අපි සියල්ලෝම මධ්‍යස්ථ වෙන්න ඕනෑ. හැමෝම ඒ ත්‍රස්තවාදී ගොඩට දමන්න අපට බැහැ. සහරාන් එහෙම කිව්වාට සාමාන්‍ය මුස්ලිම් මිනිස්සු එහෙම කියන්නේ නැහැ. අපි මේ වෙනස සියුම්ව අවබෝධ කර ගත්තොත් විතරයි අපට මේ ප්‍රශ්නයෙන් දිනන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම සෑම විටම කියන ආකාරයට මුස්ලිම් සමාජය තුළින් ගොඩනැඟෙමින් තිබෙන වහාබ්වාදී අන්තවාදය අපි පරාජය කළ යුතුමයි! එසේ පරාජය කරලා මධ්‍යස්ථ මුස්ලිම් ජනතාවට එම සමාජයේ බලය තහවුරු කර ගැනීම සඳහා අපි උදව් කරන්න ඕනෑ. අපි මධ්‍යස්ථ මුස්ලිම් ජනතාවට ගහලා වට්ටලා ඒ කට්ටිය වහාබ්වාදීන් කියලා කොන් කළොත් අපි මොකක්ද කරන්නේ? අපි ඒ කට්ටියත් සහරාන්ලාගේ පැත්තට තල්ලු කරන එකයි ඒකෙන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටට එක නීතියක්, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පමණක් පාලනය වන පාසල් පද්ධතියක්, සියලු ආගම් සඳහා එක් අමාත්‍යාංශයක් අප හඳුන්වා දෙන්න ඕනෑ. මේ දවස්වල මතු වෙමින් තිබෙන ජාතිවාදී කණ්ඩායම් කරන කියන දේවලින් සිද්ධ වන්නේ, මධ්‍යස්ථ මතධාරී සාමාන්‍ය මුස්ලිම් ජනතාව අන්තවාදී ගොඩට තල්ලු කර දැමීමයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ජාතිවාදීන්ට ඉඩ දුන්නොත් මොවුන් මේ රට සුසාන භූමිය දක්වා අරගෙන යනවා. කෙටි කාලීනව ඡන්දයක් දිනන්න මොවුන් කරන දේවලින්, මේ රට ගොඩ ගන්න ඉන්න ජනතාව දිගු කාලීනව සතුරන් බවට පත් වෙනවා. ඒක ජයග්‍රහණයක් ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? නැහැ, ඒක දැවැන්ත පරාජයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එක උදාහරණයක් ගන්නම්. "ඇට්ලස්" පෑන් සම්බන්ධයෙන් මේ දවස්වල කතා වෙනවා. ඒවා ගන්න එපා කියලා ජාතිවාදීන් කියනවා. එහෙම කිවුවාම ඒගොල්ලෝ කියනවා, "ඔයා කොහොමද එහෙම කියන්නේ? හලාල් කරන්න කියලා ඒ අය කියනවා. ඒ අයට පුළුවන් නම් ඇයි අපට බැරි" කියලා. දෙපැත්තෙන්ම සාධාරණීකරණය කරනවා. අපි දෙතුන්පැත්තෙන්ම මේ වැඩේ කළාම මොකද වෙන්නේ? අවුරුදු 15 වයසේ සිටින දරුවාට 'අවුරුදු 75ක් ම බෙදිලා ජීවත් වෙයල්ලා' කියලා තමයි මේ ගොල්ලන් කියන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ජනතාව මේ කාරණා හොඳින් තේරුම් ගන්න ඕනෑ. අප මේ අවස්ථාවේ අවදි කළ යුත්තේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදි සියලු ජාතීන්ට අයත් මධ්‍යස්ථ මතධාරීන්ගේ මතයයි. මා නැවතත් කියනවා, අපට අවශ්‍ය වන්නේ මධ්‍යස්ථ මතධාරීන්ගේ මතය බව.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තව තත්පර 30කින් පමණ කථාව නවත්වනවා. අපේ සමාජයේ වැඩිපුර ජීවත් වන්නේ මධ්‍යස්ථ මතධාරීන්. අපි ඔවුන්ට ශක්තිය ලබා දිය යුතුයි. අපේ රට සිංහල බෞද්ධ රටක්. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. නියම බෞද්ධයා ජාතිවාදියකු නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නියම බෞද්ධයා මිනිසාට පමණක් නොව සතා සිව්පාවාට, ගහ කොළට, කුරා කුහුඹියාට පවා හිංසා නොකරන, පීඩා නොකරන පුද්ගලයෙක්. එම නිසා එවැනි පිරිසකට තමන්ගේ අනෙකුත් සහෝදර ජනතාව සමඟ එක්ව සාර්ථක ගමනක් යන්න පුළුවන්. එදා අපේ රටට නිදහස ලබා ගන්න අප සියලුදෙනා එකට සිටියා නම්, ඇයි අපට ඉදිරියටත් ඒ විධියට ඉන්න බැරි? ඒක එහෙම කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හැබැයි, ඒ සඳහා අප සියලු ජාතීන්ට අයත් ජාතිවාදය පරාජය කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණයත් කියා මා කතාව නවත්වනවා. ඉදිරියට මේ සමාජයේ බලය සහරාන්ලාට හෝ වෙනත් ජාතියක ජාතිවාදීන්ට හෝ අප ලබා නොදිය යුතුයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ දරු පැටවුන් වෙනුවෙන් බබළන ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම සඳහා අප අද දිනයේ අපේ යුතුකම ඉටු කළ යුතුයි. අපේ රටේ බහුතරයක් වන මධ්‍යස්ථ මතධාරී ජනතාව මේ සඳහා පෙරමුණ ගනු ඇතැයි මා විශ්වාස කරනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Prasanna Ranatunga. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 8යි.

[අ.භා.1.42]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාගෙන් අවසරයි. මේ ඉදිරිපත් කර තිබෙන විශ්වාසභංග යෝජනාව පිළිබඳව අපට සැකයක් මතු වෙනවා. ඒ සැකය මතු වෙන්නේ අපට විතරක් නොවෙයි. මේ සමාජය තුළත් ඒ සැකය මතු වී තිබෙනවා. ඒ තමයි, මේ විශ්වාස භංග යෝජනාව සද්භාවයෙන් ම ගෙන එනවා ද, එහෙම නැත්නම් ආණ්ඩුව ආරක්ෂා කරන්න ගෙන එනවා ද කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙසේ වෙතත් මේ වන කොට කතා වෙච්ච, සාකච්ඡා වෙච්ච කරුණු දෙස බැලුවාම පෙනෙනවා, ආණ්ඩුවේ බෙදීම තුළ මේ සිද්ධිය වුණාය කියන කාරණාව ඔප්පු වෙන්න ඕනෑ තරම් කාරණා තිබෙන බව.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

ආණ්ඩු පක්ෂයෙන් අහනවා, "මේකට ආරක්ෂක ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා වග කියන්න ඕනෑ. ඇයි එතුමාගේ නම මෙහි නැත්තේ?" කියලා. අනෙක් අතට, ආණ්ඩුවට හා අමාත්‍ය මණ්ඩලයට, මන්ත්‍රීවරුන්ට මේ පාර්ශ්වයෙන් චෝදනා කර තිබෙනවා. මේ චෝදනා දෙක දෙපැත්තට කර ගනිමින් බෝලය දෙපැත්තට පාස් කර ගැනීමයි සිද්ධ වෙන්නේ. ඒකෙන් පැහැදිලිව පෙනෙනවා, මේ බෙදීම තුළ තමයි ඒ සිද්ධිය වුණේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳ සැකය මතු වන්නේ ඇයි? මේ විශ්වාසභංග යෝජනාවට පාදක වන්නේ පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයයි. පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයෙන් පස්සේ මේ ආණ්ඩුවේ ඇමතිවරයකුට විරුද්ධව විපක්ෂය විශ්වාසභංග යෝජනාවක් ගෙනාවා. නමුත්, මේ පාර්ලිමේන්තුව තුළ ඒ විශ්වාසභංග යෝජනාව සාකච්ඡාවට ගැනීම ප්‍රමාද කළා. ඒ ප්‍රමාද කරන කාල සීමාව තුළ ජනතා විමුක්ති පෙරමුණ තවත් විශ්වාසභංග යෝජනාවක් ගෙනාවා, ආණ්ඩුවට විරුද්ධව. එදා ඒ මුස්ලිම් ඇමතිවරයාට විරුද්ධව ගෙන ආ විශ්වාසභංග යෝජනාව විවාදයට ගැනීම හිතා මතා ප්‍රමාද කිරීමට ආණ්ඩුව කටයුතු කළා. ඒ ප්‍රමාද කරන කාල සීමාව තුළ පාර්ලිමේන්තු කාරක සභාවක් පත් කරලා චෝදනා ලබපු අය නිර්දෝෂී කරන්න ආණ්ඩුව ලොකු උත්සාහයක් සහ වෑයමක් දැරුවා. ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව ගෙනෙන්න හේතු වෙලා තිබෙන්නේ, මේ රටේ ජාතික ආරක්ෂාව බිඳ වැටීම, රට ආර්ථික වශයෙන් කඩා වැටීම, රට අස්ථාවර වීම, රට ගෙන යන්න බැරි වීම කියන කාරණායි. මේ යෝජනාව ගෙන එන්නේ කවුද? මේ යෝජනාව ගෙන එන්නේ, මේ ආණ්ඩුව පත් කරන්න කටයුතු කරපු කණ්ඩායමක්. මට මතකයි, පසු ගිය කාලයේ දින 52 ආණ්ඩුව පත් කළ වෙලාව. එදා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඇතුළු ආණ්ඩුව රැක ගන්න ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් විශ්වාසභංග යෝජනාවක් ගෙන එන්න දුවලා පැනලා කටයුතු කරපු හැටි අපි රූපවාහිනියෙන් දැක්කා. එදා ඒ ආණ්ඩුව රැක ගත් අය අද මේ විශ්වාසභංග යෝජනාව ගෙන එනවා.

මෙම ප්‍රහාරයෙන් මේ ආණ්ඩුවේ නොහැකියාව වාගේම වගකීමෙන් තොරව කටයුතු කිරීම දැන් රටටම අවබෝධ වෙලා ඉවරයි. දැන් කොයි තරම් සුදනා කරන්න හැදුවත්, ඒක කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එදා අපි රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට විරුද්ධව ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාව කරුණු 10ක් මූලික කරගෙන මන්ත්‍රීවරු 64දෙනෙක් අත්සන් කරලායි භාර දුන්නේ. ඒ යෝජනාවට සහාය පළ කරන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරුත් සූදානම් වෙලා හිටියා. ඒ නිසා පැහැදිලිව ආණ්ඩුවේ බෙදීමක් තිබුණා. මේ බෙදීම නිසා තමයි ආණ්ඩුව ඒ විශ්වාස භංග යෝජනාව සාකච්ඡාවට ගන්න කටයුතු කළේ නැත්තේ. එහෙම වුණා නම්, මේ ආණ්ඩුව කඩා වැටෙනවා; ආණ්ඩුව ගෙනියන්න බැරි වෙනවා. ඒ නිසා එය සාකච්ඡාවට ගත්තේ නැහැ. ආණ්ඩුවේ සිටින, මේ ප්‍රහාරය හෙළා දකින ක්‍රිස්තියානි මන්ත්‍රීවරු එළියට බැහැලා කිව්වා, "අපි මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය පළ කරනවා" කියලා. ඒ නිසා ආණ්ඩුව තුළ බෙදීමක් ඇති වුණා. මේ බෙදීම නැති කිරීමට ආණ්ඩුවට විරුද්ධව යෝජනාවක් ගෙනාවාම, අර මන්ත්‍රීවරු කවුරුවත් එයට සහයෝගය දෙන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුව තුළ තිබුණු බෙදීම නවත්වා ගැනීමට මේ යෝජනාව ගෙනාවාය කියන චෝදනාව ජනතා විමුක්ති පෙරමුණට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙසේ වෙතත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ අපි මේ යෝජනාව ගැන සාකච්ඡා කළා. එහිදී ආණ්ඩුවට විරුද්ධව ගෙනෙන ඕනෑම විශ්වාස භංග යෝජනාවකට අපි සහයෝගය දෙනවා කියලා එක ස්ථාවරයකට ආවා. මේ යෝජනාවට විපක්ෂය නියෝජනය කරන බොහෝ පක්ෂ සහයෝගය ලබා දීමට කටයුතු කරනවා. මේ යෝජනාව සඳහා සහයෝගය ලබා ගැනීමට බැරි වෙයි කියන විශ්වාසය මා හට තිබෙන නිසා මම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ට මේ කාරණය කියනවා. මේ විශ්වාස භංග යෝජනාව සද්භාවයෙන් ගෙනාවා නම්, මෙය ජයග්‍රහණය කිරීමට අවශ්‍ය පසුබිම හදලාද තිබෙන්නේ? මේ ගැන අනෙක් දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කරලා ඒ අය සහයෝගය ලබා ගැනීමට කටයුතු කරලා තිබෙනවාද කියන එක ගැටලුවක්. එතුමන්ලාට තව කාලය තිබෙනවා. අද දවසේ, හෙට දවසේ කාලය තිබෙනවා, අනෙක් දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කරලා මෙයට සහයෝගය ලබා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවස්වල මුස්ලිම් ඇමතිවරයෙකුට විරුද්ධව රටේ ලොකු මතයක් ගොඩ නැඟෙනකොට මුස්ලිම් ඇමතිවරු ඔක්කොම ඉල්ලා අස් වුණා. ඔවුන් මල්වතු නායක හාමුදුරුවෝ හමුවෙලා කිව්වේ, "මුස්ලිම් ජාතිය ගැන තිබෙන අවිශ්වාසය නැති කිරීමට ඔවුන් ඒ කටයුත්ත කළා." කියලායි. ඒ ජනතාවට සහයෝගය දෙන්න මෙන්න හොඳ අවස්ථාවක් තිබෙනවා. මේ ආණ්ඩුවේ නොහැකියාව නිසා තමයි, ආණ්ඩුව මේ ගැන කටයුතු නොකරපු නිසා තමයි අද මුස්ලිම් ජනතාවට මේ තත්ත්වයට මුහුණ දීමට සිදු වී තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ඒ නිසා මුස්ලිම් ජනතාව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේ අවස්ථාවේදී එළියට ඇවිත් මෙයට සහයෝගය ලබා දීමට කටයුතු කරන්න පුළුවන්. ඒ වාගේම දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරුන්ට මේ පාස්කු ප්‍රහාරය පිළිබඳ විවේචනයක් තිබෙනවා නම්, එය හෙළා දකිනවා නම් මේ අවස්ථාවේ ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාවට සහයෝගය දෙන්න පුළුවන්. එම නිසා අපි විශ්වාස කරනවා, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මුස්ලිම් හා දෙමළ පක්ෂවල අය මෙයට සහයෝගය දෙයි කියලා.

අද ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කථා කරන විට සමහර පක්ෂ දේශපාලන වශයෙන් ජාතිවාදය අවුස්සන්න හදනවා කියලා කිව්වා. නමුත් අපි කිසිම කෙනෙකුට ජාතිවාදය අවුස්සන්න ඕනෑ කරන්නේ නැහැ. අද ආණ්ඩුව කෙරෙහි කලකිරීමක් තිබෙන නිසා ජාතිවාදය අවුස්සලා එය වාසියක් බවට පත් කර ගැනීමට මේ ආණ්ඩුව කටයුතු කරනවා. ඒ තරම් පහත් තත්ත්වයට මේ ආණ්ඩුව වැටිලා තිබෙනවා.

මේ ප්‍රහාරයෙන් පස්සේ සියයට 99කට වන්දි ගෙවලා තිබෙනවා කිව්වා. ඒත් පාස්කු ප්‍රහාරයෙන් තුවාල ලබපු අයගෙන් බහුතරයකට වන්දි ගෙවා ගැනීමට අද ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය ආණ්ඩුව කාලයේ බේරුවල සිද්ධියක් ඇති වුණා. ඒ සිද්ධියේදී ජාතිවාදය අවුස්සපු ඇමතිවරු දෙදෙනාම ඉන්නේ මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ. ඒ වාගේම මිනුවන්ගොඩ සිද්ධිය ගැන කථා

කරනවා නම්, අවුරුදු ගණනකින් ඇති නොවුණු සිද්ධියක් තමයි මේ ඇති වුණේ. පාස්කු ප්‍රහාරයෙන් තුවාල ලැබූ සහ මිය ගිය අයට සාධාරණයක් වෙන්න නම්, මේ වේලාවේ මෙම පාර්ලිමේන්තුවේ සිටින වගකිව යුතු මන්ත්‍රීවරුන් කළ යුත්තේ මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය පළ කිරීම බවයි මම විශ්වාස කරන්නේ.

ආණ්ඩුව ප්‍රචාරක කටයුතු සඳහා අද විශාල මුදලක් වැය කරනවා. ආණ්ඩුව "Enterprise Sri Lanka", ගම්පෙරළිය කියන ව්‍යාපෘතිවලට විශාල මුදල් ප්‍රමාණයක් වැය කරනවා. හැබැයි, පසුගිය පාස්කු දින ප්‍රහාරයෙන් තුවාල ලබපු අයගේ වන්දි ටික විධිමත් විධියට ගෙවන්න ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ. ආණ්ඩුව දැන් "සුදු ජූලිය" ප්‍රකාශ කරලා තිබෙනවා. එදා ජේ.ආර්.ජයවර්ධන මහත්මයාගේ කාලයේ -1983 අවුරුද්දේ- කළු ජූලිය කළා. ඒ වාගේම අද සුදු ජූලියක් කරන්න හදනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මේක සුදු ජූලියක් නොවෙයි, මේක මළ ජූලියක් වෙලායි තිබෙන්නේ. මේ රටට ආණ්ඩුවම එපා වෙලායි තිබෙන්නේ. මේ සිද්ධිවලට ජනාධිපතිවරයා, අගමැතිවරයා වගකියන්න ඕනෑ. බෝල පාස් කර කර රටේ මිනිස්සු ගොනාට අන්දවන්න ඒ අයට බැහැ. අද මේ ආණ්ඩුවේ නොහැකියාව පෙන්වලා තිබෙනවා. ඒ නිසා තමයි මේ විශ්වාසභංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. එහෙම නම්, මේ විශ්වාසභංග යෝජනාවට සහයෝගය පළ කරන්න කොන්දක් ඇතිව මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කටයුතු කරයි කියන විශ්වාස ජනතාව තුළ තිබෙනවා. එහෙම නැති වුණොත්, ඊළඟ මැතිවරණය වෙනකොට මේ අයට ගම්වලට යන්න බැරි තත්ත්වයක් උදා වෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට නියමිත කාලය අවසාන නිසා අවසාන වශයෙන් දෙයක් කියන්න කැමැතියි. මේ යෝජනාව ගෙනාපු දේශපාලන පක්ෂය හැටියට, පසුගිය කාලයේම ආණ්ඩුවට සහයෝගය දීපු කණ්ඩායම හැටියට එතුමන්ලා ගෙනා මේ යෝජනාව ජයග්‍රහණය කරයි කියලා විශ්වාස කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා.1.51]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අප රටට ඉතාම වැදගත් වන, මේ ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත් වන දෙවැනි විශ්වාසභංග යෝජනාව ගැන තමයි විවාද කරමින් සිටින්නේ. මේ යෝජනාව ඉදිරිපත් කරමින් ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා දීර්ඝ විස්තරයක් කළා. ඒ වාගේම, මට පෙර කථා කරපු මන්ත්‍රීවරුන් මේ පිළිබඳව කරුණු දැක්වූවා. මේ සිද්ධිය වෙලා, ඊළඟට පාර්ලිමේන්තුව රැස් වුණු සතියේ මම පෙන්වා දුන්නා, ආණ්ඩුව මේ සිද්ධිය සම්බන්ධයෙන් ගෙන යන ඇල් මැරුණු ස්වභාවයේ පරීක්ෂණ පිළිබඳව. මේ වෙනකොට මෙම විශ්වාසභංග යෝජනාවේ සම්පූර්ණ වගකීම පවරලා තිබෙන්නේ අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවටයි. අපි 2018 අප්‍රේල් 4 වන දින ආණ්ඩුවට විරුද්ධව මහ බැංකු බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් විශ්වාසභංග යෝජනාවක් ගෙනාවා. ඒකට වෙච්ච ක්‍රියාදාමයම තමයි දැනුත් මේ යන්නේ. එදා කළේ මොකක්ද? 2015 පෙබරවාරි 27 වෙනි දා සිදු වුණු මහ බැංකු බැඳුම්කර සිද්ධිය ප්‍රථම වතාවට එළියට ආවාම, මාර්තු මාසයේදී ගරු අගමැතිතුමා කිව්වා, ඒ ගැන හොයන්න කමිටුවක් දැම්මා කියලා. ඒ අයගේ පක්ෂයේ නීතිඥ මහත්වරුන් තුන්දෙනෙක් දාලා කමිටුවක් පත් කරලා වාර්තාවක් ගෙනැල්ලා මෙතැන කියෙව්වා. ඊට අමතරව විපක්ෂයේ ඕනෑකම මත ඩිව් ගුණසේකර මහත්මයාගේ සභාපතිත්වයෙන් COPE කමිටුවේ අනු කමිටුවක් දැම්මා. මාත් ඒ කමිටුවේ සමාජිකයෙක්. එම වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර 2015 ජූනි 26 වෙනි දා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඊට පස්සේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් සහ තවත් මන්ත්‍රීවරුවරුන් විසිදෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් ඊළඟ COPE කමිටුව පත් කළා. පාද සටහන් යොදමින් ලොකු කලබැගෑනියක් කරලා ඒ කමිටු වාර්තාවත් ඉදිරිපත් කළා. ඊට පස්සේ ගරු ජනාධිපතිතුමා විසින් ජනාධිපති කොමිසමක් පත් කරලා ඒ ජනාධිපති කොමිසමේ වාර්තාව ඉදිරිපත් කළා. ජනාධිපති කොමිසමෙන් ඉදිරිපත් කරපු ඒ වාර්තාව පදනම් කරගෙන නීතිපතිතුමා විසින් අධි චෝදනා පත්‍ර ඉදිරිපත් කරන බවට වාර්තා වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී ඉතා පැහැදිලිව කියනවා "Colombo Telegraph" වෙබ් අඩවිය ගැන. මම දැන් මේ කියන මොහොතේ අපේ පුස්තකාලයට ගිහිල්ලා, "Colombo Telegraph" වෙබ් අඩවියට ඇතුළු වෙලා බලන්න. මහ බැංකුවේ බැඳුම්කර සිද්ධියට සම්බන්ධ අධි චෝදනා පත්‍රය "Full Text of Indictments In CBSL Bond Scam Case" කියන ශීර්ෂය යටතේ මේ වෙනකොටත් "Colombo Telegraph" වෙබ් අඩවියේ තිබෙනවා. හැබැයි, දැන් වාර්තා වෙන ආකාරයට අධි චෝදනා පත්‍ර භාර දෙන්නේ කවදාද? ජූලි මාසයේ 19 වෙනි දා. අද ජූලි මාසයේ 10 වෙනි දා. නමුත් ජූලි මාසයේ 10 වෙනි දා වෙනකොට "Colombo Telegraph" වෙබ් අඩවියේ ඒ අධි චෝදනා පත්‍රය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ සභාවට පෙන්වපු මේ කාරණය අභගන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරු කීප දෙනායි සභාවේ ඉන්නේ. ආණ්ඩුවේ ඇමතිවරු නම් එක්කෙනෙක්වත් පෙනෙන්න නැහැ. ඉස්සරහ පේළි දෙකේම කවුරුත් නැහැ. මේ අධි චෝදනා පත්‍රයේ නීතිපතිගේ අංකය CF/31/2016. මහාධිකරණ අපරාධ නඩු අංකය PTB/01/05/2019. චෝදනා නඟන 10 දෙනෙක් ඉන්නවා. පළමුවැනි වූදිත තමයි ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන්. මම ඒ සියල්ල කියවන්න යන්නේ නැහැ වෙලාව යන නිසා. එයා ඇතුළු 10 දෙනෙක් ඉන්නවා. දැන් මේ අධි චෝදනා යටතේ චෝදනා 23ක් තිබෙනවා. දණ්ඩ නීති සංග්‍රහය මගේ අතේ දැන් තිබෙනවා. දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිත්, ඒ වාගේම පොදු දේපළ පනතේ වගන්තිත්, වෙනත් ආනුෂාංගික නීතිත්, අපරාධ නීති යටතේ මේ චෝදනා ගොනු කරලා තිබෙනවා. දැන් මේ චෝදනා 23ට අදාළව ලියැවිලි සහ වෙනත් ඉදිරිපත් කරන දේ සමඟ මේ අධි චෝදනා පත්‍රයේ documents 236ක් සඳහන් වෙනවා. අපේ ගරු ජයම්පති වික්‍රමරත්න මැතිතුමාත් දැන් මේ සභාවේ ඉන්නවා. එතුමාත් නීතිඥයෙක් නේ. මේ අධි චෝදනා පත්‍ර බාර දෙන්න තිබෙන්නේ ජූලි 19වැනි දා. නමුත්, මේ වන විට “Colombo Telegraph” පුවත් පතේ ඒ අධි චෝදනා පත්‍රය තිබෙනවා. දැන් Library එකට ගිහිල්ලා ඒක ගන්න පුළුවන්. සාක්ෂිකාරයෝ 116ක්. මෙන්න මේක තමයි අපි කිව්වේ. එදා කිව්වා, බැඳුම්කර සිද්ධියට කරන්න යන දේ. දැන් වූදිතයෝ ඔක්කෝම දන්නවා. වූදිතයෝ වෙනුවෙන් පෙනී ඉන්න නීතිඥ මහත්වරුන්ගේ අතේ අධි චෝදනා පත්‍රය තිබෙනවා. මම දේශපාලනයට එන්න කලින් අවුරුදු 10ක් කොළඹ මහාධිකරණයේ හිටියා. ලංකාවේ පසුගිය අවුරුදු 30, 35තුළදී විභාග වූ දෙවැනි trial-at-bar එක, දෙවැනි ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලය අහපු පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

නඩුවේත් මම විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටියා. ඒ එදා. ඊට පසුවත් අධි චෝදනා පත්‍ර ඉදිරිපත් වුණු නඩු ගණනාවකට අපි පෙනී සිටියා. හැබැයි, අපට තිබෙන අත්දැකීම් අනුව කිසිම අවස්ථාවක අධි චෝදනා පත්‍රය අධිකරණයට බාර දෙන තෙක් අපේ අතට අධි චෝදනා පත්‍රයක් ඇවිල්ලා නැහැ. එහෙම නම් මේක වුණේ කොහොමද? මම මේ කාරණය සම්බන්ධ කරන්නේ අද ගෙනෙන විශ්වාස භංග යෝජනාවත් එක්කයි. එදා විශ්වාස භංග යෝජනාවක් අපි ගෙනාවේ මේ හේතුව නිසා තමයි. ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් නැහැ; මේ පරීක්ෂණ ගැන විශ්වාසයක් නැහැ; නඩු දමන එක ගැන විශ්වාසයක් නැහැ. නඩු දැම්මත් ඒ නඩුව පිළිබඳව විශ්වාසයකුත් නැහැයි කියන එක සම්බන්ධයෙන් අද කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධ කරගෙන. පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණවලට මොකද වුණේ? දැන් ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. එම කමිටුවේ වාර්තාවක් මත නීතිපතිතුමා විසින් අනිවාර්ය නිවාඩු යවපු පොලිස්පතිතුමායි, ආරක්ෂක ලේකම්තුමායි දෙදෙනාට චෝදනා පත්‍ර ගෙනැල්ලා මහේස්ත්‍රාත් අධිකරණයේ "බී" වාර්තාව දැම්මාම, මහේස්ත්‍රාත්තුමිය ඊයේ නියෝගයක් දුන්නා ඇප දෙන්න පුළුවන් කියලා. දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් සඳහන් වෙන්නේ. එතුමිය සඳහන් කරලා තිබෙන දේ අද පුවත් පත්වල වාර්තා කරලා තිබෙනවා. ප්‍රමාණවත් කරුණු නැහැ, අඩුම තරමින් විත්තිකරුවන්ගේ ප්‍රකාශ අරගෙන නැහැයි කියලා සඳහන් වෙනවා. ඒක තමයි ඒ කොමිටියේ වාර්තාවට වෙච්ච දේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් මේ පාර්ලිමේන්තුවේත් දැන් නඩුවක් අහනවා. එහි විනිශ්චයකාරවරු දැන් මේ සභාව තුළත් ඉන්නවා. දැන් එතුමන්ලාත් එක නඩුවක් අහනවා. ඒක තවම අහලා ඉවර නැහැ. ඒ අතරේ උසාවියට බී වාර්තා ඉදිරිපත් කරනවා. දැනට නීතිපතිතුමා විසින් අදහස් කරන චූදිතයන් දෙදෙනෙකුට බී වාර්තා ගෙනැවිත් තිබෙනවා. දැන් ඒ අයට ඇප දුන්නා. අපි දන්නේ නැහැ තව කොච්චර කල් යයිද කියලා මේ කටයුතු ඉවර වෙන්න. මෙතැනත් පිරිසක් නඩු අහනවා. හැබැයි, මේ විශේෂ කාරක සභාවේ වාර්තාව මත නඩු පවරන්න පුළුවන්ද? මොකක්ද ඒකෙන් කරන්න පුළුවන්? ඒකෙන් කිසිදු නීතිමය පියවරක් ගන්න බැහැ. ජනාධිපති කොමිසමකින් නම් පුළුවන් ඒ සාක්ෂි adopt කරලා ගන්න. මේකෙන් එහෙම කරන්න බැහැ. එහෙම නම් COPE වාර්තා අනුවත් නඩු දාන්න පුළුවන් නේ! ඒ නිසා සම්පූර්ණ ඇස්බැන්දුමක් මේ කරන්නේ. මේ සිද්ධිය පිටුපස්සෙන් ඉන්න නියම වග උත්තරකරුවන් කවුද කියලා කියන්න මේ ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. ඒක තමයි ප්‍රශ්නය. අපි මෙතැන මුස්ලිම් අන්තවාදීන් තමයි මේ අල්ලාගෙන ඉන්නේ. හැබැයි, ඇත්තටම කවුද මේ සිද්ධි පිටුපස්සේ ඉන්නේ කියන එක අද වෙනතුරු කියන්න ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ. අද වනතුරු කිසිම සැකකරුවෙක් අධිකරණයට ඉදිරිපත් කරලා නැහැ, නියම ආකාරයේ "බී" වාර්තාවක් එක්ක. මෙන්න මේක තමයි තත්ත්වය. එදා බැඳුම්කර පිළිබඳව විශ්වාසය කඩ වුණාම සමහර ඇමතිවරු චූදිතයන් නිදොස් කරලා පොත් ලිව්වා. හැබැයි දැන් නීතිපතිවරයා ඒ අයට අධි චෝදනා පත්‍රයක් දාලා තිබෙනවා. දැන් මොකද කියන්නේ? පොත් ලියපු ඇමතිවරු දැන් මොකද කියන්නේ? ඊට පස්සේ වාර්තා වුණා, Perpetual Treasuries Limited එක එක්කෙනෙකුට මිලියන තුනයි, තව එක්කෙනෙකුට මිලියනයයි ආදී වශයෙන් දුන්නා කියලා. දැන් ඒවාට මොකද වෙන්නේ? ඒක නිසා විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. එදත් විශ්වාසය බිඳ වැටුණා, අදත් විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. එහෙම නම් මේ ආණ්ඩුවට කිසිදු ආකාරයකින් සදාචාරාත්මක අයිතියක් නැහැ තවදුරටත් මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනයන්න. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාවට අපේ සහය අපි ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
மாண்புமிகு பைசால் காசிம் அவர்கள்! உங்களுக்கு ஐந்து நிமிடங்கள் உள்ளன.

[பி.ப. 2.01]

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைசால் காசிம்)
(The Hon. Faizal Cassim)
ஆறு நிமிடங்கள்!
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்தச் சபையில் இடம்பெற்றுக்கொண்டிருக்கும் அரசுக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணைமீது உரையாற்றுவதற்கு எனக்கும் வாய்ப்பளித்தமைக்காக முதலில் உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். ஏப்பிரல் 21இல் இடம்பெற்ற துரதிருஷ்டவசமான குண்டு வெடிப்புச் சம்பவத்துக்கு முழு அரசுமே பொறுப்பு என்று கூறி, இந்த அரசைக் கவிழ்க்கும் நோக்கில் JVP கொண்டு வந்திருக்கும் இந்தப் பிரேரணைமீது உரையாற்றுகையில், எனது சமூகம் எதிர்நோக்கும் சில முக்கியமான பிரச்சினைகளைப் பற்றிப் பேசுவதற்கு விரும்புகிறேன்.

யுத்தம் முடிந்து முழுமையான அமைதியை முழு நாடுமே அனுபவித்துக்கொண்டிருந்த சந்தர்ப்பத்தில்தான் யாருமே எதிர்பார்த்திராத வகையில் இந்தக் குண்டுவெடிப்புச் சம்பவம் இடம்பெற்றது. முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த சில பயங்கரவாதிகள் இதைச் செய்வார்கள் என்று நாங்கள் எதிர்பார்த்திருக்கவில்லை. உண்மையிலேயே, இவ்வாறான சம்பவமொன்று நடைபெறுமென்று முஸ்லிம்களாகிய நாங்கள் கனவில்கூட நினைத்ததில்லை. இதற்குப் பின்னணியில் இருப்பவர்கள் யார்? இதைச் செய்தவர்கள் யார் என்பதைப் பற்றிச் சிந்தித்துப் பார்க்க வேண்டியிருக்கின்றது. இன்று, ISIS என்று கூறும்போது அந்த அமைப்பின் பின்னணியில் உலகில் பெரியதொரு நாடு இருக்கின்றது என்று நாங்கள் தெரிந்து கொண்டிருக்கின்றோம். ஆனால், இவ்வாறான ஒரு மிலேச்சத்தனமான பயங்கரவாதக் குண்டுத்தாக்குதலை இவர்கள் ஏன் இலங்கையில் நடத்தினார்கள் என்ற ஒரு கேள்வி எமக்கு முன்னால் இருக்கின்றது. இலங்கை நாடானது வல்லரசு நாடுகளினால் பந்தாடப்படும் ஒரு நாடு என்பது உங்களுக்குத் தெரியும். ஆனால், நாங்கள் வல்லரசு நாடுகளின் கைப்பொம்மைகளாக இருக்க வேண்டும் என்பதற்காக அவர்கள் இந்த நாட்டை இவ்வாறு துண்டாடி அதன்மூலம் இந்த நாட்டை அழிவுப் பாதையில் கொண்டு செல்வதற்காக எம்மீது இந்த இயக்கத்தைத் தாவவிட்டிருக்கின்றார்கள். இருந்தாலும், இன்று இந்தப் பழி இந்த நாட்டின் முஸ்லிம்கள்மீது போடப்பட்டிருக்கின்றது. முஸ்லிம்கள் செய்த பாவம் என்னவென்று நான் கேட்க விரும்புகின்றேன்.

இந்த நாட்டிலே தமிழர்களுடனும் சிங்களவர்களுடனும் முஸ்லிம்கள் ஒற்றுமையாக வாழ்ந்து வந்த இந்தக் காலத்திலே ஏன் இவர்கள் இந்த நாட்டில் இந்தப் பிரச்சினைகளை ஏற்படுத்தி முஸ்லிம்களைச் சிங்கள மக்களின் எதிரியாக மாற்றியிருக்கின்றார்கள் என்பது எனக்குப் புரியவில்லை. சஹ்றான் என்ற கொடும்பாவி செய்த செயலுக்காக ஏன் இவ்வாறு நீங்கள் முஸ்லிம்களைத் தண்டிக்க நினைக்கிறீர்கள் என்று நான் கேட்க விரும்புகிறேன். ஆனால், முஸ்லிம்கள் ஒருபோதும் சிங்களவர்களுக்கெதிரான எந்தவொரு போராட்டத்திலும் ஈடுபட்டதில்லை. உங்களுக்கு ஒரு விடயம் தெரியுமோ தெரியாது. அதாவது, 1500 ஆண்டுகளுக்கு முன் அனுராதபுரத்தை ஆண்ட பண்டுகாபயன் மன்னரினால் அன்று அனுராதபுரத்தில் சோனகர் கிராமம் அமைக்கப்பட்டது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றது.

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
ஒரு மன்னருடைய ஆட்சிக் காலத்திலே, 1500 ஆண்டுகளுக்கு முன்னரே, சோனகர்களுக்கென்று ஒரு குடியேற்றத்தை நிறுவ முடியுமென்றால், இன்று ஏன் முஸ்லிம்களுக்கும் சிங்களவர்களுக்கும் இடையில் பிரச்சினை உருவாகியிருக்கின்றது என்பதனை நீங்கள் யோசித்துப் பார்க்க வேண்டும். இன்று முஸ்லிம்கள் செய்யும் எல்லாச் செயல்களையுமே சிங்களவர்கள் ஓர் எதிர்ச் செயலாகவே பார்க்கின்றார்கள். சில முஸ்லிம் தீவிரவாதிகளினால் நம் நாட்டிலே ஏற்படுத்தப்பட்ட பிரச்சினைகளினால் ஏன் இன்று முஸ்லிம்களை எதிரியாகப் பார்க்க வேண்டும்?

இந்தப் பாராளுமன்றத்திலே நீங்கள் உங்கள் நாவினால் பேசுகின்றீர்கள்; உங்களுடைய இதயத்தினால் பேசவில்லை. ஏன்? ஆனால், முஸ்லிம்களின் வாக்குகளைப் பெற்று ஆட்சியை அமைப்பதற்காக எத்தனையோ முறை ஆளும் கட்சியிலேயும் எதிர்க்கட்சியிலேயும் இருந்து எங்களை நாடி வந்திருக்கின்றார்கள்; எங்கள் வாக்குகளைத் தேடி வந்திருக்கின்றார்கள். நாங்கள் உங்களுக்கு வாக்களித்திருக்கின்றோம். ஆனால், உங்களில் யார் இதுவரைக்கும் இந்தப் பாராளுமன்றத்திலே முஸ்லிம்களுக்காகப் பேசியவர்கள்? என்று நான் கேட்கவிரும்புகின்றேன். நீங்கள் யாருமே முஸ்லிம்களுக்காகப் பேசவில்லை. எங்களுடைய வாக்குகளைப் பெற்றுக்கொண்டு ஆட்சியை அமைப்பதற்காக வந்திருக்கின்றீர்களே தவிர, முஸ்லிம்கள் எதிர்நோக்கும் பிரச்சினையைப் பற்றி இதுவரை இந்தப் பாராளுமன்றத்திலே நீங்கள் யாருமே பேசவில்லையென்று நான் கூற விரும்புகின்றேன்.

இன்று சில தீவிரவாத இயக்கங்கள் என்ன கூறுகின்றன? முஸ்லிம் கடைகளில் பொருட்கள் வாங்க வேண்டாம் என்று. இன்று என்ன நடந்திருக்கின்றது? நாங்கள் நாட்டைக் கூறுபோடவில்லை என்று கூறிக்கொண்டு நீங்களே நாட்டைக் கூறுபோட்டிருக்கின்றீர்கள். இன்று தமிழர் கடைக்குச் செல்ல முடியாது, தமிழ் டாக்டரிடம் செல்லமுடியாது, முஸ்லிம் டாக்டரிடம் செல்லமுடியாது, முஸ்லிம் கடைக்குச் செல்லமுடியாது என்றால் என்ன அர்த்தம்? சிங்களவர் சிங்களவர்களின் கடைக்குத்தான் செல்லவேண்டும்; முஸ்லிம்கள் முஸ்லிம்களின் கடைக்குத்தான் செல்லவேண்டும்; தமிழர்கள் தமிழர்களின் கடைக்குத்தான் செல்லவேண்டும் என்றால் நீங்களே நாட்டை இன்று பிரித்துத் தந்திருக்கின்றீர்கள் என்பதை நீங்கள் மனதில் கொள்ளுங்கள்! இன்று இது எந்த அளவுக்கு முஸ்லிம் மக்களின் மனதைத் தாக்கியிருக்கின்றது என்றால், இனிமேல் முஸ்லிம்களுக்கு எதிரான எந்தவொரு தாக்குதல் குறித்தும் தாங்கள் எதிர்த் தாக்குதல் நடத்த வேண்டுமென்ற அளவுக்குச் சிந்திக்கும் நிலைக்கு அவர்களைத் தள்ளிவிட்டிருக்கின்றது என்பதை நீங்கள் கவனத்தில் கொள்ள வேண்டும்.

இன்று நாங்கள் நாட்டின் ஒற்றுமை மற்றும் அபிவிருத்தி பற்றிச் சிந்திக்கவேண்டிய ஒரு காலகட்டத்திலே இருக்கின்றோம். ஆகவே, நாங்கள் இந்த இடத்திலே கேட்க விரும்புவது நீங்கள் முஸ்லிம்களுக்கு எதிராகச் சிந்திப்பதை விட்டுவிட்டு, முஸ்லிம்களாகிய நாங்களும் நீங்களும் எவ்வாறு கடந்த காலத்தில் ஒற்றுமையாக வாழ்ந்தோமோ அதேபோன்று தொடர்ந்தும் ஒற்றுமையாக வாழவேண்டிய வழிவகைகளைச் செய்ய வேண்டுமென்று கேட்டுக்கொண்டு, விடை பெறுகின்றேன். நன்றி

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி உறுப்பினர் அவர்களே! The next speaker is the Hon. Lakshman Yapa Abeywardena.

[අ.භා. 2.07]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ජනතා විමුක්ති පෙරමුණ විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාවේ තිබෙන සියලු කරුණු, මේ ආණ්ඩුව සිය වගකීම් පැහැර හැරීම නිසා, වගකීම් නිසියාකාරව ඉටු නොකිරීම නිසා මතු වූ ඒවායි. මට පෙර කථා කළ හිටපු ඇමතිතුමා සඳහන් කළා වාගේ, අද ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය නැති වෙලා, ජාතීන් අතර සාමයත් නැති වෙලා රටත් අස්ථාවර තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නමුත් මුස්ලිම් ජනතාවට මේ සිද්ධියේ පීඩනය දෙන්න අපි කවුරුවත් කොයිම අවස්ථාවකවත් සූදානම් නැහැ. මොකද, මුස්ලිම් ජනතාවගේ නොවෙයි, අන්තවාදයේ ප්‍රශ්නය තමයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ. මේ රටේ එහෙම අන්තවාදී ප්‍රශ්නයක් ඇති වුණේ ඇයි? එහෙම වෙන්න හේතුව මොකක්ද? රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් මේ රජයේ වගකීම ඉෂ්ට නොකළ නිසායි එහෙම වුණේ. අද මුළු රටම ඒක පිළිගන්නවා.

ජනතාව අලුත් ආණ්ඩුවක් බලයට පත් කරන්නේ හිටපු ආණ්ඩුවට වඩා හොඳින් රට පාලනය කරාවි කියන විශ්වාසය ඇතිවයි. විශේෂයෙන්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය යුද්ධය අවසන් කරලා, මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරලා, කිසිම බියක් සැකක් නැතිව මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හදපු වෙලාවේ තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. මේ ආණ්ඩුව බලයට පත් වුණු දවසේ සිට සිදු වුණු එක එක සිද්ධි අපි පොඩ්ඩක් මතක් කරලා බලමු. පළමුවෙන්ම, මුදල් අමාත්‍යාංශය යටතේ තිබුණු මහ බැංකුව ඉතිහාසයේ පළමු වතාවට අගමැතිවරයා යටතට පත් කර ගැසට් කර ගත්තා. එහෙම කරලා, මේ රටේ පුරවැසියකු නොවෙන කෙනෙකු මහ බැංකු අධිපතිවරයා හැටියට පත් කළා. ඔහු පත් කරලා ඉතාම කෙටි කලක් ඇතුළතදී මහ බැංකුවේ විශාල කොල්ලයක් සිද්ධ වුණා. ආණ්ඩුව පැත්තේ ඉන්න ඇමතිවරු ඒ කොල්ලය නිසා මූල්‍ය වශයෙන් රටට වුණු පාඩුව සාධාරණීකරණය කරන්න හැදූ බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. ඒ වෙනුවෙන් කෝප්

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

වාර්තාවේ පාද සටහන් තැබුවේ ඒ ඇමතිවරු තමයි. මහ බැංකුවේ අධිපතිවරයා රැක ගැනීමට අගමැතිතුමා තමයි කථා කළේ. එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ කියලා අගමැතිතුමා කිව්වා. එතුමා වගකීම ගන්නවා කියලා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා. අන්තිමට මේ බැඳුම්කර සිද්ධිය පිළිබඳව තොරතුරු සොයන්න කොමිසමක් පත් කළා. ඒ කොමිසමේ වාර්තාව නිසා තමයි කෝප් වාර්තාවේ පාද සටහන් තියපු සහ ඊට අදාළ උත්තර සැපයූ මන්ත්‍රීවරුන්ටත්, ඇමතිවරුන්ටත් නිශ්ශබ්ද වෙන්න වුණේ. ඒක මේ ඇමතිවරුන්ගේ වරදක් නොවෙයි. අගමැතිවරයා බල කළා ඇමතිවරුන්ට ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේදී කථා කරන්න කියලා, කෝප් වාර්තාවේ කමිටුවේදී පාද සටහන් තියන්න කියලා. මේ සියල්ල කරලා, නැති කුණු ගොඩක් අද ආණ්ඩුව විසින් දමා ගෙන තිබෙනවා. ඉතිහාසය පුරාවටම මහ බැංකුව තිබුණේ මුදල් අමාත්‍යාංශය යටතේයි.

මහ බැංකුව අගමැතිතුමා යටතේ ගැසට් කළේ ඇයි? එය අගමැතිතුමා යටතේ ගැසට් කරලා, එතුමාට වුවමනා කෙනෙක් මහ බැංකු අධිපතිවරයා වශයෙන් පත් කළා. පත් කරලා, මේ වංචාව කළා. ඊට පස්සේ, ඒ වංචාව වහගන්න කථා කළා. නමුත් මුළු රටටම මේ වංචාව එළිවුණාට පසුව තමයි මේ බොහෝ අයට සම්පූර්ණයෙන්ම නිශ්ශබ්ද වෙන්න සිද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවුරුදු 26ක් පුරාවට මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ ඉතිහාසය තුළ, කෙටිම කාලයකදී, ඇමතිවරුන්ට විරුද්ධව, ඒ වාගේම ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනා වැඩිම ප්‍රමාණයක් ගෙන ආ වකවානුව මේ මෑත ඉතිහාසයයි.

ඒ විශ්වාස භංග යෝජනා ගෙනෙනකොට ඇමතිවරු ඉල්ලා අස් වුණා. මේ අවස්ථාවේදී විශ්වාස භංගයට මුහුණ දෙන්න බැරිව තවත් ඇමතිවරුන්ට කණ්ඩායමක් වශයෙන්ම ඉල්ලා අස්වෙන්නට සිද්ධ වුණා. මේ වාගේ තත්ත්වයක් තුළ තමයි අපට මේ කාලය ඇතුළත කටයුතු කරන්නට සිද්ධ වුණේ.

මේ ආණ්ඩුවේ වගකීම මේ ආණ්ඩුව ඉටු කළේ නැහැ. කැබිනට් අනුමැතියක් නැතිව ගිවිසුම් කිහිපයක් අත්සන් කළා. තමුන්නාන්සේලා දන්නෙත් නැහැ, පාර්ලිමේන්තුවේ අනුමැතියට ගෙනාවෙත් නැහැ සිංගප්පූරු ගිවිසුම අත්සන් කළා. ඉන් පසුව මෑතකදී ගිවිසුමක් නැතිව ලියුමකින් එකඟතාවක් ඇති වුණා. SOFA එක ගිවිසුමක් නොවෙයි, අපි කියන්නේ ඒක ලියුමක් කියලා. අගමැතිතුමා අද පාර්ලිමේන්තුවේදී කිව්වා, "ගිවිසුමක් තිබෙනවා නම් පෙන්වන්න" කියලා. ගිවිසුමක් නොවෙයි එකඟතාවක් එතැන තිබුණේ. ඒ එකඟතාව තුළ, SOFA එකෙන් මේ රට අනාගතයේදී විශාල අර්බුදයකට පත් කරනවා. ඒක තව කාලයක් යනකොට තේරෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තුර්කියේ තානාපතිවරයා 2017දී තුර්කියෙන් ආපු 50 දෙනෙක් ගැන එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියකින් දැනුම් දුන්නා. තුර්කි රජය පෙරළන්නට කටයුතු කළ, ඒ වාගේම ත්‍රස්තවාදී ක්‍රියා කළ ත්‍රස්තවාදීන් 50 දෙනෙකු තුර්කියේ ඉඳලා ඇවිල්ලා ඉන්නවාය කිව්වා. වසන්ත සේනානායක රාජ්‍ය ඇමතිතුමා ඉතා පැහැදිලිව පත්තරයට පමණක් නොව ආරක්ෂක අමාත්‍යාංශයට ලියුමක් ලියලා කිව්වා, "මේ අය අත් අඩංගුවට ගන්න" කියලා. ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලියුමක් එව්වා ඒ පිළිබඳව පරීක්ෂණ කරනවා කියලා. ආපහුත් ලියුමක් යැව්වා, නමුත් පරීක්ෂණ කරලාත් ඒ අය අත් අඩංගුවට ගත්තේ නැහැ. ඒ අයගේ Identity Card number දුන්නා, ඔවුන්ගේ විස්තර දුන්නා. නමුත් ආණ්ඩුවට ඒ අය අත් අඩංගුවට ගන්නට ක්‍රියා කරන්නට බැරි වුණා.

මාවනැල්ල සිද්ධිය ගැන අපේ පායලී චම්පික රණවක ඇමතිතුමා දන්නවා. මාවනැල්ලේ බුදු පිළිම කැඩීමට සම්බන්ධ අය නිදහස් කළේ කවුද, නිදහස් කරන්න බලපෑම් කළේ කවුද? කබීර් හෂීම් මැතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා, "ඒ සඳහා ඇමතිවරයෙකුගෙන් බලපෑම් තිබෙනවා" කියලා. එහෙම නම් ආණ්ඩුව ඒකට වග කියන්නට ඕනෑ. ඒවායේ ප්‍රතිඵල විධියට මේ රටේ මුස්ලිම් ජනතාව, සිංහල ජනතාව සහ දෙමළ ජනතාව අතර අවිශ්වාසයක් ඇති කරලා සියලු ජාතීන් අතර මේ මෑතකදී ප්‍රශ්නයක් ඇති කළා.

තමුන්නාන්සේලා දන්නවා 2015 ජනවාරි මාසයේ 08වෙනි දා වෙනකොට මේ රටේ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තිබුණේ නැහැ කියලා. දෙමව්පියන්ට ඉස්කෝලවල ලඟින්නට සිදු වෙන ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඒ කාලයේ ආණ්ඩුව යමක් කිව්වා නම්, මිනිස්සු ඒ දේ විශ්වාස කළා. යම් දෙයක් මේ රටේ ආණ්ඩුවේ ඇමතිවරයෙක් කිව්වා නම්, ආරක්ෂක ඇමතිවරයා කිව්වා නම්, ඒක විශ්වාස කළා. නමුත් පසු ගිය දවස්වල මොකක්ද වුණේ? අධ්‍යාපන ඇමතිවරයා ඉස්කෝල අරින්න කියනකොට, හිටපු හමුදාපතිවරයා කියනවා තවම ඉස්කෝලවලට ආරක්ෂාවක් නැහැ, රටේ ආරක්ෂාවක් නැහැ කියලා. ආණ්ඩුවේ ඇමතිවරු එකිනෙකාට විරුද්ධව ප්‍රකාශ කරන්නට පටන් ගත්තා. මේ තත්ත්වය තුළ තමයි පසුගිය වකවානුව ඇතුළත මේ රටේ ආරක්ෂාව නැතිවෙලා අනාරක්ෂිත තත්ත්වයට පත් වුණේ. එහෙම නම් මේ ආණ්ඩුව මේ අනාරක්ෂිත තත්ත්වයට වග කියන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද ආර්ථිකය සම්පූර්ණයෙන් කඩාගෙන වැටිලා තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් නැති විධියට දෙකයි දශම ගණනකට ආර්ථික වර්ධන වේගය පහළට වැටුණා. ඒවා මතක ඇති. එම නිසා මේ කාලය ඇතුළත ආර්ථිකයේ අංශ කිහිපයක්ම සම්පූර්ණයෙන්ම විනාශවෙලා තිබෙනවා.

මේ රටට පිටරටින් ගම්මිරිස් ගෙනැල්ලා ඒවා අපනයනය කරන්නට ඉඩ දුන්නේ කවුද? පසුගිය කාල පරිච්ඡේදය තුළ ඉන්දියානු ගිවිසුම යටතේ අවුරුද්දකට මෙට්‍රික්ටොන් 2,500ක් පිට රට යවනකොට එයින් මෙට්‍රික්ටොන් 2,400ක්ම හොර පාරේ යන්නට ඉඩ දුන්නේ කවුද? එම නිසා මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම සාධාරණයි වාගේම, මේ විශ්වාස භංග යෝජනාවට අපේ පූර්ණ සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
மாண்புமிகு முகம்மட் இஸ்மாயில் அவர்கள்! உங்களுக்கு ஐந்து நிமிடங்கள் உள்ளன.

[பி.ப. 2.15]

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில்)
(The Hon. (Dr.) S. M.Mohamed Ismail)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, பிரதம அமைச்சர், அமைச்சரவை உள்ளிட்ட அரசாங்கம்மீதான நம்பிக்கையின்மை தொடர்பான இந்த விவாதத்தில் பங்குபற்றுவதற்கான சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் நன்றி தெரிவிக்கின்றேன். உண்மையில், உயிர்த்த ஞாயிறு

குண்டுவெடிப்பின் பின்னர் நாட்டில் ஏற்பட்ட பல்வேறுபட்ட அனர்த்த நடவடிக்கைகள் இந்த நாட்டின் பொருளாதாரத்தை மிகவும் சீரழித்துக் கொண்டிருப்பதை நாங்கள் காணக் கூடியதாக இருக்கின்றது. அந்த வகையில் இலங்கையில் பல்வேறுபட்ட பொருளாதாரச் சீரழிவுகள் ஏற்பட்டிருக்கின்றன. சுற்றுலாப் பயணிகளின் வருகை குறைவினால் எங்களுக்குப் பிரதான வருமானத்தைத் தருகின்ற சுற்றுலாத்துறை வீழ்ச்சி கண்டிருக்கின்றது. அதேபோன்று, இனங்களுக்கிடையிலான ஒற்றுமை சீர்குலைக்கப் பட்டிருக்கின்றது. தனிப்பட்ட ரீதியில் ஒரு சில உயர் அதிகாரிகள்மீது பல்வேறுபட்ட அழுத்தங்கள் பிரயோகிக்கப் படுவதுடன் அவர்களுக்கெதிரான பல்வேறுபட்ட நடவடிக் கைகளும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. சில நாடுகள் எமது நாட்டுக்கு எதிராகக் குற்றத்தைச் சுமத்துகின்ற ஒரு சூழலில் இன்று நாங்கள் இந்த விவாதத்தில் பேசிக் கொண்டிருக்கின்றோம்.

எது எப்படியாக இருந்தாலும் எங்களுடைய நாடு பொருளாதார ரீதியாகவோ அல்லது ஏனைய கல்வி ரீதியாகவோ முன்னேறிக் கொண்டிருந்த ஒரு நாடாகும். எங்களுடைய பொருளாதார நிலையாக இருந்தாலும் சரி, ஏனைய சமூக கலாசார விழுமியங்களாக இருந்தாலும் சரி, அண்மையில் இடம்பெற்ற இந்த நிகழ்வுகளின் பின்னர் அனைத்து விடயங்களிலும் பல்வேறுபட்ட சிக்கல்களுக்கு நாங்கள் முகங்கொடுத்துக் கொண்டிருக்கின்றோம். இந்த நாட்டை எதிர்காலத்தில் எவ்வாறு கட்டியெழுப்ப வேண்டும் என்று நாங்கள் சிந்தித்துச் செயற்பட வேண்டும். இன்னும் நாங்கள் எங்களுக்குள்ளே குறைகளைக் கூறிக்கொண்டிருப் பதனால் இந்த நாட்டை நல்ல முறையில் முன்னெடுத்துச் செல்ல முடியுமா? என்கின்ற ஒரு சந்தேகம் இன்று மக்கள் மத்தியில் எழுந்து கொண்டிருக்கின்றது.

நாட்டில் அண்மையில் மேற்கொள்ளப்பட்டு வருகின்ற சில நடவடிக்கைகளினால் அரசாங்கத்தில் இருக்கின்ற உயர் அதிகாரிகள் மற்றும் ஏனைய உயர் மட்டங்களில் இருக்கின்றவர்கள் பாரிய அழுத்தங்களுக்கு மத்தியில் இருக்கின்றார்கள். குறிப்பாக, இந்த நாட்டில் இருக்கின்ற சிறுபான்மை இனத்தவர்கள் அதிலும் குறிப்பாக, முஸ்லிம்கள் மிகவும் அச்சத்துடன் வாழ வேண்டிய சூழ்நிலை இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்றது. ஆகவே, மீண்டும் மீண்டும் முஸ்லிம் மக்களைச் சந்தேகக் கண்கொண்டு பாராமல் இவ்வாறான சூழ்நிலைகளிலிருந்து இந்த நாடு மீள வேண்டும்.

இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம்கள் தனி நாடு கேட்டவர்களோ, இந்த அரசாங்கத்திற்கு எதிரான யுத்தங்களில் ஈடுபட்டவர்களோ அல்லர். அண்மையில் ஒருசிலர் குண்டுவெடிப்புத் தாக்குதலை மேற்கொண்ட காரணத்தினால், இன்று ஒட்டுமொத்த முஸ்லிம் சமுதாயத்தையும் சந்தேகக் கண்ணோட்டத்தில் பார்க்கக்கூடிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது. இந்தத் தாக்குதல் சம்பவத்தை மேன்மேலும் தூக்கிப் பிடிப்பதில் எவ்வித அர்த்தமும் இல்லை. ஆகவே, எல்லா இனங்களும் சந்தோஷமாக வாழக்கூடிய ஒரு நாட்டைக் கட்டியெழுப்புவதில் நாங்கள் சில முயற்சிகளை மேற்கொள்ள வேண்டி இருக்கின்றது.

இன்று எங்களுடைய நாட்டுக்கான வெளிநாட்டு முதலீடுகள் பின்னடைவைச் சந்தித்துக் கொண்டிருக்கின்றன. நாட்டின் பொருளாதாரத்தைத் திறம்படக் கட்டியெழுப்ப வேண்டுமேயானால் வெளிநாட்டு முதலீடுகள் அவசியமாகும். அதேபோன்று எங்களுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்பும் வகையில் உல்லாசப் பிரயாணத்துறையை கட்டிவளர்க்க வேண்டியிருக்கின்றது; எங்களுடைய தொழிலாளர்களை வெளிநாடுகளுக்கு வேலைக்கு அனுப்ப வேண்டிதொரு சூழ்நிலையிருக்கின்றது. இன்றைய அரசின் பதவிக் காலத்திலே ஏற்பட்டிருக்கின்ற இவ்வகையான பின்னடைவுகளினால் அனைத்துத் துறைகளிலும் நாங்கள் வீழ்ச்சியை எதிர்நோக்கிக் கொண்டிருக்கின்றோம். ஆகவே, இவ்வாறான நிலைமையை நீட்டிக்கொண்டு செல்லாமல் முடியுமானவரை இந்த நாட்டில் சமூக ஒற்றுமையை ஏற்படுத்தி, நாட்டின் பொருளாதாரத்தை மீண்டும் முன்னேற்றிச் செல்வதற்கான வாய்ப்பை ஏற்படுத்த வேண்டுமென இந்த உயரிய சபையில் கேட்டு, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

மாண்புமிகு உறுப்பினர் அவர்களே நன்றி. The next speaker is the Hon. Kanchana Wijesekera. You have six minutes.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

Sir, I have eight minutes.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

No.

[අ.භා.2.20]

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප්‍රේල් මාසයේ 21 වැනි දා එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ තොරතුරු ලැබී තිබියදීත් තම වගකීම කඩකිරීම පිළිබඳව අගමැතිවරයාට සහ ආණ්ඩුවට විරුද්ධව අද දවසේ විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම ගැන ජනතා විමුක්ති පෙරමුණට අපේ ස්තුතිය පළමුවෙන් පුද කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අපි මතක් කළ යුතුව තිබෙනවා, මේ ආණ්ඩුවේ විශ්වාසය කඩවෙච්ච පළමුවැනි අවස්ථාව මේ පාස්කු ඉරිදා ප්‍රහාරය නොවන බව. මීට පෙර -පසුගිය අවුරුදු හතරහමාර ඇතුළේ,- අවස්ථා ගණනාවකදී මේ ආණ්ඩුවේ විශ්වාසය බිඳ වැටිච්ච අවස්ථා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඡන්ද බලයෙන් පත් වෙච්ච මේ ආණ්ඩුව මේ රටේ ඉතිහාසයේ සිදු වූ විශාලතම කොල්ලය වෙච්ච මහ බැංකු වංචාවට සම්බන්ධ වුණා. මේ රටේ වර්තමාන අගමැතිවරයාත්, මේ කැබිනට් මණ්ඩලය නියෝජනය කරන ඇමතිවරු කිහිප දෙනෙකුත්, ඒ වාගේම අගමැතිවරයා විසින් පත් කරගන්නා ලද මහ බැංකුවේ අධිපතිවරයා ඇතුළු කණ්ඩායමත් සෘජුව සම්බන්ධ වී එක වතාවක් නොවෙයි, දෙවතාවක් මේ රටේ මහ බැංකුව කොල්ල කෑ හැටි අපි දැක්කා. ඒ නිසා එක පැත්තකින් මේ විශ්වාස භංග යෝජනාව මේ ආණ්ඩුවට විරුද්ධව ගෙන ආ යුතුව තිබුණේ මීට අවුරුදු හතරහමාරකට පෙර. ඒ වාගේම, ඊට පසු අවස්ථා කිහිපයකදී ඇමෙරිකානු එක්සත් ජනපදයත් සමඟ එක්ව මේ රටට විරුද්ධව, මේ රටේ හමුදාවට, මේ රටේ හිටපු රාජ්‍ය නායකයන්ට විරුද්ධව මානව හිමිකම් කවුන්සිලයේ සමයෝජනාවලට එකඟතාව මේ ආණ්ඩුව පළ කළා. පාර්ලිමේන්තුවට, ඇමති මණ්ඩලයට නොදන්වාම, කරුණු ඉදිරිපත් කරන්නේ නැතුවම, ඉතිහාසයේ පළමු වැනි වතාවට, තම රටට විරුද්ධව සමයෝජනාවක් වෙනුවෙන් ඉදිරිපත් වූ හැටි අපි

[ගරු කංචන විජේසේකර මහතා]

දැක්කා. මෙවැනි අවස්ථා ගණනාවක් තිබෙනවා. හම්බන්තොට වරාය ඇතුළු ආර්ථික මර්මස්ථාන එකින් එක විදේශීය රාජ්‍ය වෙනුවෙන්, විදේශීය ආයතනවලට විකිණීම වැනි අවස්ථා ගණනාවකදීම ආණ්ඩුව කෙරෙහි ඇති විශ්වාසය පලුදු වෙලා තිබෙනවා.

අපි එදා ඒකාබද්ධ විපක්ෂයෙන් ගෙනා විශ්වාසභංග යෝජනාවලදී එක අවස්ථාවක රවි කරුණානායක ඇමතිතුමා අමාත්‍ය ධුරයෙන් ඉවත් වෙලා, පසුව වෙනත් අමාත්‍ය ධුරයක දිවුරුම් දුන්නා. රාජිත සේනාරත්න ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනා අවස්ථාවේදී, ඒ විශ්වාස භංග යෝජනාව න්‍යාය පුස්තකයට ඇතුළත් කරලා විවාදයට ගන්නේ නැතුව හිටපු හැටි අපි දැක්කා. ඒ වාගේම, මේ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සිද්ධිදාමයට අදාළ චෝදනා ගණනාවක් යටතේ මූලික නමක් හැටියට කියවෙච්ච රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමාට විරුද්ධව විපක්ෂය විසින් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. නමුත් ඒ චෝදනාව ආපු වෙලාවේ ආණ්ඩුව කළේ රිසාඩ් බදියුදීන් ඇමතිතුමා එම ඇමතිකමින් තාවකාලිකව ඉවත් කරලා විශ්වාස භංග යෝජනාව ඉවත් කර ගැනීමයි. අද දවසේ මේ ගෙනෙන විශ්වාස භංග යෝජනාව තුළිනුත් අපි හිතන්නේ - සමස්ත විපක්ෂයේ අප සියලු දෙනා මේ වෙනුවෙන් සහයෝගය දෙනවා, ජනතා විමුක්ති පෙරමුණට. එසේ සහාය දුන්නත්, - මෙහි ප්‍රතිඵලය බවට පත් වෙන්නේ හෙට හවස හත වෙනකොට මේ විශ්වාසභංගයට මුහුණ දීලා එය පරාජය කරලා නැවත වතාවක් අගමැතිවරයාත්, ආණ්ඩුවත් පත්වීමයි.

අපි ජනතා විමුක්ති පෙරමුණෙන් තව ඉල්ලීමක් කරනවා. මේ විශ්වාස භංග යෝජනාව ගෙනා එක හරි. මේ විශ්වාස භංග යෝජනාව ගෙනැත් තිබෙන්නේ අගමැතිවරයාට හා ආණ්ඩුවේ ඉන්නා සියලු පාර්ශ්වවලට විරුද්ධවයි. ජනතා විමුක්ති පෙරමුණට මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන්න බැරි වුණත්, මේ ගෙනා යෝජනාව ඵල සහිත යෝජනාවක් බවට පරිවර්තනය කරන්න නම්, ඊළඟ ජනාධිපතිවරණයේදී ඒ පාර්ශ්වය නියෝජනය කරන කිසිම අපේක්ෂකයෙකුට සහාය ලබා නොදීම තුළින් මේ කරුණු මේ රටේ ජනතාවට ඔප්පු කරලා පෙන්වන්න පුළුවන් කියලා අපි හිතනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපි වෙනම ඉල්ලනවා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
වෙනම ඉල්ලනවාද? බොහොම ස්තූතියි. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, ජනතා විමුක්ති පෙරමුණ වෙනම ඉල්ලනවා කියලා. අපි හිතනවා, එතුමා ඒ කියපු වචනය, ඒ විශ්වාසය ඒ ආකාරයෙන්ම ආරක්ෂා කරයි කියලා. මොකද, ඔබතුමන්ලාටත් මේ වගකීමෙන් මිදෙන්න බැහැ. මේ ආණ්ඩුව බලයට පත් කිරීමේ විශාලම වගකීමක් දැරුවේ ජනතා විමුක්ති පෙරමුණයි. එදා අපට මතකයි, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පෙරළන්න ඔබතුමන්ලා පොදු අපේක්ෂකයා වටා එකතු වූ හැටි. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති සහ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති එකකට එකක් ගැළපුණේ නැති වෙලාවේත්, - එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති එක්ක ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති කවදාවත් ගැළපුණේ නැහැ; TNA එකේ ප්‍රතිපත්ති එක්ක ගැළපුණේ නැහැ. - තමුන්නාන්සේලා එකතු වුණා. එම නිසා මේ අවුරුදු හතරහමාර තුළ වූ මේ විනාශයේ කොටසක් තමුන්නාන්සේලාත් භාර ගත යුතුයි. එම නිසා ඒ වරද නිවැරදි කරන්නත් ඔබතුමන්ලාට අවස්ථාවක් තිබෙනවා. ජනාධිපතිවරණයේදී ඔබතුමන්ලා වෙනමම ඡන්දය ඉල්ලනවා නම්, එහෙම නැත්නම් වෙන කාට හරි සහයෝගය දෙනවා නම් ඔබතුමන්ලාට ඒක කරන්න පුළුවන්. නමුත්, අගමැතිවරයාට විරුද්ධව, මේ ආණ්ඩුවට විරුද්ධව, ආණ්ඩුවේ සියලු පාර්ශ්වවලට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ජනාධිපතිවරණයේදී ඒ පැත්ත ගන්න ඔබතුමන්ලාට සදාචාරාත්මක අයිතියක් තියෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමාත් මේ සභාවට යම් කිසි හෙළි කිරීමක් කළ බව අපි දැක්කා. එනම්, අධිකරණයේදී තවමත් අධි චෝදනා ගොනු නොවූ කාරණයක් සම්බන්ධයෙන් වූ ඒ අධි චෝදනා මාධ්‍යයට නිකුත් වුණේ කොහොමද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී අපට සැකයක් මතුවනවා. අපි දැක්කා, නීතිපතිවරයා ඉතාම කඩිනමින් දැන් නඩු කටයුතු කර ගෙන යන ආකාරය. ඊයේත් අපි දැක්කා, නඩුවලින් නිදහස් වූ පොලීසියේ නිලධාරින්ට, යුද හමුදාවේ නිලධාරින්ට ඊළඟ දවසේ නැවත ඒ නඩුවම පවරන හැටි. අපේ රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමාගේ නඩුවක් නිෂ්ප්‍රභ කළා. නමුත්, එදා දවසේ රෑම ආයෙත් එතුමාට අධි චෝදනා ගොනු කරනවා. හිටපු ආරක්ෂක ලේකම්තුමා වන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත් අධි චෝදනා ගොනු කරන ආකාරය අපි දැක්කා. හැබැයි, මේවා මාධ්‍යවල ප්‍රචාරය වුණේ නැහැ. අපට සැකයක් තිබෙනවා, බැඳුම්කර වංචාවේ චූදිතයන් තවදුරටත් නිදහස් කරන්නද, ඒ නඩුව තුළදී ඔවුන්ට යම් කිසි වාසියක් ලබා දෙන්නද මේ තොරතුරු මාධ්‍යයට නිදහස් කර තිබෙන්නේ කියලා. ඒ website එක මේ රජයේම සිටින ඇමතිවරයෙකුගේ පාලනය යටතේ තිබෙන website එකක්. ඒ website එක කියෙව්වාම පෙනෙනවා, ඒ ඇමතිවරයා කවුද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය මම යොමු කරවනවා.

අප්‍රේල් 21 වැනි දා සිදු වූ ප්‍රහාරවලින් පසුව ගත වූ මාස තුන තුළ තවමත් මේ රටේ ආරක්ෂාව තහවුරු කරන්න මේ ආණ්ඩුවට පුළුවන්කමක් ලැබී නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට මේ කරුණ මතක් කරනවා. මේ දවස්වල කතරගම පෙරහැර පැවැත්වෙනවා. තව මාසයකින් මහනුවර දළ දා පෙරහැරත්, දෙවිනුවර ඇසළ උත්සවයත් පැවැත්වෙනවා. දෙවිනුවර ඇසළ උත්සව කමිටුවට ආරක්ෂක කමිටුවෙන් ලිපියක් එවා තිබෙනවා, පෙරහැර කෙටි කරන්න, පෙරහැරේ ගමන් මාර්ගය වෙනස් කරන්න, පෙරහැරේ සමහර අංග ඉවත් කරන්න පුළුවන් නම් ඉවත් කරන්න කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ ආණ්ඩුව එක පැත්තකින් කියනවා, වගකීමක් අරගෙන ආරක්ෂාව තහවුරු කර තිබෙනවා කියලා. මම මේ කියන්නේ දෙවිනුවර පෙරහැර ගැන. අපේ ඩී.වී. චානක මන්ත්‍රීතුමා නියෝජනය කරන ප්‍රදේශය වන කුඩාවැල්ල ප්‍රදේශයේ පසුගිය දවස්වල පෙරහැර තිබුණා. එම පෙරහැරේ තිබුණු අංග ඉවත් කරන්නත් උසාවි නියෝගයක් ගත්තා. ඒ අනුව, පොලීසිය උසාවියට කරුණු දක්වා ආරක්ෂාව දෙන්න විධියක් නැහැයි කියලා එම පෙරහැරේ කාවඩි නර්තන ඉවත් කළා. ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා, ආරක්ෂාව තහවුරු වෙලා තිබෙන්නේ, සහරාන් ඇතුළු ත්‍රස්තවාදී කණ්ඩායම්වල නායකයෝ අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ දැන් කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා. හැබැයි, සරත් ෆොන්සේකා මැතිතුමා කියනවා, "නැහැ, මරාගෙන මැරෙන ප්‍රහාරකයෝ තවමත් අහුවෙනවා" කියලා. ඒ අතරේ පොලීසියෙන් ගිහිල්ලා ගමේ පෙරහැර කරන්න එපා

කියනවා. ඔබතුමන්ලා වගකීමක් ඇති ආණ්ඩුවක් විධියට මේ පිළිබඳව අවධානය යොමු කරන්න. අවුරුදු 762ක් පවත්වාගෙන ආ දෙවිනුවර පෙරහැර කෙටි කරන්න, ගමන් මාර්ගය වෙනස් කරන්න, පෙරහැරේ අංග ඉවත් කරන්න පුළුවන්කමක් නැහැ. ඒක ආණ්ඩුවට කරන්න පුළුවන් කාරණයක් නොවෙයි. ඒ පෙරහැර වාර්ෂිකව පවත්වාගෙන ආ පෙරහැරක්. 89දී ජනතා විමුක්ති පෙරමුණේ භීෂණ කාලයේදීත් ඒ පෙරහැර තිබුණා; යුද සමයේදීත් තිබුණා. එම නිසා මේ කටයුතු කරන්න එපා කියන ඉල්ලීමත් කරමින්, මේ යෝජනාව සඳහා ඒකාබද්ධ විපක්ෂය හැටියට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවාය කියන එකත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
அடுத்ததாக, மாண்புமிகு வடிவேல் சுரேஷ் அவர்கள்!

Order, please! Will an Hon. Member propose the Hon.Velu Kumar to the Chair?

**ගරු අර්ජුන රණතුංග මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Transport and Civil Aviation)

Sir, I propose that the Hon. Velu Kumar do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[பி.ப. 2.28]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்- பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vadivel Suresh - State Minister of Plantation Industries)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கத்திற்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணையில் மலையக மக்கள் சார்பாக சில விடயங்களை இங்கே பதிவுசெய்ய விரும்புகின்றேன். இந்த நாடு 1948ஆம் ஆண்டு சுதந்திரம் அடைந்திருந்தாலும்கூட, மலையக மக்களுக்கு 1977ஆம் ஆண்டுக்குப் பிறகுதான் சுதந்திரம் கிடைத்திருக் கின்றது; பிரஜாவுரிமை கிடைத்திருக்கின்றது; இலவசக் கல்வி கிடைத்திருக்கின்றது; ஏனைய இன்னோரன்ன சலுகைகள் கிடைத்திருக்கின்றன. குறைநிறைகள் இருந்தபோதிலும்கூட மலையக மக்கள் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரே அரசாங்கம் ஐக்கிய தேசிய கட்சி அரசாங்கமாகும். மலையக மக்கள் நன்றியுடையவர்கள். மலையக மக்களுக்குரிய அங்கீகாரம் கிடைக்கப்பெற்றதும் அவர்களுக்கு முழுமையான சுதந்திரம் கிடைக்கப்பெற்றதும் ஜே.ஆர் ஜயவர்தன அவர்கள் இந்த நாட்டின் ஜனாதிபதியாக இருந்த இந்த ஐக்கிய தேசிய கட்சியின் காலகட்டத்தில்தான் என்பதை எமது மக்கள் நன்கு அறிவார்கள்.

இந்த ஐக்கிய தேசிய கட்சி அரசாங்கத்திற்கு எதிராகக் கொண்டுவரப்பட்டிருக்கின்ற இந்த நம்பிக்கையில்லாப் பிரேரணை சம்பந்தமான விவாதத்தில், கண்டி மாவட்டத்தைச் சேர்ந்த என்னுடைய இரத்த உறவான கௌரவ வேலு குமார் அவர்கள் அக்கிராசனத்தில் அமர்ந்திருக்கும்போது, கண்டி மாவட்டத்தில நடைபெற்ற சில விடயங்களை ஞாபகமூட்ட விரும்புகின்றேன். கண்டியில் இரண்டு நாட்களுக்கு முன்னர் நடைபெற்ற ஒரு நிகழ்வின்போது மலையக மக்களைக் 'கள்ளத்தோணிகள்' என வர்ணித்த நிகழ்வு இடம்பெற்றிருந் ததை ஊடகங்கள் மூலமாக நாங்கள் அறியக்கூடியதாக இருந்தது. 'கள்ளத்தோணிகள்' என அவர்கள் குறிப்பிடும் மலையக மக்கள் இங்கு அழைத்து வரப்பட்டதன் காரணமாகத்தான் காடு மேடாக இருந்த மலையகத்தைக் கொத்திப் பதப்படுத்தி தேயிலை, தென்னை, இறப்பர் போன்றவற்றை உருவாக்க முடிந்தது. இந்த நாட்டின் பொருளாதாரத்தைத் தன்னுடைய முதுகிலே சுமந்து, "Ceylon Tea" என்ற பெயரிலே இந்த நாட்டிற்கு விலாசத்தைப் பெற்றுக்கொடுத்தவர்கள் மலையக மக்களாவர். "Ceylon Tea" என்ற அங்கீகாரத்தைப் பெற்றுக் கொடுப்பதற்கு மலையக மக்கள் இன்னோரன்ன துன்பங்களைச் சுமந்து, வேதனைக்கு மத்தியிலே சாதனை படைத்திருக்கின்றார்கள்.

மலையக மக்கள் நல்லவர்கள்; அமைதியாக இருக்கக் கூடியவர்கள்; உண்மையானவர்கள்; பொறுமையானவர்கள்; பேச்சுவார்த்தைமூலம் வெற்றி காண முனைபவர்கள். மலையக மக்கள் இந்த நாட்டிலே என்றைக்கும் ஆயுதம் ஏந்தவில்லை. பொறுமையாக இருந்து பேச்சுவார்த்தை மூலமாகத் தங்களுக்குக் கிடைக்கவேண்டிய நியாயமான, மனிதாபிமானத் தேவைகளை நிறைவேற்றிக்கொள்ள முற்படுபவர்கள்தான் இந்த மலையக மக்களும் அவர்களுடைய பிரதிநிதிகளும். அப்படியான எங்களைப் பார்த்துக் 'கள்ளத்தோணி' என்று கூறுவது வேதனையாக இருக்கின்றது. 200 வருடங்களுக்குப் பிறகும் மீண்டும் எங்களைக் 'கள்ளத்தோணி' என விளிப்பவர்களுக்கு நான் ஒன்றைச் சொல்ல விரும்புகிறேன். அதாவது, வடக்கு, கிழக்கிலேயிருந்த இளைஞர்கள் தமது பிரச்சினைகளுக்காக ஆயுதம் ஏந்தினார்கள். இன்று முஸ்லிம் சகோதரர்களுக்குப் பிரச்சினை ஏற்பட்டிருக்கின்றது. ஆனால், மலையகத்திலேயிருக்கின்ற இளைஞர்கள் - மலையக மக்கள் முழுமையான கட்டுப்பாட்டோடு இருந்து ஒற்றுமையாகச் செயற்பட்டுக் கொண்டிருக்கிறார்கள். அவர்கள் இந்த நாட்டின்மீது அக்கறை கொண்டவர்கள், பாசம் கொண்டவர்கள், உண்மையான அன்பு கொண்டவர்கள். அந்த வகையில், அவர்களைக் கௌரவிக்க வேண்டுமேதவிர, அவர்களுக்கு இன்னோரன்ன பட்டங்களைச் சூட்டி எங்களுடைய மனதை வேதனைப்படுத்த வேண்டாமென நான் இந்த உயரிய சபையிலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

எது எவ்வாறாக இருந்தபோதும்கூட, இந்த நாட்டிலே மலையக மக்களுக்குப் பிரஜாவுரிமையை வழங்கிய ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்திற்கு நாங்கள் பரம்பரை பரம்பரையாக நன்றியுள்ளவர்களாக இருப்போம். இந்த ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்திற்கு மலையக மக்களும் அவர்களுடைய பிரதிநிதிகளும் என்றுமே ஆதரவாகத்தான் இருப்பார்கள். அதிலே எந்தவிதமான சந்தேகமும் கிடையாது. நாங்கள் பல சவால்களுக்கு முகங்கொடுத்திருக்கின்றோம். பல கசப்பான அனுபவங்கள் எங்களுக்கு இருக்கின்றன. எங்கு, எப்போது, என்ன பிரச்சினை ஏற்படுத்தப்பட்டாலும் அதில் பாதிக்கப்படுபவர்கள் மலையக மக்களாகவே இருந்தார்கள்.

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

இந்த மலையக மக்களுடைய அபிவிருத்தி சம்பந்தமான வேலைத்திட்டங்களில் ஐக்கிய தேசியக் கட்சி முழுமையாகப் பங்கெடுத்துள்ளது. ஆசிரிய நியமனங்கள் மற்றும் அரசாங்க நியமனங்கள், காணியைப் பெற்றுக்கொள்வதற்குரிய அங்கீகாரம் போன்றவையெல்லாமே இந்த அரசாங்கத்தின் மூலமாகத்தான் மலையக மக்களுக்குக் கிடைக்கப்பெற்றிருக் கின்றன. ஐக்கிய தேசியக் கட்சி அரசாங்க காலத்தில்தான் பிரதேச சபைகள், மாகாண சபைகள் மற்றும் பாராளு மன்றத்தில் எமது சமூகம் சார்ந்த மலையக மக்களுடைய பிரதிநிதிகள் ஆகக் கூடுதலாக அங்கம் வகிக்கின்றார்கள். அதன்மூலமாக எங்களுடைய மக்களுக்கு ஆகக்கூடுதலான சேவை கிடைத்திருக்கின்றது. ஆகவே, உள்ளூராட்சிச் சபைகள் உட்பட மாகாண சபை மற்றும் பாராளுமன்றத்தில் இருக்கின்ற மலையக மக்களின் பிரதிநிதிகள் அனைவரும் இந்த அரசாங்கத்திற்கு முழுமையான ஆதரவைத் தெரிவிப்பார்கள் என்பதில் எந்தவிதமான சந்தேகமும் கிடையாது. ஆகவே, எங்களுக்குத் தேவையற்ற பட்டங்களைச் சூட்டி எங்களை அசௌகரியத்துக்குட்படுத்த வேண்டாமென நான் மீண்டும் மீண்டும் பொறுப்பானவர்களைப் பொறுப்புடன் கேட்டுக்கொள்ள ஆசைப்படுகின்றேன். நன்றி.

[பி.ப. 2.33]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று அரசாங்கத்திற்கு எதிராகக் கொண்டுவரப்பட்டிருக்கின்ற நம்பிக்கையின்மை தொடர்பான பிரேரணை சம்பந்தமாக எனது கருத்துக்களையும் தெரிவிப்பதற்குச் சந்தர்ப்பத்தை வழங்கியதற்காக எனது நன்றியைத் தெரிவித்துக்கொள் கின்றேன். இந்த நாட்டில் கடந்த Easter தினத்தன்று மேற்கொள்ளப்பட்ட குண்டுத் தாக்குதலினால் பலதரப்பட்ட மக்கள் கொல்லப்பட்டிருக்கிறார்கள். இந்த உயிரிழப்புக்கள் யாரால் ஏற்படுத்தப்பட்டன? இதற்கு என்ன காரணம்? என்கின்ற பல கேள்விகள் எழுப்பப்படுகின்றன. இதனடிப்படையிலே இந்த நாட்டிலே இருக்கின்ற அரசாங்கம் என்ற வகையில் ஜனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் உண்மையிலே இதற்குப் பதில் கூறக் கடமைப்பட்டவர்களாக இருக்கிறார்கள். சர்வதேச புலனாய்வுத் துறையினர் சரியான, துல்லியமான தகவல்களை இந்த நாட்டின் புலனாய்வுத் துறையினருக்கு வழங்கியும்கூட, அதற்குரிய நடவடிக்கையை இந்த இரண்டு தரப்பினரும் எடுக்காமல்விட்டதன் காரணமாகத்தான் இந்த உயிரிழப்புகள் ஏற்பட்டிருக்கின்றன. இதற்குப் பொறுப்புக்கூறவேண்டியவர்கள் இவர்கள் இரண்டுபேரும்தான். ஆனாலும் இதற்குரிய கூடுதலான பங்கை இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள் ஏற்க வேண்டும். ஏனென்றால், அவரின்கீழ்தான் பாதுகாப்புத் துறை, மற்றும் சட்டம், ஒழுங்கு ஆகிய விடயங்கள் இருக்கின்றன. அவர் உரிய நேரத்தில் பாதுகாப்புச் சபையைக் கூட்டி நடவடிக்கை எடுத்திருந்தால், இந்த நாட்டிலே இப்படியொரு பாரிய அனர்த்தம் எற்பட்டிருக்காது. அவர் இந்தத் தாக்குதல் தொடர்பில் தெரிந்திருந்தும் இந்த நாட்டைவிட்டு வெளிநாட்டுக்குச் சென்றிருக்கின்றார். அவருக்குப் பதிலாக யாரையும் நியமிக்காமல் விட்டதும் இந்த உயிரிழப்புகளுக்குக் காரணமாக அமைகின்றது.

இந்த நாட்டிலே பெறுமதிமிக்க உயிர்கள் இஸ்லாமியத் தீவிரவாதிகளினாலே காவுகொள்ளப்பட்டிருக்கின்றன. இந்த இஸ்லாமியத் தீவிரவாதிகள் கூடுதலாகக் கிழக்கு மாகாணத்திலேதான் உருவாக்கப்பட்டவர்களாக இருக்கின்றார்கள். இஸ்லாமிய ISIS தீவிரவாதிகளுடன் தொடர்புடைய இந்தத் தற்கொலைக் குண்டுத் தாக்குதலுக்குச் சூத்திரதாரியாக இருந்து செயற்பட்ட சஹ்ரான் தற்கொலைக் குண்டுதாரியாக மாறி இறந்துள்ள நிலையில், சஹ்ரானுக்கு யார் இந்த அறிவுறுத்தல்களை வழங்கினார்? என்பதை இந்த அரசு இன்னும் கண்டுபிடிக்கவில்லை. இதனோடு தொடர்புடைய பயிற்சிகளைப் பெற்ற ஆயிரக்கணக்கான இஸ்லாமியத் தீவிரவாதிகளை இந்த அரசு இன்னும் கைது செய்யாமல் விட்டிருப்பது மாபெரும் தவறாக இருக்கின்றது. மென்மேலும் தற்கொலைக் குண்டுதாரிகள் இந்த நாட்டிலே தற்கொலைத் தாக்குதலை நடத்தக்கூடிய சூழ்நிலை காணப்படுகின்றது. சஹ்ரானின் தலைவர் இந்த நாட்டிலே இப்போதும் இருக்கின்றார். அவர்தான் அதனை நடைமுறைப்படுத்தியவர். அவரைக் கண்டுபிடிக்கவில்லை; அவரைக் கைது செய்யவில்லை. எனவே, உடனடியாக அந்த நடவடிக்கையிலே இந்த அரசு ஈடுபட வேண்டும்.

நாம் இந்த அரசிடம் பல தடவை பல கோரிக்கைகளை முன்வைத்திருந்தோம்; பல தேவைப்பாடுகளைக் கேட்டிருந் தோம். அபிவிருத்தி சார்ந்த விடயங்களைப் பற்றிக் கூறியிருந்தோம்; உரிமை சார்ந்த விடயங்களைப் பற்றிக் கூறியிருந்தோம். விசேடமாக கல்முனை வடக்குப் பிரதேச செயலகம் சம்பந்தமாக இந்த அரசிடம் பல தடவை அழுத்தம் திருத்தமாகக் கூறியிருக்கின்றோம். கல்முனை வடக்குப் பிரதேச செயலகமானது 30 வருட காலமாகத் தரமுயர்த்தப்படாமல் இருக்கின்ற ஓர் உப பிரதேச செயலகமாக இருக்கின்றது. தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் மட்டுமல்ல, இங்கேயிருக்கின்ற அனைத்துக் கட்சி உறுப்பினர்களும் தமிழர்களுக்கான அந்த உரிமை மறுக்கப்பட்டிருக்கின்றது என்பதனை இந்த உயரிய சபையிலே உண்மையாக, நியாயமாக ஏற்றுக்கொண்டிருக்கின்றார்கள். நிலத்தொடர்பற்ற முறையிலே கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவு இருக்கின்றதென்றும் இந்தப் பிரதேச செயலகமானது சட்டவிரோதமாக உருவாக்கப்பட்டதென்றும் வதந்திகளைப் பரப்பி, மாயையான - பொய்யான பிரச்சாரங்களை மேற்கொண்டு, தமிழர்களையும் சிங்களவர்களையும் மட்டுமல்லாது, தங்களது இனமான முஸ்லிம் மக்களையும் திசைதிருப்புகின்ற செயற்பாட்டைச் சில அரசியல்வாதிகள் தங்களது இலாபத்துக்காக முன்னெடுத்து வருகின்றார்கள். இது உண்மையாக கவலைக்கும் வேதனைக்குமுரிய விடயமாக இருக்கின்றது. கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவு இன்று நிலத் தொடர்போடு இருக்கின்றது. ஆனால், கல்முனையிலிருக்கின்ற கல்முனைத் தெற்கு முஸ்லிம்களின் பிரதேச செயலகப் பிரிவு நிலத் தொடர்பற்ற முறையிலே இருக்கின்றது. ஆனால், இன்று அங்கு ஓர் மாயையை உருவாக்கி, நிலத்தொடர்பற்ற முறையிலே கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவு இருக்கின்றதென்று பொய்ப் பிரச்சாரத்தை மேற்கொண்டிருக்கின்றார்கள். இந்தப் பொய்ப் பிரச்சாரத்தை மேற்கொள்பவர்களுக்கு நான் இந்த உயரிய சபையிலே சவால் விடுக்கின்றேன். கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவானது Google Mapsஇலே நிலத்தொடர்போடு இருக்கின்றது என்பதனை இந்த உயரிய சபையிலே சொல்ல விரும்புகின்றேன். தயவுசெய்து போலிப் பிரச்சாரங்களை மேற்கொண்டு தமிழர்களையும் முஸ்லிம் களையும் திசை திருப்புகின்ற செயற்பாடுகளை முன்னெடுக்க வேண்டாம்.

கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்த வேண்டுமென்று தமிழர்களாகிய நாங்கள் முன்னெடுக்கின்ற

அந்த உரிமைப் போராட்டத்தை, அந்த உண்ணாவிரதத்தைக் குழப்புகின்ற செயற்பாடுகளில் ஏனைய சமூகத்தினர் ஈடுபடுவது ஓர் அநாகரிகமான செயற்பாடாக இருக்கின்றது. அது ஒரு நாகரிகமான செயற்பாடு அல்ல. ஓரினம் தங்களது தேவைக்காக, தங்களது உரிமைக்காக, தங்களது கொள்கைக் காகப் போராடுகின்ற சந்தர்ப்பத்திலே, அந்த உரிமை கிடைக்கப்பெறாது, அந்த உரிமையினைப் பெற்றுக்கொள் வதற்கான அந்தச் செயற்பாட்டினை முன்னெடுக் கக்கூடாதென்று ஏனைய இனம் தடுக்கின்ற செயற்பாட்டை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. இதனடிப்படையிலே, இந்த கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்த வேண்டுமென்று நாங்கள் கேட்டுக்கொண்டிருக்கின்ற இந்த நேரத்திலே கிறிஸ்துவுக்கு முன் அல்லது ஆங்கிலேயர் ஆட்சிக் காலத்திலே நடைமுறையிலிருந்த பிரதேச சபையைப் பிரிக்கின்ற திட்டத்தை அங்கே கொண்டுவந்திருக்கின்றார்கள். இது என்ன நியாயம்? ஆங்கிலேயர் ஆட்சிக் காலத்திலே துண்டுதுண்டாகப் பிரிக்கப்பட்டதைப்பற்றி நீங்கள் கூறுவீர் களேயானால், 500 வருடங்களுக்கு முன் நீங்கள் எங்கிருந்தீர்கள்? உங்களுக்கு எங்கு இடமிருந்தது? என்று அந்த நபர்களிடம் நான் கேள்வியெழுப்ப விரும்புகின்றேன். அப்படிப் பார்க்கப்போனால் தமிழர்களின் பிரதேசமாகத்தான் அனைத்துப் பிரதேசங்களும் காணப்படுகின்றன. ஆகவே, இந்த உயரிய சபை அதற்கான நியாயமான தீர்ப்பை வழங்கவேண்டும். இது சம்பந்தமாகப் பல தடவை பிரதமர் அவர்களிடம் நான் வேண்டுகோள் விடுத்திருக்கின்றேன். அதனடிப்படையிலே எங்களுக்கான அந்த உரிமையை இந்தச் சபை தரவேண்டும். அவ்வாறு இந்த உயரிய சபையும் இந்த அரசும் அதற்கான அங்கீகாரத்தைத் தர மறுக்கின்றபொழுது இந்த அரசு மேற்கொள்ளுகின்ற செயற்பாடுகளை நாங்கள் எதிர்க்கவேண்டிய சந்தர்ப்பம் ஏற்படும் என்று கூறி விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி, கௌரவ உறுப்பினர் அவர்களே! මීළඟට, ගරු තේනුක විදානගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා.2.43]

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන මේ මොහොතේ අපි මතක් කරන්න ඕනෑ, මේ ආණ්ඩුව කෙරෙහි වූ විශ්වාසය බිඳ වැටුණේ අද නොවෙයි කියන කාරණය. ආණ්ඩුව පත් වෙලා මාස කිහිපයක් ඇතුළත තමයි මේ ආණ්ඩුව කෙරෙහි මේ රටේ ජනතාවගේ විශ්වාසය කැඩිලා ගියේ. ආණ්ඩුව පත් වෙලා මාස පහමාරක් වාගේ කාලයකදී මහ බැංකුව කැඩීම තුළින් මේ ආණ්ඩුව කෙරෙහි පළමුවෙන්ම විශ්වාසය භංග වුණා. ඒ වාගේම, එදා ඉඳලා පසුගිය අවුරුදු කිහිපය තුළදීම මේ රටේ තිබුණු සම්පත් දවසෙන් දවස විකුණාගෙන, විකුණාගෙන ගියා. එදා හම්බන්තොට වරාය විකුණලා දැම්මා. ඒ වාගේම, මත්තල ගුවන් තොටුපොළ විකුණන්න ලැහැස්ති කරගෙන තියෙනවා. කොළඹ වරාය ඇතුළු රටේ සම්පත් විකිණීමට ලැහැස්ති කරනවා.

ජාතික ආරක්ෂාව ගැන කථා කළොත්, පසුගිය අප්‍රේල් 21 වෙනි දා මේ රටේ ජනතාව කිසිසේත්ම නොසිතූ වෙලාවක ජීවිත විශාල ගණනක් බිලි ගත්තා. ඒ නිසා රටේ ජනතාව නැවත වතාවක් බියෙන්, සැකෙන් ජීවත් වෙන වාතාවරණයක් මේ ආණ්ඩු කාලය තුළ දී උදා වෙලා තිබෙනවා. ආණ්ඩුව දවසින් දවස ජාත්‍යන්තරයත් එක්ක ගිවිසුම් ගහනවා. ඇමෙරිකාවද, චීනයද, ඉන්දියාවද, සිම්බාබ්වේද අදාළ නැහැ, මේ රටේ සම්පත් ඕනෑම දෙයක් ඒ රටවලට දෙන වාතාවරණයක් මේ වෙනකොට අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ ආණ්ඩුව සකස් කරලා තිබෙනවාය කියන එක අපි අද මතක් කරන්න ඕනෑ. අද රටේ ආර්ථිකය විනාශ වෙලා ඉවරයි. ජනතාවට අවුරුදු හතරක ඉඳලා මේ රට පාලනය කරන ආණ්ඩුව ගැන විශ්වාසයක් නැහැ. රටේ ආර්ථිකය එහෙමපිටින්ම කඩා වැටුණු තත්ත්වයකට තමයි පත්වෙලා තිබෙන්නේ. ඒ වාගේ වෙලාවක මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා, ආර්ථික වශයෙන් වාගේම සෑම පැත්තකින්ම හිරවෙලා ඉන්න අග්‍රාමාත්‍යවරයාට full toss එකක් දාලා දුන්නාද කියන සැකයක් මේ විශ්වාස භංගය ගැන අද අපට මඳක් හිතන්න වෙනවා. පසුගිය කාලය තුළදී අරලියගහමන්දිරයේ වෙනම කාමරයක ඉඳගෙන FCID එකට ඉදිරිපත් කරපු පැමිණිලි ගැනත්, දේශපාලනය ගැනත් සාකච්ඡා කරපු අය තමයි අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ කියන එකත් අපි මතක් කරන්න ඕනෑ.

මේ රටේ අහිංසක දූ දරුවන්ටත් අද නිදහසේ ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් නැහැ කියන එකත් අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසා අද මේ ගෙන ආ විශ්වාස භංග යෝජනාවට විපක්ෂය විධියට අපි සියලු දෙනාගේම සහයෝගය ලබා දෙනවාය කියන කාරණයත් මතක් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

හොඳයි.

අප්‍රේල් 21 වැනි දා සිදුවීම සම්බන්ධයෙන් මේ රටේ අග්‍රාමාත්‍යවරයාත්, ජනාධිපතිවරයාත්, ඒ වාගේම ආණ්ඩුවත් ඒ පැත්තට මේ පැත්තට බෝලය පාස් කළාට, අද වෙනකල් කිසිම විසඳුමක් ලබා දීලා නැහැ. අහිංසක මිනිස්සු විශාල පිරිසක් අද වන විට ජීවිතවලින් වන්දි ගෙවා තිබෙනවා. ඒ වාගේම සමහර අයගේ පවුල්වලට සහෝදර සහෝදරියන් නැති වෙලා තියෙනවා; දූ දරුවන් නැති වෙලා තියෙනවා. ඒ නිසා අපි වාගේම මේ රටේ ජනතාවටත් මේ ආණ්ඩුව කෙරෙහි කිසිදු විශ්වාසයක් නැහැ කියන එක මීට කලිනුත් පිළිගෙන තිබෙනවාය කියන එක අපි මතක් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.2.43]

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අනුර දිසානායක මැතිතුමා විසින් අද දින ඉදිරිපත් කළ මේ විශ්වාස භංග යෝජනාව, පසුගිය පාස්කු ඉරිදා දින සිදු වූ ප්‍රහාරයට සම්බන්ධයි. ආණ්ඩුව හිතමතාම එයට මුහුණ නොදීපු තත්ත්වයක් මත ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් හැටියට තමයි එතුමා කරුණු දැක්වූයේ. විශේෂයෙන්ම මේ කාරණය මා සඳහන් කරන්නට ඕනෑ. මේ කාරණයේදී අපි රජයක් හැටියට වග කිවයුතු වෙනවා. නමුත් අපි කවුරුත් දන්නා දෙයක් තමයි, අපි රජයක් හැටියට 2018 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 26වැනි දා වෙන

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

තෙක් එක ගමනක් ආපු බව. ඒ ආපු ගමන තුළදී විටින් විට නොයෙක් දේවල් සිදු වුණා. අගමැතිතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. එම විශ්වාස භංග යෝජනාව අපි ජයග්‍රහණය කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය ජයග්‍රහණය කරලා ඉස්සරහට යන අතරතුරදී මේ රටේ විධායකය විසින් ලොකු අවුලක් ඇති කළා.

විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය, ඒ වාගේම නීතිය හා සාමය අමාත්‍යාංශය එතුමා යටතේ තිබුණු කාලය තුළදී තමයි මේ සිද්ධිය ඇති වුණේ. රටේ තිබෙන ජාතික රහස් තොරතුරු ඒකකයෙන් සහ බුද්ධි අංශයෙන් එළිවෙන තොරතුරු ආරක්ෂක ඇමතිතුමාට වාර්තා වෙනවා. මේ අවස්ථාව පාර්ලිමේන්තු කාරක සභා කාමරයක මේ ගැන සාක්ෂි විභාගයක් පවත්වන අවස්ථාවක්. එම සාක්ෂි විභාගයට ආපු අය - ආරක්ෂක ලේකම්වරයා, පොලිස්පතිවරයා - මේ ඇතිවුණු මූලික සිද්ධිය ගැන එතුමන්ලා දැනුම් දුන් බව කිව්වා. හරි නම් මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑ ආණ්ඩුවට විරුද්ධව නොවෙයි. මම විශ්වාස කරන හැටියටමේ රටේ ජනාධිපතිවරයාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනෙන්න ඕනෑ. මොකද, මේ කාරණයේ මූලික වග කීම යන්නේ මේ රටේ විධායකයට; මේ රටේ ජනාධිපතිවරයාට.

2018 ඔක්තෝබර් මාසයේ 26වැනි දා අපේ ආණ්ඩුව පැත්තකට දාලා අලුත් අගමැතිවරයෙක් පත් කරලා, අලුත් ඇමතිවරු කණ්ඩායමක් පත් කරලා මේ රට උඩු යටිකුරු කරලා තිබුණා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, තත්පර කිහිපයක් ඔබතුමාගේ වෙලාවෙන් මට දෙන්න. ඔබතුමා කිව්වා, ජනාධිපතිවරයාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙන ආ යුතුයි කියලා. අපිත් එය පිළිගන්නවා. ජනතා විමුක්ති පෙරමුණට තිබෙන මන්ත්‍රී ධුර සංඛ්‍යාවෙන් ඒක කරන්න බැහැ. එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රීවරුන් සියයකට අධික ප්‍රමාණයක් සිටිනවා. දෝෂාභියෝගයක් ගෙනෙන්න අවම මන්ත්‍රීවරුන් 75ක් අවශ්‍යයි. ඉතින් ඔබතුමන්ලා ජනාධිපතිවරයාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනෙන්නේ නැත්තේ ඇයි? ඒ ගැන කිය කියා ඉඳලා වැඩක් නැහැ නේ.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

අපි මන්ත්‍රීවරුන් 75ක් දෙනවා, මන්ත්‍රීවරුන් 150ක් හොයලා දෙනවා නම්. මම අත් දෙකම උස්සනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශ්වාස කරනවා, පසුගිය පාස්කු ඉරිදා සිදු වුණු සිද්ධිය රටට විශාල හානියක් කියලා. ඒ වාගේම අපේ බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, එතුමන්ලාත් මේ රටේ සිදු වූ මේ වාගේ සිද්ධිවලට වග කිව යුතු කාලයක් තිබුණු බව. මම දන්නේ නැහැ, එතුමා ඒ කාලයේ දී සිටියාද කියලා. 1971, 1988 - 89 කාලයේ. මම එතුමාට දොස් පවරන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ නිසා මේ පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම පීඩාවට පත් වෙච්ච මන්ත්‍රීතුමා මම. මගේ තාත්තා 1988 මාර්තු 16වැනි දා නාඳුනන තුවක්කුකරුවන් අතින් ඝාතනයට ලක් වුණා. ඊට පස්සේ 1988 මැයි මාසයේ 27වැනි දා මම විවාහ වෙච්ච දවසේ, මගේ ගෙදරට ඇවිල්ලා මට වෙඩි තිබ්බා. මම බේරුණා අනූනවයෙන්. මගේ සහෝදරයා එතැනම මිය ගියා. මට දෙපාරක් වෙඩි තිබ්බා. ඒ වාගේ ඝාතන රාශියක් කළා. ඒ කාලයේ කියැවුණේ ජනතා විමුක්ති පෙරමුණ ඒවා කළා කියලායි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, රෝහණ විජේවීර මහත්මයායි, උපතිස්ස ගමනායක මහත්මයායි මියගිය දිනට පසුදා ඉඳලා ඒ ඝාතන නතර වුණා. රෝහණ විජේවීර මහත්මයාගේ මිය යෑමත්, උපතිස්ස ගමනායකගේ මිය යෑමත් එක්ක ඒවා නතර වෙන කොට මේ රටම පිළිගත්තා, ජනතා විමුක්ති පෙරමුණ මේ කටයුතු තුළ ඉන්නවා කියලා. ඊට පසුව මේ රටේ ඝාතන රාශියක් සිදුවෙනකොට, ප්‍රභාකරන් කියන ඝාතකයා තමයි ඒවා කළේ කියලා අපි දැනගත්තා. ප්‍රභාකරන් ඝාතනය වුණා විතරයි එදා ඉඳලා එවැනි ඝාතන සිදු වුණේ නැහැ. ඒ නිසා, ඒ ඝාතන සියල්ලට නායකත්වය දුන්නේ ප්‍රභාකරන් ඇතුළු එල්ටීටීඊ කණ්ඩායමයි කියලා අපි විශ්වාස කරනවා.

මෙන්න මේ කාරණයත් මා සඳහන් කරන්න ඕනෑ. මේ සිද්ධියට මුදල් වියදම් කර තිබෙන්නේ කවුද කියලා ජාතික රහස් තොරතුරු බුද්ධි අංශයේ මහත්වරු සඳහන් කර තිබෙනවා. අපට දැනට ලැබී තිබෙන ආරංචි අනුව, පාස්කු ඉරිදා ප්‍රහාරයේ ඝාතකයකුට -මරාගෙන මැරෙන එක පුද්ගලයකුට- රුපියල් ලක්ෂ 10ක මුදලක් දෙන්න තීරණය කර තිබෙනවා. මේ මුදල් ලබාදෙන්න තීරණය කර තිබෙන්නේ පිට රටකින් නොවෙයි, අර ඊබ්‍රාහිම් කියන පුද්ගලයායි. ඊබ්‍රාහිම් කියන පුද්ගලයා ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ අපේක්ෂක මහත්මයෙක්. එවැනි දේවලුත් මේ සිද්ධිය තුළ තිබෙනවා.

මේ රටේ මෙවැනි අපරාධයක් කළ ඒ අපරාධකරුවන් දින දෙකක් හෝ දින තුනක් ඇතුළත අත් අඩංගුවට ගන්න අපේ පොලිසියට, අපේ රහස් තොරතුරු ඒකකයට, බුද්ධි අංශයට පුළුවන්කම ලැබුණා. ඒ වෙනුවෙන් එම කණ්ඩායමට අපේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.2.54]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ජනතා විමුක්ති පෙරමුණ විසින් රජයට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ විවාදය පටන් ගැනීමේදී අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු කණ්ඩායම මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය ලබාදෙයි කියලා එතුමා බලාපොරොත්තු වෙන බව. මේ ආණ්ඩුවට විරුද්ධව ගෙනෙන ඕනෑම විශ්වාස භංග යෝජනාවකට, ඒ වාගේම රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට විරුද්ධව ගෙනෙන ඕනෑම විශ්වාස භංග යෝජනාවකට සහයෝගය දෙන්න විරුද්ධ පක්ෂය නියෝජනය කරන අපි සැකයකින් තොරව සැමදා පෙනී සිටියා. හැබැයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ සැබැවින්ම මේ රජයට විරුද්ධවද, එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දියවෙලා යන බලය නැවත රැකගැනීම සඳහාද කියන කාරණාව ගැන මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ දවසේ සිට අපට සැකයක් තිබුණා. එයට හේතුව, පාස්කු ඉරිදා එල්ල වුණු අන්තවාදී, ත්‍රස්තවාදී ප්‍රහාරයත් සමඟ රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට විරුද්ධව ගෙනෙන්න තිබුණු විශ්වාස භංග යෝජනාවට පසුව මේ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තීරණය කිරීමයි. රිසාඩ්

බදියුදීන් ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබුණු අවස්ථාවක, එක්සත් ජාතික පක්ෂයේ සහ රජයේ ඇමතිවරුන් පිරිසක සහයෝගය ඒ විශ්වාස භංග යෝජනාව වෙනුවෙන් ප්‍රකාශ කර තිබියදී, එක්සත් ජාතික පක්ෂය කැඩිලා සීසීකඩ ගිහින් තිබුණු අවස්ථාවක ජනතා විමුක්ති පෙරමුණේ උත්සාහය වුණේ, ආණ්ඩුව එකතු කරන්න විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම මිසක්, සැබැවින්ම ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම නොවෙයි කියන කාරණාව අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. එනමුත් මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව, රජයට විරුද්ධව අපේ ඡන්දය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ යහ පාලනය ස්ථාපිත කරන්න බලයට පැමිණි මේ ආණ්ඩුව 2015 පෙබරවාරි 27වන දා මේ රටේ පළමුවන බැඳුම්කර වංචාව සිදු කරනවා. ඒ පළමුවන බැඳුම්කර වංචාව නිසා, මේ දක්වා -අවුරුදු හතරහමාරක කාලයක් තුළ- දවසින්-දවස, ගෙවෙන හැම පැයේම අපේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා. ඒ බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට සෘජුව චෝදනාව එල්ල වෙනවා. එතුමාගේ ගජ මිතුරු අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමාට සෘජුව චෝදනාව එල්ල වෙනවා. ඒ වාගේම 2015දී පාර්ලිමේන්තුව විසුරුවා හරින අවස්ථාවේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආරක්ෂා කර ගැනීම සඳහා එතුමාට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න සිදු වෙනවා කියලා. ශ්‍රී ලංකා මහ බැංකුව කොල්ල කාපු, ඇති නැති භේදයකින් තොරව, ජාති භේදයකින් තොරව මුළු රටේම ආර්ථිකය කඩාකප්පල් කළ, සියලු ජාතීන්ට අපේ රටේ ජීවත්වීම අසීරු කළ, ආර්ථික වශයෙන් දැඩි පීඩනයක් එල්ල කළ ආණ්ඩුවකට විරුද්ධව තමයි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයේ සිටි මුල් අවධියේ -පසුගිය අවුරුද්ද දක්වා- අපට සැබැවින්ම විපක්ෂයේ කාර්ය භාරය කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ කථා වෙන් කර ගැනීමේ අපහසුතාවක් පවා තිබුණා. හැබැයි අපි දැක්කා, ජනතා විමුක්ති පෙරමුණයි, දෙමළ ජාතික සන්ධානයයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අවශ්‍යතාව අනුව මේ පාර්ලිමේන්තුව තුළදී ආණ්ඩු පක්ෂයට අවශ්‍ය සහයෝගය ලබා දුන්නේ කොහොමද කියලා. ඊට අමතරව, අපි දැක්ක තවත් දෙයක් තිබෙනවා. ප්‍රධාන වශයෙන් අද මැතිවරණ නොපවත්වන්න එක හේතුවක් තමයි, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජයට, ජනතා විමුක්ති පෙරමුණ දැක් වූ සහයෝගය. පළාත් සභා මැතිවරණය අවුරුද්දකුත් මාස අටකින් කල් ගියේ, ජනතා විමුක්ති පෙරමුණ එදා ආණ්ඩු පක්ෂයට නොතිබුණු තුනෙන් දෙකක බලය ලබා ගැනීම සඳහා එතුමන්ලාගේ මන්ත්‍රීවරුන් 6 දෙනාගේ සහාය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ලබාදුන් නිසායි. අවුරුද්දකුත් මාස අටක් ගත වෙලාත් මේ වෙනතුරු පළාත් සභා මැතිවරණය පවත්වන්නට නොහැකි වෙලා තිබෙන්නේ ඒ නිසායි. ඊට අමතරව මෙතුමන්ලා තවත් නිර්ලජ්ජිත උත්සාහයක් ගත්තා. ඒ තමයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අවශ්‍යතාවට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙන ඒම තුළින් ජනතා විමුක්ති පෙරමුණේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා බලාපොරොත්තු වුණේ මොකක්ද? එතුමාගේ බලාපොරොත්තුව වුණේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා කෙටිම පාරෙන් ජනාධිපති කිරීමයි; කෙටිම පාරෙන් එතුමා මේ රටේ පාලනය හොබවන පුද්ගලයා බවට පත් කිරීමයි. හැබැයි ජනතා විමුක්ති පෙරමුණ ගෙනා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය -රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අවශ්‍යතාව මත ගෙනා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය- මේ රටේ විරුද්ධ පක්ෂයේ හිටපු අපගේ සහ මහ ජනතාවගේ පීඩනය නිසා ආණ්ඩුවට ඉදිරියට ගෙන යන්නට බැරි වුණා. එහෙම වුණා නම්, අපේ රටේ ජනාධිපතිවරණයත් 2025 වර්ෂය වනතුරු කල් යනවා. මහ මැතිවරණයත් 2025 වනතුරු කල් යනවා. ඒ අතරතුර, රනිල් වික්‍රමසිංහ මහත්මයා කෙටිම පාරෙන් ජනාධිපතිවරයා බවට පත් වෙනවා.

මේ ආණ්ඩුව කෙරෙහි තිබුණු ජනතාවගේ විශ්වාසය දැන් කඩ වෙලා ඉවරයි. ජනතාව මේ ආණ්ඩුව කෙරෙහි පුදුමාකාර වෛරයකින් ජීවත් වෙන්නේ. තමන්ට තුන් වේල කන්න බැරි තත්ත්වයක් නිර්මාණය කළ මේ ආණ්ඩුව හැකි ඉක්මනින් ගෙදර යැවීමටයි රටේ ජනතාව බලා සිටින්නේ.

අද ආණ්ඩුව අපට මැතිවරණයක් ලබා නොදී ඉන්නවා. දැන් මේ ආණ්ඩුවේ අවසාන කාලය එළඹ තිබෙද්දි, අර අවුරුදු හතරහමාර තුළම කටයුතු කළා වාගේ, අනුර දිසානායක මැතිතුමන්ලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ශක්තිමත් කර තව දුරටත් ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරනවා. එතුමන්ලා ආණ්ඩුවට සහයෝගය දෙන අතරම, එතුමන්ලාගේ ඡන්ද පදනම දිය වෙලා ගිය නිසා ආණ්ඩුවට විරුද්ධව පෙළපාළි යනවා; විශ්වාස භංග යෝජනා අරගෙන එනවා. එම නිසා මේ සිදු කරන්නේත්, එතුමන්ලා අවුරුදු හතරහමාරක් සහයෝගය දැක්වූ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට නැවත වාරයක් සහයෝගය ලබා දීමක්ය කියන එක අපි නැවත නැවතත් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලහත්කාරයෙන්, ආණ්ඩුවේ අවශ්‍යතාව මත, ඊළඟ මැතිවරණය ජයග්‍රහණය කිරීම සඳහා SOFA එක අත්සන් කරන්න අවශ්‍ය වැඩකටයුතු සිදු කර තිබෙනවා. එම ගිවිසුම හරහා අපේ රටේ භූමියට සහ ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් එල්ල වෙනවා. මේ තුළින් මහා පාවා දීමක් සිද්ධ වෙනවා.

ඊළඟට, Millennium Challenge Corporation Compact එක ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. ආණ්ඩුවෙන් අපි මෙන්න මේ කාරණය අහන්න කැමැතියි. Millennium Challenge Corporation ගිවිසුම අත්සන් නොකරනවාය කිව්වාට, ඔවුන්ට ලැබෙන්න නියමිත ඩොලර් මිලියන 480 වෙනුවෙන් අපේ රටේ භූමියෙන් අක්කර 1,200කට වැඩි ප්‍රමාණයක් පාවා දෙන්න -මේ රටෙන් සියයට 28ක් - ආණ්ඩුව කටයුතු කරනවා. අපට එය ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. ආණ්ඩුව එයට එකඟතාවක් නැහැ කිව්වාට, අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, Millennium Challenge Corporation එකේ ප්‍රධාන විධායක නිලධාරි Sean Cairncross මහතාත් අතර සුබපැතුම් පණිවුඩ සහ ලිපි හුවමාරු වෙනවා. Millennium Challenge Corporation එකත් සමඟ එළඹෙන ගිවිසුම් හා එකඟතා සියල්ලටම රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහාය පළ කර තිබෙනවා. එම නිසා, සැබැවින්ම මේ රටට ආදරය කරන, මේ ආණ්ඩුව ගෙදර යවන්න ඕනෑය කියා විශ්වාස කරන, ඒ වාගේම අපේ රටේ දරුවන්ට යහපත් අනාගතයක් නිර්මාණය කිරීම සඳහා උත්සාහ දරන මන්ත්‍රීවරු තමන්ගේ හෘදය සාක්ෂිය එකඟව මෙම විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දෙයි කියා අප විශ්වාස කරනවා. අගමැතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂය -විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට- ඒ සඳහා බලපෑම් නොකරයි කියා අප විශ්වාස කරනවා. හෙට දිනය මේ රටේ තීරණාත්මක දිනයක් බවට පත් කර ගන්න අපි සියලුදෙනාම ඒක රාශි වෙමු කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.03]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கத்திற்கெதிரான நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான இந்த விவாதத்திலே பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காகக் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று சிலர் நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பில் பேசுவதாக நினைத்துக்கொண்டு, தமது பேச்சுக்கள்மூலம் இனவாதத்தைக் கக்கிக் கொண்டிருப்பதைக் காண்கின்றேன். எங்களுடைய சக மொழி பேசுகின்ற உறுப்பினருடைய பேச்சை நான் கேட்டுக்கொண்டிருந்தேன். அவர் பெயரிலே கோடீஸ்வரனாக இருந்தாலும், அவருடைய பேச்சிலே மிகவும் வறுமைக் கோட்டுக்குக் கீழேயிருக்கின்ற ஒரு பிச்சைக்காரன் போன்று காணப்பட்டார். ஆயிரத்திற்கும் மேற்பட்ட பயங்கரவாதிகள் சஹ்ரானுடைய ஆதரவாளர்களாக இருப்பதாகவும் சஹ்ரானுக்கு ஒரு தலைவர் இந்த நாட்டிலே இருப்பதாகவும் அவர் கூறிய வார்த்தைகள் இந்த நாட்டினுடைய புலனாய்வுப் பிரிவினரையும் இந்த நாட்டின் சட்டதிட்ட ஒழுங்குகளை நடைமுறைப்படுத்துகின்றவர் களையும் அவர்களுடைய நடவடிக்கைகளையும் கேள்விக் குறியாக்கியிருக்கின்றது. அவர் தற்போது நியமிக்கப்பட்டிருக் கின்ற பாராளுமன்றத் தெரிவுக்குழுவுக்கு முன்னிலையில் சென்று, அவர் அறிந்த அந்த ஆயிரக்கணக்கான பயங்கர வாதிகளை அல்லது சஹ்ரானுக்கு ஒரு தலைவன் இந்த மண்ணிலேயிருந்தால் அவரை அவர் காட்டிக்கொடுக்க வேண்டும். சஹ்ரான் ஓர் இஸ்லாமிய அடிப்படைவாதியல்ல! அவரை இஸ்லாமிய அடிப்படைவாதி என்று கூறுவது முஸ்லிம்களை, இஸ்லாத்தை அவமதிக்கின்ற ஒரு செயலாகும். அடிப்படைவாதம் என்ற சொல் சர்வதேசப் பயங்கரவாதிகளால் கொண்டுவரப்பட்டது. இன்று இரண்டு பயங்கரவாத நாடுகள் இருக்கின்றன. அவர்கள் இஸ்லாத்துக்கு எதிராக மக்களைத் தூண்டுகிறார்கள்; அதன் தாக்கமாகத்தான் 'சுன்னி', 'சியா' பிரிவுகள் உருவாக்கப்பட்டன. ஆயிரம் வருடங்களுக்கு முன்னர் இருந்து இந்த மண்ணிலே வாழ்ந்து வருகின்ற நாங்கள் ஆயுதம் ஏந்திப் போராடவில்லை. இந்த நாட்டினுடைய ஆட்சியாளர்கள் அத்தனை பேருக்கும் இந்த நாட்டினுடைய சட்ட திட்டங்களைப் பாதுகாப்பதற்கு உறுதுணையாகத்தான் முஸ்லிம்கள் இருந்து வந்திருக்கின்றார்கள்.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ கோடீஸ்வரன் அவர்கள்!

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
மஹரூப் அவர்களே, நீங்கள் சஹ்ரானைப் பற்றி ஏன் இவ்வளவு அக்கறை கொள்கின்றீர்கள்? அதற்குக் காரணம் என்ன?

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
இப்பொழுது நான் இதற்குப் பதிலளிக்க வேண்டும். சஹ்ரான் என்கின்ற பயங்கரவாதியை 22 இலட்சம் முஸ்லிம்களும் பயங்கரவாதியாகக் கூறுகின்றபோது, கோடீஸ்வரன் அவர்கள் சஹ்ரானுக்கு ஒரு தலைவர் இந்த நாட்டிலே இருப்பதாகக் கூறுவாரானால், அவர் அதைப்பற்றி இந்த நாட்டிலேயிருக்கின்ற பாதுகாப்புத் துறைக்குச் சொல்ல வேண்டும்.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
சஹ்ரானின் தலைவன் இந்த நாட்டிலேயிருப்பதாகக் கூறுவதில் உங்களுக்கு என்ன பிரச்சினை? சஹ்ரானின் தலைவர் உங்களுடைய ஆளா? அல்லது சஹ்ரானின் தலைவன் நீங்களா?

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
நீங்கள் இனவாதத்தைத் தூண்டி வாக்குளைப் பெற முடியாது. உங்களுடைய அம்பாறை மாவட்டத்திலே உள்ள முஸ்லிம்களுடைய மனங்களைப் புண்படுத்த வேண்டாம். தமிழ், முஸ்லிம் உறவு அங்கு அவசியமானது. அங்கிருக்கின்ற பேரினவாதிகளை ஆசீர்வதிக்க வேண்டாம். சஹ்ரானுக்கு ஒரு தலைவன் இங்கிருப்பதாக நீங்கள் கூறினீர்கள். அப்படியானால், அந்தச் சஹ்ரானுடைய தலைவனைக் காட்டிக்கொடுங்கள்! அதுமட்டுமல்ல, இன்று முஸ்லிம்களிடையே எந்தவொரு பயங்கரவாதமும் இல்லை என்பது உங்களுக்குத் தெரியும்.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
இந்த இடத்திலே சஹ்ரானுடைய தலைவனைப் பற்றித்தான் நாங்கள் கதைத்தோமே தவிர, முஸ்லிம்களைப் பற்றிக் கதைக்கவில்லை. சரிதானே! நீங்கள் அதனைப் பிழையாக விளங்கிக்கொள்ள வேண்டாம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ அப்துல்லா மஹரூப் அவர்களே, நீங்கள் உரையாற்றுங்கள்!

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
இவர் சஹ்ரானுக்கு ஒரு தலைவன் இருப்பதாகவும் முஸ்லிம்களிடையே 1000இற்கு மேற்பட்ட பயங்கரவாதிகள் இருப்பதாகவும் கூறினார்.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ வியாழேந்திரன் அவர்கள்!

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

நண்பர் கோடீஸ்வரன் அவர்கள் முஹமட் சஹ்ரானைப் பற்றித்தான் பேசினார். கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, கோபிக்க வேண்டாம். முஹமட் சஹ்ரான் இந்துவா?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒක point of Order එකක් නොවෙයි. கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் உரையாற்றுங்கள்!

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் ஒன்றை விளங்கிக்கொள்ள வேண்டும். இங்கு சஹ்ரானுக்கு தலைவர் ஒருவர் இருந்தால் அல்லது முஸ்லிம்களிடையே ஆயிரக் கணக்கான பயங்கரவாதிகள் இருந்தால் உடனடியாக நீங்கள் பாதுகாப்புப் பிரிவுக்கும் பொலிஸிற்கும் அறிவியுங்கள்! பயங்கரவாதத்தினைக் கண்காணிப்பதற்காகச் சிறப்புப் பிரிவொன்று உருவாக்கப்பட்டிருப்பதாகத் தெரிவிக் கப்படுகின்றது. மத அடிப்படைவாதக் குழுக்கள் என்று கூறிக்கொண்டு, இஸ்லாமியர்களைக் குறிவைக்கின்றார்கள்; மத அனுட்டானங்களை எமது சமூகத்திற்குப் போதிக்கின்ற தஃவா அமைப்புக்களை, மதரஸாக்களை, உலமாக்களைக் குறிவைக்கின்றார்கள். சிறப்புப் பிரிவுக்குப் பொறுப்பாக நியமிக்கப்பட்டிருக்கின்ற மேஜர் ஜெனரால் தர்ஷன ஹெட்டிஆராச்சி அவர்களிடம் இப்படிப்பட்ட கோரிக்கைகளை விடுத்தால் பயங்கரவாதிகளை இனங்கண்டுகொள்வதற்கு -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது. நிறைவுசெய்யுங்கள்!

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

அவர் இடையிலே குறுக்கிட்டார்; என்னுடைய பேச்சை முடிப்பதற்காக எனக்கு இன்னும் ஒரு நிமிடம் தரவும்!

ஆயிரம் வருடங்களுக்கு மேலாக இந்த நாட்டில் வாழும் முஸ்லிம் சமூகத்தினராகிய நாங்கள் இந்த நாட்டின் ஆட்சியாளர்களுடன் இணைந்து செயற்பட்டிருக்கின்றோம். ஆகவே, நீங்கள் உங்களுக்கு வாக்குகளைப் பெறுவதற்காக இனவாதத்தைத் தூண்டி இன நல்லுறவைச் சீர்குலைக்க வேண்டாம் என்று கூறிக்கொள்கின்றேன். அதுமட்டுமல்ல, இன்று இந்த நாட்டிலே தற்போதைய அரசாங்கம் பல்வேறுபட்ட அபிவிருத்திகளை மேற்கொண்டு வருகின்றது. இன்று இந்த அரசாங்கம் சிறுபான்மையினராகிய முஸ்லிம்கள், தமிழ் மக்கள் மற்றும் தோட்டத் தொழிலாளர்கள் போன்றோர் ஏற்றுக்கொள்ளக்கூடியவகையில் ஓர் ஆட்சியை நிலைநாட்டிக் கொண்டிருக்கின்றபோது, இந்தப் பிரேரணை அவசியமற்ற தாகும். இதனைப் பயன்படுத்திக்கொண்டு முஸ்லிம்களுடைய மனங்களைப் புண்படுத்த வேண்டாம் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.3.09]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුවට එරෙහිවයි. ඒ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් මාත් මේ අවස්ථාවේදී අදහස් පළ කරන්න බලාපොරොත්තු වෙනවා. කරුණු කිහිපයක් නිසා මේ ආණ්ඩුවට විරුද්ධව විශාල ජන මතයක් රට පුරා ගොඩ නැඟී තිබෙනවා. අවාසනාවට වාගේ රටේ තිබෙන ජන මතය පාර්ලිමේන්තුව තුළ නියෝජනය කරන්නේ නැහැ. පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ රටේ ජන මතය නොවෙයි. ඒ නිසා අපි ගෙනෙන හැම විශ්වාස භංග යෝජනාවක්ම විශ්වාසය තහවුරු කරන විශ්වාස භංග යෝජනා නම්, විශ්වාසය ගොඩ නඟන විශ්වාස භංග යෝජනා නම් ඒක ඉතා අවාසනාවන්ත තත්ත්වයක්.

මෙම විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළ හැකි විශ්වාස භංගයක් ලෙස, පාර්ලිමේන්තුවට බලපෑමක් කළ හැකි විශ්වාස භංගයක් ලෙස, රටේ ජනතාව කුමන අරමුණක් මත සූදානම් කළ යුතුද යන කාරණය මත ගොඩ නැඟී නැහැ. එසේ වුවත්, රටේ ගොඩ නැඟී තිබෙන ජනතාවගේ බලවත් අප්‍රසාදය, රටේ ගොඩ නැඟී තිබෙන අරාජික තත්ත්වය, රටේ ජනතාව තුළ ගොඩ නැඟී තිබෙන අවිශ්වාසය හා බිය සැලකිල්ලට අරගෙන ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයකු හැටියට මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව අදහස් දැක්වීමට මා කල්පනා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවේ තිබෙන විශාලම දුර්වලතාව වන්නේ, සහරාන්ගේ ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරයයි. පළමුවෙන්ම ජනාධිපතිතුමා හා අගමැතිතුමා යන දෙදෙනාම මේ ඇති වූ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධව සම්පූර්ණයෙන්ම වගකීම භාර ගන්න ඕනෑ. මෙවැනි බෝම්බ ප්‍රහාරයක් එන බව විශේෂයෙන්ම බුද්ධි අංශ දැනුම් දී තිබුණා. සමහර මුස්ලිම් කණ්ඩායම් ඒ බව ආණ්ඩුවට දැනුම් දී තිබුණා. ආණ්ඩුව ඒ කිසිවක් ගණන් නොගෙන කටයුතු කිරීම නිසා ආගමික දිනයක අහිංසක ජීවිත ගණනක් අපට අහිමි වුණා. ප්‍රහාරයට ලක් වූ ඒ සමහර අය තවමත් රෝහල්වල ප්‍රතිකාර ගනිමින් ඉන්නවා. සමහර අයට ජීවිතය නැති වුණා. අම්මලාට දරුවන් නැති වුණා. අපේ ඒ වේදනාව තවම පහ වෙලා නැහැ.

සහරාන්ගේ බෝම්බ ප්‍රහාරයෙන් පසුව ආණ්ඩුව ක්‍රියා කරපු ආකාරය ඉතාම ප්‍රශ්නකාරීයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ අපි හදිසි නීතිය ක්‍රියාත්මක කළාට පස්සේ අවශ්‍ය අය අත්අඩංගුවට ගන්න පුළුවන්. සහරාන්ගේ ත්‍රස්තවාදය, සහරාන්ගේ බෝම්බ කල්ලිය අපි බෙදවාචකයක් විධියට දැක්කාට, ඒක බෙදවාචකයක් කියන්න බැහැ. සහරාන්ගේ බෝම්බ කල්ලිය නිසා තමයි ලංකාව තුළ නිහඬව, යටින් ගමන් කරපු ඉස්ලාම් ත්‍රස්තවාදයේ සැබෑ මුහුණත හෙළිදරවු වෙන්න පටන් ගත්තේ.

මීට කලින් කථා කරපු මන්ත්‍රීවරයාත් කිව්වා, "සමහර අය මද්‍රසා පාසල්වලට විරුද්ධව වෙනවා. ඔළුව වහනවාට විරුද්ධ වෙනවා. ආයතන හදනවාට විරුද්ධ වෙනවා" කියලා. මේ සියලු දේවල්වලට අපි විරුද්ධ වෙනවා නොවෙයි. අපි මුස්ලිම් සමාජයට නොවෙයි, විරුද්ධ වෙන්නේ. මේ කරුණු පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු නොවීමයි අපට තිබෙන ප්‍රශ්නය. අද ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයකු වන මහාචාර්ය ආශු මාරසිංහ මන්ත්‍රීතුමා අපි කියපු මතය පාර්ලිමේන්තුව තුළ තහවුරු කර තිබෙනවා. එනම්, හිස්බුල්ලා මඩකලපුවේ හදපු විශ්වවිද්‍යාලය - Batticaloa Campus (Pvt.) Limited - ලංකාවේ හදපු භයානකම,

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

මිනීමරුවන් බිහි කරන, අන්තවාදී, ත්‍රස්තවාදී කල්ලිවලට මහ පාදන, බෝම්බකරුවන් බිහි කරන factory එකක් කියලා මේ ආණ්ඩුවේම ඉන්න ආශු මාරසිංහ මන්ත්‍රීවරයා පිළිගෙන තිබෙනවා. අද ඒකට විරුද්ධව ආණ්ඩුව තුළින් යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. මම කියන්න කැමැතියි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන් මුස්ලිම්, දෙමළ වේවා, සිංහල වේවා ජාති, ආගම් භේදයකින් තොරව ආශු මාරසිංහ මන්ත්‍රීවරයා ගෙනාපු ඒ යෝජනාව ජයග්‍රහණය කිරීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා කියලා. හිස්බුල්ලා මැතිතුමාගේ - හිටපු ආණ්ඩුකාරවරයාගේ,- මේ භයානක ක්‍රියාවලිය අපට හෙළිදරවු වුණේ සහරාන් ඇතුළු කණ්ඩායමේ බෝම්බ ප්‍රහාරය නිසායි. අද හිස්බුල්ලා මැතිතුමාගේ මේ Batticaloa Campus (Pvt.) Limited එක සහරාන්ගේ බෝම්බයට වඩා සිය ගුණයකින් සැලසුම් සහගත මුළු ශ්‍රී ලංකාවම ඉස්ලාම් අන්තවාදයට කොටු කර ගැනීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළේ ප්‍රධාන ස්ථානයක්. එයට මුදල් ලබා ගත්ත විධිය නීති විරෝධීයි; ඉඩම් ලබා ගත්ත විධිය නීති විරෝධීයි. මුලින් Hira Foundation එකටයි ඉඩම ලබා ගත්තේ. ඊට පස්සේ ඒකට BOI එකේ අවසරය ලබා ගත්ත විධිය නීති විරෝධීයි. සුබසාධන සංවිධානයකින් ඉඩම ලබාගෙන, ලාභ ලබන කොම්පැනියක් හැටියට ලියාපදිංචි වෙලා ගත්තේ ණයද නැද්ද, ඒ ණය ආපසු දෙන පදනම යටතේ ගත්තාද, ඒ මුදල් මහ බැංකුවෙන් අනුමත කළාද කියන මේ සෑම දෙයකින්ම පෙන්නුම් කරන්නේ අද රට ත්‍රස්තවාදීන්ට අවශ්‍ය විධියට, ත්‍රස්තවාදී මෙහෙයුමකට අවශ්‍ය කරන විධියට නැටවෙන තත්ත්වයකට පත් වෙලා තිබෙන බවයි.

සහරාන්ගේ බෝම්බයේ අනුවේදනීය තත්ත්වයට වඩා අද හිස්බුල්ලා විශ්වවිද්‍යාලයේ ප්‍රශ්නය ඉතාම බරපතළයි. ආණ්ඩුවට යෝජනාවක් ගෙනාවා නම්, ඒක ඉක්මනින් ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි කියලා අපි අහන්නට ඕනෑ. ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කළා. පාර්ලිමේන්තුවේ කමිටු ඉදිරිපිටට ඔහු ගෙනාවා. ඔහු ප්‍රශ්නවලට උත්තර දීපු ආකාරයෙන් සමාජය මේ ප්‍රශ්නයේ ඇත්ත තත්ත්වය තේරුම් ගත්තා. හිස්බුල්ලා මැතිතුමාගේ Batticaloa Campus (Pvt.) Limited කියන පවුලේ කොම්පැනියට අපි විරුද්ධ වන්නේ ඒක පවුලේ කොම්පැනියක් වීම නිසාම නොවෙයි. අනාගතයේ ශ්‍රී ලංකාව විතරක් නොවෙයි, ඉන්දියාව ඇතුළු දකුණු ආසියාවටම බෝම්බකරුවන් නිෂ්පාදනය කරන බෝම්බ ෆැක්ටරියක් හදන ආයතනයක් නිසායි අපි Batticaloa Campus (Pvt.) Limited එකට විරුද්ධ වෙලා තිබෙන්නේ.

මුස්ලිම් තරුණයන් අත්අඩංගුවට ගත්තා. ඔවුන් අත්අඩංගුවට ගැනීම නොවෙයි ප්‍රශ්නය. 1987 මා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු වශයෙන් ඉගෙන ගත් කාලයේ -ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩු කාලයේ,- මාස හතරකට අප අත්අඩංගුවට ගත්තා. එදා කිසිම ප්‍රශ්න කිරීමකින් හා නඩුවකින් තොරව අපි මාස පහක් හිරේ තියාගෙන හිටියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මට ලැබී ඇති කාලය ඉතාම කෙටි නිසා මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්න මා බලාපොරොත්තු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
எங்களுடைய தேரர் அவர்கள் சொன்ன வார்த்தையை ஹன்சாட்டிலிருந்து நீக்க வேண்டும். இஸ்லாமியப் பயங்கரவாதம் என்பது உலகில் எங்குமே இல்லை. ISIS என்கின்ற பயங்கரவாதிகள் இஸ்லாமியர்களும் அல்லர். இந்த விடயத்திலே அவர் அதனை வாபஸ் வாங்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්සේ කථා කරන්න.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
ISIS பயங்கரவாதம் இருக்கின்றது; ஆனால், இஸ்லாமியப் பயங்கரவாதம் இல்லை.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
IS කියන්නේ Islamic State කියන එකයි. ISIS කියන්නේ-

*[இடையீடு]*

No, please! - [*Interruption.*] I will reply to you. - [*Interruption.*] This is my time. Listen to me.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්වාමීන් වහන්සේ කථා කරන්න.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා අහපු ප්‍රශ්නයට මම පළමුවෙන් උත්තර දෙන්නට ඕනෑ. අද ලෝකයේ ඉස්ලාම් අන්තවාදී ත්‍රස්තවාදී සංවිධාන 17ක් තිබෙනවා. ඒ අන්තවාදී ත්‍රස්තවාදී සංවිධාන 17න් තලෙයිබාන් ව්‍යාපාරය ඉස්ලාම් රාජ්‍යයක් හැටියට ඇෆ්ගනිස්තානයේ, එක්දහස් නවසිය - [බාධා කිරීමක්] අහගෙන ඉන්න. ඔබතුමාගේ කාලය නොවෙයි, මේ මගේ කාලය. වාඩි වෙන්න. මේ මට ලැබී ඇති කාලයයි.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
*[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அவர் பேசுவதற்கு வாய்ப்புக் கொடுங்கள்!

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
Please listen to me.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
*[இடையீடு]* பயங்கரவாதிகள் இஸ்லாமியர்கள் அல்லர்!

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉස්ලාම් භක්තිකයෙක් වෙන්න පුළුවන්. ඔබතුමා ත්‍රස්තවාදයට අයිති නොවෙන්න පුළුවන්. ත්‍රස්තවාදී නොවන ඉස්ලාම්වාදීන් ඉන්න පුළුවන්. ඒක වෙනම කථාවක්. නමුත්, ලෝකයේ ත්‍රස්තවාදය දියත් වෙන්නේ ඉස්ලාම් අල්ලාහ් දෙවියන් වහන්සේ නමින්. ඒ තලෙයිබාන් ව්‍යාපාරය හැදින්වූයේ ඇෆ්ගනිස්ථානයේ NATO සංවිධානයත් එක්ක. තලෙයිබාන් ව්‍යාපාරය රාජ්‍ය බලය පිහිටවූවා. ඒක එක ත්‍රස්තවාදී සංවිධානයක්. ඉරානයේ ත්‍රස්තවාදී සංවිධානයක් දියත් කරලා තිබෙනවා. ඒ වාගේම, හිස්බුල්ලා, තලෙයිබාන්, ජිහාඩ් ආදී නම්වලින් විශාල ත්‍රස්තවාදී සංවිධාන ජාලයක් ලෝකයේ ඉස්ලාම් නමින් තිබෙනවා. ඉස්ලාම් නමින් කාන්තාවන්ගේ මුහුණ වහන, කාන්තාවන්ට ඉගැන්වීම තහනම් කරන අද ඇෆ්ගනිස්තානයේ,-[බාධා කිරීමක්]- මම එක ප්‍රශ්නයක් අහනවා, තමුන්නාන්සේගෙන්. එහෙම නම් කරුණාකරලා මම අහන මේ ප්‍රශ්නයට උත්තර දෙන්න. මොකක්ද ඒ ප්‍රශ්නය? අද නැඟෙනහිර පළාතේ මුස්ලිම් කාන්තාවන්ට ඉගෙනීම තහනම් කරලා තිබෙනවා. ඇත්ත ද, බොරුද කියලා ඒකට උත්තර දෙන්න ඕනෑ. ඒ පළාතේ කාන්තාවන්ට ඉගෙන ගැනීම අද තහනම් කරලා තිබෙනවා. කවුද ඒ තහනම් කරලා තිබෙන්නේ? අපිද තහනම් කරලා තිබෙන්නේ? අද ඇෆ්ගනිස්තානයේ කාන්තාවන්ට මේ දේවල් තහනම් කරලා තිබෙන්නේ අපි ද? -[බාධා කිරීමක්]- පාකිස්තානයේ තහනම් කරලා තිබෙන්නේ අපි ද? කාන්තාවන් ඉගෙන ගත්තා කියලා වෙඩි තියන්නේ අපි ද? අපි ද වෙඩි තියන්නේ? අද කාන්තාවන්ට ඉස්කෝලේ යන්න තහනම්.-[බාධා කිරීමක්]- අද සිංහලයෙක් කසාද බැන්දොත් වෙඩි තියලා මරනවා! අද සිංහලයෙක් කසාද බැන්දොත් වෙඩි තියලා මරනවා!! ඒක තමයි ඇත්ත. -[බාධා කිරීමක්]- වෙඩි තියලා මරන්නේ නැත්නම් දඬුවම් දෙනවා. අද ඒවා මාධ්‍යවල පළ වෙනවා.-[බාධා කිරීමක්]- මතක තියා ගන්න, මේ ගොල්ලන් අද නැඟෙනහිර පළාතේ ඉස්කෝලවල ගැහැනු දරුවන්ට ඉගැන්වීම් තහනම් කරලා තිබෙනවා; ක්‍රීඩාව තහනම් කරලා තිබෙනවා; සංගීතය තහනම් කරලා තිබෙනවා; නැටුම් තහනම් කරලා තිබෙනවා. මේ ගොල්ලන් අන්තවාදී වැඩ කරන්නේ. නැඟෙනහිර පළාතේ ඉස්කෝලවල,-[බාධා කිරීමක්]- අහගෙන ඉන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස දැන් කථාව අවසන් කරන්න.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
අහගෙන ඉන්න. මතක තියා ගන්න, අද නැඟෙනහිර පළාතේ දෙමළ ජනතාවගේ ඉස්කෝලවල බහුතරයක් උගන්වන්නේ මුස්ලිම් ගුරුවරු. කොහොමද එහෙම වුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැඟෙනහිර පළාතේ රජයේ පත්වීම් දීලා තිබෙන්නේ කොහොමද කියලා මම කියන්න කැමැතියි. ඉස්කෝලවලට ගුරු පත්වීම් දීලා තිබෙන්නේ කොහොමද? ඔක්කෝම දීලා තිබෙන්නේ දෙමළ අයට නොවෙයි, මුස්ලිම් අයට. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පිළිබඳව ආණ්ඩුව පරීක්ෂණයක් කරන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ, මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව අපි ඡන්දය දෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස දැන් කථාව අවසන් කරන්න.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මහ බැංකු සිද්ධියම ඇති මේ ආණ්ඩුවේ අගමැතිතුමාට විරුද්ධව මේ විශ්වාස භංග යෝජනාවට සහාය දෙන්න. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාව ගෙනාපු විධිය වැරැදි වුණත් මේ විශ්වාස භංග යෝජනාවට අපේ සහාය ලබා දෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.3.20]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana and Wayamba Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අතුරලියේ රතන නායක ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා, පසුගිය දා සිදු වූ ඉස්ලාම් අන්තවාදී ත්‍රස්ත ප්‍රහාරය එක පැත්තකින් එක්තරා දේවාශීර්වාදයක් බව. ගරුතර ස්වාමීන් වහන්ස, මාත් ඒක කියනවා. අද මේ රටේ විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන අවස්ථාවේදී මම ප්‍රසිද්ධියේ මේ දේ කියන්න ඕනෑ. උතුරේ එල්ටීටීඊ සංවිධානය විනාශ වූ ආකාරය අපි දැක්කා. අපි දකුණේ භීෂණ දෙකක් දැක්කා. ඒවා ඇති කරපු අයත් විනාශ වුණා. මේ වෙලාවේ මේ සිද්ධිය වෙච්ච එක එක්තරා දේවාශීර්වාදයක් කියන එක මම විතරක් නොවෙයි, අතුරලියේ රතන ස්වාමීන් වහන්සේත් කියන එක මම සියයට දහසක් අනුමත කරනවා. මම එහෙම කියන්නේ ඇයි? මේ සිදුවීම තව අවුරුදු 5කින් සිද්ධ වුණා නම් මොකද කරන්නේ? අපේ ස්වාමීන් වහන්සේත් පිළිගත්තා, මේ සිද්ධිය යට ගිය ගිනි පුපුරක් වාගේ තිබිච්ච දෙයක් කියලා. එහෙම නම් උන්වහන්සේත් මේකේ භයානකකම හරියටම දැනගෙන තිබුණා. අද මම පැහැදිලිව කියනවා, මේකත් එක්ක මේ රටේ ඉස්ලාම් අන්තවාදය සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා කියලා. මේ රටේ ඒ වාගේ දේවල් ලේසියෙන් කරන්න බැහැ. මේ රට අවුරුදු 5000ක් බුද්ධ ධර්මය පවතින රටක්. අන්තවාදීන්, ත්‍රස්තවාදීන් හා මේ වාගේ අයහපත් දේවල් කරන අය සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. ඒක ස්වභාවධර්මය කරන දෙයක්. ඒ නිසා අද අපේ රතන ස්වාමීන් වහන්සේ ඒ කියපු දේ මම මේ අවස්ථාවේදී පිළිගන්නවා. ඒ වාගේම, මම ඒක අනුමත කරනවා. මට සතුටුයි, උන්වහන්සේගේ කටින්ම මේ ගරු සභාවේ ඒ ප්‍රකාශය කළ එක ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට අපි බංකොලොත් කරලා තිබෙනවා නම් ලෝක බැංකුව පමණක් නොවෙයි, මහ බැංකුවත් ඉදිරිපත් කරලා තිබෙනවා, මේ අර්බුද අස්සේ, ප්‍රශ්න අස්සේ මේ රටේ ආර්ථිකයේ ඒක පුද්ගල ආදායම වැඩිවීම ගැන. බන්දුල ගුණවර්ධන මැතිතුමා ඊයේත් ප්‍රකාශ කළා, ලෝක බැංකු වාර්තාවට අනුව මේ රටේ ඒක පුද්ගල ආදායම පහළ බැහැලා කියලා. මම අභියෝගයක් කරනවා. මම ඉදිරිපත් කරනවා, World Bank Report එකයි, මහ බැංකුවේ වාර්තාවයි. බලන්න, මේකේ තිබෙනවා, 2014දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 3,821යි කියලා.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

2015දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,842යි. 2016දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,886යි. 2017දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,104යි. 2018දී ඒක

පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,102 දක්වා වැඩි වෙලා තිබෙනවා. මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

මෙය වැරදි සංඛ්‍යා ලේඛනයක් නොවෙයි, නිවැරදි සංඛ්‍යා ලේඛනයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ත්‍රස්ත ප්‍රහාරයෙන් පස්සේ අපි නිකම් හිටියේ නැහැ. නමුත් සමහර අය ලෝකයාට කිව්වේ, "අපි, අපේ බුද්ධි අංශය විනාශ කළා" කියලායි. අපේ රහස් බුද්ධි අංශය විනාශ වුණා නම්, පැය ගණනක් තුළ ඒ අන්තවාදීන් ඔක්කෝම අත්අඩංගුවට ගන්න, ඔවුන්ගේ ඥාතීන් ප්‍රශ්න කිරීම් සඳහා අත්අඩංගුවට ගන්න පුළුවන් වුණේ කොහොමද? අපේ බුද්ධි අංශය ලෝකය මවිත කළා. මම ඒ බව දන්නවා. මම ඒක පැහැදිලිව කියනවා. ඒ තරම් දක්ෂකමක්, සංවිධානයවීමක් අපේ රහස් බුද්ධි අංශයට පමණක් නොවෙයි, පොලිසියට හා ත්‍රිවිධ හමුදාවටත් තිබුණා. ඔවුන් ඉතා දක්ෂ ලෙස මෙහෙයුම් ක්‍රියාත්මක කරලා ලෝකය මවිතයට පත් කළා. ISIS කියන ජාත්‍යන්තර අන්තවාදී සංවිධානය ඔවුන්ගේ ශාඛාවක් බවට අපේ රට පත් කර ගන්නයි උත්සාහ කර තිබෙන්නේ. මේ රටේ ඒවාට ඉඩ හම්බ වෙන්නේ නැහැ. මුස්ලිම් ජනතාව අපට තොරතුරු දුන්නා. මම දන්නවා, ඒවාට විරුද්ධව හිටපු පිරිස් නෝම්බි වෙලාවේ පල්ලිවලට ඇවිල්ලා කටුවාපිටිය සිද්ධිය ගැන තොරතුරු දුන්න බව. ඒ නිසා අපි ලාංකිකයෝ විධියට හිතනවා මිසක්, මිනිසුන් වර්ග කරලා හිතලා මේ රට විනාශ වෙන්න ඉඩ දෙන්න බැහැ. මේ රට එන්න එන්නම හිඟන තත්ත්වයට පත් කරන්න ඉඩ දෙන්න බැහැ. අපි රටේ ආර්ථිකය ගැන සිතා කටයුතු කරන්න ඕනෑ. බලකාමීත්වය හිතේ තබාගෙන, බලය ලබා ගැනීමේ අරමුණින් කටයුතු කරන්න එපා. අපි එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් සහයෝගය දුන්නා. එතුමා ජනාධිපති කරන්න කපුකම කළේ අපි. 2005දී අපි කළේ මොකක්ද? අරලියගහ මැඳුරට ගිහිල්ලා ගිවිසුම අත්සන් කරලා-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, තව විනාඩියකින් කථාව අවසන් කරන්න.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එදා කළා වාගෙයි කළ යුත්තේ. නැතුව අපි අවස්ථාවාදීව රට ගිනි තියන්න කටයුතු කිරීම නොවෙයි කළ යුත්තේ. මේ රටේ ආර්ථිකය දියුණු කළේ, එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ පමණක් නොවෙයි. ඉතිහාසයේ සිට එක්සත් ජාතික පක්ෂ රජයන් තුළින් මේ රටේ ආර්ථිකය දියුණු කළා. අපි ඇති කරපු මහා ජලාශ බලන්න. අවුරුදු 32කින්වත් නිම කරන්න බැරි දෙයක් අපි කළේ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා කිව්වා, "අවුරුදු 32ක් වනතෙක් ඉන්න බැහැ. මට අවුරුදු 8න් අවසන් කර ඕනෑ" කියලා. ඒ හරහා විදුලි බලය ලැබුණා; මහා කර්මාන්ත පුර ඇති කළා. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාට පින් සිද්ධ වෙන්න තමයි මේ රටේ සිංහල ජනපද ඇති කළේ. එදා විපක්ෂයේ හිටපු වාමාංශිකයන කිව්වා, සිංහල ජනතාව කාක්කෝ වාගේ මැරෙන්න මැලේරියා මදුරුවන්ට පූජා කරන්නේ නැතුව, ඉන්දියාවෙන් ගෙනැල්ලා උතුරේ සහ උතුරු මැද පළාතේ පදිංචි කරන්න කියලා. එදා එහෙම කළා නම්, අද ඒ පළාත් කඳුරට වාගේ වෙලා තිබෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාවෙන් පස්සේ මම යන්නේ BMICH එකට. මම ගරු කරන ඉතා ජ්‍යෙෂ්ඨ හිටපු ඇමතිවරයෙක් තමයි ගරු ඩිව් ගුණසේකර මැතිතුමා. එතුමා වෙනුවෙන් අද උපහාර උළෙලක් තිබෙනවා BMICH එකේ. හොඳ කෙනා මම අගය කරනවා. හොඳ කෙනාට මම ගරු කරනවා. ප්‍රතිපත්තිවලටයි මම ගරු කරන්නේ. පක්ෂය වැඩක් නැහැ.

මට ලැබී තිබෙන්නේ විනාඩි පහක කාලයක්. ඒ නිසා මේ කාරණය කියා මගේ කථාව අවසාන කරනවා. මේ විශ්වාස භංග යෝජනාවට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. නියමිත කාලය අවසන් වනතුරු අපි මේ රට පාලනය කරනවා. ඉන් පසුව මේ රටේ අලුත් පරිච්ඡේදයක් ඇති වනවා. ඒ පරිච්ඡේදය තුළ එක්සත් ජාතික පක්ෂ රජයක් ගෙනැල්ලා මේ රට සංවර්ධනය කරලා, සාමය සහ සෞභාග්‍ය ඇති කරලා, ලාංකික ජනතාවක් හැටියට සියලුදෙනාට ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් ඇති කරන බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

[අ.භා.3.27]

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාට සහ එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රීවරු අද පක්ෂ විපක්ෂව යෝජනා රාශියක් ඉදිරිපත් කළා. පසුගිය අවුරුදු හතරහමාර තුළ එක්සත් ජාතික පක්ෂය ක්‍රියාත්මක කළ විවිධ කාර්යයන් පිළිබඳව අදහස් ගණනාවක් ඉදිරිපත් කළත්, පසුගිය ඉතිහාසය තුළ වර්තමාන රජය කොපමණ ජනතා හිතෛෂී වැඩ පිළිවෙළවල් රට හමුවේ තබා තිබෙනවාද කියලා අපි කියන්නට ඕනෑ. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව පළමුව කියන්නට ඕනෑ. එල්ටීටීඊ සංවිධානය විසින් මහ බැංකුව කඩා විනාශ කළාට පස්සේ, එක්සත් ජාතික පක්ෂය මහ බැංකුව කොල්ල කෑවා. එසේ කොල්ල කාපු අයට සිංගප්පූරුවට යන්න නිදහස ලබා දීලා තිබෙනවා වාගේම, අද වෙනකල් ඔවුන්ගෙන් ඒ මුදල් අය කිරීමක් සිදු කර නැහැ.

ඒ වාගේම මේ රටේ කුණු කඳු නාය යෑම සම්බන්ධයෙන් කවුරුවත් වගකීම භාර ගත්තේ නැහැ. පසුගිය අය වැය ලේඛනවලින් ඉදිරිපත් කළ සුබ සාධන කටයුතු මේ වෙනකොටත් ඉෂ්ට සිද්ධ කළ නොහැකි බව එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මහජන නියෝජිතයන් පවා විවිධ අවස්ථාවල පැහැදිලි කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මැතිවරණ පිළිබඳව තිබූ බලාපොරොත්තු අද නැතිවෙලා තිබෙනවා. පළාත් සභා මැතිවරණය දින නියමයක් නොමැතිව කල් දමා තිබෙනවා. මහින්ද රාජපක්ෂ යුගයේ දිගින් දිගටම මැතිවරණ පැවැත්වුවා. මැතිවරණ පවත්වනවා වැඩියි කියලා පවා ඒ කාලයේ විපක්ෂය කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ බෞද්ධ ජනතාවට ප්‍රථම වතාවට වෙසක් පොහොය සමරන්න බැරි වුණා. මේ රජය

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

යටතේ පාසල්වලට, පල්ලිවලට, ඒ වාගේම පන්සල්වලට හමුදා ආරක්ෂාව සපයන්න සිද්ධ වුණා. පළමුවැනි වතාවට එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරු අස්ගිරි මහා නායක හාමුදුරුවරුන් ඇතුළු අනෙකුත් හාමුදුරුවරුන් ප්‍රසිද්ධියේ විවේචනය කළා විතරක් නොවෙයි, අස්ගිරිය මහා නායක හාමුදුරුවෝ අත්අඩංගුවට ගන්න ඕනෑය කියන ප්‍රකාශයත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගම් පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක කරනවා, "රන් මාවත්" වැඩසටහන ක්‍රියාත්මක කරනවා කිව්වාට, ගමේ එවැනි වැඩ පිළිවෙළක් නැහැ. මීටර් 500ක පාරක් හැදුවත් ලොකු බෝඩ් එකක් දමනවා.

රටේ ඒකාබද්ධ වැඩ පිළිවෙළක් නොමැති නිසා අද නැඟෙනහිර පළාත තුළ ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමය වෙනස්. එම පළාතේ පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරන්න ගියාම, කාන්තාවන්ට වෙනම නීතියක්, අධ්‍යාපනයට වෙනම නීතියක් ක්‍රියාත්මක වෙනවා. ඒ පිළිබඳව සොයා බලන්න අධ්‍යාපන අමාත්‍යාංශය විධියට අද රේඛීය අමාත්‍යාංශයට පුළුවන්කමක් නැහැ.

පසුගිය කාලයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයට ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් යැවූ වාර්තාව නොව වෙනත් වාර්තාවක් තමයි ඔවුන් එහිදී ඉදිරිපත් කළේ. ඒ පිළිබඳව ජනාධිපතිතුමා පවා කථා කරලා තිබෙනවා. මනෝ තිත්තවැල්ලට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා තිබෙනවාය කියලා වාර්තා වෙලා තිබෙනවා.

ඒ වාගේම ඇමෙරිකාව සමඟ අත්සන් කරන ගිවිසුම පිළිබඳව මේ සභාවේදී කාරණා ගණනාවක් ඉදිරිපත් වුණා. ත්‍රිකුණාමලයේ සිට වයඹ තීරුව ඔස්සේ ලබා දෙන ඉඩම් පිළිබඳව දැන් කථා කළා. ඒ වාගේම විදේශීය බහු ජාතික සමාගම්වලට ශ්‍රී ලංකාවේ ඉඩම් ලබා දීම සඳහා ඉඩම් පනත සංශෝධනය කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණා. එම පනත සංශෝධනය කරන්නත් කටයුතු කර තිබෙනවා. මේ රටේ විවිධ සංවිධාන, දේශපාලන පක්ෂ ඒ සම්බන්ධයෙන් ලොකු විරෝධයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහ මිනින්දෝරුවන්ගේ විරෝධය නොතකා ඇමෙරිකානු සමාගමක් වන ට්‍රිම්බල් ඉන්කෝපරේෂන් සමාගමට ලංකාවේ ඉඩම් මැනීමේ අයිතිය ලබා දීම සඳහා වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. එවැනි කාරණා රාශියක් පසුගිය ඉතිහාසය තුළ ක්‍රියාත්මක කර තිබෙනවා.

ඒ අතරතුර විශේෂයෙන්ම පසුගිය දවස් ටිකේත්, මේ දිනවලත් රජයේ අලුත් යෝජනාවක් විධියට ලංකාවේ කිසිම රජයක් නොකරපු විධියට පවුල් ලක්ෂ 6කට දේශපාලන වශයෙන් සමෘද්ධි සහනාධාර ලබා දීම සඳහා රුපියල් මිලියන 10,000ක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෙනුවෙන් පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා, මාධ්‍ය ප්‍රචාරණය සඳහා රුපියල් දහතුන්කෝටි නමලක්ෂ දහනමදහස් තිහක් වෙන් කරලා තිබෙනවා. ටී ෂර්ට් සැදීම වෙනුවෙන් සැලසිනේ ආයතනය සඳහා රුපියල් දෙකෝටි අසූතුන්ලක්ෂ හැත්තෑඑක්දහස් අනූතුනයි ශත හැත්තෑපහක් ගෙවා තිබෙනවා. තරුණ සේවා සභාව ලබා දුන් සේවා වෙනුවෙන්, රුපියල් එක්කෝටි පනස්ලක්ෂයක් වියදම් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එක් සමෘද්ධි බැංකුවකින් රුපියල් ලක්ෂ දෙක බැගින් කොළඹ සමෘද්ධි අධිකාරියේ ගිණුමට බැර කිරීමට පසු ගිය දවසක යෝජනා කර තිබෙනවා. ලංකාවේ සමෘද්ධි බැංකු 1,074කට අදාළව එම යෝජනාව ක්‍රියාත්මක කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන ව්‍යාපෘතියක් විධියට සලකා ඒ සඳහා රුපියල් මිලියන 300ක් වියදම් කරන්න කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක් ප්‍රචාරක පුවරුවක් සඳහා වියදම රුපියල් 50,000යි. මේක තමයි එක්සත් ජාතික පක්ෂය පසු ගිය කාලය තුළ ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ. නමුත්, රට පිළිබඳ වැඩ පිළිවෙළක්, රටේ අනාගතය පිළිබඳ වැඩ පිළිවෙළක්, සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණේ නැහැ. එම නිසා, අපි මේ විශ්වාසභංග යෝජනාවට අපේ සහය ලබා දෙමින්, මේ රජය ඉතාම ඉක්මනින් මේ රටින් තොලොංචි වෙලා යන්න කියලා ප්‍රාර්ථනා කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Kabir Hashim. Before he starts, will an Hon. Member propose the Hon. K. Thurairetnasingam to the Chair?

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - State Minister of Transport and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුරෙයිරෙත්නසිංහම් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

[අ.භා.3.35]

**ගරු කබීර් හෂීම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள், வீதி அபிவிருத்தி மற்றும் பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development and Petroleum Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ විශ්වාසභංග යෝජනාව පිළිබඳ විවාදයේ දී කතා කිරීමට මා විශේෂයෙන්ම කල්පනා කළේ, මෙම යෝජනාවට හේතු වූ එක් කාරණාවක් ලෙස සඳහන් වී තිබුණු, මගේ මැතිවරණ කොට්ඨාසයේ බුදු පිළිමවලට හානි කිරීමේ සිද්ධිය නිසායි. කලින්ම මට හිතුණ විධියට, මේ විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කළ කණ්ඩායමට එම විශ්වාස භංග යෝජනාව පිළිබඳව විශ්වාසයක් නැති බව තමයි අද මේ සභා ගර්භය දිහා බැලුවාම පෙනී යන්නේ. විපක්ෂයේ කණ්ඩායම දිහා බැලුවාම, අද කීදෙනාද මේ සභා ගර්භය තුළ රැඳී සිටින්නේ? මා හිතන විධියට, විශ්වාසභංග යෝජනාව පිළිබඳවත් අද එතුමන්ලාට ප්‍රශ්නයක් තිබෙනවා.

[ගරු කබීර් හෂීම් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විශ්වාසභංග යෝජනාවේ විවිධ කරුණු ඉදිරිපත් කර තිබුණා. ඒ අතර ඇති මාවනැල්ලේදී වූ සිද්ධිය පිළිබඳව මා විශේෂයෙන්ම කියන්න ඕනෑ. මට මතක විධියට, දෙසැම්බර් මාසයේ දිනයක එක්සත් ජාතික පක්ෂයේ මගේ බල මණ්ඩල රැස්වීමක් පවත්වන්න නියමිතව තිබුණා. එම රැස්වීමේ දිනයට කලින් දින රාත්‍රියේ අපේ ප්‍රදේශයේ කිසි දවසක නොවුණු සිද්ධියක් වුණා. ඒ තමයි, බුදු පිළිම තුනකට හානි කර තිබීම. ඊළඟ දවසේ උදේ තමයි එක්සත් ජාතික පක්ෂයේ මගේ බල මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිතව තිබුණේ. ඒ සිදුවීම් වූ කාල වේලා යෙදුණු හැටි බැලුවොත්, එදා මගේ බල මණ්ඩල රැස්වීමට ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමා, ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමා, ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය ආදි අය ඇවිත් සිටියා. ඊට කලින් දා රාත්‍රියේ තමයි ඒ සිද්ධිය වුණේ. මම ඒ වෙලාවේ කල්පනා කළා, ඒ සිද්ධිය දේශපාලන න්‍යාය පත්‍රයකට අනුව කළ දෙයක්ද කියලා. කෙසේ වෙතත්, ඒ සිදුවීම වූ ගමන්ම අප දුර දිග කල්පනා කරලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා එකතු වුණා. තවත් සිද්ධියක් වෙලා තිබුණා. ඊට කලින් දවසේ, මා දමපු ලොකු cut-out එකක් බුදු පිළිමයක් ළඟ ගිනි තබා තිබුණා. එම cut-out එක ගිනි තබපු තැන තිබුණු බුදු පිළිමයට ඊළඟ දවසේ හානි කරලා. හරියට මාත් එයට සම්බන්ධ කරලා මට මඩ ගැසීමක් හෝ එවැනි කුමක් හෝ න්‍යාය පත්‍රයකට කළ වැඩ පිළිවෙළක් වාගේ තමයි එය පෙනුණේ. එහෙත් ඒ සිද්ධිය වූ ගමන් අපි එම ප්‍රදේශයේ සිටි නායක ස්වාමීන් වහන්සේලාත් එක්ක එකතු වෙලා, අපේ ප්‍රදේශයේ නායකයන් එක්ක සම්බන්ධ වෙලා, පොලීසිය එකතු කරලා අදාළ අය වහාම අල්ලන්න අවශ්‍ය වැටලීම් කරන්න විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කළා. එසේ කරන්න අපට පුළුවන් වුණා. එහිදී විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රජාව අපට සහයෝගය ලබා දුන්නා. මගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු වූ තස්ලීම් මහතා ඒ සම්බන්ධයෙන් අපට ප්‍රධාන වශයෙන් උදවු උපකාර කළා. එතුමා පොලීසියත් එක්ක හැම තැනම ගිහින් අවශ්‍ය අය අල්ලා දුන්නා.

අපේ ප්‍රදේශයේ, මගේ මැතිවරණ කොට්ඨාසයේ නායක ස්වාමීන් වහන්සේලා ඇතුළු ස්වාමීන් වහන්සේලාට විශේෂයෙන් මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්නට ඕනෑ. අපේ ප්‍රදේශයට විවිධ අය ඇවිත් ජාතිවාදය අවුස්සලා සිංහල-මුස්ලිම් ගැටුමක් ඇති කරන්නට මෙම සිද්ධිය පාවිච්චි කරන්නට උත්සාහ කළත්, කිසිදු ප්‍රශ්නයක් ඇති නොවී අපේ ප්‍රදේශයේ ඉතාම සාමකාමී තත්ත්වයක් ඇති වුණා. පොලීසිය විධිමත් පරීක්ෂණ කරලා සැකකරුවන්, වැරැදිකරුවන් අත් අඩංගුවට ගැනීමට වැඩ කටයුතු කරගෙන ගියා. ඒ සිද්ධිය වුණාට පසුව විශාල පිරිසක් අත් අඩංගුවට ගන්නත් පුළුවන් වුණා. ඒ වාගේම අපි බුද්ධි අංශයත් සමඟ දිගටම වැඩ කළා. සාමාන්‍යයෙන් මේ වාගේ දෙයක් වෙන්නේ නැහැ කියලා අපේ හිතේ තිබුණා. මොකද, අපි අවුරුදු සිය ගණනක් මේ රටේ සිංහල ජනතාවත් සමඟ ජීවත් වුණා. මුස්ලිම් ජනතාව කිසිම දවසක මේ වාගේ දෙයක් කරන්නේ නැහැ. ඒ නිසා මෙය සැලසුම් සහගත වැඩ පිළිවෙළක්ද කියලා අපට සැකයක් තිබුණා. ඉන් පසුව බුද්ධි අංශය මගෙන් ඉල්ලුවා, මෙවැනි වැටලීම් තවත් කිරීමට තිබෙන නිසා ඒ සඳහා මගේ ලේකම්වරයාගේ සහාය ලබා දෙන්න කියලා. ඒ වේලාවේ දී තස්ලීම් මහතාට මම කිව්වා, මෙයට උපරිම සහයෝගය ලබා දෙන්න කියලා. ඒ අනුව තස්ලීම් මහතා බුද්ධි අංශයත් එක්ක, හමුදාවේ කණ්ඩායම් එක්ක වනාතවිල්ලුවට ගිහිල්ලා, වනාතවිල්ලුවේ කරපු වැටලීමකට සහයෝගය ලබා දුන්නා. එතැනදී කෙසේ හෝ එතුමාගේ ෆොටෝ එකක් අරගෙන ඒක ප්‍රසිද්ධ කළා. නමුත් එතුමා ලබා දෙන සහයෝගය නැවැත්තුවේ නැහැ. එතුමා කටයුතු කළා වාගේ අපේ කණ්ඩායම නිතරම බුද්ධි අංශයත් සමඟ සම්බන්ධ වෙලා කටයුතු කළා. ඉන් පසුව මම මෙම තොරතුරු පිළිබඳව කැබිනට් මණ්ඩලය පවා දැනුවත් කළා. මෙවැනි භයානක තත්ත්වයක් තිබියදී, ප්‍රධාන ධාරාව නියෝජනය කරන මුස්ලිම් ප්‍රජාව කිසිම විටෙක මේ කටයුත්තේදී පසු බැස්සේ නැහැ. වැරැදිකරුවන් සිටිනවා නම් ඔවුන් අල්ලා දීමට උපරිම සහයෝගය ලබා දුන්නා.

ඊට ටික දවසකට පසුව, මට මතක විධියට මාර්තු මාසයේ වාගේ මම මගේ මැතිවරණ කොට්ඨාසයේ -මාවනැල්ල මැතිවරණ කොට්ඨාසයේ- ගම්පෙරළියෙන් මට වෙන් කළ ප්‍රතිපාදනවලින් විශාල මුදල් ප්‍රමාණයක් පන්සල් 79කට ලබා දීම සඳහා ස්වාමීන් වහන්සේලා පෙරහැරෙන් වැඩමවා උත්සවයක් පැවැත්වීමට නියම කර ගත් දිනයට කලින් දින රාත්‍රියේ මගේ සම්බන්ධීකරණ ලේකම් තස්ලීම් මහතාගේ නිවසට කණ්ඩායමක් ගිහින්, මව සහ දරුවන් සමඟ නිදාගෙන සිටි තස්ලීම් මහතාගේ ඔළුවලට වෙඩි තබා තිබුණා. අපි එදා උදේ පාන්දර වෙනකොට තස්ලීම් මහතා මාවනැල්ල රෝහලට ගෙනැවිත්, මාවනැල්ල රෝහලෙන් ලේ දීලා මරණාසන්නව සිටි මනුෂ්‍යයා පණ ගන්වන්නට උත්සාහ කරලා එතැනින් නුවරට ගෙනිච්චා. නුවර රෝහලේ සති ගණනක් තියාගෙන තස්ලීම් මහතාගේ ජීවිතය ආරක්ෂා කිරීමට උපරිම උත්සාහ ගත්තා. එම රෝහලේ වෛද්‍යවරු ඇතුළු සියලුදෙනාගේම සහයෝගයෙන් එතුමාගේ ජීවිතය බේරා ගත්තා. එතුමාගේ ජීවිතය බේරුණාට, එතුමාගේ එක පැත්තක් පණ නැහැ. ඔළුවේ එක පැත්තක් සම්පූර්ණයෙන් ගැලවිලා. එතුමාගේ අත පය වැඩ කරන්නේ නැහැ; කථා කරන්න බැහැ. මම සම්බන්ධ වෙලා එතුමා පුනරුත්ථාපනය කිරීම සඳහා දිගන රජයේ රෝහලට යැව්වා. ඉන් පසුව අප්‍රේල් මාසයේ බෝම්බ පිපිරීමත් එක්ක තස්ලීම් මහතා නැවත මහනුවර රෝහලට ගෙනාවා. එතැනින් කෑගල්ල රෝහලට ගෙනැවිත්, කෑගල්ල රෝහලෙන් නැවත මහනුවර රෝහලට ගෙනාවා. දැන් නැවත දිගන රෝහලේ සිට ප්‍රතිකාර කරගෙන යනවා. තස්ලීම් මහතා මගේ සම්බන්ධීකරණ ලේකම් කියලා කිව්වාට, එතුමා එළුවන් ඇති කරන ඉතා දුප්පත් තරුණයෙක්. එතුමාට පුංචි දරුවන් දෙදෙනෙක් ඉන්නවා. තස්ලීම් මහතායි, එතුමාගේ නෝනායි එළුවන් හදාගෙන, ඒ ප්‍රදේශයේ සමාජ සේවා කටයුතු කරමින් ජීවත් වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මට තව පොඩි කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කබීර් හෂීම් ඇමතිතුමාට විනාඩි 10ක කාලයක් ලබා දෙනවා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

තස්ලීම් මහතා හැම වේලාවකම වැරැදි වැඩවලට විරුද්ධව නැඟී සිටින හොඳ තරුණයෙක්. එතුමා ඒ වාගේ රාජකාරියක් කරලා, රට වෙනුවෙන් තමන්ගේ ජීවිතය පවා පුද කරන්නට ඉදිරිපත් වෙලා, සහරාන්ගේ කල්ලිය පෙන්වා දෙන්නට හැම

දෙයක්ම කරලා වෙඩි කාලා තවම රෝහල්ගත වෙලා ඉන්නවා. තස්ලිම් මහතා වැනි මුස්ලිම් අය සිය ගණනක් හිටියා. තස්ලිම් මහතාට වෙඩි තියනකොට, ඒක මට දෙන පණිවුඩයක් කියලා මම දැන ගත්තා.

ඒක ළඟට මට වෙන්න තිබුණු සිද්ධියක්. ඒ වුණත්, ඒකට භය නොවී අපි බුද්ධි අංශයත් එක්ක දිගටම වැඩ කරගෙන ගියා. ඒක තමයි යථාර්ථය. මෙවැනි කනගාටුදායක සිද්ධියක් වෙලා තිබෙන අවස්ථාවක, සමහර අය මේක ජාතිවාදී පැත්තට හරවලා, ඒක දේශපාලන අවියක් ලෙස පාවිච්චි කරලා කටයුතු කරන්න හදපු අවස්ථා මම දැක්කා. සමහර අය අද මේ සභාවේදී පවා කථා කරන්නේ ජාතිවාදයට උඩ ගෙඩි දෙන ආකාරයටයි; තමන්ට දේශපාලන වාසි ලබාගන්න පුළුවන් ආකාරයටයි. ඒ ගැන මම කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ISIS කියන ත්‍රස්තවාදී සංවිධානය ලංකාවේ පමණක් නොවෙයි ක්‍රියාත්මක වෙන්නේ. මොවුන් ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට්වල, හැම්බර්ග්වල, ඇමෙරිකාවේ නිව්යෝර්ක්වල, ඉන්දුනීසියාවේ බාලිවල, මලයාසියාවේ ක්වාලාලම්පූර්වල, පිලිපීනයේ මින්ඩනාඕවල, ප්‍රංශයේ පැරිස්වල යනාදී වශයෙන් හැම තැනම බෝම්බ පුපුරවා තිබෙනවා. නමුත්, ඒ රටවල අය ඒක ජාතිවාදයට හැරෙව්වේ නැහැ. ඒ රටවල මුස්ලිම් අය ලක්ෂ ගණනක් ජීවත් වෙනවා. ඒ අය මේ ISIS සංවිධානයට එරෙහිව කටයුතු කළා. මුස්ලිම් ප්‍රජාවයි, ISIS සංවිධානයයි කියන්නේ දෙ කොට්ඨාසයක්.

අනෙක් කාරණය මේකයි. ඇමෙරිකාව වැනි දියුණු රටවල පවා මේ බෝම්බ පුපුරවන එක අද නතර කරන්න බැරි වෙලා තිබෙනවා. ඔවුන්ටත් ඒ ත්‍රස්තවාදීන් අල්ලන්න කාලයක් ගිහින් තිබෙනවා. නමුත්, අපේ රටේ එදා -අප්‍රේල් 21වන දා- සිදු වූ ඒ බෝම්බ පිපිරීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන්ව අල්ලන්න අපට පුළුවන් වුණාය කියන කාරණය ඔබතුමන්ලා මතක තියා ගන්න. ඒ වෙනකොට මම ගරු අග්‍රාමාත්‍යතුමාත් සමඟ අරලියගහ මන්දිරයේයි හිටියේ. අපි ඒ වෙලාවේ හමුදාපතිවරයාට කථා කළා; ආරක්ෂක ලේකම්වරයාට කථා කළා. පැය භාගයක් ඇතුළත අගමැතිතුමාත් එක්ක අපේ ඇමතිවරු, මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එතැනට ගියා. එතැනට ගිහින් අප කථා කළා. වහාම හදිසි නීතිය ක්‍රියාත්මක කරලා රටේ ආරක්ෂාව සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, මේ කණ්ඩායම වැටලීමට අවශ්‍ය පියවර ගැනීමට හමුදාවට බලය දෙන්න කියාත් ඒ වෙලාවේම අගමැතිතුමා උපදෙස් දුන්නා. ඒ විධියට ඉක්මනින් ගත්ත තීන්දු තීරණ නිසා සති දෙකක් ඇතුළත -මේ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ- මේ සහරාන් කල්ලිය සම්පූර්ණයෙන්ම වටලන්න අපේ හමුදාවට පුළුවන් වුණා.මේ වෙනකොට ප්‍රධාන - hardcore - කණ්ඩායම සම්පූර්ණයෙන්ම අල්ලාගෙනයි තිබෙන්නේ. ඒ ත්‍රස්ත ක්‍රියාවට සම්බන්ධ වූ අය එක එක්කෙනා අල්ලගෙන අවසන් කර තිබෙනවා. සවුදි අරාබියේ සිටි පස් දෙනෙක් -විශේෂයෙන්ම මගේ ලේකම්ට වෙඩි තියපු කෙනාත්- හමුදාවට අල්ල ගන්න පුළුවන් වුණා. අපි එච්චර දුරට ගියා. මේ සිද්ධියට සැක සහිත අය තව කිහිප දෙනෙක් ඉන්න පුළුවන්. නමුත්, මේ බෝම්බ පිපිරීම් එදා වාගේ සංවිධානාත්මකව කරන්න අද ඉඩක් නැහැ. මේ ත්‍රස්ත ක්‍රියාවට, ප්‍රධාන මුස්ලිම් ප්‍රජාවගෙන් සියයට 99.9ක් විරුද්ධයි. අනෙක් කාරණය මේකයි. ඕනෑම කෙනෙකුට -තනි පුද්ගලයකුට වුවත්- මේ වාගේ දෙයක් කරන්න පුළුවන්. දියුණු රටවල් -යුරෝපය, ඇමෙරිකාව වැනි රටවල්- ත්‍රස්තවාදී කල්ලි කොයි තරම් ඇල්ලුවත්, එක පුද්ගලයෙකුට පුළුවන් බෝම්බයක් බැඳ ගෙන ගිහිල්ලා මෙවැනි විනාශයක් කරන්න. ඒ නිසා අපි හැම වෙලාවේම බොහොම කල්පනාවෙන් සිටිය යුතුයි. ඒ වාගේම අපේ බුද්ධි අංශ අවධානයෙන් සිටිය යුතුයි. ඒක අනිවාර්යයෙන්ම විය යුතුයි. අපි එකට වැඩ කරන්න ඕනෑ.

අද මේ විශ්වාසභංග යෝජනාවක් ගෙනෙන්නේ මොන දෙයක් සඳහාද? ඇයි, අපේ හමුදාවට මේ ත්‍රස්තවාදීන් වටලන්න පුළුවන් වුණාටද? දියුණු රටවලට වඩා හැකි ඉක්මනින් මේ ත්‍රස්ත ක්‍රියාව පාලනය කරන්න, කළමනාකරණය කරන්න පුළුවන් වුණ එකටද? ඒ ඔක්කෝම කණපිට හරවලාද මේ යෝජනාව සම්මත කරන්න කියන්නේ? මා හිතන විධියට, තිබුණු ප්‍රශ්න මත අපි රජයක් හැටියට මේ ප්‍රශ්නය හරියට කළමනාකරණය කර තිබෙනවා. විශේෂයෙන්ම එම සිද්ධිය වෙනකොට ජනාධිපතිතුමා විදේශගත වෙලා හිටියා. නමුත් ඒ සිද්ධිය වෙනකොටම පැය 24ක් ඇතුළත අගමැතිතුමා ආරක්ෂක අමාත්‍යාංශයට ගිහිල්ලා අදාළ උපදෙස් දීලා, ඒ රාජකාරි ඉටු කිරීමට හමුදාවට අවශ්‍ය බලය, ඒ නිදහස ලබා දුන් නිසා තමයි අපට මේ ත්‍රස්ත ක්‍රියාව හැකි ඉක්මනින් අවසන් කර ගැනීමට පුළුවන් වුණේ කියලා මම හිතනවා. එදා රාත්‍රියේම අපට දඹුල්ලේ දී දෙන්නෙක් අත් අඩංගුවට ගන්න පුළුවන් වුණා. ඒ අයගෙන් තමයි අපට තොරතුරු ලබා ගන්න පුළුවන් වුණේ. ඒ වාගේම කාත්තන්කුඩිවල මුස්ලිම් ප්‍රජාවම ගිහිල්ලා, ගෙවල්වල හැංගිලා ඉන්න සැකකරුවන් පිළිබඳ තොරතුරු හමුදාවට දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එදාම දෙමටගොඩදී කණ්ඩායමක් අල්ලා ගත්තා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඔව්, එදාම දෙමටගොඩදීත් කණ්ඩායමක් අල්ලා ගත්තා. මෙච්චර වැඩ කරන ප්‍රජාවක්, මෙච්චර වැඩ කරන රජයක් පැත්තකට දමලා, ජාතිවාදය මතු කරමින්, සියලු දේ සම්පූර්ණයෙන්ම විනාශ වුණාය කියන කථාව ගැන ඇත්තටම මම කනගාටු වෙනවා. අද වුවත්, මගේ ලේකම්වරයා තවම රෝහල්ගත වෙලා ඉන්නවා. ඔහු ගැන එක වචනයක්වත් කවුරුවත් කථා කළේ නැහැ. ඔහු මුස්ලිම්ද, සිංහලද කියන එක නොවෙයි ප්‍රශ්නය. ඔහු එදා ඉදිරිපත් වුණේ රට වෙනුවෙන්. ඒ නිසා තමයි ඔහු වෙඩි කෑවේ. මැරෙන්න හිටපු ඒ මනුස්සයා අපි කෙසේ හෝ බේරා ගත්තා. ඒක ලොකු දෙයක්. ඒ නිසා මම විශේෂයෙන්ම,- [බාධා කිරීමක්] මට වෙලාව නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා පසුව කියන්න. දේශපාලනඥයන් හැටියට අපට මීට වඩා ලොකු වගකීමක් තිබෙනවා. අපි මැතිවරණ දිනන්න එක එක්කෙනාගේ ජාතිය, ආගම පාවිච්චි කරන්නේ නැතිව කටයුතු කළ යුතුයි. මේ වාගේ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනකොට රට වෙනුවෙන් අපි සියලුදෙනාම එකතු වෙන්න ඕනෑ. අපි කොයි පැත්තේ වාඩි වුණත් කමක් නැහැ. මේ ප්‍රශ්නය ඕනෑම කෙනෙකුට වෙන්න පුළුවන්; ඕනෑම ජාතියකට සිදුවෙන්න පුළුවන්. අපි එකතුවෙලා මේ රට වෙනුවෙන් ඉස්සරහට ගමන් කිරීම වැදගත්ය කියන කාරණය විශේෂයෙන්ම මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත.]*

அடுத்ததாக, கௌரவ பாராளுமன்ற உறுப்பினர் வியாழேந்திரன் அவர்கள். *[சபையில் சமுகமாயில்லை.]*

[අ.භා.3.49]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

[ගරු ජයන්ත සමරවීර මහතා]

තමන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් වූ තස්ලිම් කියන තරුණයා සහරාන් කල්ලියේ වෙඩි පහරට ලක් වෙලා මේ වන විට දිගන රෝහලේ ප්‍රතිකාර ලබන බවත්, ඔහු ගැන කවුරුවත් කථා කළේ නැති බවත් මට පෙර කථා කළ ගරු කබීර් හෂීම් ඇමතිතුමා කිව්වා. ගරු ඇමතිතුමනි, මම හිතන විධියට ඔබතුමා දන්නේ නැතිව ඇති, එක්කෝ දැන දැන නොකිව්වා වෙන්න පුළුවන්, ඒ තස්ලිම් කියන තරුණයා පිළිබඳව අපි කථා කළා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඔබතුමා මට අවස්ථාව දුන්නේ නැහැ නේ, ගරු ඇමතිතුමනි. ඔබතුමා මා ගණන් ගත්තේවත් නැහැ. ඒ නිසා ඔබතුමා වාඩි වෙන්න. මට විනාඩි හතයි තිබෙන්නේ. [බාධා කිරීමක්]

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව අවස්ථා ගණනාවකදී කථා කළා. තස්ලිම් කියන තරුණයා සහරාන්ලාගෙන් වෙඩි කෑවා. ඔබතුමා සහරාන්ලාට බයේ ඇමතිකම අත් හැරියා. ඔබතුමා සහරාන්ලාට යටත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ අදහස් දක්වන්න කැමැතියි. මෙය ඉදිරිපත් කර තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. ජනතා විමුක්ති පෙරමුණ මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑ නිර්වස්ත්‍රව කියායි මම නම් හිතන්නේ. මේ දුෂ්ට ආණ්ඩුවට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණට රෙදි ඇඳගෙන නම් මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න බැහැ. මේ විශ්වාස භංග යෝජනාව පිළියෙල කරන්න ඇත්තේ මලික් සමරවික්‍රම අමාත්‍යතුමාගේ රාත්‍රී කෑම මේසයේදීයි. මේ යෝජනාව ගෙනෙන්න ජනතා විමුක්ති පෙරමුණ ලෑස්ති වෙන්න ඇත්තේ මලික් සමරවික්‍රම මැතිතුමාගේ කෑම මේසයේදීයි කියා අපි විශ්වාස කරනවා. [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
රෑ කෑම මේසයේදී නොවෙයි, දවල් කෑම මේසයේදී.

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
Sir, I rise to a point of Order.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
දවල් කෑම මේසයේදී කියලා තමයි ඔන්න එතුමා කියන්න යන්නේ.[බාධා කිරීමක්]

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා සම්පූර්ණ බොරුවක් මේ කරන්නේ. මෙතුමන්ලා සිහින ලෝකයකයි ඉන්නේ. මා හම්බ වුණාය කියන දවස්වල මම හිටියේ චීනයේයි. මෙතුමන්ලා එච්චර අසත්‍ය ප්‍රකාශ කරනවා. ඕවා සම්පූර්ණ අසත්‍ය. හැම දාම කියන්නේ ඕවා තමයි.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජාතික ආරක්ෂාව වැනසූ, රටේ ආර්ථිකය කාබාසිනියා කළ, මේ රටේ රණවිරුවන්, බුද්ධි අංශ නිලධාරීන් හිරේ විලංගුවේ දමපු මේ දුෂ්ට ආණ්ඩුව ගැන අපි දන්නවා නේ. දැන් කබීර් හෂීම් ඇමැතිතුමා බුද්ධි අංශය ගැන පප්පුවට ගහ ගන්නවා. බුද්ධි අංශ නිලධාරීන් හිරේ විලංගුවේ දමලා, බුද්ධි අංශය වනසා දමා මේ රට ඉතිහාසයේ බරපතළම ප්‍රපාතයට ඇද දමපු මේ දුෂ්ට හවුල -මේ ආණ්ඩුව- බලයට පත් කරන්න ජනතා විමුක්ති පෙරමුණ අනුපමේය සේවාවක්, අසමසම කැපවීමක් කළ බව අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ දුෂ්ට ආණ්ඩුව, වික්‍රමසිංහ මහත්මයාගේ පාලනය, මේ විපත මේ රටට කරන්න හිටියේ මේ අවස්ථාවේ නොවෙයි. 2001 දෙසැම්බර් මාසයේ 05වන දා බලයට ඇවිල්ලා, වේලුපිල්ලේ ප්‍රභාකරන් එක්ක ඊනියා රට පාවා දීමේ ගිවිසුම අත්සන් කරලා, එක පැත්තකින් "Regaining Sri Lanka" සහ අනික් පැත්තෙන් ඊලාම් පොට්ටනිය අරගෙන ඇවිල්ලා එදා තමයි එතුමන්ලා මේ විපත මේ රටට කරන්න හැදුවේ. නමුත්, එදා සෝමවංශ අමරසිංහ සහෝදරයාගේ නායකත්වයෙන් යුතු ජනතා විමුක්ති පෙරමුණ ඒ විපත පැරැද්දුවා. එතුමන්ලා වික්‍රමසිංහ මහත්මයාට මේ රටට ඒ විපත කරන්න ඉඩ දුන්නේ නැහැ. එදා වික්‍රමසිංහ මහත්මයා යන්න හිටපු ගමන ගියා නම් අද වනවිට එක පැත්තක ඊළම අටවලා, මේ රටේ අනික් පැත්ත ඇමෙරිකානු පිළිකන්නක් වෙලා. එහෙම නම්, එදා තමයි ACSA ගහන්නේ; එදා තමයි SOFA අත්සන් කරන්නේ; එදා තමයි Millennium Challenge Corporation එකට ත්‍රිකුණාමලය වරායේ සිට කොළඹ වරාය දක්වා අක්කර ලක්ෂ 12ක් දීලා ඇමෙරිකානු නීතිය සහිත ඇමෙරිකානු තිප්පොළ හදන්න ඉඩ දෙන්නේ. එදා සෝමවංශ අමරසිංහ සහෝදරයාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වුණු ජනතා විමුක්ති පෙරමුණ ඒක වැළැක්වූවා. සෝමවංශ අමරසිංහ සහෝදරයාගේ නායකත්වයෙන් එදා ඒක වැළැක්වූවාට, 2015 ජනවාරි 08වෙනි දා මේ දුෂ්ට ආණ්ඩුව පත් කරලා මේ රට ඇමෙරිකානු තිප්පොළක්, පිළිකන්නක් බවට පත් කරන්නට මේ යන ගමනේදී, නූතන ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ මලික් සමරවික්‍රම මහත්තයාගේ ගෙවල්වල රෑට රෑට ගාට ගාටා යනවා. මලික් සමරවික්‍රම මහත්මයාම තමයි ජනතා විමුක්ති පෙරමුණේ නායකයන්ට රතු අලි පැටවු කියලා කිව්වේ. අපි නොවෙයි ඒක කිව්වේ. ඒ නිසායි මම කිව්වේ මේ විශ්වාස භංග යෝජනාව රෙදි නැතිව ගෙනෙන්න ඕනෑය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතික ආරක්ෂාව වනසලා තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I rise to a point of Order.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
අනේ, "point of Order" කිය කියා ඉන්න එපා. එහෙම නම්, මට ඔබතුමාගෙන් වෙලාව දෙන්න.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔබතුමා මගේ නම කිව්වා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඉතින් බොරු නොමෙයිනේ ඇත්තනේ කිව්වේ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මට ආරංචි හැටියට අනුර කුමාර දිසානායක ඔබතුමන්ලාගේ නායකතුමා තමයි හම්බවෙලා තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ හම්බවෙලා තිබෙනවා කියලා මට ආරංචිවෙලා තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා, මීට දවස් දෙක තුනකට ඉස්සෙල්ලාත් එතුමා ඔබතුමාගේ ගෙදරින් පිට පිට දවස් තුනක් රාත්‍රියටයි, දවල්ටයි තුන්වේලටම කෑම කෑවා. ඒ නිසා අහ ගන්නට එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මේ රටේ 254 දෙනෙකුගේ ජීවිත වැනසුණා. සහරාන්ලාගේ කල්ලියට අහිංසක ජීවිත 254ක් බිලි ගන්නට මේ ආණ්ඩුව ඉඩ දුන්නා. මේ විපත ගත්තේ ඇණවුම් කරලා. මේ විපත වළක්වා ගන්නට තිබුණා.

එදා දෙසැම්බර් මාසයේ 24වෙනි දා මාවනැල්ලේ බුදු පිළිම කඩා දැමීමේ සිදුවීමට පසුව කබීර් හෂීම් ඇමතිතුමා කිව්වා, එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් තස්ලිම් දීපු තොරතුරු ඔස්සේ නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මහත්තයා සහ ගාමිණී තෙන්නකෝන් කියන සහකාර පොලිස් අධිකාරිවරයාගේ නායකත්වයෙන් පරීක්ෂණ හරියට සිද්ධ වුණා කියලා. ඒ පරීක්ෂණ සිද්ධ වෙනකොට තමයි පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයා, ගාමිණී තෙන්නකෝන් මහත්මයාට කථා කරලා කියන්නේ, මේ සිද්ධියට සම්බන්ධ සහීඩ් ඊබ්‍රාහිම් සහ ඊබ්‍රාහිම් සාදික් කියන, තස්ලිම් කියපු, මාවනැල්ලේ බුදු පිළිම කඩා දැමීමේ සිද්ධියේ වගඋත්තරකරුවන් දෙදෙනා, -සහරාන්ගේ ගෝලයෝ දෙන්නා- භාර දෙන්න මවුලවිවරයෙක් සූදානමින් ඉන්නවා, එයා එවන්නම් කියලා අසාද් සාලි මහත්මයා පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයාට කිව්වා කියලා. පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයා කථා කරලා ගාමිණී තෙන්නකෝන් කියන සහකාර පොලිස් අධිකාරිවරයාට කියනවා, අන්න අසාද් සාලි ආණ්ඩුකාරතුමා, - බස්නාහිර- ලෑස්තියෙන් ඉන්නවා සහීඩ් සහ සාදික් භාර දෙන්න. අසාද් සාලිගේ දුරකථන අංකය මෙන්න. කරුණාකරලා අසාද් සාලිට කථා කරන්න කියලා. ඒක කියන්නේ පූජිත් ජයසුන්දර මහත්තයා. අසාද් සාලි මහත්තයාට කථා කරනවා. අනේ! සහකාර පොලිස් අධිකාරි ගාමිණී තෙන්නකෝන්. මොකක්ද වෙන්නේ? ගාමිණී තෙන්නකෝන් මහත්තයාට අසාද් සාලි මහත්තයා කියනවා, දෙසැම්බර් මාසයේ 30වෙනි දා සාදික් සහ සහීඩ් ගෙනැල්ලා භාර දෙනවා කියලා. නමුත් භාර දෙන්නේ නැහැ. 30වෙනි දා දවසම බලාගෙන ඉන්නවා, භාර දෙන්නේ නැහැ. පූජිත් ජයසුන්දර මහත්තයාට ගාමිණී තෙන්නකෝන් මහත්තයා කියනවා, "භාර දුන්නේ නැහැ" කියලා. 31වෙනි දා උදේ සමාලෝචන අවස්ථාවේදී භාර දීලා තිබුණෙත් නැහැ. දැන් හරි නම් කරන්නට ඕනෑ මොකක්ද? කබීර් හෂීම් මහත්තයෝ අහ ගන්න. එහෙම නම් කරන්නට තිබුණේ, අසාද් සාලිගෙන් අහන්නට ඕනෑ කවුද භාර දෙනවා කියලා කිව්වේ, දැන් කොහේද සාදිකුයි, සහීඩුයි ඉන්නේ කියලා. අසාද් සාලි මහත්මයාගෙන් ඇහුවා නම් මොහොමඩ් සහරාන්ලා ඉන්න තැන, ඊබ්‍රාහිම් මවුලවිලා ඉන්න තැන, මේ බෝම්බ කල්ලියේ නායක නායිකාවෝ ඉන්න තැන ඔක්කොම සොයා ගන්නට තිබුණා. ඔත්තුව දන්නවා අසාද් සාලි. අසාද් සාලි ඔත්තුව දන්නවා, ඇහුවේ නැහැ. එදා හරියට කළා නම් තස්ලිම්ගේ ජීවිතය අනතුරට වැටෙන්නෙත් නැහැ. කබීර් හෂීම් ඇමතිතුමා ඒකට වග කියන්නට ඕනෑ. තස්ලිම්ගේ ජීවිතය අනතුරට වැටෙන්නේත් නැහැ, මේ 254දෙනාගේ ජීවිත පූජා වෙන්නෙත් නැහැ. මේ අහිංසකයන්ගේ ජීවිත නැති වෙන්නෙත් නැහැ. ඒ අනුව, මේ ආණ්ඩුවයි මේ විපත හැදුවේ, මේ ආණ්ඩුව මේ විපත ඇණවුම් කරලා ගත්ත එකක්. විපත වෙන්න ඉඩ දුන්නා. බෝම්බ පුපුරුවලා අහිංසකයන් මරන්නට සහරාන්ලාට ඉඩ දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා දැන් කථාව නවත්වන්න.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩි 8ක්ද කොහේද තිබුණා.

නවත්වා ගන්නට තිබුණු විපතක් මේක. කුරුණෑගල රෝහලේදී ලෝක ඉතිහාසයේ තිරිසන්ම අත් දැකීම එකතු කළා පාපි සාෆි. සාෆි වෛද්‍යවරයා නිදොස් කොට නිදහස් කරන්නට CID එක අද මාන බලනවා. ඒක වළක්වන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පාපි සාෆි මව්වරුන්ගේ කැමැත්ත නැතිව LRT සැත්කම් 11ක් කරලා තිබෙනවා. ඒ පිළිබඳව කුරුණෑගල ශික්ෂණ රෝහලෙන් පත් කළ වෛද්‍ය මණ්ඩලයේ වාර්තාවක් මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරලා තිබුණා. 2019.06.26 දිනැතිව ශික්ෂණ රෝහල - කුරුණෑගල යන ලිපි ශීර්ෂය යටතේ ඇති වාර්තාව මම **සභාගත*** කරනවා.

මව්වරුන්ගේ එකඟතාව නැතිව බලහත්කාරයෙන් LRT සැත්කම් 11ක් කරලා තිබෙනවා. ඒකට ඔහු වරදකරුවෙක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෛද්‍ය කණ්ඩායම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ වාර්තාව සභාගත කරමින් මම ප්‍රකාශ කරන්නේ මේ අපරාධය මේ ආණ්ඩුව දැනුවත්ව කළ බවයි. ඒ නිසා මේ ආණ්ඩුවට එක විශ්වාස භංග යෝජනාවක් නොවෙයි විශ්වාස භංග 100ක් හෝ ගෙනෙන්න ඕනෑ. ලජ්ජාවක් තිබෙනවා නම් රටට තව දුරටත් පව් නොදී, වද නොදී මේ ආණ්ඩුව අදම ඉවත් වෙන්න ඕනෑය කියන බලපෑම අපි මේ වෙලාවේ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ உறுப்பினர் எச்.எம்.எம். ஹரீஸ் அவர்கள்!

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 3.59]

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஏப்பிரல் 21ஆம் திகதி நடைபெற்ற පාස්කු ඉරිදා குண்டுத்தாக்குதலை முக்கிய கருப்பொருளாகக் கொண்டு இந்த அரசுக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவரப்பட்டிருக்கின்றது. ஒரு சிறிய பயங்கரவாதக் குழுவின் நடவடிக்கையினால் இந்த நாட்டிலுள்ள அப்பாவிப் பொதுமக்கள் கொல்லப்பட்டார்கள். உண்மையில், இந்தப் பயங்கரவாதத் தாக்குதல் இந்த நாட்டிலிருக்கின்ற எந்த ஒரு சமூகத்தினாலும் ஏற்றுக்கொள்ளமுடியாத ஒரு மிலேச்சத்தனமான தாக்குதலாகும். எங்களுடைய அதிர்ஷ்டம் என்னவென்றால், எங்களுடைய நாட்டின் முப்படையினர், பொலிஸார் ஆகியோர் இந்தப் பயங்கரவாதத்துடன் தொடர்புடைய அத்தனை பேரையும் கைதுசெய்திருப்பதாகும். அதேபோன்று, அவர்களுக்கு உச்ச தண்டனை வழங்குவதற்காக இன்று அரசாங்கம் நடவடிக்கை எடுத்து வருகின்றது. உலகத்தில் இவ்வாறான பயங்கரவாதக் குழுவினரை ஒரு குறுகிய காலத்தில் கைதுசெய்து, அவர்களை ஒழிப்பதற்கு நடவடிக்கை எடுத்தமை இந்த அரசாங்கத்தின் கெட்டித்தனம் என்றுதான் நாங்கள் சொல்லலாம். இவ்வாறிருக்கையில், இன்று இந்தச் சபையில் பேசிய எங்களுடைய மாவட்டப் பாராளுமன்ற உறுப்பினரான கோடீஸ்வரன் அவர்கள் துரதிருஷ்டவசமாக ஒரு விடயத்தைக் கூறினார். அதாவது, சஹ்ரானுடன் தொடர்புபட்ட ஆயிரக்கணக்கானவர்கள் இருப்பதாகவும், இந்த நாட்டில் சஹ்ரானுக்கு ஒரு தலைவன் இருப்பதாகவும் அதுவும் உயிரோடு இருப்பதாகவும் பொய்யான ஒரு பரப்புரையை மேற்கொண்டிருந்தார். உண்மையில், இது மிகவும் கவலையான ஒரு விடயமாகும். இவ்வாறு பொய்யான கூற்றுக்களைத் தெரிவித்து, ஓர் இனத்தின்மீது மென்மேலும் நெருக்கடிகளைக் கொடுக்கின்ற விடயத்தைத் தயவுசெய்து செய்யாதீர்கள்! இந்த சஹ்ரான் குழுவின் உறுப்பினர்களைக் கைதுசெய்வதற்கு - *[இடையீடு]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ கோடீஸ்வரன் அவர்கள்!

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
கௌரவ உறுப்பினர் அவர்களே, என்னுடைய நேரத்தை நீங்கள் வீணாக்காதீர்கள்! தயவுசெய்து பின்னர் கதையுங்கள்! தயவுசெய்து என்னுடைய நேரத்தைத் பாழாக்காதீர்கள்!

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, சஹ்ரானை வழிநடத்திய ஒரு தலைவன் இருக்கவேண்டும். எந்த ஓர் அமைப்பாக இருந்தாலும் அதற்கென்று ஒரு தலைவன் இருக்கவேண்டும் என்ற அடிப்படையில்தான் நான் சஹ்ரானைப் பற்றிக் கூறினேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, இது point of Order இல்லை.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
அவருடன் ஆயிரம் உறுப்பினர்கள் இருப்பதாக நீங்கள் கூறினீர்கள்! எந்த ஆதாரதாரத்தின் அடிப்படையில் அவ்வாறு கூறுகின்றீர்கள்? இந்த நாட்டின் இராணுவத் தளபதி -

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
சஹ்ரான் இறந்ததால் அவரை வழிநடத்திய தலைவர் ஒருவர் இருக்கவேண்டும்.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
அவருடன் ஆயிரம் உறுப்பினர்கள் இருப்பதாக நீங்கள் இந்தச் சபையில் கூறி இருக்கின்றீர்கள்!

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
ஆயிரக்கணக்கானவர்கள் training எடுத்திருக்கிறார்கள்!

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
அது பொய்! ஏனென்றால், 185 பேருக்கு உட்பட்டவர்கள்தான் இதன் உறுப்பினர்களாக இருந்திருக்கிறார்கள் என்று இந்த நாட்டின் இராணுவத் தளபதி, உளவுப் பிரிவின் தலைவர் போன்றோர் கூறியுள்ளார்கள். அவர்களில் 99 வீதமானவர்களை இந்த நாட்டின் பாதுகாப்புப் படையினர் கைதுசெய்துள்ளதுடன், தற்பொழுது அவர்களுக்கு உச்ச தண்டனையை வழங்குவதற்கு அவர்கள் தயாராகி வருகின்றார்கள். அதேநேரம், இந்த நாட்டில் பல போராட்டங்கள் நடந்திருக்கின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றன.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
சரி!

இந்த நாட்டில் முஸ்லிம் சமூகம், குறிப்பாக இந்த சஹ்ரானுடைய நடவடிக்கை தொடர்பில் அவருடைய அமைப்பின் உறுப்பினர்களைக் கைதுசெய்வதற்கு வலியே வந்து, பெறுமதியான தகவல்களை வழங்கியிருக்கிறது. அதற்கு அத்தாட்சியாக இந்த நாட்டின் பாதுகாப்புப் பிரிவு சாய்ந்தமருதைச் சேர்ந்த மூன்று சகோதரர்களுக்கு தலா 10 இலட்சம் ரூபாய் சன்மானத்தை வழங்கியிருக்கிறது. அவ்வாறான ஒரு காத்திரமான பங்களிப்பை முஸ்லிம் சமூகம் செய்ததினால்தான் இன்று இந்தக் குழுவின் செயற்பாடுகள்

ஒடுக்கப்பட்டுள்ளன. இதனை நாங்கள் வரவேற்க வேண்டும். சாதாரண அப்பாவிகள் கொல்லப்படுவதை யாரும் அனுமதிக்க முடியாது.

அதேபோல, நீங்கள் கல்முனை சம்பந்தமாகப் பேசும்போது, "நிலத்தொடர்பற்ற ரீதியில் நாங்கள் வாழவில்லை" என்று கூறினீர்கள். உண்மையில், இது சம்பந்தமான பேச்சுவார்த்தைகள் நடைபெறுகின்றன. கல்முனையில் இருக்கின்ற உப பிரதேச செயலகம் நிலத்தொடர்பற்ற ரீதியில் இருக்கின்றது என்பதை அந்தப் பேச்சுவார்த்தையின்போது நாங்கள் நிரூபிப்பதற்குத் தயாராக இருக்கின்றோம். அதற்கென்று ஒரு வரலாறு இல்லை. ஆனால், முஸ்லிம் மக்களுக்கென்று கல்முனையில் ஒரு வரலாறு இருக்கின்றது.1897ஆம் ஆண்டு மட்டுமல்ல, ஆயிரம் வருடங்களுக்கு முன்னர் அதாவது,1890க்கு முன்னர் ரஹுமான் ராஜா என்ற ஒரு முஸ்லிம் மன்னர்கூட அந்த -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ வியோழேந்திரன் அவர்கள்!

**ගරු එස්. වියාළේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் ஹரீஸ் அவர்கள் கூறிய இரண்டு விடயங்களை ஏற்றுக்கொள்ள முடியாது. ஒன்று, கல்முனையில் வாழுகின்ற தமிழர்களுக்கு வரலாறு இல்லையென்று கூறினார். அந்தக் கருத்தை அவர் வாபஸ்பெற வேண்டும். இரண்டாவது இந்த நாட்டிலே இந்தப் பயங்கரவாதம் முற்றாக ஒழிக்கப்பட்டுவிட்டது என்று அவர் சொன்னார். கௌரவ உறுப்பினர் அவர்களே, சென்ற மாதம் மொஹமட் மில்ஹான் என்பவரைச் சவூதி அரேபியாவிலிருந்து கொண்டுவந்து, அவரிடம் மேற்கொண்ட விசாரணைகளின் அடிப்படையில், காத்தான்குடி - ஒல்லிக்குளத்திலிருந்து 300 'ஜெலிக்னைட்' குச்சிகளையும் 1,000 'டெட்டனேட்டர்'களையும் கண்டெடுத் திருக்கிறார்கள். இந்த மில்ஹான் யார்?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் வியாழேந்திரன் அவர்களே, தயவுசெய்து நிறுத்துங்கள்!

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
கௌரவ வியாழேந்திரன் அவர்களே, இந்தப் பூச்சாண்டிகளுக்கெல்லாம் நாங்கள் - *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் உங்களுடைய பேச்சைத் தொடருங்கள்!

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
நான் தமிழ் மக்களுக்கு வரலாறு இருக்கவில்லையென்று சொல்லவில்லை. தமிழ் உப பிரதேச செயலகத்திற்கு ஒரு குறுகிய வரலாறுதான் இருக்கின்றது. *[இடையீடு]* ஆனால், அதைவிட பல நூற்றாண்டு கால வரலாறு முஸ்லிம் பிரதேசத்தின் ஆட்சிக்கு இருக்கின்றது. இதை யாரும் மறுக்க முடியாது. வெறுமனே கிழக்கிலுள்ள முஸ்லிம்களைப் பயங்கரவாதிகள் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிந்துவிட்டது. தயவு செய்து உங்களுடைய பேச்சை நிறுத்துங்கள்!

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
கிழக்குப் பல்கலைக்கழகத்தில் பயங்கரவாதம் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, தயவு செய்து பேச்சை நிறுத்துங்கள்!

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
மட்டக்களப்புப் பல்கலைக்கழகமே இயங்கவில்லை. அங்கு கல்லும் மண்ணும் கம்பிகளும்தான் இருக்கின்றன. மாணவர்களும் இல்லை; *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்கள் நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
கௌரவ உறுப்பினர் அவர்களே, கிழக்குப் பிராந்தியத்தை -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ வியாழேந்திரன் அவர்கள்; உங்களுக்கு 7 நிமிடங்கள்!

[பி.ப. 4.06]

**ගරු එස්. වියාළේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பாராளுமன்ற உறுப்பினர் ஹரீஸ் அவர்கள் கல்முனையில் முஸ்லிம் மக்களுக்கென்று ஒரு வரலாறு இருக்கின்றதென்றும் தமிழ் மக்களுக்கென ஒரு வரலாறு இல்லையென்றும் இன்று அப்பட்டமாக உண்மைக்குப் புறம்பான விடயத்தைக் கூறினார். தமிழ் மக்கள் இந்த மாகாணத்திலே பூர்வீகக் குடிகள்! இந்த நாட்டின் ஒரு பூர்வீகக் குடிகள்! அப்படியிருக் கும்போது, கல்முனையிலிருக்கின்ற ஒட்டுமொத்த தமிழ் மக்களுக்கும் ஒரு வரலாறு இல்லையென்ற கேவலமான வார்த்தையை இன்று அரசாங்கத்தைப் பிரதிநிதித்துவப்

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

படுத்துகின்ற இந்த உறுப்பினர் கூறியிருக்கின்றார். இவர் இந்தக் கருத்தை வாபஸ் பெறவேண்டும் என்று நான் இந்த இடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அதுமாத்திரமல்ல, நண்பர் கோடீஸ்வரன் அவர்கள் சொன்ன கருத்துக்கு மாறாக, இந்தப் பயங்கரவாதம் முழுமையாக ஒழிக்கப்பட்டுவிட்டதென்று இவர் இன்று சொன்னார். நான் இவரிடம் ஒரு விடயத்தைக் கேட்கின்றேன். அதாவது, அப்படியென்றால், சென்ற மாதம் சவூதி அரேபியாவிலிருந்து கொண்டுவரப்பட்ட மொஹமட் மில்ஹான் காட்டிக்கொடுத்ததன்பேரில் காத்தான்குடியிலே ஒல்லிக்குளத்துக்குப் பக்கத்தில் 1000 'டெட்டனேற்றர்'களும் 300 'ஜெலிக்னைட்' குச்சிகளும் இரசாயனப் பதார்த்தங்களும் கண்டுபிடிக்கப்பட்டிருக்கின்றனவே! அவர் ஒரு பயங்கரவாத அமைப்பைச் சேர்ந்தவர். நேற்றையதினம்கூட, ஏறாவூரிலே தண்ணீர் tankக்கு மேலேயிருந்த ஆயுதங்கள், கைக்குண்டுகள் கண்டுபிடிக்கப்பட்டன. இவ்வாறான நிலைமையில் இவர்களால் இந்தப் பயங்கரவாதம் முழுமையாக ஒழிக்கப்பட்டுவிட்டதென்று இந்த சபையிலே எவ்வாறு அழுத்தம் திருத்தமாக அடித்துச் சொல்லமுடியும்? ஆகவே, இந்த அரசாங்கத்தைப் பொறுத்தவரைக்கும் - *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ கோடீஸ்வரன் அவர்களே, இது அவரின் பேச்சு நேரம்; அவர் பேசிக்கொண்டிருக்கின்றார். தயவுசெய்து குறுக்கிடாதீர்கள்!

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

2017ஆம் ஆண்டு மொஹமட் சஹ்ரான் அவர்களுக்குப் பிடியாணை பிறப்பிக்கப்பட்டிருந்தது. ஆனால், அவர் கைதுசெய்யப்படவில்லை. ஏன், அவர் கைது செய்யப் படவில்லை? வவுணதீவிலே 2 பொலிஸார் கொலைசெய்யப் பட்ட விடயம் சம்பந்தமாகச் சந்தேகத்தின்பேரில் 2018ஆம் ஆண்டு நவம்பர் மாதம் 27ஆம் திகதி அஜந்தன் என்கின்ற முன்னாள் போராளியைக் கைது செய்தார்கள். அவர் சமூகமயப்படுத்தப்பட்டு இயல்பு வாழ்க்கைக்குத் திரும்பியிருந்தவர். ஆனால், ஏப்பிரல் 21ஆம் திகதி நடைபெற்ற குண்டு வெடிப்புக்குப் பிறகு நடந்த விசாரணையின்போது, மொஹமட் சஹ்ரானுடைய சாரதி கபூர் என்பவர்தான் அந்த 2 பொலிஸாரையும் கொலை செய்தார் என்பதைப் புலனாய்வுத் துறையினர் கண்டுபிடித்தனர். அவர் அந்த 2 பொலிஸாரையும் உயிரோடு கண்களைப் பிடுங்கியெடுத்து, உடல் அங்கங்களை வெட்டி, அதற்குப் பின்பு சுட்டுக்கொன்றிருக்கிறார். ஆனால், 5 குழந்தைகளைக்கொண்ட இந்த முன்னாள் போராளி 6 மாதங்களுக்கு மேலாகத் தடுத்து வைக்கப்பட்டிருந்தார். அவருக்கான நஷ்டஈடுகள்கூட ஒழுங்கான முறையிலே வழங்கப்படவில்லை.

அதுமாத்திரமல்ல, புலனாய்வுப் பிரிவினர் அன்று சரியாகச் செயற்பட்டிருந்தால் இந்தக் குழுவைக் கைது செய்திருக்கமுடியும். ஏப்பிரல் 16ஆம் திகதி காத்தான்குடிக்கு அருகிலிருக்கின்ற ஆரையம்பதியிலே, வேடர் குடியிருப்பிலே மொஹமட் சஹ்ரானுடைய பரீட்சார்த்தக் குண்டுவெடிப்பு இடம்பெற்றது. அதைக்கூட அவர்கள் கண்டுகொள்ளவில்லை. ஏப்பிரல்17ஆம் திகதி அந்த வளவுக்குச் சொந்தக்காரரான ஒரு முஸ்லிம் நபர் காத்தான்குடி பொலிஸ் நிலையத்தில் அதுபற்றி முறையிட்டிருக்கின்றார். ஆனால், ஏப்பிரல் 18ஆம் திகதிதான் அவர்கள் வந்து அந்த இடத்தைப் பார்வையிட்டுள்ளார்கள். ஏப்பிரல் 18ஆம் திகதி அந்தப் பரீட்சார்த்தக் குண்டுவெடிப்பு முயற்சி பற்றிய விடயங்களைக் கண்டுபிடித்திருந்தால், ஏப்பிரல் 21ஆம் திகதிய சம்பவத்தைத் தடுத்திருக்க முடியும். நேற்றையதினம்கூட, ஏறாவூரிலே ஆயுதங்கள் கண்டுபிடிக்கப்பட்டன. இன்று அடித்துச் சொல்லுகின்றார்கள், இப்பொழுது எல்லாம் முடிந்துவிட்டது, இனி ஒன்றுமே இல்லையென்று. இன்று கிழக்கு மாகாணத்திலே வாழுகின்ற எங்களுடைய மக்கள் உயிரைக் கையில் பிடித்துக்கொண்டு வாழுகின்ற நிலைமைதான் இருக்கின்றது. இன்று நாங்கள் மொஹமட் சஹ்ரானைப் பற்றி பேசினால் அப்துல்லா மஹரூப், MP எழுந்து காரசாரமாகப் பேசுகின்றார். நான் கேட்கின்றேன், மொஹமட் சஹ்ரான் யார்? இன்று ஒரு பிரச்சினை நடந்துவிட்டதால், அவர் இஸ்லாம் மதத்தைச் சேர்ந்தவர் இல்லையென்று கூறுகின்றீர்கள். அப்படியென்றால், அவர் இந்து மதத்தைச் சேர்ந்தவரா, அல்லது கிறிஸ்தவ மதத்தைச் சேர்ந்தவரா, அல்லது பௌத்த மதத்தைச் சேர்ந்தவரா? அவரது பெயர் கந்தசாமியா அல்லது முத்து பண்டாரவா அல்லது டேவிட்டா? இன்றுகூட மொஹமட் சஹ்ரானை மௌலவி என்றுதான் அழைக்கிறார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 2 நிமிடங்கள்தான் இருக்கின்றன.

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

ஆகவே, இந்தப் பயங்கரவாதத்தை ஊட்டிவளர்க்கின்ற செயற்பாட்டைத்தான் இவர்கள் செய்துகொண்டிருக்கிறார்கள். எக்காரணத்தைக் கொண்டும் இந்தப் பயங்கரவாதம் முற்றுமுழுதாக ஒழிக்கப்பட்டுவிட்டதென்று இவர்களால் அழுத்தந்திருத்தமாகக் கூறமுடியாது என்று நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු තිලක් මාරපන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.4.10]

**ගරු තිලක් මාරපන මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலக் மாரபன - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Tilak Marapana -Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම ශෝකජනක සිද්ධියක් වූ පාස්කු ඉරිදා එල්ල වූ එම කෲර ප්‍රහාර මුල් කරගෙන අද ඉදිරිපත් කර තිබෙන විශ්වාසභංග යෝජනාව සම්බන්ධයෙන් පවත්වන්නට යෙදෙන මේ විවාදයට මාත් අදහස් කීපයක් එකතු කිරීමට කැමැතියි. ජනාධිපතිතුමා රටේ නැති අවස්ථාවකදී ඒ සිද්ධිය වූ දවසේ අපේ ආණ්ඩුව අගමැතිතුමාගේ මූලිකත්වය යටතේ යුද හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවම උනන්දු කරවා රටේ සාමය ඇති කරන්න කළ උත්සාහය ගැන අපි හැමෝම දන්නවා. මීට පෙර කථා කළ කථිකයන් කීප දෙනෙක්ම ඒ පිළිබඳව කථා කළා. ඒ නිසා මම ඒ පිළිබඳව තවදුරටත් කරුණු දක්වන්නේ නැහැ. ඒ වාගේම අපේ කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් ඒ අවස්ථාවේදී ක්‍රිස්තියානි භක්තිකයන් සන්සුන් ලෙස මෙහෙයවූ

එකටත් අපි උන්වහන්සේට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම ඉස්ලාම් ආගමික නායකයන් සහ දේශපාලන නායකයන් මේ සිද්ධිය සම්පූර්ණයෙන්ම හෙළා දකිමින්, මෙයට කිසිම සම්බන්ධයක් හෝ අනුබලදීමක් කළේ නැහැ කියන පණිවුඩය රටට පැවසීමත් මම හිතන විධියට අපට විශාල රුකුලක් වුණා, ඒ වේලාවේ සාමය පවත්වාගෙන යෑමට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා රාත්‍රියේ යුද හමුදාව රට පුරාම සංචාරයේ යෙදෙමින් මේ සිදුවීම මුල් කරගෙන ජාතිවාදී ආරවුලක් ඇති වෙන එක වළක්වාලීමට පියවර ගැනීම සම්බන්ධව ඒ අයටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විශ්වාසභංග යෝජනාව මොන පදනමක් මත ගෙනැත් තිබෙනවාද කියන එක මම දැනගන්න කැමැතියි. මම මුලින් සඳහන් කළ ආකාරයට මේ ආණ්ඩුව යම් යම් ක්‍රියාමාර්ග අරගෙන පැය 24ක් යන්න ඉස්සෙල්ලා එම සිදුවීමට සම්බන්ධ මූලික අය හඳුනාගෙන ඔවුන් අත්අඩංගුවට අරගත්තා. දැන් වෙනකොට මේ සිද්ධියට සෘජුව සම්බන්ධ සියලුදෙනාම අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ සිදුවීමට සම්බන්ධ යැයි අනුමාන කරන තව කට්ටියක් ඉන්නවා. ඒ ගොල්ලන් පිළිබඳවත් අපට තොරතුරු ලැබී තිබෙනවා. ඔවුන් අත්අඩංගුවට ගැනීම විතරයි, දැන් ඉතුරු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව දෙයක් කියන්න තිබෙනවා. මේ සිද්ධිය සම්බන්ධයෙන් විශේෂ කාරක සභාවක් දැනටත් ක්‍රියාත්මක වෙනවා. එම විශේෂ කාරක සභාවේ කර්තව්‍ය තමයි මෙම සිදුවීම යම්කිසි අඩු පාඩුවක් නිසා වෙලා තිබෙනවාද කියලා සොයාබලා, වරදකරුවකු හැටියට මේ සම්බන්ධ වගකීම පවරන්න කවුරුවත් ඉන්නවාද කියලා පරීක්ෂා කර බලා මේ ගරු සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම. එවැනි වාතාවරණයක් යටතේ කිසියම් කෙනෙක් මේ පිළිබඳව නොසැලකිලිමත්කමින් කටයුතු කර තිබෙනවා, මේ සිදුවීම වැළැක්වීමට පියවර ගත්තේ නැහැ කියලා ඇඟිල්ල දිගු කරන එක අසාධාරණයි කියලා මා හිතනවා. එම විශේෂ කාරක සභාවේ කටයුතු අවසන් වුණාට පස්සේ අපට පැහැදිලි චිත්‍රයක් ලබා ගන්න පුළුවන්, මේ තොරතුරු ලැබුණේ කොහොමද, මේ තොරතුරුවලට දැක් වූ ප්‍රතිචාරය මොකක්ද, ඒ ප්‍රතිචාරය දැක්වීමේදී යම්කිසි අඩු පාඩුවක් වෙලා තිබෙනවාද කියන වගට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම සිදුවීමෙන් පසුව මිනුවන්ගොඩ සහ කුලියාපිටියේ සිද්ධ වූ අවාසනාවන්ත සිදුවීම් ගැනත් සඳහන් කරන්න මා කැමැතියි. මම පැහැදිලිව එම සිද්ධි හෙළා දකිනවා. මම හිතන්නේ නැහැ, ඒවා ජාතිවාදය මුල් කරගෙන ඇති වෙච්ච සිද්ධි කියලා. පැහැදිලිව අපට දැන් පෙනී යනවා, මේ සිද්ධි පිටුපස ඉඳලා තිබෙන්නේ මේ ආණ්ඩුව අස්ථාවර කරන්න යම් කිසි ප්‍රයත්නයක් දරපු කොටසක් බව. ඒ උදවියට මම මතක් කරනවා, මේ වාගේ ක්‍රියාදාමවල යෙදීමෙන් ආණ්ඩුව අස්ථාවර වනවා විතරක් නොවෙයි, අපේ රට කෙරෙහි මුළු ලෝක ප්‍රජාව තුළම විශාල කැලලක් ඇතිවන බව. මොකද, ඒ තුළින් ජාතිවාදී ලෙස එකිනෙකා මරා ගන්නා කෲර සමාජයක් හැටියට ජාත්‍යන්තරයට අපේ රට පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව තව දුරටත් කියනවා නම්, ඇමෙරිකානු ජාතිකයන් ඇවිල්ලා මෙහේ කඳවුරු බැඳගෙන පදිංචි වෙලා මේ රට ආක්‍රමණය කරන්න ලෑස්ති වනවාය කියලා දැන් තවත් ගෝණි බිල්ලෙකු මවාගන්න හදන්නේත් මේ කණ්ඩායමම තමයි. ඒකට හේතුව වශයෙන් ඔවුන් ගිවිසුම් කීපයක් සඳහන් කරනවා. ACSA කියලා ගිවිසුමකුයි, SOFA කියලා ගිවිසුමකුයි, MCC කියලා ගිවිසුමකුයි අත්සන් කරලා මේ රජය මුළු රටම ඇමෙරිකාවට පාවා දෙන්න යනවා කියලා ඔවුන් කියනවා. මෙවැනි කථා කියන අයට මම කියන්න කැමැතියි, ඔවුන්ට තිබෙන කැක්කුමට වඩා කැක්කුමක් මේ ආණ්ඩුවේ සිටින අපටත් මේ රට ගැන තිබෙන බව. අපි කැමැති නැහැ, කිසිම රටකට බාල්දු වෙලා ඒ රටවලට පැඟිලා ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගිවිසුම් තුනම ගැන කෙටියෙන් මම සඳහන් කරන්න කැමැතියි. මේ ACSA කියන ගිවිසුම මුලින්ම අත්සන් කළේ 2007දී. මේ ACSA කියන ගිවිසුමෙන් කෙරෙන්නේ මොකක්ද? අපේ රට වටා ඇති මුහුදු අවට සංචාරයේ යෙදී සිටින යුද නැව් ලංකාවට ඇවිල්ලා ලංකාවේ වරායවලින් යම් කිසි පහසුකම් ලබා ගැනීමට තමයි, මේ ACSA කියන ගිවිසුම ඇමෙරිකාවත් එක්ක 2007දී මුල් වරට අත්සන් කර තිබෙන්නේ. මේ නැව් මේ ආකාරයෙන් අපේ රටේ වරායවලට එන එක අලුත් දෙයක් නොවෙයි. මට මතකයි, මම ආරක්ෂක ඇමති හැටියට 2002 සිට 2004 දක්වා ඉන්න කොටත් ඕනෑ තරම් නැව් අපේ රටේ වරායවලට ආවා. ඒ කාලයේ ACSA කියන ගිවිසුම් තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම ඇමෙරිකාවත් එක්ක ACSA කියන ගිවිසුම ප්‍රථම වතාවට අපි ඇති කර ගත්තේ 2007දී. ඊට පෙර ඕනෑ තරම් ඇමෙරිකාවේ නැව් විතරක් නොවෙයි, ජපානයේ නැව් අපේ රටේ වරායවලට ආවා. ඒ කාලයේ අපේ වරායවලට විශාල වශයෙන් ආවේ ජපානයේ නැව්. ජපානය, චීනය, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව වැනි නොයෙක් රටවල නැව් අපේ රටේ වරායවලට පැමිණියාට ඒ ගොල්ලන් එක්ක අපි ACSA වැනි ගිවිසුම් අත්සන් කර තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒ ගොල්ලන් අපේ රටේ වරායවලට ඇවිල්ලා නැවට අවශ්‍ය පහසුකම් ලබා ගත්තා. ඒ වාගේම ඒ නැවේ සිටින නැවියන් ගොඩබිමට ඇවිල්ලා අපේ හෝටල්වලට ගිහිල්ලා සංචාරකයන් වාගේ දවස් දෙක තුන ගත කරලා නැවත ගියා. ඒකට අපට භය වෙන්න දෙයක් නැහැ. ඒ ගිවිසුමම තමයි 2017දීත් අපි අලුත් කර තිබෙන්නේ. ඒ පිළිබඳව අපේ ගරු අගමැතිතුමා දීර්ඝ පැහැදිලි කිරීමක් අද උදේ කළා. එම නිසා මම හිතන්නේ නැහැ, මම මීට වඩා ඒ ගැන කථා කරන්න ඕනෑය කියලා.

SOFA කියන ගිවිසුමත් අපි 1995දී හුවමාරු කර ගෙන තිබෙනවා. ඒක අලුත් කරන්න ඒ ගොල්ලන් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. අපි ඒක සලකා බලමින් ඉන්නවාය කියන එක විතරයි මේ අවස්ථාවේදී මට කියන්න තිබෙන්නේ. සංචාරයක් සඳහා ඇමෙරිකාවට ගිය අවස්ථාවේදී මම කිසිම ගිවිසුමකට අත්සන් කළේත් නැහැ; කිසිම ගිවිසුමකට එකඟතාව පළ කළේත් නැහැ. මම ගියේ වෙනත් රාජකාරියකට. "United States-Sri Lanka Partnership Dialogue" කියලා අපි වර්ෂ දෙකකට සැරයක් කරන, ඇමෙරිකාවත් එක්ක ඇති සම්බන්ධතා පිළිබඳව වූ සාකච්ඡාවකට තමයි මම සහභාගි වුණේ. ඒ වාගේම මේ MCC - Millennium Challenge Corporation - කියන එකඟතාව ගැන මට කියන්න තිබෙන්නේ එක දෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ගිවිසුම හරහා ඩොලර් මිලියන 500ක පමණ මුදලක් ඇමෙරිකාවෙන් අපට ලැබෙනවා. ඒ ඩොලර් මිලියන 500න් මොනවා කරනවාද කියන වග තීරණය කරන්නේ අපේ රජය. අපේ රජය තමයි ඒ ගොල්ලන්ට විස්තර දීලා තිබෙන්නේ මෙන්න මේ මේ කර්තව්‍යයන් කිරීමට මේ මුදල් දෙන්න කියලා. ඒ ගොල්ලන් අපට කිසි දෙයක් කියලා නැහැ. අපි තමයි කියලා තිබෙන්නේ මෙන්න මේ පාර, මෙන්න මේ දේවල් සංවර්ධනය කරන්න අපට මුදල් දෙන්න කියලා. ඒ අනුව, ඒ ඔක්කෝම ලැයිස්තුව දීලා තිබෙන්නේ අපි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, ඔබතුමාගේ ඇමෙරිකානු සංචාරයේදී SOFA කියන ගිවිසුම ගැන නිල වශයෙන් සාකච්ඡා

[ගරු බිමල් රත්නායක මහතා]

වුණේ නැහැ, එහෙම නැත්නම් වෙනත් කරුණු තමයි ප්‍රධාන වශයෙන් එහිදී සාකච්ඡා කෙරුණේ කියලා ඔබතුමා කිව්වා. මා මේ පිළිබඳව පාර්ලිමේන්තුවේදී කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා, මීට මාසයකට පමණ කලින්. ඒ අවස්ථාවේදී සභානායකතුමා මට ඔබතුමා වෙනුවෙන් පිළිතුරු ලබා දුන්නා. එතුමා මට ඔබතුමා පාර්ලිමේන්තුවට ලබා දුන් පිළිතුර ලබා දුන්නා. එහි සඳහන් කර තිබුණා, දැනට යාවත්කාලීන කිරීමට යෝජනා කර තිබෙන ගිවිසුමේ ප්‍රධාන කොන්දේසි නැත්නම් යෝජනා 15ක් තිබෙනවා කියලා. එම යෝජනා 15න් දෙකක් පිළිබඳව ඔබතුමා සඳහන් කළ බව සභානායකතුමා කිව්වා. එයින් එකක් වන්නේ diplomatic immunity කියන එකයි. අනෙක් එක ලංකාවේ නීතියට වලංගු නැතුව ඇමෙරිකානු නීතිය යටතේ ක්‍රියාත්මක වෙන්න මෙහේ ඉඩක් නැති බව. ඒ දෙක ගැන ඔබතුමා ප්‍රකාශ කළ බව සභානායකතුමා කිව්වා. මගේ තර්කය මේකයි. එතකොට එම යෝජනා 15න් දෙකක් ගැන තමයි අපට පැහැදිලි කිරීම ආවේ. ඉතිරි යෝජනා 13 සම්බන්ධව විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ රජයේ ස්ථාවරය කුමක්ද කියන එකයි SOFA එක සම්බන්ධයෙන් අපි අහන්නේ.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

ගරු මන්ත්‍රීතුමනි, එතුමා ලබා දුන් උත්තරය සම්පූර්ණ උත්තරයක් නොවෙයි. මේ SOFA එක ගැන ඇත්ත වශයෙන්ම ඒ වෙලාවේ කථා බහට ලක් වුණා. එතැනදී යම් සඳහනක් කළා, that this is also one of the matters pending. ඒ අවස්ථාවේ දී මම කිව්වා, "ඔව් ඇත්ත තමයි. මේක ගැන අපි තීන්දුවක් අරගෙන නැහැ. මේකේ අපට පොඩි පොඩි ප්‍රශ්න වගයක් තිබෙනවා" කියලා. උදාහරණ හැටියට තමයි මා ඔය කරුණු දෙක පිළිබඳව සඳහන් කළේ. මෙන්න මේ ප්‍රශ්න තිබෙනවා කියලා මා කිව්වා. "ඒ සම්බන්ධයෙන් all the stakeholdersලා එක්ක කථා කරන්න ඕනෑ. කලින් SOFA එක වාගේ නිකම් ලියවිලි හුවමාරුවකින් මේක කරන්න බැහැ. මොකද මේ සම්බන්ධයෙන් 1996දී වරප්‍රසාද පනත ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපි එකඟතාවකට ඇවිත් වරප්‍රසාද ලබා දීම ගැන විශේෂයෙන් ගැසට් කරලා, පාර්ලිමේන්තුවට ගෙනැවිත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන තමයි මේ ගිවිසුම නීතිගත කරන්න ඕනෑ, මේක කලබලයට කරන්න බැහැ කියන එක තමයි මම ඒ වෙලාවේ ඒ ගොල්ලන්ට කිව්වේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා නීතිපතිවරයකු වශයෙන් හිටපු නිසා හොඳටම දන්නවා, SOFA කියන එක reciprocal නොවෙයි කියලා. අපට අන්‍යෝන්‍ය වශයෙන් කිසිම අයිතියක් ලැබෙන්නේ නැහැ. ඔවුන්ට පමණයි ලැබෙන්නේ. දැනට ඇමෙරිකාවෙන් යෝජනා කරලා තිබෙන ගිවිසුමේ පිටපත ඔබතුමා මේ සභාවට ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි?

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

ඒ පිටපත මට ඉදිරිපත් කරන්න අවස්ථාවක් නැහැ. අපට ඒකෙන් වාසියක් නැහැයි කියලා මම පිළිගන්නවා. හැබැයි, ඒක ඒගොල්ලන්ට විතරක් නොවෙයි, අපේ නැව් ඒ ගොල්ලන්ගේ portsවලට ගියත්, ඒ පහසුකමම දෙන්න ඕනෑ කියලා තිබෙනවා. හැබැයි, අපේ නැව් -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මා කියන්නේ ACSA එක ගැන නොවෙයි.

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

ඒ, ACSA.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

SOFA එක reciprocal නැහැ. SOFA එකේ-

**ගරු තිලක් මාරපන මහතා**
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)

මම එක කාරණයක් කියන්නම්, ගරු මන්ත්‍රීතුමනි, මේ SOFA එකේ තිබුණත්, නැතත් ඔය ආකාරයටම තමයි ඒ වරප්‍රසාදය ඒ ගොල්ලන් දැන් වුණත් භුක්ති විඳින්නේ. මොකද යුද මෙහෙයුම්වලට - military exercises - ඇමෙරිකන් ජාතිකයන් ආවාම ඒගොල්ලන් ගොඩබැහැලා, ගමන් කරන්නේ uniforms පිටින්; ආයුධ අරගෙන යන්නේ. ඒගොල්ලන්ගේ military exercises කරන්න ගෙනෙන වාහන ඒ ගොල්ලන් පදවාගෙන යනවා. අපි ඒ ගොල්ලන්ගේ licences බලන්න යන්නේ නැහැ. ඔය SOFA එක තිබුණත් නැතත් ඒක එහෙම වෙනවා. ACSA එක තිබුණත් නැතත් එහෙම වෙනවා. අපි ACSA එකක් අත්සන් කරලා නැහැ, ජපන් රටත් එක්කයි; ඉන්දුනීසියාව එක්කයි; ඕස්ට්‍රේලියාවත් එක්කයි. හැබැයි, ඒ නැව් එන්නේත් කොළඹ Harbour එකට. ඇවිල්ලා ඒගොල්ලන් ඒ පහසුකම් ලබා ගන්නවා. මේකේ විශේෂ තත්ත්වයක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු ඇමතිතුමනි.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක් තිබෙනවා.

[අ.භා.4.25]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ප්‍රශ්න ගණනාවක් මැද තමයි ජනතා විමුක්ති පෙරමුණ විසින් ගෙනාවේ. මේක දිනන්න ඕනෑ එකක් නම්, මේ සම්බන්ධව විවිධ පක්ෂ එක්ක සාකච්ඡා කරලා, වැඩ පිළිවෙළක් හදලා ඉදිරියට ගෙන එන්න ජනතා විමුක්ති පෙරමුණට පුළුවන්කම තිබුණා. මෙච්චර කාලයක් යම් විදියකට මේ ආණ්ඩුව තියාගන්න වැඩ කරපු ජනතා විමුක්ති පෙරමුණට, ඔක්තෝබර් 26 විප්ලවයේ දී ආණ්ඩුවට සහයෝගය දෙන්න කථා කරපු ජනතා විමුක්ති පෙරමුණට මාස කිහිපයක් ඇතුළත මේ ආණ්ඩුව එපා වීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. අනෙක් පැත්තෙන්, මම එතුමන්ලා ගැන කනගාටු වෙනවා. එදා මේ ආණ්ඩුව පෙරළලා රටේ තිබුණු ප්‍රශ්න ඉවර කරගන්න අවස්ථාව තිබුණා. ඒ වැඩේ හරියට කර ගත්තා නම්, රටේ ප්‍රශ්නත් නතර වෙනවා; මේ ප්‍රහාරත් නතර වෙනවා. නමුත් මේ ප්‍රහාරය එල්ල වුණාට පසුව තමයි ඒගොල්ලන්ට ඒක

මතක් වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත්, මේ යෝජනාව ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක කිසිම සාකච්ඡාවක් ජනතා විමුක්ති පෙරමුණේ කිසිම නායකයෙක් කරලා නැහැ. මේ විශ්වාස භංග යෝජනාව දිනන්න අවශ්‍ය නම්, එහෙම සාකච්ඡාවක් කරන්න තිබුණා. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ දිනන්න නොවෙයි කියලා මම හිතනවා. "එපා වාහෙට හොදි බෙදනවා වාගේ" කියලා කියමනක් තිබෙනවා. ඒ විධියට ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් බවට මේක පත් වෙලා තිබෙනවා.

ඒ කෙසේ වෙතත් ආණ්ඩුව කෙරෙහි ජනතාව තුළ තිබෙන විරෝධය නතර වෙලා නැහැ. ඒ නිසා ආණ්ඩුවට විරුද්ධව පියවර ගන්න කොට, ආණ්ඩුවට විරුද්ධව සිටින සියලු බලවේග එකට එකතු වෙලා වැඩ කළ යුතුයි කියන ස්ථාවරයේ තමයි අපි සිටින්නේ. ඒ නිසා විවිධ පෞද්ගලික ප්‍රශ්න සියල්ල පැත්තකට විසි කරලා, මේ ක්‍රියාත්මක වන සිද්ධිවලට විරුද්ධව වැඩ කරනවා නම්, ඒක තමයි විපක්ෂයේ කාර්යභාරය විධියට මම දකින්නේ.

කෙසේ වෙතත්, අපේ තිලක් මාරපන මැතිතුමා කියපු කාරණය ඇත්තටම ටිකක් විහිළුවට ලක් වෙන කාරණයක් බවට පත් වුණා. එතුමා කියනවා, "මේ ACSA ගිවිසුම් නැති වුණත් මේ කට්ටිය එනවා" කියලා. එහෙම එන්න පුළුවන් නම් මේ රටේ නීතියක් තියෙන්න ඕනෑ නැහැ නේ. ජපන් හමුදාව මේ රටට ඇවිල්ලා බැහැලා පාර දිගේ ඇවිදිනවා නම්, ජපන් හමුදාවට මේ රටේ නීතියක් නැද්ද? මේ රටේ නීතියක් හදාගත්තේ නැත්නම්, ඉන්දියාවේ අයට ඇවිල්ලා සපත්තු දාගෙන, weapons අරගෙන පාරවල් දිගේ ඇවිදගෙන යන්න පුළුවන්ද? එහෙම නීතියක් නැතිවුණොත් අපේ ස්වෛරීත්වය මොකක්ද? මේ රට අපේ නොවෙයිද? රටේ ස්වෛරීත්වයක් නැද්ද?

දැන් මේ ACSA එක "මැක්සා" කරලා තියෙන එකයි මෙතැන වෙලා තියෙන්නේ. ඉස්සරවෙලා ACSA ගැහුවා. ACSA එක "මැක්සා" කරලා, SOFA ගෙනැල්ලා තියෙනවා. [බාධා කිරීමක්] ඔව්, ඒක තමයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ ඒක. අපි ඒකයි කියන්නේ, තමුන්නාන්සේලා මේ කරුණු සාකච්ඡා කළා, ඒවාට එකඟ වුණා කියලා. මේ SOFA එක තුළ, බොහොම පැහැදිලිව ඇමෙරිකන් හමුදාව දැනටමත් මේ රටට ගොඩ බැහැලා වැඩ කරගෙන යනවා. රටේ ආණ්ඩුව, ඒවා අපේ නොවෙයි වාගේ පාඩුවේ ඉන්නවා. ඇමෙරිකන් හමුදාව කටුනායකින් ගොඩ බහිනවා. ගොඩ බැහැලා යනවා ත්‍රිකුණාමලයට. ගිය සතියේ ඇමෙරිකන් නිලධාරින් තෙලිප්පලෙයි ප්‍රදේශයට ගිහිල්ලා බැලුවා. ඒවා කවුරුවත් කල්පනා කරන්නේ නැහැ. තමුන්නාන්සේලාට ඇමෙරිකාවෙන් නොවෙයි, කොහෙන් කට්ටියක් ඇවිල්ලා ගොඩ බැස්සත් ප්‍රශ්නයක් නැහැ, ආණ්ඩුව තියෙනවා නම්. ඒක තමයි වෙලා තියෙන්නේ.

ඒ නිසා, මේ ක්‍රියාදාමය තුළ මේ ගිවිසුම් කවුරු අත්සන් කළත් මේ රටේ වග කීමක් තියෙනවා කියලා අපි කියන්න කැමැතියි. අපි මේ ගිවිසුම් ගැන සාකච්ඡා කරනකොට මේවායින් මොනවාද වෙන්නේ කියලා බලන්න ඕනෑ. මීට කලින් මම මේ ඇමෙරිකන් ගිවිසුම් ගැන කථා කළා. ඉතිහාසයේ ඉඳලා මේ සම්බන්ධ තත්ත්වය අපි දැකලා තියෙනවා. එදා Voice of America - ඇමෙරිකන් හඬ- මේ රටට ගෙනාවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණු කාල වකවානුවේයි. ඊළඟට, ඒ ක්‍රියාදාමය දිගටම 1994 වෙනකල් ගිහිල්ලා 1995දී තමයි ACSA එක, එහෙම නැත්නම් SOFA ගිවිසුම් ගැන කථා කරන්න පටන් ගත්තේ. මේ ගිවිසුම් අත්සන් කළා නම්, අපේ රටට එන පිටරටක හමුදාවේ ඕනෑම කෙනෙක් කරන සෑම මානව විරෝධී වැඩක් සම්බන්ධයෙන් ඒ ගොල්ලන්ට විරුද්ධව තීන්දුවක් ගන්න බැහැ. ඒක තමයි තත්ත්වය. මේ ගිවිසුමේ තියෙන භයානකකම කල්පනා කරන්නේ නැතිවයි තමුන්නාන්සේලා කථා කරන්නේ. ජපානයේ මේ වාගේ දේවල් සිද්ධ වෙලා තිබෙනවා. ඇමෙරිකානු හමුදාවේ සෙබළෙක් ජපානයේ ඔකිනාවාවල කාන්තාවක් දූෂණය කළ අවස්ථාවක ඔහුට විරුද්ධව ගන්න පියවරක් තිබුණේ නැහැ. ඒ නිසා අපි මේ සියලු ගිවිසුම් අත්සන් කරනකොට ආණ්ඩුවක් විධියට නොවෙයි, රටක් විධියට කල්පනා කරන්න ඕනෑය කියලා මම හිතනවා. ආණ්ඩුවේද, විපක්ෂයේද කියලා ප්‍රශ්නයක් නැහැ, රටේ පැවැත්ම සම්බන්ධව අපි සියලුදෙනාටම වගකීමක් තිබෙනවා. ඒ නිසා තමයි අපි කිව්වේ, මේ සම්බන්ධව වැඩ කරනවා නම් කරුණාකරලා ඒ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. එහෙම ඉදිරිපත් කරලා, සාකච්ඡා කරලා අවශ්‍ය දේ කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

ඊළඟට, මම මේ කාරණයත් කියන්න කැමැතියි. අද උදේ අපේ කිරිඇල්ල ඇමතිතුමා කිව්වා, මේ ප්‍රහාරය ගැන තොරතුරු මොනවත් දැනගෙන හිටියේ නැහැ කියලා. නමුත්, මේ සිද්ධිය වුණාම මේ සභාවේදීම කිරිඇල්ල ඇමතිතුමා නැඟිටලා කිව්වා, 4 වැනි දා වන විට තොරතුරු දන්නවා කියලා. "4 වැනි දා මේවා දැනගෙන හිටියා, අපි දන්නවා" කිව්වා. දැන් කියනවා, "කවුරුවත් තොරතුරු දැනගෙන හිටියේ නැහැ, එම නිසා අපට මොකුත් කියන්න එපා" කියලා. මම එදාත් නැඟිටලා ඇහුවා, මේ බුද්ධි අංශයට තොරතුරු ආපු රටට කියන්න කියලා. එහෙම කිව්වේත් නැහැ. තොරතුරු දැනගෙන හිටියා, වැඩ කරලා තිබුණේ නැහැ කිව්වා. ඒ සම්බන්ධව අද ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා.

ඒ වාගේම, ඒ ක්‍රියාදාමය තුළ ඇති වුණු සිද්ධිවලට එක්කෙනෙක්, දෙන්නෙක් නොවෙයි, ආණ්ඩුවේ සියලුදෙනාම වග කියන්න ඕනෑ. එහෙම නැතිව දැන් අරයාට මෙයාට, අර පැත්තට මේ පැත්තට බෝලය පාස් කරගන්නවා, කොමිටි හදාගන්නවා. ඒ කොමිටි ඇතුළේ සමහර අය නිදහස් කරගන්නවා. ආපහු ඒ අයත් එක්ක සාකච්ඡා කරනවා. ඊළඟට ඇමතිකම්වලින් ඉවත් වෙනවා. ආයේ ඇමති තනතුරු ගන්නවා. මේක දැන් නාඩගමක් වාගේ වෙලා තිබෙන්නේ. ඒ නිසා මම කියන්න කැමැතියි, කරුණාකරලා මේ ක්‍රියාදාමය,- [බාධා කිරීමක්] නැහැ ඉතින්, ඔබතුමන්ලා "ඔක්තෝබර් 26ට" සහයෝගය දුන්නා, - [බාධා කිරීමක්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා තමයි රනිල් වික්‍රමසිංහගෙන් ඇමතිකම් අරගෙන රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවේ අවුරුදු හතරක් හිටියේ. දැන් ජනතාවගේ විශ්වාස භංග,- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක අපි,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කථා කරන්නේ නැතිව ඉන්න කෝ. ඒක අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට ගත්ත තීන්දුවක්. ජනතා විමුක්ති පෙරමුණ ගිහිල්ලා ආණ්ඩුව රැක්කා. මතක තියාගන්න. ඒ අවුරුදු හතරේ ආණ්ඩුව වැඩ කරන හැටි අපි දැනගත්තා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් විධියට අපි වැඩ කළා. ඒක අපි පක්ෂය විධියට ගත්ත තීන්දුවක්. හරිද? තමුන්නාන්සේලා වාගේ හොරෙන් ගිහිල්ලා එක එක්කෙනාගේ සල්ලිවලට අපි යටත් වුණේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ පාර්ලිමේන්තුවේ බහුතරය නැතිව තියෙද්දී තමුන්නාන්සේලා තමයි ගිහිල්ලා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකකම ගත්තේ. මතක තියාගන්න. සාමාන්‍යයෙන්, එහෙම හයදෙනෙක් ඉන්න කණ්ඩායමකට ඒ තනතුර දෙන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ කොහොමද ඒ තනතුර ගත්තේ? විපක්ෂයේ ප්‍රධාන සංවිධායකකම ගත්තේ කොහොමද? ඔබතුමන්ලා ආණ්ඩුව රැක්කේ කොහොමද, රකින්න පෙළපාළි ගියේ කොහොමද? දැන් තමුන්නාන්සේලා මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනා ගෙනෙනවා.

ලජ්ජාවක් තිබෙන්න ඕනෑ. ඔක්තෝබර් 26වන දා එළියට බැහැලා, මේ ආණ්ඩුව රකින්න කරන්න තිබෙන ඔක්කොම දේවල් කරලාදැන් හීනෙන් නැඟිට්ටා වාගේ ලජ්ජා නැතිව කථා කරනවා. මේ විධියට බෝම්බ පිපිරුවේත් ජනතා විමුක්ති පෙරමුණ කළ ඒ විනාශය නිසායි. ඔක්තෝබර් 26වන දා ඒ ආණ්ඩුව පවත්වාගෙන යන්න ඉඩ දුන්නා නම්, සහරාන්ලා බෝම්බ ගහන්නේත් නැහැ, වෙන කවුරුවත් බෝම්බ ගහන්නේත් නැහැ, මෙවැනි විශ්වාස භංග යෝජනා ගෙනෙන්න ඕනෑත් නැහැ. සහරාන්ලා බෝම්බ ගහන්න ජනතා විමුක්ති පෙරමුණ කරපු ඒ දෙයත් හේතුවක් වුණා. ජනතා විමුක්ති පෙරමුණ තමයි සහරාන්ලාට බෝම්බ ගහන්න අවශ්‍ය කරන පදනම හදා දුන්නේ. ඒ බව මතක තියා ගන්න. මේ රටේ ජාතික ආරක්ෂාව සම්පූර්ණයෙන්ම විනාශ කරලා, ඒ සියල්ල කරන්න ඉඩ දීලා, පෙරළපු ආණ්ඩුව ආපසු පත්කරගෙන, ඒ සඳහා ඡන්දය දීලා, ඇහෙන ශබ්දයෙන්, එහෙම නැත්නම් හඬේ ශබ්දයට ඡන්දය දෙන්න කියලා, කථානායකතුමා ළඟට දුවගෙන ගිහින් එක දවසින් විශ්වාස භංග යෝජනාව භාර දුන්නා. දැන් ලජ්ජා නැතිව තව කථා කරනවා.

මේ සභාවේ මිරිස් කුඩු ගහගත්තේත් ජනතා විමුක්ති පෙරමුණ කළ පිස්සු වැඩ නිසායි. ඔබතුමන්ලා දැන් ලජ්ජා නැතිව මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනා ගෙනෙනවා. ආණ්ඩුවත් එක්ක සිටියා නම් කරුණාකරලා ඒ විධියටම ආණ්ඩුවත් එක්ක ඉන්න. දැන් මෙතැනට ඇවිල්ලා ලජ්ජා නැතිව කථා කරනවා. ඒකයි අපි කිව්වේ. ඒවා වහගන්න, අලුත් ආණ්ඩු විරෝධයක් හදන්න දැන් පෙළපාළි ගිහින් වැඩක් වෙන්නේ නැහැ. පෙළපාළි යන්න තිබුණේ එදායි.

ඔබතුමන්ලා ඊබ්‍රාහිම් ළඟ තබාගෙන සිටියා. ඊබ්‍රාහිම් ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවට ඇතුළත් කරගෙන තිබුණා. වැඩේ කරලා ඉවර වෙලා ඒ වැඩේ ගැන කථා කරන්න එපාය කියන කාරණයත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කේ.කේ. පියදාස මන්ත්‍රීතුමා.

Order, please!

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. K. THURAIRETNASINGAM *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

[අ.භා.4.32]

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වාසය කඩකර තිබෙනවාය කියන කාරණය සම්බන්ධයෙන් ගරු අගමැතිතුමාට සහ අපේ රජයට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කර තිබෙන මේ විශ්වාස භංග යෝජනාව කරුණු කාරණා 8ක් හෝ 10ක් සමඟ ඉදිරිපත් කර තිබෙනවා. අප්‍රේල් මාසයේ 21වන දා, පාස්කු ඉරිදා සිදු වුණු සිද්ධිය ගැන විශේෂයෙන්ම රජයක් හැටියට අපි කනගාටුවට පත්වෙනවා. අපි මේ තොරතුරු දැනගෙන හිටියා නම් ඒ මනුෂ්‍ය ඝාතන සිද්ධවන තැනකට මේ රට ගෙන යන්නට ඉඩ දෙන්නේ නැහැ. මේ සිද්ධිය අපි දැනගෙන සිටි දෙයක් නොවෙයි. මේවා අද ඊයේ වුණු දේවල් නොවෙයි. 2014 වර්ෂයට පෙර සිටම සහරාන්ගේ සංවිධානය මේ රටේ පැවතිලා තිබෙනවා. තැනින් තැන ඒ සංවිධාන පවත්වාගෙන ගිහින් තිබෙනවා. නුවරඑළියේත් මේ අයගේ පුහුණු මධ්‍යස්ථානයක් තිබිලා අහුවුණා. ඒ සම්බන්ධයෙන් කටයුතු කර තිබෙනවා. නුවරඑළියට බෝම්බයකුත් ගෙන ගිහින් තිබෙනවා, පුපුරවන්න. නමුත් ප්‍රමාද වීමකින් ඒක පුපුරවන්න බැරිවෙලා තිබෙනවා. එය පිපිරුණා නම් එතැනත් විනාශයක් ඇතිවෙන්න ඉඩ තිබුණා. කරුණු කාරණා සොයාගෙන ගිහින්, පැය 48ක් වැනි කාලයක් තුළ ඒක සම්පූර්ණයෙන්ම නතර කරන්න ආරක්ෂක හමුදාව කටයුතු කළා. ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරක්ෂක මණ්ඩලය රැස්වෙලා සාකච්ඡා කරලා, ඒ සම්බන්ධයෙන් පියවර ගත්තා. ඒ පියවර තුළින් දැන් මේ රට සාමාන්‍ය තත්ත්වයට පත් කර තිබෙනවා. නමුත් සමහර අය දිගින් දිගටම, දිගින් දිගටම ඒ කරුණු මතු කරලා, රජය අපහසුවට පත් කර තිබෙනවා. රටේ සංවර්ධන කටයුතු සිදු කරමින්, ජනතාවට විශ්වාසයක් ඇතිව මේ රට ඉදිරියට ගෙනයන්න පුළුවන් මාර්ගයක් ඇති කරලා තිබෙන අවස්ථාවකදී මෙවැනි විශ්වාස භංග යෝජනා ගෙනැවිත් රජය අපහසුතාවට පත් කරන්නේ නැතිව, රජය ගෙනයන හොඳ වැඩ කටයුතුවලට තමුන්නාන්සේලා සහයෝගය දෙනවා නම්, මීට වඩා හොඳයි කියන කාරණය මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරනවා.

යම් යම් වැඩසටහන් ක්‍රියාත්මක කරගෙන යන අවස්ථාවල ඒවා කඩාකප්පල් කිරීමේ වැඩ පිළිවෙළක් තමයි පසුගිය අවුරුදු

හතර තුළම මා දැක්කේ. යහපත් දෙයට යහපත් ප්‍රතිචාරයක් තමුන්නාන්සේලාගෙන් ලැබෙන්නේ නැහැ. මේ රජය පසුගිය අවුරුදු හතරක කාලය තුළ සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර තිබෙනවා. අප්‍රේල් 21වන දා වුණු සිද්ධියට වඩා වැඩි දේවල් මීට කලින් මේ රටේ සිද්ධවෙලා තිබෙනවා.

1971දී මේ රටේ කැරැල්ලක් ඇති වුණා. ඒකෙන් විශාල පිරිසක් මිය ගියා. 1983දී තව ප්‍රශ්නයක් ඇති වුණා. 1988දීත් තව ප්‍රශ්නයක් ඇති වුණා. මෙවැනි ප්‍රශ්න මේ රටේ ඇති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අවුරුදු තිහක් තිස්සේ මේ රටේ යුද්ධයක් තිබුණා. ඒ වාගේ දේවල් ඇති වෙලා, ඇති වෙලා රට ඉස්සරහට ඇවිත් තිබෙනවා. මේ සිද්ධියත් සුළු දෙයක් විධියට අපි සලකන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේලා මෙන්න මේ ගැන හිතන්න ඕනෑ. මුස්ලිම් ජනතාවත් සමඟ අපි මේ රටේ සහෝදරත්වයෙන් ජීවත් වෙනවා. ද්‍රවිඩ ජනතාව සමඟත් අපි මේ රටේ සහෝදරත්වයෙන් ජීවත් වෙනවා. අපි කවුරුත් සහෝදරත්වයෙන් ජීවත් වෙන මේ රටේ මේ වාගේ ප්‍රශ්න ඇති වෙනකොට ඒ ප්‍රශ්න නිරාකරණය කර ගන්නට අපි එකට එකතු වෙලා යම්කිසි වැඩ පිළිවෙළක් යොදනවාද, එසේ නැත්නම් රට විනාශ කරන්න හිතාගෙන රට අරාජික කරලා, මේ රට ලෝකයෙන් කොන් කරන වැඩ පිළිවෙළකට යනවාද කියන එක තමයි මේ අවස්ථාවේදී මට තමුන්නාන්සේලාගෙන් අහන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඉතිහාස කථාවක් මම දැන් කියන්නම්. ඒ කාලයේ මහවැලි ගඟේ පෙට්ටියක් පා වෙලා ආවා. ඒ පෙට්ටිය පා වෙලා එන කොට කාන්තාවන් පිරිසක් ඒ තොටුපොළේ රෙදි සෝදමින්, නාමින් සිටියා. එතැන සිංහල අයයි, මුස්ලිම් අයයි දෙගොල්ලන්ම සිටියා. මේ පෙට්ටිය පා වී එනවා දැකලා මේ කාන්තාවන් පිරිස කණ්ඩායම් දෙකකට බෙදිලා, පෙට්ටිය ඉල්ලුවා සිංහල කාන්තාවන්. මුස්ලිම් කාන්තාවන් එම පෙට්ටිය ඇතුළේ තිබෙන දේ ඉල්ලුවා. එම පෙට්ටිය ඇරලා බලනකොට පෙට්ටිය ඇතුළේ තිබුණේ, බිසෝ බණ්ඩාර දේවියගේ මළ කඳයි. බිසෝ බණ්ඩාර දේවිය මරලා මළ කඳ පෙට්ටිය ඇතුළේ දමලා මහවැලි ගඟේ පා කර එවා තිබුණා. ඒ මළ කඳ උස්සාගෙන ඇවිත් කහටපිටියේ පල්ලියේ තිබ්බා. මළ කඳ පල්ලියේ තියලා මුස්ලිම් අය වැඳුම් පිදුම් කළා. සිංහල අයත් එතැනට ගියා. ඉතින් මොකක්ද වෙනස? ත්‍රස්තවාදීන්ට දඬුවම් දෙනවා නම්, මුස්ලිම් සහෝදරයෝ හැම කෙනෙක්ම ඒකට එකතු වෙනවා. ඒකට කිසිම විධියකින් පැකිළෙන්නේ නැහැ. අපි මුස්ලිම් ජනතාවත් එක්ක සහෝදරත්වයෙන් මේ රටේ ජීවත් වෙලා තිබෙනවා. අදත් ඒ විධියට ජීවත් වෙනවා. එහි කිසිම වෙනසක් නැහැ.

මේ හොර ත්‍රස්තවාදී කණ්ඩායම් මේ රටෙන් තුරන් කරන්නට දැන් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ත්‍රිවිධ හමුදාව හා පොලීසිය මැදිහත් වෙලා, බුද්ධි අංශත් ඉතා හොඳින් වැඩ කටයුතු කරලා අද මේ රට හොඳ තත්ත්වයකට ගෙනැවිත් තිබෙනවා. සමහර අවස්ථාවලදී ඒවාට බාධක මතු වුණු නිසා තමයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒ ප්‍රශ්න නිරාකරණය කර ගන්නට විශේෂ කාරක සභාවක් පත් කරලා තිබෙනවා. සමහර අය මේ විශේෂ කාරක සභාව පිළිගන්නේ නැහැ. සාක්ෂි දෙන්න එතුමන්ලා ඒ කාරක සභාවට එන්නේ නැහැ. අපට අවශ්‍ය විධියට ඒ විශේෂ කාරක සභාව පත් කර ගෙන, නඩු අහලා අපි චූදිතයන් එළියට දමනවාය කියන කථාවක් මෙතැන ඇති කර තිබෙනවා. එය මේ රටට දෙන යහපත් පණිවුඩයක් නොවේය කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

විශේෂයෙන්, අපි මෙන්න මේ දෙය ආදර්ශයට ගන්නට ඕනෑ. අපේ පක්ෂයේ සභාපතිතුමා වන ගරු කබීර් හෂීම් ඇමතිතුමා, මේ සිද්ධිය ආරම්භයේ සිටම ඒ පරීක්ෂණ කටයුතුවලට සම්පූර්ණයෙන්ම උදවු උපකාර කර තිබෙනවා. එතුමාගේ ලේකම්වරයා වෙඩි පහරට ලක් වෙලාත් ඒ කිසිවකින් පැකිළෙන්නේ නැතිව, නොබියව ඒවාට මුහුණ දීලා එතුමා මේ කටයුතුවලට උදවු උපකාර කර තිබෙනවා. අනික් අයත් එහෙමයි. හැම කෙනෙක්ම මේ සිද්ධියේදී සහයෝගයෙන් එකතු වෙලා ඒ පරීක්ෂණ කටයුතුවලට උදවු කර තිබෙනවා. එහෙම තියෙද්දීත්, අපේ රජයට විරුද්ධව මෙතුමන්ලා විශ්වාස භංග යෝජනා ගෙනෙනවා. විශ්වාස භංග යෝජනා නොවෙයි, ඊට වඩා තව ලොකු දේවල් ගෙනාවත් භය නැතිව අපි ඒවාට මුහුණ දෙනවාය කියන කාරණය මම මතක් කරන්න කැමැතියි. ඒ සියල්ලටම මුහුණ දීලා රට ජයග්‍රහණය කරා ගෙන යන්නට අපි සියලුදෙනාම එකට ඉදිමින් සහයෝගය දෙනවාය කියන කාරණයත් මම විශේෂයෙන් මතක් කරනවා. මේ සියලු ප්‍රශ්නවලට මුහුණ දීලා, අපේ ආණ්ඩු කාලය තුළ මේ රට ඉදිරියට ගෙන යනවාය කියන කාරණයත් සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 07ක කාලයක් තිබෙනවා.

[පි.ව. 4.39]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்கள் விடுதலை முன்னணியினால் இந்த அரசாங்கத்திற்கு எதிராகக் கொண்டுவரப்பட்டிருக்கின்ற நம்பிக்கையில்லாத் தீர்மானத்திலே எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இந்தச் சபையில் மீண்டும் ஒரு நம்பிக்கையில்லாத் தீர்மான நாடகம் அரங்கேற்றப்படுகின்றது. இந்தச் சபை அரசியலமைப்புச் சபையாக மாற்றப்பட்டதும், பின்னர் புதிய அரசியல் யாப்புக்காக இடைக்கால அறிக்கை கையளிக்கப்பட்டதும், அதனைத் தொடர்ந்து இடம்பெற்ற நிகழ்வுகளும் தமிழ் மக்களின் தேசிய இனப்பிரச்சினையை இழுத்தடிப்பதற்காக அனைத்துத் தரப்பினராலும் மேற்கொள்ளப்பட்ட திட்டமிட்ட நாடகங்கள் என்பது தெளிவாகின்றது. இதுவரை காலமும் இந்நாட்டில் மாறி மாறி ஆட்சி செய்து வந்த கட்சிகளின் அரசாங்கங்களும் ஆட்சியாளர்களும் தமிழ் மக்களின் நலன்களில் அக்கறை செலுத்தத் தவறிவிட்டனர் என்று சுயவிமர்சனம் செய்து, நல்லாட்சி அரசாங்கம் என்ற பெயரில் இந்நாட்டின் இரண்டு பிரதான கட்சிகளும் இணைந்து ஆட்சி அமைத்தனர். இதன் பயனாகச் சர்வதேச சமுதாயத்திடமிருந்து இந்த ஆட்சிக்கு நற்பெயர் கிட்டியது. அதற்குத் தமிழ்த் தேசியக் கூட்டமைப்பு ஆதரவும் வழங்கியிருந்தது. ஆனால், கடந்த நான்கரை வருட காலப்பகுதியிலே இந்த அரசாங்கம் எமது தேசிய இனப்பிரச்சினையைத் தீர்ப்பதற்கு இதயசுத்தியுடன் செயற்படவில்லை என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

தமிழ்த் தேசியக் கூட்டமைப்பின் நிபந்தனையற்ற ஆதரவைப் பெற்றுக்கொண்ட இந்த அரசாங்கம் கடந்த ஆட்சியாளர்களைக் காப்பதிலும் தமிழர்களின் தேசிய இனப்பிரச்சினையை இழுத்தடிப்பதிலுமே இன்னமும் குறியாக இருக்கின்றது. ஆகவே, அரசாங்கம் நாட்டு மக்களுக்கு குறிப்பாக, தமிழ் மக்களுக்கு வழங்கிய வாக்குறுதிகளுக்கமைய

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

பெற்றுக்கொண்ட மக்களின் ஆணைகளிலிருந்து விலகிச் சென்றுள்ளது. அதனைப்போன்றே புதிய அரசாங்கத்தினூடாக புதிய அரசியல் யாப்பைத் தயாரித்து தமிழ் மக்களின் தேசிய இனப்பிரச்சினைக்கு நிரந்தர அரசியல் தீர்வைப் பெற்றுக் கொடுப்போம் என்று வாக்குறுதி அளித்து தமிழ்த் தேசியக் கூட்டமைப்பு தமிழ் மக்களின் வாக்குகளைப் பெற்றுக் கொண்டது. ஆனால், நாளாந்தப் பிரச்சினை தொடக்கம் அரசியல் தீர்வுவரை அனைத்தையும் பெற்றுக்கொள்வதற்கு அரசாங்கத்திற்கு உரிய அழுத்தங்களைப் பிரயோகிக்கத் தவறி, இன்று மக்களின் ஆணையையும் மீறியுள்ளது. சமஷ்டித் தீர்வைப் பெற்றுக்கொடுப்பதாகக் கூறி, மக்களின் ஆணையைப் பெற்றுக்கொண்ட தமிழ்த் தேசியக் கூட்டமைப்பு 'கம்பெரலிய', பனை அபிவிருத்தி போன்ற அற்பசொற்ப சலுகைகளைப் பெற்றுக்கொண்டு இந்த அரசாங்கத்துக்குத் தொடர்ந்தும் முண்டுகொடுத்து வருகின்றது.

கடந்த ஆண்டின் இறுதிப் பகுதியில் பிரதமருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணையின்மீதான வாக்கெடுப்புக்கு முன்னர் நாம் சில கோரிக்கைகளை முன்வைத்திருந்தோம். பிரதமரும் அதனைத் தனது செயலாளருக்குத் தெரிவித்து, உரிய நடவடிக்கை எடுக்குமாறு கூறியிருந்தார். ஆனால், நாம் குறிப்பிட்ட எந்த விடயத்தையும் பிரதமர் நிறைவேற்றாத துடன், அவரது பதவி காப்பாற்றப்பட்டதன் பின்னரே திருகோணமலை மாவட்டத்தில் கன்னியா வெந்நீரூற்று மற்றும் முல்லைத்தீவின் நீராவியடிப் பிள்ளையார் ஆலயம் ஆகியவற்றில் புத்தர் சிலையை வைத்து அவற்றை வலுக்கட்டாயமாக பௌத்த சமய வழிபாட்டிடங்களாக மாற்றும் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளது. அரசியற் கைதிகளின் விடுதலை, காணாமலாக்கப்பட்டோருக்கான பொறுப்புக் கூறல், காணிகளை விடுவித்தல் தொடர்பில் விரைந்து நடவடிக்கை மேற்கொள்ளல் போன்ற விடயங்களை நாம் சுட்டிக்காட்டியபோது, ஆவன செய்வதாகப் பிரதமரும் உறுதியளித்திருந்தார். ஆனால், அவை எவையுமே நடைபெறவில்லை. அரசியற்கைதிகள் விடயத்தில் ஒருவித அணுகுமுறையையும் தனது பாதுகாப்புத் தரப்பினர் விடயத்தில் இன்னுமொரு அணுகுமுறையையும் இந்த அரசாங்கம் கடைப்பிடிக்கின்றது. "குற்றமிழைத்தவர்கள் எத்தகைய பதவிநிலையில் இருந்தாலும் அவர்களைச் சட்டத்தின் முன் நிறுத்தித் தண்டனை பெற்றுக் கொடுப்போம்" என்று முன்னர் கூறியவர்கள், "ஒரு சிப்பாயைக்கூடச் சட்டத்தின் முன் நிறுத்த இடமளிக்கமாட்டோம்" என்று தெளிவாகக் கூறிவருகின்றனர். அதனையே நடைமுறைப் படுத்தவும் செய்கின்றனர்.

எமது மக்களுக்கான நீதி உள்நாட்டில் கிடைக்காது என்பது தற்பொழுது திட்டவட்டமாக நிரூபிக்கப்பட்டுள்ளது. அரசியற்தீர்வு விடயத்திலும் இவர்கள் இதய சுத்தியுடன் செயற்படுவதாகத் தெரியவில்லை. இன்னும் சொல்லப் போனால், இது சிங்கள நாடு என்றும் ஏனையவர்கள் அவர்கள் தயவில் தங்கியிருக்க வேண்டியவர்கள் என்றும் பௌத்த பிக்குகள் பிரச்சாரம் செய்கின்றனர். அவர்களின் பிரச்சாரத்திற்கு இன்றுவரை இந்த அரசாங்கம் பதில் வழங்கவில்லை. வடக்கு, கிழக்கு அபிவிருத்தி தொடர்பில் நாம் முன்வைத்த சில நல்ல திட்டங்களைக்கூட இந்த அரசாங்கம் முன்னெடுக்க விரும்பவில்லை. கடந்த முறை பிரதமரை ஆதரிப்பதற்காக நானும் எனது கட்சியின் தலைவரும் முன்வைத்த நிபந்தனையின் பின்னரே தமிழ்த்தேசியக் கூட்டமைப்பினரும் சில கோரிக்கைகளை முன்வைத்திருந் தனர். தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் வழங்கிய ஆதரவினாலேயே இன்றைய அரசாங்கம் இன்னமும் பதவியில் தொடரமுடிகின்றது. ஆனால், பிரதமரும் அவரது தலைமையிலான அமைச்சர்களும் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரின் ஆதரவைப் பெற்றுக்கொண்டபோதிலும், எமது பிரதேசங்களில் மேற்கொள்ளப்பட்ட திட்டமிட்ட சிங்களக் குடியேற்றங்களையோ அல்லது வலுக்கட்டாயமான பௌத்தமயமாக்கலையோ அல்லது அரசாங்கத் திணைக்களங்களினால் மேற்கொள்ளப்படும் காணி அபகரிப் புக்களையோ தடுக்க முடியாதவர்களாகவே உள்ளனர். இந்நிலையில், இந்த அரசாங்கம் தொடர்ந்து பதவியில் இருந்தால் என்ன? இல்லாவிட்டால் என்ன? எமது பிரதிநிதிகளின் ஆதரவைப் பெற்றுவிட்டு எமது மக்களின் நலனில் அக்கறை செலுத்தாத அரசாங்கத்தை ஏன் நாம் காப்பற்றவேண்டும்?

கடந்த ஜனாதிபதித் தேர்தலின்போதும் பொதுத்தேர்தலின் போதும் நல்லாட்சியூடாக நாட்டின் அனைத்துப் பிரச்சினை களுக்கும் தீர்வுகாணப்படும் என்றும் அனைவரும் நாட்டுப் பற்றுடன் ஒன்றிணைந்து நாட்டைக் கட்டியெழுப்புவோம் என்றும் வாக்குறுதி அளிக்கப்பட்டது. ஆனால், இன்று கடந்த ஆட்சியாளர்களையும் படையினரையும் காப்பாற்றிவிட்ட திருப்தியிலே நீங்கள் தனித்தனியாகப் பிரிந்து நின்று இந்த நாட்டிலே புரையோடிப்போயுள்ள தேசிய இனப் பிரச்சினைக்கான தீர்வைப் புறக்கணிக்க முயல்கின்றீர்கள். இரண்டு பிரதான கட்சிகளும் இணைந்து நீடித்து நிற்கக்கூடிய அரசியல் தீர்வை முன்வைக்க வேண்டும் என்பதற்காகவே நாமும் எமது மக்களின் வாக்கினை உங்களுக்குப் பெற்றுக் கொடுத்தோம். ஆனால், நீங்கள் உங்கள் நலன்களுக்கு மட்டுமே முக்கியத்துவமளித்து, நாட்டைப் பற்றியும் அழிவின் விளிம்பு நிலையில் இருக்கும் தமிழ்த் தேசிய இனம் பற்றியும் அக்கறையில்லாமல் இருக்கின்றீர்கள். ஆகவே, நீங்கள் பதவியில் இருப்பதும் இல்லாதிருப்பதும் எங்களைப் பொறுத்த வரை ஒன்றே! இந்த அரசாங்கத்தைக் காப்பாற்றவேண்டிய எந்தவொரு தேவையும் எமக்கில்லை என்பதை நான் இந்தச் சபையில் பதிவுசெய்ய விரும்புகின்றேன். தமிழ் மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதாகக்கூறி ஆணையைப் பெற்றுக் கொண்ட எவரும் இந்த அரசாங்கத்தை ஆதரித்து வாக்களிக்கமாட்டார்கள் என்று நான் நினைக்கின்றேன். அப்படி வாக்களித்தால் அவர்களுக்கு வேறு தேவைகள் இருப்பதாகவே பொருள்படும் என்று கூறி, விடைபெறுகின்றேன்.

[பி.ப. 4.46]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கத்திற்கு எதிராக மக்கள் விடுதலை முன்னணியினால் முன்வைக்கப்பட்டிருக்கும் நம்பிக்கையில்லாப் பிரேரணை மீது உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன். குறிப்பாக, கடந்த ஏப்ரல் மாதம் 21ஆம் திகதி இடம்பெற்ற ஈஸ்டர் தாக்குதலுடன் தொடர்பு டையதாக, அது தொடர்பான தகவல்கள் உளவுத்துறை யினருக்குத் தெரிந்திருந்தபோதும்கூட அதுபற்றி உரிய நடவடிக்கை எடுக்கவில்லை என்ற காரணத்தைக் காட்டி, அரசாங்கத்துக்கு எதிராக இந்த நம்பிக்கையில்லாப் பிரேரணை முன்வைக்கப்பட்டிருக்கிறது. இந்தச் சம்பவம் இடம்பெற்று அடுத்தடுத்த வாரங்களிலேயே இது தொடர்பாகப் பல கதைகள் இடம்பெற்ற நிலையில், தேசிய பாதுகாப்புக்குப் பொறுப்பான இராஜாங்க அமைச்சர் அவர்கள்,

இத்தகையதோர் அசம்பாவிதம் இடம்பெற்றமை சம்பந்தமாக அல்லது கவன யீனம் காரணமாக இவ்வாறான ஒரு சம்பவம் இடம்பெற்ற தாகப் பொதுவாகவே தேசிய ரீதியாக நாட்டு மக்களிடம் மன்னிப்புக் கோரியிருந்தார். அது உண்மையிலேயே ஏற்றுக்கொள்ள முடியாத ஒன்றாகும். நாங்கள் உளவுத் துறையைக் குற்றம்சாட்ட முடியாது. உளவுத்துறை அது தொடர்பாக அறிந்து அறிக்கையிட்டிருக் கிறது. யாருக்கு அதிகாரம் இருக்கிறதோ, அப்படிப்பட்ட அதிகாரம்மிக்கவர்கள் உரிய நடவடிக்கை எடுக்காத காரணத்தினாலேயே பல உயிர்கள் காவுகொள்ளப்பட்டிருக் கின்றன. அந்த உயிர்கள் காவு கொள்ளப்பட்டமை சம்பந்தமாகவும் இந்தத் தாக்குதலுடன் சம்பந்தப்பட்டவர்கள் முஸ்லிம் தரப்பினர் என்கின்ற காரணத்தினாலும் முழு முஸ்லிம் சமூகத்தையும் குறைகாண்கின்ற விடயம் ஒரு பக்கம் இருக்கிறது. அதனை நாங்கள் வன்மையாகக் கண்டிக்க வேண்டியிருக்கிறது. அதேநேரம் பாதிக்கப்பட்டவர்கள் கிறிஸ்தவர்கள் என்கின்ற அடிப்படையில், இது மத ரீதியாகவும் பார்க்கப்படுகின்றது. இவற்றுக்கெல்லாம் அப்பால், இன்னுமொரு பக்கமும் இருக்கிறது. அதாவது, இந்தத் தாக்குதலில் அதிகமாக உயிரிழந்தவர்கள் தமிழர்கள் என்பது பெரிதாகப் பேசப்படாமல் இருக்கிறது. அந்தப் பக்கமும் பேசப்படவேண்டுமென்று நாங்கள் நினைக்கிறோம். அந்த வகையில், தமிழர்கள் மிகப் பொறுமைசாலிகளாக இதனை அவதானித்துக்கொண்டிருக் கிறார்கள். காரணம், அவர்கள் கடந்த காலங்களிலே பல கசப்பான அனுபவங்களைப் பெற்றிருக்கிறார்கள். இந்த நாட்டிலே தொடர்ச்சியாக இடம்பெற்றுவந்த உள்நாட்டு யுத்தத்தினால் பாதிப்படைந்த வர்கள் என்ற வகையில், அதனோடு பாதிப்புக்களுக்கு உள்ளானவர்கள் என்ற வகையில், இன்னுமொரு யுத்தத்தையோ, அத்தகைய இன்னுமொரு சூழ்நிலையையோ அவர்கள் எதிர்கொள்ளத் தயாரில்லை. இதற்காகத் தேசிய ரீதியாக மன்னிப்புக் கோரப் பட்டிருக்கும் நிலையில், நாட்டில் 2015ஆம் ஆண்டுக்கு முன்பிருந்த சூழலிலிருந்து 2015ஆம் ஆண்டுக்குப் பின்னர் ஏற்படுத்திக் கொடுக்கப்பட்ட பல ஜனநாயகச் சந்தர்ப் பங்களைத் தமக்குச் சாதமமாக்கிக் கொண்டவர்கள் அதற்கு ஏற்றாற்போல் தங்களது திட்டத்தை நிறைவேற்றியுள்ள நிலையில், இதனைத் தேசிய ரீதியாக எவ்வாறு எதிர்கொள்வது என்பது சம்பந்தமாக நாங்கள் பார்க்க வேண்டியிருக்கிறது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

இன்று இந்த நாட்டுக்குத் தேவையானது என்ன? நம்பிக்கை இல்லாதவர்கள் யாரென அடையாளம் காண்பதா, அல்லது மக்கள் யார்மீது நம்பிக்கை கொள்வது என்பதை அடையாளம் காண்பதா? நாங்கள் யாரை நம்பிக்கையுடன் அடையாளம் காணப்போகிறோம்? அந்த வகையில், நம்பிக்கையில்லாப் பிரேரணையை முன்வைத்திருக்கக்கூடிய மக்கள் விடுதலை முன்னணியினர், இன்று நாட்டு மக்கள் எதிர்நோக்கியிருக்கும் நம்பிக்கைக்குரியவர்களை அடையாளம் காட்டுவதில் அக்கறை செலுத்துவது மிக முக்கியம் என்று நினைக்கிறேன். ஈஸ்டர் தாக்குதலுக்குப் பின்னதாக அவர்களால் வெளியிடப்பட்டிருக் கின்ற "நாட்டுக்கு முன் வைக்கின்ற விசேட ஆலோசனைகள்" என்ற கையேட்டில் பல்வேறு விடயங்கள் குறிப்பிடப்பட்டிருக் கின்றன. Truth and Reconciliation Commission - உண்மையைக் கண்டறியும் ஆணைக்குழு சம்பந்தமாக அவர்கள் அதிலே பரிந்துரைக் கிறார்கள். Commission against discrimination என்பது சம்பந்தமான பாகுபாட்டுக்கு எதிரான பிரேரணைகள் எனப் பல விடயங்களை முன்வைக் கின்றார்கள். Whistleblower Protection Act, Anti-Hate Act எனப் பல்வேறு சட்டங்கள் சம்பந்தமாகவும் பல்வேறு விடயங்கள் இதில் முன்வைக்கப் பட்டிருக்கின்றன. நானும் இதனை வாசித்தவன் என்ற வகையிலே, இதில் பல முற்போக்கான அம்சங்களைப் பார்க்கின்றேன். இருந்தபோதும் கூட, இந்த ஈஸ்டர் தாக்குதல்தான் நாட்டில் முதல் முதலாக நடந்த அசம்பாவிதச் சம்பவமல்ல. இதுபோல, கடந்த காலங்களில் பல அசம்பாவிதச் சம்பவங்கள் இடம்பெற்றிருக் கின்றன. எனவே, மக்கள்மயப் பட்ட மக்கள் விடுதலை முன்னணி போன்ற கட்சியினர், ஒரு சம்பவத்துக்கு மாத்திரம் உரித்தான ஆலோசனையாகவும் பதிலுரையாகவும் இல்லாது, இந்தக் கையேட்டில் "இலங்கை நாட்டில் அனைத்து மக்களும் ஒன்று சேர்ந்து வாழவேண்டும்" என அவர்கள் குறிப்பிட்டுள்ளதற்கமைய, நம்பிக்கை தரக்கூடிய பொதுவான அரசியல் நிகழ்ச்சிநிரலுடன்கூடிய அரசியல் முறைமை யொன்றைக் கட்டியெழுப்புவதற்கான விடயங்களை மக்கள் முன்வைக்கவேண்டுமென்ற வேண்டுகோளை விடுத்து, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා.4.51]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාවේ අන්තර්ගත කරුණු අපි සියලුදෙනා දන්නවා. ජාතික ආරක්ෂාව පිළිබඳ මෙම ප්‍රශ්නයේ අන්තර්ගත කරුණු අපි දන්නවා. ඒ වගේම, මෙය න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බව අපි දන්නවා. ඒ වාගේම මෙය විවාදයට ගන්නා දින නියම කර තිබෙන බව අපි දන්නවා. ඒ නිසා සාමාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන කාර්ය පටිපාටිය අනුගමනය කර තිබෙනවා. නමුත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කෙටි කාලීන ආණ්ඩුවට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත් මන්ත්‍රීතුමා ගෙනාපු විශ්වාස භංග යෝජනාව අපට මතකයි. එය න්‍යාය පත්‍රයේ සඳහන් වුණේ නැහැ; පක්ෂ නායක කමිටුවක සාකච්ඡා කළේ නැහැ; නිසි ක්‍රමවේදයක් යටතේ ඡන්දය විමසුවේ නැහැ; අන්තර්ගත කරුණු පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කළේ නැහැ. අපි දැක්කා, විජිත හේරත් මන්ත්‍රීතුමා කොළ ටිකක් උස්සාගෙන ආවා; බටහිර තානාපති කාර්යාලවල නිලධාරීන් අත්පුඩි ගහද්දී දුවගෙන ඇවිල්ලා මොකක්දෝ කොළයක් සුමන්තිරන් මන්ත්‍රීතුමා එක්ක එකතු වෙලා කථානායකතුමා අතට පත් කළා. හැබැයි, එදා ලෝක ඉතිහාසයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවක කථානායකවරයකු ශබ්දය මත ඡන්දයක් ගණනය කරලා විශ්වාස භංගය දිනුවා කියලා ප්‍රකාශයට පත් කළා. ඒ නිසා තමුන්නාන්සේලා ඒ වෙලාවේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවට එරෙහිව කඩිමුඩියේ විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ඒ ආණ්ඩුව ගෙදර යැව්ව පිළිවෙළට මේ කටයුත්ත සිදු නොවී, -හැබැයි, ඒ ආණ්ඩුව යැව්වා- මේ අනුගමනය කළ ක්‍රියාදාමය සම්බන්ධයෙන් එක පැත්තකින් අපි සන්තෝෂ වනවා. හැබැයි, මෙය දෙබිඩි

[ගරු සිසිර ජයකොඩි මහතා]

රංගනයක් බව නම් අපට ඉතාම පැහැදිලියි. එදා පාර්ලිමේන්තුව විසුරුවා හැරලා නැවත මැතිවරණයක් ලබා ගන්න කටයුතු කළා නම් මේ රටට සිදු වන විනාශය වළක්වන්න පුළුවන්කම තිබියදීත් ඒ විනාශයට හවුල් වුණු දේශපාලන ව්‍යාපාරයක් මේ විශ්වාස භංගය ගෙන ඒම දේශපාලන සරදමක් ලෙස අපි සලකනවා.

ඊළඟට කියන්නට ඕනෑ, අප්‍රේල් 21 ප්‍රහාරයේ වග උත්තරකාරයන් පිළිබඳව අලුතින් කරුණු පැහැදිලි කිරීමක් අනවශ්‍ය බව. ජනාධිපතිවරයාගේත්, අගමැතිවරයාගේත්, කැබිනට් මණ්ඩලයේත් ඒ කාගෙ කාගෙත් නිරුවත හෙළි වෙලා ඉවරයි. කාත්තන්කුඩියේ අල්හාජ් අබ්දුල් ජහිඩ් සංගමයේ මවුලවි මොහොමඩ් සහිලාන් කියලා තිබෙනවා, සහරාන්ගේ රාජ්‍ය විරෝධී දේශන, සියලු ක්‍රියාකාරකම් පිළිබඳව සාක්ෂි ඇතිව ජනපතිට, අගමැතිට, පොලිස්පතිට ඉදිරිපත් කළත් පිළිතුරක්වත් ලැබුණේ නැහැ කියලා. ඒ බව 2019 ජූනි මස 19වැනි බදාදා "දිවයින" පුවත්පතේයි සඳහන් වෙන්නේ. සහරාන්ගේ ක්‍රියාකාරිත්වය ගැන, මෙවැනි මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කරන බව, ඔවුන්ගේ හැඳුනුම්පත් අංක, ඔවුන්ගේ දුරකථන අංක, ඔවුන් අපරාධ කරන බව, ජනාධිපතිතුමා, අගමැතිතුමා, පොලිස්පතිතුමා ඇතුළු අනෙකුත් රජයේ නිලධාරින්ටත් දැනුවත් කර තිබියදී, මේ ඇමති මණ්ඩලයත්, මේ ආණ්ඩුවත් මේ රටේ ජනයාට ආරක්ෂාව සලසා නැති බවක් පෙනී යනවා. ඒ නිසා ආණ්ඩුව දුර්වල බව, ජාතික ආරක්ෂාව විහිළුවට ලක් කර ඇති බව අපට ඉතාම පැහැදිලිව පෙනෙනවා. ආණ්ඩුවට මේ හැම දෙයක්ම විහිළුවක් බවට පත් වෙලායි තිබෙන්නේ. අගමැතිතුමා මේ රටේ සුපක්‍රට මහබැංකු බැඳුම්කර හොරකම සිද්ධ වෙච්ච වෙලාවේ ප්‍රකාශ කළේ මොකක්ද? "ආ, බොන්ඩ් ද? මේක ජේම්ස් බොන්ඩ් වාගේ තමයි" කිව්වා. එතුමා Bonds ගැන කථා කළේ එහෙමයි. හැබැයි, ඒ මහ බැංකු බැඳුම්කර හොරකමින් මේ රටට වුණු රුපියල් කෝටි ලක්ෂයක පාඩුව කොපමණක්ද කියලා මම ගණන් හදලා බැලුවා. මත්තල ගුවන් තොටුපොළත්, සූරියවැව ක්‍රීඩාංගණයත්, කොළඹ කටුනායක අධිවේගී මාර්ගයත් හදන්න පුළුවන්කම ලැබෙනවා, මහ බැංකුවේ හොරකම් කරපු මුදල් ප්‍රමාණය මේ රටේ තිබුණා නම්. මම මේ සංඛ්‍යා විද්‍යාත්මකව ගණන් හදලායි කියන්නේ. මහ බැංකු බැඳුම්කර හොරකම නිසා මේ රටට වෙච්ච බරපතළ ආවස්ථික විනාශය ආර්ථික වශයෙන් ගණනය කළොත් එම අහිමි වුණු මුදල කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයට ගිය වියදමත්, මත්තල ගුවන් තොටුපළට ගිය වියදමත් හා හම්බන්තොට සූරියවැව ක්‍රීඩාංගණයට ගිය වියදමට සමානයි. එවැනි ස්ථාන අද මේ රටට ඉතුරුවෙලා තිබෙනවා. නමුත් මේ කරපු විනාශය නිසා රටට සහ රටේ ජනතාවට දැන් හෙණ ගහලා තිබෙනවා.

ආණ්ඩුව ප්‍රචාරක ව්‍යාපාරය ශීඝ්‍ර කරලා තිබෙනවා. ජනාධිපති අපේක්ෂකයන් මිනිසුන්ට විහිළු සපයමින්, රටේ ජනතාව බඩගින්නේ සිටියදී ප්‍රචාරක වැඩ පිළිවෙළට මුදල් වෙන් කරනවා. සමෘද්ධි ආධාර දීමේ ප්‍රචාරක වැඩේට රුපියල් ලක්ෂ 3,000යි. ඒ මුදල ප්‍රචාරක වැඩේට විතරයි. "Enterprise Sri Lanka" සහ "ගම්පෙරළිය" වැඩසටහනට රුපියල් කෝටි 49යි -ලක්ෂ 4,900යි-. 'පන්නරය' කියලා 'ඉන්න හිතෙන රටක්' ගොඩ නඟන වැඩසටහනක් තිබෙන බව අපි දන්නවා. රටේ කන්න බොන්න දෙයක් නැහැ. මේ රටේ ඉන්න හිටින්න හිතෙන්නේ නැහැ. හැබැයි, පාඨලී චම්පික රණවක ඇමතිතුමාගේ අමාත්‍යාංශය මේ වෙනුවෙන් ප්‍රචාරක වියදම් වශයෙන් ඇස්තමේන්තු කරලා තිබෙනවා, රුපියල් මිලියන 100ක්. එනම් රුපියල් ලක්ෂ 1,000ක්. මේ මුළු මුදල එකට එකතු කළොත් ඒ මුදලින් නෙළුම් කුලුන සම්පූර්ණයෙන් හදන්න අවශ්‍ය වියදම අපට සොයා ගන්න පුළුවන්කම ලැබෙනවා. මුළු රටම විනාශයට පත් කරමින්, විහිළු කරමින්, මේ ආණ්ඩුව තවදුරටත් ඉන්නේ නැතිව, දෙයියනේ කියලා මේ රටින් ඉවත් වෙන්න කියන ඉල්ලීම අපි කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.4.57]

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ආණ්ඩුවට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ජනතා විමුක්ති පෙරමුණ අද ගෙනැල්ලා තිබෙන බව අපි දන්නවා. මේ පිළිබඳව කථා කරන්න කලින් මා මේ කාරණය කියන්න කැමැතියි. අප්‍රේල් මාසයේ 21 වැනි පාස්කු ඉරිදා දිනයේ මේ රට තුළ අවාසනාවන්ත සිදුවීමක් ඇති වුණා. ඒ සිදුවීමෙන් අපේ ලක්වැසියන් -අම්මලා, තාත්තලා, දරුවන්- විශාල පිරසකගේ ජීවිත නැති වුණා. ඒ නිසා අප්‍රේල් මාසය තුළ රට ඇතුළේ විශාල ආන්දෝලනයක් වාගේම අස්ථාවරභාවයක් ඇති වුණා. එපමණක් නොවෙයි, ජනතාව තුළ බියක් ඇති වුණා, අන්තවාදීන් එළියට එන්න පටන් ගත්තා, නොයෙක් අන්තවාදීන් එළියට ඇවිල්ලා, ජාතිවාදී අදහස් පතුරුවලා, ප්‍රචණ්ඩත්වයෙන් ඉදිරියට යන්න කටයුතු කළා. ඒ තුළින් කොතරම් දේපළ හානි සිදු වුණාද කියලා අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිද්ධි තුළින් අහිංසක ජන කොටසක් බිල්ලට ගන්න හැටි අපි දැක්කා. ඒ අයට විරුද්ධව එක්තරා අන්තවාදී කොටසක් ක්‍රියා කරන ආකාරයත් අපි දැක්කා. ඒ අන්තවාදය හා ජාතිවාදය ඇති කරන්න මේ පාර්ලිමේන්තුවේ සමහර මන්ත්‍රීවරුන් පවා විවිධ ප්‍රකාශ කරන හැටි අපි දැක්කා. ඒ වාගේම ඒ අවස්ථාවේ සමහර ජනමාධ්‍යය කොයි විධියටද කටයුතු කළේ කියන එකත් අපි දැක්කා. රූපවාහිනිය ගත්තොත් විශේෂයෙන්ම "හිරු" නාලිකාව හා "දෙරණ" නාලිකාව ජාතිවාදී අදහස් ඉදිරියට ගෙනිච්චේ කොයි විධියටද කියාත් අපි දැක්කා. ඉංග්‍රීසියෙන් කිව්වොත්, media ethics කියන එක අද මේ රටේ නැහැ. අද මාධ්‍ය නිදහස ලබා දීලා තිබෙනවා. හැබැයි, මාධ්‍ය සදාචාරය අද මේ රටේ නැහැ. කොයි විධියටද මාධ්‍ය සදාචාරය ආරක්ෂා කරන්නේ, කොයි විධියටද මෙවැනි අවස්ථාවක කටයුතු කරන්නේ කියලා මාධ්‍යකරුවන් දැන ගන්නට ඕනෑ. එක ජාතියකට අයිති අහිංසක මිනිසුන් කොටසකට අද සිදුවෙලා තිබෙන හානිය අපි දකිනවා. අද රට තුළ Islamophobia කියන එක ඇති කරලා තිබෙනවා. ඒක ඇති කරලා තිබෙන්නේම මෙතැන ඉන්න සමහර අය විසින්මයි. ජාතිවාදය පතුරුවලා, ඒ තුළින් දේශපාලනය කරලා, ඒ ජාතිවාදය තුළින් නැවතත් ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන් බව අපි දන්නවා. ඒ පැත්තෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වනවාය කියන මනුස්සයා මොකක්ද කළේ කියලා අපි දැක්කා. අනේ! අර මිය ගිය අහිංසක අම්මලා, තාත්තලා වළ දමන්නත් කලින් තමන් "ජනාධිපතිවරණයට ඉදිරිපත් වනවා" කියලා ප්‍රකාශ කළා. අපි දන්නවා එදා ඒ අය කොහොමද කටයුතු කළේ කියලා. එදා ඒ සන්නද්ධ වූ කොටස්වලට ආයුධ දුන්නේ කවුද, කොහොමද දුන්නේ කියලා මුලින්ම හොයලා බලන්න ඕනෑ. Avant-Garde එකෙන් කොතැනටද ආයුධ ගියේ කියන එක, Djiboutiවලින් ඒ තොටුපොළවල්වලින් කොහොමද ISIS එකට ආයුධ ගියේ කියන එක, සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමෙන් mark කරන්නේ නැතුව ආයුධ කොහොමද ගියේ කියන එක හොයලා බලන්න ඕනෑ. මෙන්න මේවා තමයි හොයලා බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අහිමි වූ ජීවිත නැවතත් ලබා ගන්න බැරි බව අපි දන්නවා. නමුත්, අපේ ආණ්ඩුව මේ ප්‍රශ්නවලට මුහුණ දීලා, රටේ ස්ථාවරභාවය ඇති කරලා අද රට ඉදිරියට ගෙනැවිත් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණට අපි කියන්න ඕනෑ, ඔබතුමන්ලා විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑ මේ ආණ්ඩුවට විරුද්ධව නොවෙයි, ජනාධිපතිවරයාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනැත් ඔබතුමන්ලා කටයුතු කරන්න ඕනෑය කියලා. එතුමා මේ රටේ නායකයා නිසා. එතැනින් තමයි මේ රටේ මූලිකම ප්‍රශ්නය ඇති වුණේ. එතුමා අද වග කීමක් භාර ගන්නේ නැහැ. එතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනෙන්න ඕනෑ. ඔබතුමන්ලා ඒ කර්තව්‍ය කරන්න.

මේ රට ඉදිරියට ගෙනයන්න අද ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය විශාල කැප වීමක් කර තිබෙනවා. අද රටේ ස්ථාවරභාවයක් ඇති වෙලා තිබෙනවා. අද ළමයින් නැවත පාසල්වලට යනවා. අද රටේ ආරක්ෂාව ඇති කරලා තිබෙනවා. ආර්ථිකය ඉදිරියට ගමන් කරනවා. එම නිසා අපි කියනවා, මේ විශ්වාස භංග යෝජනාව අපි සියලුදෙනාම එකතු වෙලා අනිවාර්යයෙන්ම පරාජය කරන බව. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සීනිතම්බි යෝහේස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක් වෙන් වී තිබෙනවා.

[பி.ப. 5.02]

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று மக்கள் விடுதலை முன்னணியினால் கொண்டுவரப்பட்டிருக் கின்ற, அரசாங்கத்திற்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணையில் உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடை கின்றேன். குறிப்பாக ஏப்பிரல் மாதம் 21ஆம் திகதி இந்த நாட்டிலே நடாத்தப்பட்ட பாரிய மிலேச்சத்தனமான தாக்குதலினால் அப்பாவித் தமிழ் மக்களும் ஒருசில சிங்கள மக்களும் உயிரிழந்திருக்கிறார்கள். இந்தத் தாக்குதலை இஸ்லாமியத் தீவிரவாதிகள்தான் மேற்கொண்டார்கள் என்பதனை நாங்கள் எல்லோரும் நன்கு அறிவோம். அதே வேளையில் இந்தத் தாக்குதல் தொடர்பான தகவல்கள் இத்தாக்குதலுக்கு முன் அரசாங்கத் தரப்பைச் சேர்ந்தவர்களுக்குக் கிடைத்திருக்கின்றதையும் நாங்கள் நன்கு அறிகின்றோம். குறிப்பாக இந்தத் தாக்குதல் நடைபெறும் என்பது தொடர்பான தகவல் 09.04.2019 அன்று இந்த நாட்டின் தேசிய புலனாய்வுப் பிரிவினருக்குக் கிடைத்திருக் கின்றது. தேசியப் புலனாய்வுப் பிரிவினர், பொலிஸ் மா அதிபர் உட்பட சில பாதுகாப்பு உயரதிகாரிகளுக்குத் தெரியப்படுத்தப்பட்டிருக்கின்றது. அந்த வேளையிலே இந்த நாட்டின் பாதுகாப்பு அமைச்சராக இருந்தவர் இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள். ஜனாதிபதி அவர்கள்தான் எப்போதும் பாதுகாப்பு அமைச்சர்! அதேபோன்று அவர் 19ஆவது அரசியலமைப்புச் சீர்திருத்தத்திற்கு முரணாண வகையில் சட்டம், ஒழுங்கு அமைச்சையும் தன்வசம் வைத்திருக்கின்றார். இவ்வாறான நிலைமையில் அவருக்குத் தெரியாமல் இது எவ்வாறு நடந்திருக்க முடியும்?

உண்மையிலே அரசாங்கம் மீதான நம்பிக்கையின்மை தொடர்பான பிரேரணை என்று இங்கு கொண்டுவந்திருப்பது தனியே பிரதமரை மாத்திரமல்ல, இந்த நாட்டின் ஜனாதிபதி யையும் சேர்த்துத்தான். ஏனென்றால், அமைச்சரவையின் தலைவர் ஜனாதிபதி அவர்கள்தான். அவர் பாதுகாப்பு அமைச்சர்; சட்டம், ஒழுங்கு அமைச்சர். இவற்றையெல்லாம் தன்வசம் வைத்துக்கொண்டு அவர் என்ன செய்தார்? உண்மையிலே இந்த அழிவிலிருந்து இந்த மக்களைப் பாதுகாக்கத் தவறியிருக்கிறார். அதை அவர் ஏற்றுக் கொண்டுதான் ஆக வேண்டும். அதுதவிர, ஜனாதிபதி அவர்கள் தேசிய பாதுகாப்புச் சபைக் கூட்டங்களுக்குக்கூடப் பிரதமர், பாதுகாப்பு இராஜாங்க அமைச்சர் ஆகியோரைக்கூட அழைக்காமல் முன்னர் கூட்டங்களை நடாத்தியிருக்கின்றார் என்ற செய்திகளையும் நாங்கள் அறிகின்றோம். இவை யெல்லாம் மிக மோசமான நடவடிக்கைகள்! இந்தத் தாக்குதலினால் எங்களுடைய தமிழ் மக்கள் பெரிதும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்; 250க்கு மேற்பட்டோர் உயிரிழந்திருக்கிறார்கள்; 500க்கு மேறப்பட்ட அப்பாவி மக்கள் காயப்பட்டிருக்கிறார்கள்; துன்பப்பட்டிருக்கிறார்கள்; சொத்துக்கள் அழிக்கப்பட்டிருக்கின்றன. அதனால்தான் மக்கள் விடுதலை முன்னணி இன்று இந்த நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவந்திருக்கின்றது.

இதேவேளையில் இன்று இங்கு பேசிய பாராளுமன்ற உறுப்பினர் ஹரீஸ் அவர்கள், “முஸ்லிம்கள் அந்தக் கொலை முயற்சிகளை மேற்கொண்டவர்களைக் காட்டிக்கொடுத் தார்கள்” என்று கூறினார். ஆனால் அந்தக் கொலைக் குற்றங்களைச் செய்தவர்கள் இஸ்லாமியத் தீவிரவாதிகள்! அதைத்தான் அவர் முக்கியமாகக் கூறவேண்டும். காட்டிக் கொடுப்பது என்பது இரண்டாவது விடயம். அவர்கள் இன்று நேற்றல்ல, தமிழர்களின் போராட்டத்தைக்கூடக் காட்டிக்கொடுத்த பெருமைக்குரியவர்கள். இஸ்லாமியர்களில் பலர் அவ்வாறு இருந்தார்கள். தேசிய தௌஹீத் ஜமாஅத் அமைப்பு என்பது மஹிந்த ராஜபக்ஷ ஆட்சிக் காலத்திலிருந்து இந்த நாட்டின் புலனாய்வுப் பிரிவாக இயங்கியது. ஒரு மத அமைப்பை எவ்வாறு புலனாய்வுப் பிரிவாகப் பயன்படுத்த முடியும்? அந்த இஸ்லாமிய தீவிரவாத மத அமைப்பைப் பயன்படுத்தி தமிழ் இனத்தை அழிக்கலாமென்றுதான் ராஜபக்ஷ அரசாங்கமும் அந்த நடவடிக்கையை மேற்கொண்டது. ஆகவே, இன்று நேற்றல்ல, பல நாட்களுக்கு முன்பே தமிழ் மக்களை அழிப்பதற்காகப் பல திட்டங்கள் தீட்டப்பட்டிருக்கின்றன. இன்று ஹரீஸ் MP அவர்கள் இங்கே கூறுகின்றார், தங்கள் இனம் காட்டிக்கொடுத்ததனால்தான் இன்று பயங்கரவாதத்தை ஒழிக்க நடவடிக்கை எடுக்கப்பட்டதென்று.

இதே ஹரீஸ் MP தான் சொல்லுகின்றார், “கல்முனையின் பூர்வீகக் குடிகள் முஸ்லிம்கள்” என்று. நான் அவரிடம், உனது பூர்வீகம் எது? என்று நீ நிரூபிக்க வேண்டும் என்று கேட்கின்றேன். அரபு நாட்டிலிருந்து வந்த ஆண்கள் தமிழ்ப் பெண்களைத் திருமணம் செய்துதான் இந்த முஸ்லிம் சமூகத்தை இலங்கையிலே உருவாக்கினார்கள். இதனால்தான் இன்று வரை இவர்கள் ‘இலங்கைச் சோனகர்கள்’ என்று அழைக்கப்படுகின்றார்கள். இவர்களால் சொல்ல முடியாது, “அரபு நாட்டிலிருந்து பெண்களும் இறக்குமதி செய்யப்பட்டார்கள்” என்று. ‘தமிழிச்சியின் மக்கள்’ என்று சிலர் இன்றும் கூறிக்கொண்டிருக்கிறார்கள். அவ்வாறு இருக்கையில் எவ்வாறு அவர் கல்முனை பூர்வீக முஸ்லிம்களின் குடியிருப்பு என்று கூறமுடியும்? கல்முனை என்பது பூர்வீகத் தமிழர் குடியிருப்பு! அதை யாரும் மறுக்க முடியாது. ஏனென்றால் மட்டக்களப்பு மாவட்டம் 1967ஆம் ஆண்டுக்கு முன் அம்பாறை மாவட்டத்தையும் இணைத்ததாகத்தான் இருந்தது. மட்டக்களப்பு மாவட்டத்திற்கு உட்பட்டதாகத்தான் கல்முனை

[ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා]

யும் இருந்தது. அந்தப் பகுதியில் தமிழர்கள் பூர்வீகமாக வாழ்ந்தார்கள். ஹரீஸ் MP இன் இந்தப் பிழையான கருத்தை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்தக் கூடாது என்ற விடயத்தில் முன்பு தேசிய தௌஹீத் ஜமாத் அமைப்புத் தீவிரமாகச் செயற்பட்டிருக்கின்றது. அப்படியானால், இதன் பின்னணியில் தேசிய தௌஹீத் ஜமாத் அமைப்போடு சேர்ந்து ஹரீஸ் MP உம் இயங்கினாரா? என்று நான் கேட்க விரும்புகின்றேன். அவ்வாறாயின், அவரும் கைது செய்யப்பட வேண்டும்; விசாரிக்கப்பட வேண்டும். தமிழர்கள் அங்கு பூர்வீகக் குடிகள் இல்லையென்று ஹரீஸ் MP சொல்ல முடியாது. கல்முனையில் தமிழர்கள் பூர்வீகக் குடிகள். அதை யாரும் மாற்றவோ மறுக்கவோ முடியாது. தமிழர்கள் இந்த நாட்டின் பூர்வீகக் குடிகள். அண்மையிலே நவசமாஜக் கட்சியின் தலைவர், ஒரு சிங்களத் தலைமகன் "இந்த நாட்டின் பூர்வீகக் குடிகள் தமிழர்கள்தான்" என்று அதனை மிகத் தெளிவாகச் சொன்னார். ஆகவே, இந்தப் பூர்வீகக் குடிகளை யாரும் கொச்சைப்படுத்த முடியாது; அடிமையாக்க முடியாது.

கௌரவ உறுப்பினர் அவர்களே, ஒன்றை உணர்ந்து கொள்ளுங்கள்! இன்று பாரிய பிரச்சினையாக எழுந்திருக் கின்ற இந்தத் தீவிரவாதத் தாக்குதல் முயற்சிகள் காத்தான்குடி யிலிருந்துதான் ஆரம்பிக்கப்பட்டது. 2019.04.16ஆம் திகதி அங்கு ஒரு குண்டு வெடிப்புப் பரீட்சிக்கப்பட்டிருக்கின்றது. அப்போது அங்கிருக்கின்ற பொலிசார் நடவடிக்கை எடுத்திருந்தால், அல்லது தேசியப் புலனாய்வுப் பிரிவினர் நடவடிக்கை எடுத்திருந்தால், இன்று அந்தப் பாரிய விளைவைச் சந்தித்திருக்கமாட்டோம். அதுமாத்திரமல்ல, 2017.03.13ஆம் திகதி காத்தான்குடி இஸ்லாமிய அமைப்புக்கள் சஹரானுக்கு எதிராகவும் அவரது தேசிய தௌஹீத் ஜமாத் அமைப்புக்கு எதிராகவும் பாரிய ஆர்ப்பாட்டங்களைச் செய்திருக்கின்றார்கள்; பொலிசிலே முறைப்பாடு செய்திருக்கின்றார்கள். ஆனால், காத்தான்குடிப் பொலிசார் அசமந்தப் போக்காக இருந்தார்கள். அதுமாத்திர மல்ல, 2017.03.27ஆம் திகதி அவர்கள் இன்னுமொரு கவனயீர்ப்புப் போராட்டத்தை நடாத்தி, இந்த நாட்டின் ஜனாதிபதி, பிரதமர், நீதி அமைச்சர், சட்டம், ஒழுங்கு அமைச்சர் ஆகியோருக்கும் நீதித் துறை, பொலிஸ் ஆணைக்குழு உட்படப் பலவற்றுக்கும் மகஜர் சமர்ப்பித்திருக் கின்றார்கள். ஆனால், யாரும் எந்த நடவடிக்கையும் எடுக்கவில்லை. அவ்வாறு எடுத்திருந்தால், இன்று இந்தப் பாரிய அழிவை நாங்கள் சந்தித்திருக்க மாட்டோம். அப்பாவித் தமிழ் மக்கள் அழிந்திருக்கமாட்டார்கள். ஆகவே, தவறு நடைபெற்றிருக்கின்றது. அரசாங்கம் என்ற வகையில் தவறு கௌரவ பிரதமர் அவர்களை மட்டும் சார்ந்ததாக இல்லை. மிக முக்கியமாக மேதகு ஜனாதிபதி அவர்களைச் சார்ந்திருக் கின்றது. இன்றும் அவர் சட்டம், ஒழுங்கு அமைச்சைத் தான் வைத்துக்கொண்டிருக்கின்றார். இது 19ஆவது அரசிய லமைப்புத் திருத்தத்துக்கு முரணானது. இன்றுவரை கௌரவ பிரதமர் அவர்களோ, அவரைச் சார்ந்தவர்களோ ஏன் நீதிமன்றுக்குச் சென்று அந்த அமைச்சைப் பெறவில்லை? அது அவர்களது குற்றம். ஏனென்றால், அந்த அமைச்சுப் பொறுப்பு மேதகு ஜனாதிபதி அவர்களிடம் இருக்க முடியாது. ஆகவே, பாரிய பிழைகள் இருக்கின்றன.

நாங்கள் இந்த ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்துக்கு எமது ஆதரவைக் கொடுத்ததனால்தான் இன்று இது ஆட்சியிலிருக்கின்றது. எனவே, நாங்கள் பலவற்றுக்கு ஆதரவைக் கொடுத்து அவர்களை இன்றுவரை பாதுகாத்துக் கொண்டிருக்கும் நிலையில், கல்முனை வடக்குப் பிரதேச செயலகம் தொடர்பான ஒரு சாதாரணமான விடயத்தை நிறைவேற்றாதிருப்பது மிகவும் கவலைக்குரியது. கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்தத் தேவையில்லை. அதற்குக் காணி அதிகாரம் மற்றும் நிதி அதிகாரத்தைக் கொடுத்துவிட்டால் போதும் என்று அவர்கள் கருதுவதாகத் தெரிகின்றது. அது ஏற்கனவே பிரதேச செயலகமாக உருவாக்கப்பட்டுவிட்டது. அது 29 கிராம அலுவலர் பிரிவுகளைக் கொண்டது. 8 கிராம அலுவலர் பிரிவுகளோடு நிலத்தொடர்பற்ற முறையிலே வாகரைப் பிரதேசத்திலேயிருந்த ரிதிதென்ன ஜெயந்தியாவை இணைத்துக் கோரளைப்பற்று மத்திப் பிரதேச செயலாளர் பிரிவை உருவாக்க முடியுமாக இருந்தால், ஓர் இஸ்லாமியப் பிரதேச செயலகப் பிரிவாக அதனை உருவாக்க முடியுமாக இருந்தால், ஏன் கல்முனை வடக்குப் பிரதேச செயலகத்துக்கு இவ்வாறு நிதி மற்றும் காணி அதிகாரத்தை வழங்குவதில் கௌரவ உள்நாட்டு அலுவல்கள் அமைச்சர் அவர்களும் மாண்புமிகு பிரதமர் அவர்களும் இழுத்தடிக்க வேண்டும்? ஆகவே, நாளை நாங்கள் இந்த நம்பிக்கையில்லாத் தீர்மானம் தொடர்பாக முடிவெடுப்பதற்கு முன் கௌரவ பிரதமர் அவர்களும் கௌரவ உள்நாட்டலுவல்கள் அமைச்சர் அவர்களும் கல்முனை வடக்குப் பிரதேச செயலகத்துக்குச் சகல அதிகாரங்களையும் வழங்கி, அதனைத் தரமுயர்த்த வேண்டுமென்று அன்பாகக் கேட்டு நிறைவுசெய்கின்றேன்.

[අ.භා.5.13]

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වෙලා ප්‍රථමයෙන්ම කරපු විනාශය තමයි ජනතාවගේ පරමාධිපත්‍ය වන ඡන්ද අයිතිය නැති කිරීම. පළාත් පාලන ආයතන මැතිවරණ දිගින් දිගටම කල් දමමින් ජනාධිපතිවරයාත්, අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවත් හවුල් වෙලා වසර ගණනාවක් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය උල්ලංඝනය කළා. ඒ වාගේම ආණ්ඩුවත්, ජනතා විමුක්ති පෙරමුණත්, ද්‍රවිඩ සන්ධානයත් කියන මේ සියලු දෙනා එකතුවෙලා අද පළාත් සභා සම්පූර්ණයෙන්ම අක්‍රිය කරලා තිබෙනවා.

ඊයේ-පෙරේදා මේ ගරු සභාවට ඉදිරිපත් කරපු රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතට නීතිය අනුව නම් පළාත් සභාවල අනුමැතිය ගන්න ඕනෑ. පළාත් සභාවල අනුමැතිය ගන්නේ නැතුව නීති කඩලා තමයි මෙම පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන්නේ. පළාත් සභාවේ අනුමැතිය ගන්නේ කොහොමද පළාත් සභා ව්‍යුහය අද සම්පූර්ණයෙන්ම අක්‍රිය වෙලා තිබෙනකොට? ඊයේ පෙරේදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා පාපොච්චාරණයක් කරනවා, දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවලංගු කළ යුතුයි කියලා. දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවලංගු කළ යුතුයි කියලා පාපොච්චාරණය කළ එතුමාම තමයි එදා ඒ ගැන මහා පුරසාරම් දෙඩුවේ. "විධායක ජනාධිපතිවරයා විධියට තමන්ගේ බලය පරිත්‍යාග කරපු එකම ජනාධිපතිවරයා මම" කියලා එදා පම්පෝරි ගැහුවා. එහෙම පම්පෝරි ගැහුවත් රටේ ජනතාවට කිසිම විශ්වාසයක් තැබිය නොහැකි ආණ්ඩුවක් තමයි අද මේ රට පාලනය කරන්නේ.

එක පැත්තකින් ජනතා විමුක්ති පෙරමුණ මෙම විශ්වාස භංග යෝජනාව ගෙන ඒම පිළිබඳව අපි එකඟ වෙනවා. ඒ වාගේම තව පැත්තකින් අපට කනගාටුවකුත් ඇති වෙනවා. ඒ තමයි, ජනාධිපතිවරයා පසුගිය ඔක්තෝබර් 26වැනි දා ගත් තීන්දුවෙන්

පස්සේ, මහින්ද රාජපක්ෂ මහත්මයා සමඟ බහුතරයක් නැහැයි කියලා නැවත වතාවක් එක්සත් ජාතික පක්ෂයට බලය අරන් දෙන වෙලාවේ, අගමැතිධුරය හෝ සංශෝධනය කරන්න ජනතා විමුක්ති පෙරමුණ මැදිහත් නොවීම ගැන. එහෙම වුණා නම් මේ රටට මෙතරම් ව්‍යසනයක් වෙන්නේ නැහැයි කියන එක අපි විශේෂයෙන්ම සිහිපත් කරනවා. ඒක තමයි සත්‍ය කථාව.

අද වෙනකොට විධායකය, ව්‍යවස්ථාදායකය අතර පවතින අර්බුදයට අධිකරණයත් සම්පූර්ණයෙන් පටලවාගෙන තිබෙනවා. ඒ වාගේම අද නීතිපති දෙපාර්තමේන්තුව උග්‍ර විධියට එක් කඳවුරකට පක්ෂග්‍රාහීව වැඩ කරන තත්ත්වයක් පෙනෙන්නට තිබෙනවා. ඉතින් මේ තත්ත්වයත් එක්ක රට යන්නේ කොහේටද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ආණ්ඩුවක් පත් කරන්නේ ජනතාවගේ ප්‍රශ්න කියන්නයි. රජයක් පිහිටුවන්නේ, විධායක ජනාධිපතිධුරයක් හදන්නේ ජනතාවගේ ප්‍රශ්න කියන්නයි. හැබැයි, අද සිදුවෙලා තිබෙන්නේ මොකක්ද? විධායක ජනාධිපතිවරයායි, අගමැතිවරයායි එතුමන්ලාගේ දුක කියනවා, ජනතාවට. අද මේ දෙදෙනාගේ දුක අහන්න ජනතාවට සිදුවෙලා තිබෙනවා. මේක තමයි සත්‍ය තත්ත්වය.

අපි විශේෂයෙන්ම කියනවා, මේ වෙනකොට පළාත් සභා මැතිවරණය පැවැත්වූවා නම් මේ ආණ්ඩුවට බහුතරයක් තිබෙනවාද කියලා අපට බලාගන්න තිබුණු බව. මෙම විශ්වාස භංග යෝජනාව සඳහා හෙට පැවැත්වෙන ඡන්ද විමසීමේ දී එක්සත් ජාතික පක්ෂය ද්‍රවිඩ ජාතික සන්ධානයත් එක්ක එකතුවෙලා, එතුමන්ලාගේ ඡන්ද ටිකත් අරගෙන නැවත වතාවක් කියයි, "පාර්ලිමේන්තුවේ බහුතරය අපට තිබෙනවා"යි කියලා. හැබැයි, අපි එක්සත් ජාතික පක්ෂයට කියනවා, ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ විකෘති බහුතරයක් තබාගෙන සිටියාට, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට එරෙහිව මේ රටේ ජනතාවගෙන් තුනෙන් දෙකක් පෙළ ගැහිලා ඉවරයි කියන එක. මම බොහොම පැහැදිලිව එය කියනවා.

දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව මේ පාර්ලිමේන්තුව විසුරුවන්න, 150දෙනෙකුගේ -තුනෙන් දෙකක- බලයක් අවශ්‍ය නම්, මේ රටේ ජනතාවගේ විශ්වාසයක් නැති, මේ රටේ ජනතාවගේ විශ්වාසය භංග වුණු මේ ආණ්ඩුවට විරුද්ධව සදාචාරාත්මක විධියට අපේ ඡන්දය දෙන්න අපි සූදානම්. මේ රටේ අහිංසක ජනතාවගේ නාමයෙන් පාර්ලිමේන්තුව විසුරුවා මහා මැතිවරණයකට යෑම මේ රටේත්, අනාගත පරපුරේත් යහපත වෙනුවෙන් සිදු කළ යුතු කාරණයක් බව මේ වෙලාවේ අගමැතිවරයාටත්, ආණ්ඩුවටත් අපි සිහිපත් කරනවා.

අද වෙනකොට මේ රට ආර්ථිකමය වශයෙන් කොපමණ පහළට වැටිලාද කියලා අපි දන්නවා.

මහ බැංකුවේ බැඳුම්කර ගනු දෙනුව හරහා සිද්ධ වුණු මගඩිය, ඉන් පසුව සේද මාවතේ ආර්ථික මර්මස්ථානය වූ හම්බන්තොට වරාය විකිණීම ආදී සිදුවීම් එකින් එකට ගත්තාම ඒ බව පෙනෙනවා. මෙතුමන්ලා පසුගිය කාලයේ හැම වෙලාවේම කථා කළේ මොනවා හෝ විකිණීම ගැනයි. තෙල් ටැංකි ටික විකුණන්න දඟලන හැටි අපි දැක්කා. ඊට පසුව මහජන බැංකුව විකුණන්න හැදුවා. මෙන්න මේ කාරණා නිසා මේ රට ආර්ථික වශයෙන් වැටිලා, දිගින් දිගටම පරිහානියට පත් වෙලා අද වන විට මොකක්ද සිදුවී තිබෙන්නේ? මේ වසර හතරහමාරට බිලියන 6,500කට ආසන්න මුදලකින් මේ රට ණය කරලා තිබෙනවා, රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් වට්ටලා තිබෙනවාය කියන එක තමයි අපට විශේෂයෙන්ම සිහිපත් කරන්න තිබෙන්නේ. ඔබතුමන්ලා ආර්ථික වශයෙන් මේ රට වට්ටලා තිබෙනවා; සංස්කෘතිකමය වශයෙන් රට සම්පූර්ණයෙන් අවුලකට පත් කර තිබෙනවා.

අපේ සහෝදර මන්ත්‍රීවරු අද ජාතික ආරක්ෂාව පිළිබඳව කථා කළා. ජාතික ආරක්ෂාව පිළිබඳව කථා කරද්දී, අවුරුදු 4ක් තුළ, වසර 30ක,- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
මට තවත් විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ද්‍රවිඩ ජනතාව අතරින් අන්තවාදී විධියට "LTTE" නමින් බිහි වී, වසර 30ක් තිස්සේ පැවැති සංවිධානය අවසන් කරලා, මේ රටට නිදහස ගෙනැවිත් දීලා වසර ගණනාවක් ඇතුළත, මුස්ලිම්වරුන් අතරින් බිහි වූ "තව්හිත් ජමාත්" කියන අන්තවාදී මිලේච්ඡ කණ්ඩායම පිළිකාවක් වාගේ අද මේ රට ත්‍රස්තවාදයෙන් වෙළා ගැනීමේ කටයුත්තක නිරත වෙනවා. මේ අන්තවාදයට උඩ ගෙඩි දෙන, අත දෙන කවුරුන් හෝ පාර්ලිමේන්තුවේ ඉන්නවා නම් අපි විශේෂයෙන්ම ඒ අයට මෙන්න මේ කාරණය කියන්න ඕනෑ. ඒ අන්තවාදය යට ගහමින් ආණ්ඩුව විධියට එදා හරියාකාරව ක්‍රියාත්මක නොවීමේ කාරණයත් තමුන්නාන්සේලා විශේෂයෙන් අවධානයට ගන්න. මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන්න, රටේ ජනතාවට ආරක්ෂාව ලබා දෙන්න ඔබතුමන්ලා අසමත් වීම ප්‍රධාන කාරණයක් වන බව මා මෙහිදී සිහිපත් කරනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේ මහා ලොකුවට උදන් අනලා, හෙට දිනයේ විශ්වාසභංග යෝජනාව පරාජය කරනවාය කියලා ආණ්ඩුවත්, අගමැතිවරයාත්, තමුන්නාන්සේලාත් පම්පෝරි ගැහුවාට, රටේ ජනතාව අතර ඔබතුමන්ලා අසමත්ය කියන පණිවුඩය ලබා දෙමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.21]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි හතර කියන්නේ නැඟිටලා වාඩි වෙන්නත් මදි වෙලාවක්. කමක් නැහැ, මම ඉතාම කෙටියෙන් කාරණා කීපයක් කියන්නම්.

මීට අවුරුදු හතරහමාරකට පෙරාතුව ආරම්භ කළ එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව, ගෙවී ගිය කාල පරිච්ඡේදයේ කළ යම් යම් කාර්යයන් පිළිබඳව මේ රටේ ජනතාවගේ විශ්වාසය භංගත්වයට පත් වෙලාය කියා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම ඉදිරිපත් කර තිබෙන විශ්වාසභංග යෝජනාවට එරෙහිවයි, එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරයකු හැටියට මා මේ මොහොතේ කථා කරන්නේ. ගරු රොෂාන් රණසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා සභා ගර්භයෙන් පිටව යන්න එපා. පොඩ්ඩක් ඉඳලා මේක අහ ගන්න. ඔබතුමා කිව්වා, "මෙය විකෘති ආණ්ඩුවක්, විකෘති පාර්ලිමේන්තුවක්" කියලා. ඔබතුමන්ලා අද

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ජනාධිපතිතුමාට පහර ගැහුවාට, එතුමා මහින්ද රාජපක්ෂ මහත්මයා හඳ පානේ ගෙනැල්ලා, අගමැතිකමේ දිවුරවලා එතුමාට අගමැතිකමත් අරගෙන දුන්නා. ඒ විකෘති තත්ත්වය ප්‍රකෘති කර ගන්න තිබූ අවස්ථාව ඔබතුමන්ලා සම්පූර්ණයෙන් මහ හැර තිබෙනවා. "අද නැත්නම් හෙට බහුතරය පෙන්වනවා; අපි 113 පෙන්වනවා" කියලා උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා, විමල් වීරවංශ මන්ත්‍රීතුමා කෑ ගහලා, මොර ගහලා, බෙරිහන් දීලා සපථ කර කිව්වා. අන්තිමේදී, උත්තරීතර ශ්‍රේෂ්ඨාධිකරණය ඉතාම ශ්‍රේෂ්ඨ, උත්තරීතර තීන්දුව දීපු වෙලාවේ එතුමන්ලා පැල දොරින් යන්න ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තවත් පැත්තකින් කරුණු දක්වන්නම්. ISIS ත්‍රස්තවාදය නිසා ඇති වූ මේ ඉතාම අවාසනාවන්ත තත්ත්වය මුල් කරගෙන තමයි මේ විශ්වාසභංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ. ලෝකයේ රටවල් අරගෙන බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකා එක්සත් ජනපදයේ පෙන්ටගනයට ගහනකොට ඒ රට කටයුතු කළේ කොහොමද? ඇමෙරිකා එක්සත් ජනපදය කියන්නේ රහස් ඔත්තු සේවාවලින් බලසම්පන්න, ආයුධවලින් බලසම්පන්න, ලෝකයේ ප්‍රතාපවත් රටයි. ඒ දේශයේ පිහිටි පෙන්ටගනයට ප්‍රහාර එල්ල කළ වෙලාවේ කවුරුවත් ගිහින් කිව්වේ නැහැ, "ජනාධිපතිවරයාට අයින් වෙන්න" කියලා. ඒ අය කවදාවත් කිව්වේ නැහැ, ආණ්ඩුව කෙරේ විශ්වාසය භංගත්වයට පත් වුණා කියලා. ඒ වාගේම, නවසීලන්තයේ එවැනි සිදුවීමක් වූ වෙලාවේ, ප්‍රංශයේ එවැනි සිදුවීමක් වූ වෙලාවේ, වෙනත් රටවල එවැනි සිදුවීම් වූ අවස්ථාවල -1970 ගණන්වල ඉඳලා ත්‍රස්තවාදී ක්‍රියා සිදුවූ කාල වකවානුවල - පැවැති කිසිදු ආණ්ඩුවකට අයින් වෙන්න කියලා කිව්වේ නැහැ. එංගලන්තයේ ඇති වූ තත්ත්වය තුළ වුණත්, පාර්ලිමේන්තු රැස්වීම් පවා Church House එකේ පවත්වලා, අණ පනත් සම්මත කරලා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් ඒ අයට තිබුණා. ඒ ආණ්ඩුවේ නායකයන්ට, අගමැතිවරයාට ඉල්ලා අස් වෙන්න කියලා කිසිම කෙනෙක් කිව්වේ නැහැ. මේ දෛවෝපගත සිදුවීම ගැන අප ඉතාම කනගාටු වෙනවා. ත්‍රස්තවාදී ක්‍රියාවක් තුළින් ඇති වූ මේ අපරාධය මැඩ පවත්වන්න බැරි වුණාය කියලා අද අපට චෝදනා කරන අයට මම එක දෙයක් කියන්න ඕනෑ. අප්‍රේල් 21වන දින ප්‍රහාරය සිදුවී සති හයක් වැනි කාලයක් තුළ - ජනාධිපතිවරයා නොසිටියත්- ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ ආරක්ෂක අංශ එකට එකතු වෙලා ඒ සිද්ධි සම්පූර්ණයෙන් මර්දනය කර ඒ අවශ්‍ය කටයුතු කිරීම නිසා අද වන විට ඒ ත්‍රස්තවාදීන් සියලුදෙනා අත් අඩංගුවට ගැනීමට හැකි වී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වෙලාවක් ලබාදෙන්න. ඔබතුමා මගේ මිත්‍රයෙක් නේ.

අවසාන වශයෙන්, මම තව එක කරුණක් කියන්න ඕනෑ. මේ යෝජනාව ගෙනාපු අයගේ පක්ෂය දිහා බලන්න. එතුමන්ලා අවුරුදු 50කට ආසන්න කාලයක් මේ රටේ ජනතාවට වැදි බණ කිව්වා. පක්ෂයේ මන්ත්‍රීවරු සංඛ්‍යාව වැඩි කර ගැනීමට අද වන තුරුත් එතුමන්ලාට පුළුවන්කමක් ලැබී නැහැ. 71 කැරැල්ලත් මේ රටේ සිදුවූ ත්‍රස්තවාදී ක්‍රියාවක්. 71 කැරැල්ල මෙහෙය වූයේ ජනතා විමුක්ති පෙරමුණයි. නිවාඩුවට ගමට එන හමුදා භටයන්ගේ බෙලි කපලා වැටවල්වල ගහපු යුගයක් මේ රටේ එදා තිබුණා; ඡන්දය දමන්න ගිය අයගේ අත, පය කැපූ යුගයක් තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන්ම බල්ලාට දමලායි ඒ කාලයේ වැඩ කළේ. එහෙම අය තමයි අද මේ ත්‍රස්තවාදය මර්දනය කරන්න බැරි වුණාය කියලා අපේ ආණ්ඩුවට එරෙහිව විශ්වාස භංග යෝජනා ගෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1988-1989 කාලයේ මේ රටේ සිද්ධ වුණු දේවල් මම නැවත කියන්න යන්නේ නැහැ. ඔබතුමන්ලා කියයි, "අපි ඒ කාලයේ හිටියේ නැහැ" කියලා. හැබැයි, "ජනතා විමුක්ති පෙරමුණ" කියන පක්ෂයේ ආදි නිර්මාතෘවරුන් තමයි ඒ කටයුතු කළේ. ඒ කාලයේ රටේ අපරාධ රැසක් සිදු වුණා. බස් සිය දහස් ගණනක් ගිනි තියපු, transformers ගිනි තියපු, රජයේ ගොඩනැඟිලි ගිනි තියපු, ගොවිජන සේවා මධ්‍යස්ථාන, ඒ ගොඩනැඟිලි සියල්ල ගිනි තියපු, මේ රටේ දහස් ගණනක් මිනිස් ජීවිත නැති වෙන්න හේතු වුණු පක්ෂයක අය තමයි අද පාර්ලිමේන්තුවට මේ විශ්වාස භංග යෝජනාව ගෙනැත් තිබෙන්නේ. තව අවුරුදු පණහක් ගත වුණාට පසුවවත් තමුන්නාන්සේලාට ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට හැකියාව ලැබේවායි කියලා මා ප්‍රාර්ථනා කරනවා. එසේ වුවත්, පෙනෙන තෙක් මානයක එහෙම සේයාවක්වත් නැහැ කියන එක තමයි මට නම් පෙනෙන්නේ.

හෙට අනිද්දා වන මේ රටේ ජනාධිපතිවරණය පැවැත්වෙනවා. තව අවුරුද්දක් යන්න කලින් පාර්ලිමේන්තු මැතිවරණය පවත්වනවා. කිසිම ඡන්ද ප්‍රතිශතයක් නැති, බංකොලොත් වූ දේශපාලන පක්ෂවලට සහ ඒවාට ගැතිකම් කරලා, ඒ ඔස්සේ බලය තහවුරු කර ගැනීමට බොර දියේ මසුන් බාන තත්ත්වයට පත් වුණු විපක්ෂයේ කණ්ඩායම්වලට මා කියනවා, මේ වාගේ සිල්ලර වැඩ කරන්න එපා කියලා. මෙවැනි විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා ආණ්ඩුවට එරෙහිව කටයුතු කරන්න හැදුවාට, මොකක්ද වෙන්නේ කියලා හෙට සවස 6.30 වෙනකොට තමුන්නාන්සේලාට දැක ගන්න පුළුවන් වෙයි.

අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුග්‍රහය යටතේ, එක්සත් ජාතික පක්ෂයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ නායකත්වයෙන් මේ ආණ්ඩුවේ ඉදිරි ගමන යෑමට ශක්තිය ලැබෙන බව මම නැවත වරක් මතක් කරනවා. "ගම්පෙරළිය" , "සමෘද්ධිය" "රන් මාවත්" වැනි වැඩසටහන් තුළින් ගෙන එන විප්ලවීය වෙනස හරහා අප මේ රට තවත් ශක්තිමත් කරනවා. පුළුවන් නම් ඉදිරි මැතිවරණවලින් අප පරාජයට පත් කරන්න කියලා මම තමුන්නාන්සේලාට අභියෝග කරනවා.

තමුන්නාන්සේලා මේ වාගේ සිල්ලර වැඩ කරන්න එපා; තුච්ඡ දෙකේ වැඩ කරන්න එපා. මේ විදියට විශ්වාස භංග යෝජනා ගෙනැත් ආණ්ඩුවේ ඉදිරි ගමනට අකුල් හෙළන්න එපා කියලා ප්‍රකාශ කරමින්, එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුවට ඉදිරියට යෑමට තව තවත් ශක්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්ද?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවට විරුද්ධව විපක්ෂයේ ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස භංග යෝජනාවක් ගෙනැත් තිබෙනවා. මේ අවස්ථාවේ සභාවේ Quorum එක නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ එක මන්ත්‍රීවරයෙක් විතරක් මේ ගරු සභාවේ ඉන්නවා. මේ ආණ්ඩුවට විරුද්ධව ඇඟිල්ල දිගු කරන්න හදන අය මෙතැන නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් හයදෙනෙක් මේ සභාවේ ඉන්න ඕනෑ. නමුත් එක මන්ත්‍රීවරයායි ඉන්නේ. මේක විහිළුවක්. ඉතින් කොහොමද ආණ්ඩු පෙරළන්නේ? විපක්ෂය අද මේ ගරු සභාවේවත් නැහැ. සභාවේ Quorum එක නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන් -***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present -*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ලකී ජයවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවට පෙර මට විනාඩියක කාලයක් ලබා දෙන ලෙස මා ඔබතුමාගෙන් අවසර පතනවා. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මිය ගිය මිනිසුන් පිළිබඳව වගකීම් ඉටු නොකරපු ආණ්ඩුවට, ඒ පුද්ගලයන්ට විරුද්ධව අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. තමුන් කතෝලික මන්ත්‍රීවරුන් බව කිය කියා ඉඳලා, පාස්කු ප්‍රහාරයේ වගකිවයුත්තන්ට විරුද්ධව ගෙනාපු මේ යෝජනාවේදී ඒ සමහර මන්ත්‍රීවරුන්ගේ හැසිරීම ගැන අපි ඉතාම කනගාටු වෙනවා. මිනී උඩින් ගිහිල්ලා ඡන්ද කොල්ල කනවා. ලජ්ජයි. [බාධා කිරීමක්]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව එතුමන්ලාට මෙතරම්ම හිතේ වේදනාවක් තිබෙනවා නම්, ආණ්ඩුවට ඇඟිල්ල දික් කරන්න වුවමනාවක් තිබෙනවා නම් එතුමන්ලා මේ ගරු සභාවේ ඉන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ඉඳලා මේ ගැන කථා කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව Quorum එක නැතිව පවත්වාගෙන යන්න බැහැ.

අනෙක් එක, ඒ කාලයේ ලේ උඩින් ගියේ කවුද කියලා අපි දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලකී ජයවර්ධන මැතිතුමා කථා කරන්න.

ඊට පෙර, මූලාසනය සඳහා ගරු බිමල් රත්නායක මහතාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. HESHA WITHANAGE *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

[අ.භා.5.34]

**ගරු ලකී ජයවර්ධන මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය සහ නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන වැඩබලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சரும் நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி பதில் அமைச்சரும்)
(The Hon. Lucky Jayawardana - State Minister of City Planning and Water Supply and Acting Minister of City Planning,Water Supply and Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019.04.21 වන පාස්කු ඉරිදා වූ සිද්ධිය අල්ලා, විශේෂයෙන්ම එදා සිදු වූ බෝම්බ ප්‍රහාරය,-

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වගකීම දෙපැත්තටම තිබෙනවා. මේ සභාවේ ගණපූරණය පවත්වා ගෙන යෑම ආණ්ඩුවත්, විපක්ෂයත් දෙපැත්තම එකතු වෙලා කරන්න ඕනෑ. ආණ්ඩුව ප්‍රශ්නයට මුහුණ දෙන්නේ නැතිව, ආණ්ඩුවේ කථිකයන් ඉදිරිපත් කරන්නේ නැතිව මඟහැර යෑම තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

කථිකයෝ නැත්තේ නැහැ. කථිකයෝ ඉන්නවා. මේ අපි කථා කරනවා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන කාලය කාලය විනාඩි 7යි නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට දැන් තිබෙන්නේ විනාඩි 5ක කාලයක් පමණයි. දැන් විනාඩියක් ගිහිල්ලා.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

නැහැ. ඒ මගේ කථාවට ගිය කාලය නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2019 අප්‍රේල් 21 වෙනි පාස්කු ඉරිදා වූ සිද්ධිය පිළිබඳව ආණ්ඩුවටත්, අග්‍රාමාත්‍යතුමාටත් විරුද්ධව ඉදිරිපත් වූ විශ්වාස භංග යෝජනාවේදී අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා.

ජනතා විමුක්ති පෙරමුණ මඟින් ඉදිරිපත් කෙරුණු මේ විශ්වාස භංග යොජනාව තුළ කරුණු 12ක් අඩංගු කළත්, එකම කාරණය සම්බන්ධව දීර්ඝව කරුණු දක්වලා තිබෙනවා. ඒ කරුණු එකින් එක ගැන කථා කළොත් හොඳයි කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා වූ සිද්ධිය අපි කවුරුත් අපේක්ෂා නොකළ සිද්ධියක්. කෙසේ වෙතත් එදා සිද්ධියෙන් රටටත්, ජාතියටත්, ජනතාවටත් සිදු වූ බලවත් පාඩුව පිළිබඳව අපි අදත් කනගාටු වෙනවා. නිදහස ලැබීමෙන් පසුව අවුරුදු 71ක් පුරා පැවති විවිධ රාජ්‍ය කාල තුළ අප රටේ මෙවැනි ත්‍රස්තවාදී ක්‍රියා සිදු වුණාය කියන එක පිළිගත යුතුව තිබෙනවා. සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ කියන හැම ජාතියකින්ම අපේ රටට, අපේ රටේ අභාග්‍යයකට මෙවන් ව්‍යසන ඇති වුණාය කියන එකත් මතක් කළ යුතුයි. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්ත ක්‍රියා නිසාත් මේ රට විශාල වශයෙන් අගාධයට පත් වුණාය කියන එක අපි දන්නවා. ඒ වාගේම LTTE සංවිධානය විසින් කරන ලද ත්‍රස්ත ක්‍රියා නිසාත් මේ රටේ ලොකු විනාශයක් වුණා. 2019 අප්‍රේල් 21 වෙනි දා සහරාන් ඇතුළු ඒ කල්ලියේ ත්‍රස්ත සිද්ධිය නිසා මේ රටේ ලොකු විනාශයක් වුණා. මේ රටේ සිටින විසිලක්ෂයක් පමණ මුස්ලිම් ජනතාව අතරින් 200ක්, 250ක් වාගේ ඉතා අතලොස්සක පිරිසක් තමයි මේ ක්‍රියාව කළේ. අපි ඒ තුළින් මේ රටට සිදු වූ පාඩුව ගණනය කළොත්, එය විශාල පාඩුවක් කියන එක අපි දකිනවා. විශේෂයෙන්ම මෙවන් අවස්ථාවක රජයක් විධියට රජයේ වගකීම ඉෂ්ට කළාය කියන එක අපට සතුටින් සඳහන් කරන්න පුළුවන්.

විශේෂයෙන්ම 21 වෙනි දා සිද්ධිය වෙලා පැය ගණනක් ඇතුළත ඒ සිද්ධිය සමනය කරන්නට ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව ක්‍රියාත්මක වුණාය කියන එක මතක් කරන්න ඕනෑ. මෙවන් සිද්ධියක් වුණාම, මෙවන් පසුබිමක් ඇති වෙන බව අපි කවුරුත් පිළිගත යුතු වෙනවා. මෙවැනි කටයුතු තත්පරයෙන්, විනාඩියෙන්, මාසයෙන්, මාස දෙකෙන් නැවැත්වීමේ අසීරුකම් තිබෙනවා. එවන් තත්ත්වයක් තුළ මෙලෙස ක්‍රියාත්මක වීම ඉතා වැදගත් කියන එක මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රට තුළ ජාතීන් අතර භේදයක් ඇති කරන්න විශාල පිරිසක් උත්සාහ දරනවා. විශේෂයෙන් ආණ්ඩුවට විරුද්ධව, ආණ්ඩුව විනාශ කරන්නට, ආණ්ඩුව පරාජය කරන්නට යම් පක්ෂ යම් උත්සාහයක් දරන බව අපි දකිනවා. විශේෂයෙන් අපි කනගාටුවට පත් වෙනවා ජනතා විමුක්ති පෙරමුණත් මෙවන් අවස්ථාවකට එකතුවීම පිළිබඳව. මේ සිද්ධිය තුළින් මේ ආණ්ඩුව වට්ටලා එතුමන්ලා බලාපොරොත්තු වන්නේ මොකක්ද කියලා අපට හිතාගන්න බැහැ. මෙවන් අවස්ථාවක ආණ්ඩුවක් නැති වුණොත් එය ත්‍රස්තවාදීන්ට කරන උඩගෙඩිදීමක් විධියටයි මම දකින්නේ. ඒ නිසා මෙවන් ආකාරයට කටයුතු කිරීම අපි හෙළා දකින අතර, විශේෂයෙන්ම මේ විශ්වාස භංග යෝජනාව අපේ අග්‍රාමාත්‍යතුමාටත් ඒ වාගේම අපේ රජයටත් ආශිර්වාදයක් බව හෙට දවසේ දකින්න පුළුවන් කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. අද දවසේ පැවැත්වුණු මේ විවාදය තුළින් අපට හෙට දවස දකින්න පුළුවන්. විපක්ෂයේ ජනතා විමුක්ති පෙරමුණ මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළා. ඒකට සහය දෙන්න අනික් අය එතරම් සූදානම් නැති බව අපි දකිනවා. ඒ නිසා හෙට දවසේ නියත වශයෙන්ම මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරලා අපේ ආණ්ඩුව ඉදිරියට ගෙන යනවාය කියන එක සක්සුදක් සේ පැහැදිලියි කියන එකත් මතක් කරනවා. මේ නිසා අපේ රජය තව තවත් ශක්තිමත් වෙන බව කියන්න ඕනෑ. 2015ට පෙර මේ රටේ පැවති රජය තුළින් මේ රටට සිදුවුණු ඒ අයහපත් තත්ත්වය මඟහරවමින්, විශේෂයෙන්ම යහ පාලනය ඇති කර ගනිමින්, මේ රටේ සුබසිද්ධිය වෙනුවෙන් විශාල සේවාවක් කළ අපේ එක්සත් ජාතික පෙරමුණු රජය ඉදිරියටම ගෙන යන්නට අපට ශක්තිය ලැබෙන බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
***එතැන් සිට විවාදය 2019 ජූලි මස 11වන බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.***

*இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம் 2019 யூலை 11, வியாழக்கிழமை மீளத் தொடங்கும்.*

*The Debate stood adjourned accordingly.*
*Debate to be resumed on Thursday, 11th July, 2019.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.40ට, 2019 ජූලි 09වන දින සභා සම්මතිය අනුව, 2019 ජූලි 11වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 5.40 மணிக்கு பாராளுமன்றம், அதனது 2019 யூலை 09ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2019 யூலை 11, வியாழக்கிழமை மு.ப.10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.40 p.m. until 10.30 a.m. on Thursday, 11th July, 2019, pursuant to the Resolution of Parliament of 09th July, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.